කරුණාදාස සූරියආරච්චි වෙනත් නිර්මාණ

හදවතට මුවාවෙන මතකයන්

තෝමා සහ සෝමා

වැහි කළුව

වටරවුම

කසුරිගෙ කොලම

අපේ කාලයේ කුමාරිකාවකගේ කතාවක්


කන්ද පාමුල

© කරුණාදාස සූරියආරච්චි

155 ඒ,

...මිපෑ...

... 033 2226577


# වෙද මහත්තයා සහ මගේ පියා

මේ වන විට මගේ කතා කිහිපයක්ම පොත් වශයෙන් මුද්‍රණද්වාරයෙන් පිටව ඇතත් "කන්ද පාමුල" මා හඳුන්වන්නේ මගේ පළමු නවකතාව වශයෙනි. මින් පෙර මා කතා රචනා කළේ පුවත්පත් සඳහාය. පුවත්පත් සඳහා කතා ලිවීමත් නවකතා කලාවත් අතර සුවිශාල පරතරයක් ඇති බව මම දැන සිටියෙමි. එහෙත් සැබෑ නවකතාවක් ලිවීම මා සිතාගෙන සිටි තරම් පහසු කාර්යයක් නොවූ නිසා වසර ගණනාවක් තිස්සේ "කන්ද පාමුල" සිතුවිලි අතර පමණක් සිරුමාරු වෙමින් තිබිණි.

මා එවකට සේවය කළ "දිවයින ඉරිදා සංග්‍රහයේ" බොහෝ වගකීම්වලින් මිදී "නවලිය" කාන්තා පුවත්පතෙහි කර්තෘ වශයෙන් වැඩ කරන්නට පටන්ගත් දින සිට විශාල නිදහසක් මට ලැබිණි. එහෙත් ඒ වකවානුව පුරා ම පාඨකයන්ගෙන් මට ලැබුණු බලපෑම් දිනෙන් දින තියුණු වන්නට විය.

කාන්තාවන්ගේ පාට පාට ලෝකයක අතරමං නොවී නවකතාවක් යමක් කරන්නැයි ඔවුහු සෞම්‍ය බසින් මෙන් ම රළු පරළු කටුක වදන්වලින් ද මට කියා පෑහ. මට ම මා තේරුම් ගැනීමට මේ ප්‍රතිචාර බොහෝ සෙයින් උපකාරී විය.

"කන්ද පාමුල" මා අතින් ලියැවුණේ මේ නිසාය. මුල් පිටපත ලෙසින් එහෙන් මෙහෙන් ලියැවී වසරකටත් අධික කාලයක් මේසයේ මුල්ලක ෆයිල් කවරයක දුර්වර්ණ වෙමින් තිබුණු කඩදාසිගොන්න දූලි පිසදා යළිත් සකසන්නට මා පටන්ගත්තේ පාදයේ ආබාධයකට ලක්ව මසකටත් අධික කාලයක් ඇඳ මත ද ඉන් පසු තවත් මාස කිහිපයක් කන්තෝරු යෑමට නොහැකිව නිවෙසේ ද රැඳී සිටීමට සිදු වූ කාල වකවානුවේය.

ඒ හදිසි අනතුර ආශිර්වාදයක් වූවා නොවේ දැයි මට සිතුණේ නව කතාව දෙතුන් වරක් ලියා "කන්ද පාමුල" යනුවෙන් එය නම් කළ මොහොතේය.

ම'පියාණන්ගේ ඇතැම් ගති සිරිත් සහ සංවේදී චර්යාවන් "කන්ද පාමුල" නවකතාවේ වෙද මහත්තයාගේ චරිතය නිර්මාණය කිරීම සඳහා මා පෙළඹී විය. ඒ නිසාම මහා කන්දක් බඳු ඒ උතුම් මිනිසාගේ නමට "කන්ද පාමුල" පූජා කළෙමි.

කෙසේ වුවද දයාවංශ ජයකොඩි මහතාගේ අනුග්‍රහය නොවන්නට "කන්ද පාමුල" පොතක් වශයෙන් එළි දකින්නේ නැත. එසේ ම මා කෙරෙහි නිබඳව අවධානය යොමු කළ පාඨකයන්ගේ දැඩි විවේචන නොවන්නට මෙවැන්නක් නොලිය වෙන්නටද ඉඩ තිබිණි. ඒ සැමට තුති පුදමි.

සැබැවින්ම මේ මගේ පළමු නවකතාවයි. මගේ කාර්යය මම අවසන් කළෙමි. ඔබේ අදහස් මම බලාපොරොත්තු වෙමි.

කරුණාදාස සූරියආරච්චි


WWW.SINHALAELIBRARY.COM 1

Uploaded By Paba

ප්‍රථම මුද්‍රණය:- ශ්‍රී බුද්ධ වර්ෂ 2550 ක් වූ පොසොන් පුර පසළොස්වක ලත් ඊට
දින පෙවස් 2006 ජූනි මස 11 වැනි ඉරිදා

විශේෂ ස්තුතිය:-
- පසුපිටට හරවත් වැකි කිහිපයක් ලියාදුන් මහාචාර්ය සුභාන්ද මහේන්ද්‍රයන්ට
- කවදාසි ගොන්නක් මුල් පිටපතක් සේ සලකා කියවා යම් යම් කරුණු මතු කළ චන්ද්‍රසිරි දොඩන්ගොඩට
- තේමාව ආත්ම කොටගත් සිතුවමක් නිර්මාණය කළ කුමුදු තාරකට
- පසුපිට ඡායාරූපය නිමැවූ සුදම් ගුණසිංහට
- පරිගණක අක්ෂර පෙළගැස්වූ තිස්ස කෝරකොටට

පිටකවරය:-
කුමුදු තාරක

SL UNLIMITED
The spirit of Sri lankan ecommunity

# 1

වෙද මහත්තයාගේ මළගමට පැමිණි බොහෝ දෙනෙක් එකිනෙකා හා කතාබහ කරමින් ර. බෝ වූ පසුවද නිවසෙහි රැඳී සිටියහ. වෙදමහත්තයාගේ මරණය නිසා ගමට සිදුවූ පාඩුව වැනි මාතෘකාවකින් පටන්ගත් ඇතැම් කතා බහ ටික වේලාවකින් දේශපාලන වාද බවට ද පත්විය. මාටින් මුදලාලි කීවේ ඩඩ්ලිට වැඩක් කිරීමට ඉඩ නොදුන් සමසමාජකාරයන් මැතිනියටත් "වැඩක් කරන්ඩ" ඉඩ නොදෙන බවය. එහෙත් සී. ජී. ආර්. එකේ දුම්රිය මාර්ග වැඩ කට්ටියේ කම්කරුවෙකු වූ සරනේලිස් කීවේ ඇන්. ඇම්. කොල්වින් වැනි රත්තරන් මොලවලින් වැඩක් ගන්නට නොලැබීම රටේ අවාසනාව බවය. ජිනසෝමට මේ කතා බහවල සමහර කොටස් පැහැදිලිව ඇසුණු නමුත් ඇතැම් කොටස් ඇසුණේ තේරුම්ගත නොහැකි තරමට හෙමිනි. ඇතැම් දෙනා මේ කතාබහ අස්සේම මළ ගෙදරින් පිටවී ගියහ. ඒ අය අතරින්ද ජිනසෝමට කතා කොට ආපසු ගියේ අතරින් පතර එක්කෙනෙක් දෙන්නෙක් පමණි.

"ඉස්කෝලෙ මහත්තය අපි ගිහින් එන්නම්"

ඔවුන් සමුගත්තේද එවැනි සාම්ප්‍රදායික වචන කිහිපයක් පිටකරමිනි. ඒ සැමටම "බොහොම ඉස්තුතියි" කියනවා හැරෙන්නට ජිනසෝමගේ මුවගටද වෙනත් හැඟීම් දනවන සුළු යෙදුම් කිසිවක් පැමිණියේ නැත. "බොහොම ස්තුතියි" කියනවාට වඩා "හොඳයි මාමේ... හොඳයි නැන්දේ..." යනුවෙන් ප්‍රතිචාරය දැක්වූවා නම් එතරම් හොඳදැයි ජිනසෝමට පසුව සිතිණි. එගොඩ ගොඩැල්ලේ ආදිරිස් මාමලා සමුගන්නා විට "හොඳයි මාමේ" යනුවෙන් ප්‍රකාශ

WWW.SINHALAELIBRARY.COM 2
Uploaded By Paba
www.sinhalaelibrary.com

කිරීමට හැකිවීම නිසා ජිනසෝමගේ සිතට කිසියම් සැහැල්ලුවක් ඇතුළු විය. තමන් එසේ ප්‍රකාශ කරන විට ආදිරිස් මාමාගේ මුහුණට නැගුණු සිනාවෙහි අන්තර්ගතව තිබූ ගිනවත්කම ජිනසෝමට පැහැදිලිව පෙනුණේය.

මළගෙදරට පැමිණි සැම දෙනාටම වගේ අවශ්‍ය වූයේ ඇසිලින් නෝනා සමග වචනයක් දෙකක්වත් කතා කොට සමුගෙන යාමටය. වෙදමහත්තයාගේ මිණිය මසවන අවස්ථාවේ සිහි විසඳුණු ඇසිලින් නෝනා බොහෝ වේලාවක් යහතුරු සිටියේ කාමරයේ ඇඳමතය. ඒ නිසාම බොහෝ දෙනකුට කාමරයට ගොස් ඇගෙන් සමුගැනීමට සිදුවිය. පසුව කුසුමලතා විසින් වත්තන් කරගෙන එනු ලැබූ ඇසිලින් නෝනා ඉස්තෝප්පුවේ පුටුවක් මත වාඩි කරවූයේ මළගමට පැමිණ ආපසු යන අයට කතා කිරීම පහසුවනු පිණිසය.

"වෙදමහත්තය නැති පාඩුව ගමේ මිනිස්සුන්ට දැනෙන්නෙ අදින් පස්සෙ තමයි. ආරක්ෂාවට ඇප නූලක් දාගන්ඩ... හදිස්සියකට බෙහෙත් ගෙතක් අහගන්ඩ... ගැණු දරුවෙක් පෝරුවෙ නග්ගන්ඩ... මේ ගම්මැද්දටම හිටියෙ මච්චරයිනෙ..."

ජේතන් අප්පුහාමි කීවේ ඇසිලින් නෝනාට පමණක් නොව ඒ අසල සිටි කිහිපදෙනාටද ඇසෙන පරිද්දෙනි.

"වෙදමහත්තයගෙ පුත්තු දෙන්නගෙන් එක්කෙනෙක්වත් මෙ සෑත්තරේ ඉගෙන ගත්තෙ නැති එක තමයි වස වැරැද්ද... ඒ සෑත්තරේ එතනින්ම ඉවරයි"

විලිසෝං කීවේ අතරින් පතර වචනයක් දෙකක් පටලවමිනි. ඔහු පදමට හැලි අරක්කු පානය කොට ඇතැයි ජිනසෝම අනුමාන කළේය. ඇසිලින් නෝනා විලිසොං දෙස බැලුවා විනා ඒ කතාවලට පිළිතුරු වචන කියන්නට ගියේ නැත. විලිසොංගේ වචනවල තිබූ චෝදනාත්මක ස්වරූපය ගැන ජිනසෝම ඊට පසුවද සිතුවේය. ගමෙන් එහා තිබෙන සමාජය ගැන තේරුමක් නැති විලිසොංලාගේ වචන ගැන එතරම් දුරට සිතිය යුතු නැතැයි සිතමින් ඔහු සිත හදාගන්නට උත්සාහ ගත්තේය.

වෙදමහත්තයාගේ සිරුර මිහිදන් කරන්නට දොඹගහවත්තේ කඳුගැටයක වළ කැපුවේ විලිසොංලා සහ සුබතේරිස් ගොයියලා විසිනි. කැතින් කැත මතුව තිබූ ගල්තලාව නිසා වළ කැපීම අසීරු කාර්යයක් විය. එහෙත් ඒ අසීරු බව නොදැනුණේ ගුණසෝම



විසින් සපයන ලද හැලි අරක්කු බෝතල් දෙක තුන නිසාය. මෙසේ හැලි අරක්කුවලින් මත්වූ ඔවුන් තාත්තා ගැන ඕනෑවටත් වඩා වර්ණනා කරන්නේ දැයි ජිනසෝමට වරෙක සිතිණි.

එහෙත් එසේ සිතීම තාත්තාට මහත් හත්තියක් දක්වූ ගමුන්ට මෙන්ම තාත්තාටද කරන්නාවූ විශාල වැරැද්දක් නොවේදැයි යළි යළිත් සිතෙන්නට වූ නිසා ඉන් අත්මිදෙන්නට සිත තුළ විශාල අරගලයක් කිරීමට ජිනසෝමට සිදුවිය. මේ අරගලය කෙළවර වූයේ තමන් පිළිබඳවම වූ කලකිරීමක් ඔහුගේ සිත කොනක නැන්පත් කරමිනි.

නුවර සිට පැමිණි රමණීගේ නෑදෑයෝ මෙන්ම කුරුණෑගල හිතවත්තුද ඒ වනවිට ආපසු ගොස් සිටියහ. ඒ නිසාම ජිනසෝමට මොකක්දෝ තනිකමක් දැනෙන්නට පටන්ගෙන තිබිණි. රමණීද තමාගේ උරහිසට හිස තබාගෙන සිටින්නේ ඒ තනිකම ඇටත් දැනෙන නිසා විය යුතු යැයි ඔහු සිතුවේය. බොහෝ සේ ඉදිරියට නෙරා ඇති කුසත් දරාගෙන සෙනඟ අතර ගැවසෙමින් දවස පුරාම අවිවේකීව සිටීම නිසා රමණී අධික ලෙස වෙහෙසට පත්ව සිටියාය.

"චිත්තරාලගෙ කාමරේට ගිහින් ටිකක් ඇලවෙලා ඉන්ඩ"

ජිනසෝම කීවේ ප්‍රවේශමෙන් ඇගේ උරහිසට තට්ටු කරමිනි. ඈ හිස වනා එවැන්නක් අවශ්‍ය නොවන බව ඇඟවූවාය.

"නංගිට මහන්සි වගේ... කාමරේට ගිහින් ටිකක් ඇලවෙලා ඉන්ඩ... මං අම්මලගෙ කාමරේ හරිගස්සල දෙන්නං"

බොහෝ වේලාවකට පසු ඔවුන් වෙත පැමිණි කුසුමලතා කීවාය.

"එපා... අක්කෙ..."

රමණී එසේ කියන්නට ඇත්තේ මේ පරිසරය මැද ජිනසෝමගෙන් ඈත් වී සිටින්නට අකමැති නිසා වෙන්නට ඇතැයි කුසුමලතාට සිතිණි. ඇගේ දෙතොල් අගින් සිහින් සිනාවක් මතු වූයේ ඒ නිසාය. ඒ සිනාව ජිනසෝමද නොදක්කා නොවේ.

"මල්ලී මොනවත් කිව්වෙවත් නෑ නේද? මං කෝපි ටිකක් ගේන්නං"

"අපි දෙන්නටම එක කෝප්පයක් ඇති"

WWW.SINHALAELIBRARY.COM 3
Uploaded By Paba

ජිනසෝම කෙළින්ම කුසුමලතාගේ මුහුණ දෙස බලමින් කීවේය. ඔහු ඇගේ මුහුණ දෙස එසේ කෙළින් බැලුවේ බොහෝ වෙලාවකට පසුවය.

වෙදමහත්තයාගේ අවමංගල්‍ය කටයුතුවල සම්පූර්ණ බර ගුණසෝම දරා සිටි අතර ගෙදර දොර අනෙක් කටයුතු සම්පූර්ණයෙන්ම වාගේ කුසුමලතාගේ කරපිට වැටී තිබිණි. වැටි වැටී ඇවිදින බාල දියණියගේ කරදරයද ඉවසමින් ඇ වැඩකටයුතු කළ කඩිසර ආකාරය සැමගේත් අවධානයට යොමුවී තිබිණි. "කුසුමලතෝ අරක කෝ? මේක කෝ? ඒකට මොකද කරන්නෙ?" ආදී වශයෙන් මළ ගෙදර කුස්සියේ වැඩවල නියැලී සිටි අසල්වැසි ගැහැණුන් ඇගෙන් නිතර නිතර විමසුවේ ඒ කටයුතුවල නායකත්වය නොදැනුවත්වම ඇ වෙත පැවරී තිබුණු හෙයිනි. දවසේ වැඩි වෙලාවක් බිළිඳු දරුවාද තුරුලු කොටගෙන ඇඳෙහි වැතිරී සිටියා විනා චිත්තරාටද වැඩක් කරන්නට පුළුවන්කමක් තිබුණේ නැත.

ඇසිලින් නෝනා අසල් ගැවසෙමින් සිටි ගම්මුන් එතැනින් ඉවත්ව ගිය පසු ජිනසෝම හුන් තැනින් නැගිට විත් ඇ අසළින්ම වූ පුටුවක ඉඳගත්තේය. රමණීද ඔහු පසුපසින්ම පැමිණියාය.

"මේ ළමයට ටිකක් ඇලවෙලා ඉන්ඩ කියාපං... හොඳටම කෙහෙට්ටු වෙලා... උදේ ඉඳලම කිසි විවේකයක් නැතෙ."

ඇසිලින් නෝනා කීවේ ජිනසෝමට පමණක් ඇසෙන තරමට සෙමිනි. ඇගේ ඇඟපත මෙන්ම කට හඬද බොහෝ දුබල වී ඇතැයි ජිනසෝමට සිතිණි.

"නුවරින් ආපු කට්ටියත් එක්ක හරියට කතා කරන්ඩවත් බැරිවුණා"

"නුවරටත් එහා යන්ඩත් එපායැ... ඒක හින්ද ඉක්මනටම ගියා..."

"ඒක හොඳයි... කොච්චර දුරක් කියල යන්ඩද?"

සිරිදාස, ඇසිලින් නෝනා සොයා පැමිණියේ ජිනසෝමත් ඇයත් මෙසේ කතා කරමින් සිටින අතරතුරේය.

"වෙදමහත්තයා නැතැයි කියල සිරිදාස මේ පැත්තෙ නැවත් ඉන්ඩ එපා... සිරිදාස මොනොම හිතවත් කෙනෙක් කියල වෙදමහත්තයා කීප දවසක් මාත් එක්ක කිව්වා"



සිරිදාස ඇසිලින් නෝනාගේ මුහුණ දෙස බලා සිටියා මිස කිසිවක් කීවේ නැත. ඇසිලින් නෝනාගේ හඬද බිඳී ගියේය. රමණී ඇ දෙස බලා සිටියාය.

"සිරිදාස හුගක් උදව් කළාය කියල අම්මා කිව්වා"

ජිනසෝමගේ වචන කිහිපය නිසා නැගීම බරවූ නිහඬතාව මොහොතකට බිඳී ගියේය.

"මං හිතින් එන්නම් ඉන්නෙල මහත්තයා..."

"සිරිදාස වගේ කෙනෙක් යන එන එක අම්මටත් ලොකු හයියක්"

ජිනසෝම එසේ කියද්දී ඇසිලින් නෝනා සාරිපොටින් දෑස් පිසගත්තාය. සිරිදාස පිටව යන දෙස ඇ බලා සිටියාය.

"අන්තිම දවස්වල තාත්ත සිරිදාස එනකල් බලාගෙන හිටිය"

එසේ පැවසූ ඇසිලින් නෝනා නැවතත් සාරිපොටින් මුහුණ පිසදමා ගත්තාය. නැවතත් දරා සිටිය නොහැකි නිහඬතාව පැතිර ගියේය.

"තාත්තා නැති පාඩුව ගමට දැනෙන්නෙ අදින් පස්සෙ තමයි. රටක් වටින මනුස්සයෙක්... ඒත් ඉතිං මිනිස්සුන්ටම කෙරුව මිසක් ගෙයක් දොරක් ගැන හිතුවෙ නෑ... අක්ක ගැන තමයි හිතේ දුක තිබුණේ... කාලකන්නි කෙල්ල කියල හත් අට වතාවක්ම කිව්ව. ඒ මිනිහ වෙදමහත්තයගෙ මිනියටවත් ආවෙ නෑ... දැන් පරණ ගෑනිගෙ ගෙදරත් යනවලු... හිනාවෙලා හිටියට කුසුමලතා පුදුම දුකක් විඳින්නෙ... ඒකී දුක් විඳිනව නේද කියල තාත්ත මැරෙන දවසෙ උදෙත් ඇහුව... පේන්ඩ හිටියෙ නැතුවට තාත්තට ඒ දුක දැනෙන්ඩ ඇති..."

"තාත්තා අන්තිමට මොකක් හරි අම්මට කිව්වද?"

"නෑ..."

"මොකක් හරි කියන්ඩ හැදුවෙවත් නැද්ද?"

"හිතේ තිබුණද දන්නෙ නෑ... ඒත් වචන පිටකෙරුවෙ නෑ... මං දිහා බලාගෙන හිටිය විතරයි. එහෙමම හුස්ම විත ගියා..."

ඇසිලින් නෝනා ඉකිගසන්නට වූවාය. රමණී, ජිනසෝමගේ අල්ලා ගත්තාය. ජිනසෝම ඇට ඉකිගසන්නට ඉඩ හැරියේය. යළිත් දෑස් පිසගත් ඇසිලින් නෝනා දිග සුසුමක් හෙළුවාය.

WWW.SINHALAELIBRARY.COM 4
Uploaded By Paba

''තාත්ත අන්තිමට පොඩි ළමයෙක් වගේ වුණා. මගේ හිතට දරාගන්ඩ බැරි විදියට තාත්තා අහිංසක වෙන්ඩ පටන් ගත්තා. හැම තිස්සේම මට කිව්වෙ කාමරෙන් ඉන්ඩ කියල. පේන්ඩ නොහිටියොත් අඬගහනවා. මමත් කාමරෙන් එළියට ගියේ තාත්තට නින්ද ගියාම... තාත්තට මොකක් හරි තනිකමක් දැනුණද දන්නෙත් නෑ...''

''අම්මට හිතෙනවද තාත්ත ඇස් පියාගත්තෙ ලොකු දුකක් හිතේ තියාගෙන කියල''

''නෑ. උඹලගෙ තාත්ත උඹල අපි හිතනවට වඩා හරි වෙනස්. උඹල කසාද බැන්ද කියල දැනගත්තු වෙලාවෙත් තාත්තා කිව්වෙ උන් සතුටෙන් ඉන්නව නං එච්චරයි කියල. ගුණසෝම ගැන හිතුවෙත් එහෙමයි... කුසුමලතා ගැන හිතුවෙත් එහෙමයි... උඹල අසතුටෙන් ඉන්නවද කියන එක විතරයි තාත්තට ප්‍රශ්නයක් වුණේ...''

''ඒත් මට වෙලාවකට හිතෙනව අපි තාත්තගෙ ආසාවල්වලට ඉඩක් දුන්නෙ නැද්ද කියලත්. තාත්ත ඇස් පියාගත්තෙ දුකක් හිතේ තියාගෙනද නැද්ද කියල මම දන්නෙ නෑ. ඒත් මං එකක් දන්නව. තාත්ත ඇස් පියාගත්තෙ හුගක් දේවල් හිතේ ඉතුරුවෙලා තියෙද්දි. ඒව කවදාවත් අපට කිව්වෙත් නෑ. දනෙන්ඩ ඇරියෙත් නෑ. උඹලගෙ තාත්තගෙ හිත අපි උඹල හිතනවට වඩා හරි විශාලයි''

ඇසිලින් නෝනා එක් අතකින් මුහුණ වසාගෙන හඬන්නට පටන් ගත්තාය. රමණී, ජිනසෝමගේ අත තදින් මිරිකමින් ඔහුගේ උරහිසට හේත්තු වූවාය. ගුණසෝම ඔවුන් දෙස බලමින්ම වත්ත පහළට ගියේය.

x x x x

# 2

කස්තුරිආරච්චිගේ ආරොන් සිංඤෝ කොස්ඹවිට ගමේ මිනිසුන් අතර පමණක් නොව අහල ගම්වල මිනිසුන් අතර පවා ප්‍රසිද්ධව සිටියේ ''ආරොන් වෙදමහත්තයා'' නමිනි.

''බෙල් ටිකක් මතුරව ගන්ඩ ආරොන් වෙදමහත්තේලගෙ ගෙවල් පැත්තෙ යනව''

''ලොකු එකීට දෙහි ටිකක් කප්පවා ගන්ඩ ආරොන් වෙදමහත්තය හම්බ වෙන්ඩ යනව''

කොස්ඹවිට ගම් පළාතේ උදවිය ආරොන් වෙදමහත්තයා හමුවීමට යන කාරණාව ගැන අතරමගදී මුණගැහෙන කෙනෙකුට කීවේ ඒ විදියටය. සමහරු ''ආරොන්'' යන නම ද ඉවත් කොට ''වෙදමහත්තයා'' යනුවෙන් අමතන්නට වූහ. එය වඩාත් සමීප හිතවත් ආමන්ත්‍රණයක් යැයි ඔවුන් සිතුවා විය හැකිය. ඇසිලින් නෝනා හැඳින්වූයේ ''වෙදමහත්තයාගේ පවුල'' නමිනි. එසේම ''වෙදමහත්තයාගේ ලොකු කොලුවා'', ''වෙදමහත්තයාගේ පිල්ලෑව'' වැනි යෙදුම්ද අවට ගම් පළාත්වල මිනිසුන් අතර තිබිණි.

සර්වාංග රෝග සඳහා වට්ටෝරු වෙදකම් නොකළ නමුත් හදිසි බඩේ කැක්කුමකට දෙන අත්දුටු ගුලි බෙතක් වෙදමහත්තයා ළඟ තිබිණි. මහ රෑ දෙගොඩහරි ජාමයේ වුවද පැමිණෙන ගැමියෙක් උස් හඬින් කතා කොට වෙදමහත්තයාව අවදි කරන්නේ බඩේ කැක්කුමෙන් කෑමොර දෙන තම දරුවාගේ එකම සහනය මේ ගුලි බෙහෙත බැව් හොඳින්ම දන්නා නිසාය.

SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 5
Uploaded By Paba

"පොඩි කෙල්ල බඩේ කැක්කුමයි කියල පැයක හමාරක ඉඳල කෑගහනවා... බලාගෙන ඉන්ඩ බැරි තැන තමයි දෙගොඩහරි ජාමෙ වුණත් වෙදමහත්තයාට කරදර කෙරුවෙ..."

"මොන කරදරයක්ද බං... මෙහෙම වෙලාවකට නැති වෙදකම මොකටද?"

එසේ කියන වෙදමහත්තයා කාමරයට ගොස් අල්මාරියේ ලාච්චුව ඇද එහි තුඩා හෝර්ලික්ස් බෝතලයක දමා ඇති ගුලිවලින් තුන හතරක් ගෙනැවිත් ගැමියා අත තබයි.

"ඉඟුරු ඉස්මෙන් දියකරල බොන්ඩ දීපං... යන ගමන් ගුණෙරිස් ගොයියලගෙ ගෙදරින් ඉඟුරු අලයක් ඉල්ලගෙන පලයං... ඉඳල හිටල මය ළමයින්ගෙ බඩ සුද්ධ කරපල්ල"

වෙදමහත්තයා ගැමියාට ආපසු අරින්නේ බෙහෙත් ගුලි පමණක් නොව එවැනි උපදේශයක්ද දෙමිනි. ඔහු මේ වෙදකමට මුදල් ගන්නේ නැත. ගුලි හදාගන්නට ඔහුට වියදමක් යන්නේ ද නැත. අවශ්‍ය බෙහෙත් වර්ග කිහිපයක්ම වත්තේම තිබිණි. කුඹුරු දළු නම් ලබාගන්නේ ඇල්පේනිස් ගොයියලාගේ බඩවැටියෙනි. වියදමක් නොමැතිව පිළියෙළ කරගන්නා මෙවැනි බෙහෙත්වලට අසරණ මිනිසුන්ගෙන් මුදල් ගතහොත් එම බෙහෙත්වල ගුණය මෙන්ම තමාගේ අත් ගුණයද නැතිව යනු ඇතැයි වෙදමහත්තයා තදින්ම විශ්වාස කළේය. ඒ වෙනුවට ගැමියෝ සිංහල අවුරුද්දට වෙදමහත්තයා බලන්නට නෑගි බෝගද රැගෙන ආහ. සිංහල අවුරුද්දට හිස තෙල් ගෑවේ වෙදමහත්තෙලාගේ ගෙදරය. වෙදමහත්තයාගේ අතින් නානු මිශ්‍ර හිසතෙල් ගා ගන්නා ඔවුහු ඒ ගමන්ම දෙවැට දිගේ පහළට ගොස් අත්තනගලු ඔයට බැස ස්නානය කිරීම පුරුද්දක් කරගෙන සිටියහ.

එහෙත් ආරොන් සිංඤෝට "වෙදමහත්තයා" යන ගෞරවනීය හැඳින්වීම ලැබුණේ ගුලි බෙහෙත් හෝ හිසතෙල් ගෑම නිසාම නොවේ. අවට ගම්වල උදවිය ඔහුගෙන් ලබාගත් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල පිළිසරණ නිසාය. දරුවා වදනු පිණිස විළිරුජාවෙන් පෙළීගෙන කෑකෑනියකට බොන්නට දීම සඳහා ඔවුහු වෙදමහත්තයා ලවා නැඹිලි ගෙඩියක් මතුරවා ගත්හ. උලුක්කුවකට ගාන්නට ඔහු තෙල් ටිකක් මතුරා දුන්නේය. ඇස්වහ කටවහ දුරුවෙනු පිණිස දෙහි ටිකක් කප්පවා ගන්නට... ආරක්ෂාවට ඇප නූලක් දමාගන්නට



පමණක් නොව ගෙට වුණු දරියක් නැවීම සඳහා නැකැත් වෙලාවක් හදාගන්නටද අවට ගම්වල ගැමියෝ වෙදමහත්තයා සොයා ආහ. ඔවුන් විශ්වාස කරන පරිදි ප්‍රේත කුම්භාණ්ඩයින් පමණක් නොව භයානක මළ යකුන් පවා වෙදමහත්තයාගේ කට හඬ ඇසෙන මානයේවත් නොසිට පලා යන්නේය. කෙසග සිරුරක් තිබුණද වෙදමහත්තයා ඒ තරමටම බලවන්තයෙකි.

එදා හැන්දෑකරේ විලිසොං පැමිණියේද එවැනි කාරණාවකටය.

"මොකද විලිසොං මළ පෙරේතයො එළිබහින වෙලාවෙ?"

ඉස්තෝප්පුවට වී බුලත් විටක් සපමින් සිටි වෙදමහත්තයා බුලත් කෙළ පහරක් මිදුලට විද දෙපා ගසා බසා දමමින් ගෙට ගොඩ වෙන විලිසොං දෙස බලමින් ඇසුවේය.

"මේ වෙලාවෙ නිච්චියටම වෙදමහත්තය ගෙදර ඇති කියල හිතුණ"

"ඉතිං හිටගෙන ඉන්නෙ... බුලත්විටක් කාලම කියාපංකො කහගහියක් ආපු කාරණේ"

වෙදමහත්තයාගේ අවසරයෙන් පසු විලිසොං පුටුවක් ඇද ඉඳගත්තේය. බුලත් හෙප්පුව දෙකලවා අතර හිරකොට තබා ගනිමින් පුවක් කෑල්ලක් ගෙන දත් අතර තබා ගත්තේය.

"ලොකු කෙල්ලට පෙරේත බැල්මක් වැටිල වාගෙ වෙදමහත්තයො... කතා බහ අඩුයි... බලාගත්තු අතේ බලාගෙන වරුවක් වුණත් ඔහේ ඉන්නවා"

"උඹ කොහොමද හරියටම දන්නෙ පෙරේත බැල්මක්ද කියල...?"

වෙදමහත්තයාගේ ප්‍රශ්නයට එක එල්ලේ පිළිතුරක් නොදුන් විලිසොං "කවදාවත් ඔහොම ඉඳල නෑ" යි පවසා බුලත් කොළයක දෙකොණ කඩා තුනට හතරට නමා තක්කේ කෙළවරින්ම තබා ගත්තේය.

"ඊයෙ හැන්දෑවෙ බිං කළුවර වැටුණටත් පස්සෙ පහළ ළිඳට ගිහිං නාල තියෙනව"

"බිං කළුව වැටුණට පස්සෙ තනෙමයි ගිනි මද්දහනෙ වුණත් උඹලගෙ ළිඳ පැත්තට ගියොත් පෙරේතයො තෙමෙයි මළ යක්කුන් බැල්ම දාන්ඩ පුළුවන්... එහන ටිකක් සුද්ධ පවිත්තර කරපල්ලකො...

WWW.SINHALAELIBRARY.COM 6
Uploaded By Paba

ඔය දිය බිඳෙන සද්දෙ ඇහෙන තැන්වල අකුල්... ගාල්... තියෙන්ඩ හොඳ නැ බං... අනික් එක ළමිස්සියෝ ගැවසෙන මැංඩියේ..."

වෙදමහත්තයා පැවසූ දේවල් අසා සිටියා විනා විලිසොං කිසිවක් එකතු කරන්නට ගියේ නැත.

"හිං කළුව මැද්දෙන් ළමිස්සියො නාන්ඩ යවනවද බං?"

ඇසිලින් නෝනා ද ගෙතුළ සිට පැමිණ උළුවස්සට හේත්තු වෙමින් මේ කතාබහට එක්වූවාය.

"මොකට කියනවද ඇසිලින් නෝනෝ දැන් හැදෙන එකිල වචනයක් කිව්වාම අහන එකක්යැ. උන්ගෙ අම්ම කිව්වලු යන්ඩ එපා කියලක්.. දාඩිය දාතව ඉන්ඩ බැ කියල ගියාලු..."

"කළුවර වැටෙනකං හිටියෙ?"

"ඊකි දැන් ගම්පහ ඉංගිරිස් පංතියකට යනව නෙව... ඒ ගිහිල්ල ඇවිල්ල තමයි ළිඳට ගිහිං තියෙන්නෙ"

"ඉංගිරිස් ටිකක් දැන ඉගෙන ගන්න එකනං හොඳ තමා..."

වෙදමහත්තයා මේ කතාබහේ අනුමාතෘකාව අවසන් කළේ ඒ අසුරිනි.

"දැන් ඉතිං උඹ ආවෙ?"

"ආරස්සාවට නූල් පොටක්වත් දාගන්ඩ කියල වෙදමහත්තයො"

ඇසිලින් නෝනා එතැනින් ඉවත්ව යළිත් කුස්සිය පැත්තට ගියේ ඉන්පසු සිදුවෙන කතා බහට එක්වීමට ඇති අකමැත්තක් නිසා නොව මිනැවට වඩා කතාබහට එක්වීම ගැන වෙදමහත්තයා එතරම් මනාපයක් නැති බව හොඳින්ම දන්නා නිසාය.

"විලිසොං ඕහොම කිව්වට ඕක පෙරේත බැල්මක්ද... එහෙමත් නැත්තං අන්දකාරෙට බය වෙලා හිත ගැස්සිලාද කියල එකපාරට කියන්ඩ අමාරුයි"

වෙදමහත්තයා පුටුවේ හරිබරි ගැහෙමින් කීවේය. විලිසොං ඒ වචනවලට හූමිටි තිබ්බා පමණි.

"කොහොමත් මම හෙට උදේ වරුවෙ එන්නං ගෙවල් පැත්තෙ... මං ඒ පැත්තෙ යන්ඩත් කියල තමයි හිටියෙ... සරණේලිස් ගොයියගෙන් හරකෙක් ඉල්ලගන්ඩ... තාම දවටගහ කුඹුරේ දෙහිය හාගන්ඩ බැරි වුණානෙ බං..."



"හැබැයි ඉතිං.. හැන්දෑ කළුවෙ තමයි කෙලිගෙ වෙනස්කම් මතුවෙන්නෙ... උදේ වරුවෙ ඒ තරං වෙනසක් නෑ..."

විලිසොං කියන්නට හදන්නේ දන්ම ඒ පැත්තේ ආවොත් හොඳය කියන කාරණාව බව තේරුම් ගන්නට වෙදමහත්තයාට මහ වෙලාවක් ගියේ නැත. ඊත් ඔහු එක්වරම යමක් නොකියා පපුවේ රෝම අතරින් ඇඟිලි යවමින් මඳ වේලාවක් නිහඬව සිටියේය.

"මේ වෙලාවෙ සරණේලිස් ගොයියත් ගෙදර ඇති නෙව නේද?"

"නිච්චියටම ඇති... උදේ රැයිං බත්තිය බැඳගෙන සිරියාවතී ඉස්කෝලෙ හාමිනේව එක්කරගෙන ඉදිගොල්ල ඉස්කෝලෙට යනවනෙ... ඊට පස්සේ ලෙඩ්ඩුන්ගෙ ටිකට් කපන වෙලාව අල්ලල ඉස්පිරිතාලෙ ගාවට යනව. ඒ ගියාම ඉතිං පැයක් හමාරකට එන්නෙ නෑ... කුලියක් හම්බවුණොත් තවත් පරක්කු වෙනවා... හැබැයි මේ වෙලාවෙනං නිච්චියටම ඇති"

මඳක් රෑ බෝවෙමින් තිබුණද ගෙවල් පැත්තේ යන්නට වෙදමහත්තයා අකමැත්තක් නැති බව තේරුම්ගත් විලිසොං තවත් බුලත් කෙළ පහරක් මිදුලට විද අත්ලෙන් දෙතොල පිසින අතරතුරේම එසේ කීවේ අලුත් උනන්දුවක් ඇති කිරීමේ අදිටන යටි සිතේ තබාගෙනය.

"එහෙම නං ගිහිල්ල බලමුකො"

එසේ කියමින් පුටුවෙන් නැගී සිටි වෙදමහත්තයා ගෙතුළට ගියේය. ඇතැම් විට ඒ බැනියමක් ඇඟට දමාගන්නට විය යුතු යැයි විලිසොං සිතුවේය.

"දැන් මේ රෑ පාතේ යන්නෙ... හෙට උදේ ගියානං ඉවරනෙ..."

වෙදමහත්තයා පසු පසින්ම වාගේ කාමරයට ගිය ඇසිලින් නෝනා කීවේ තරමක් පහත් හඬකින් වුවද එය කුසුමලතාට මෙන්ම ජිනසෝමටත් ඇසුණේය. ටිපෝව දෙපැත්තට වී පොත්පත්වල වැඩ කරමින් සිටි කුසුමලතාත් ජිනසෝමත් එකිනෙකාගේ මුහුණු බලමින් කාමරය තුළින් ඇසෙන කතා බහට ඇහුම්කන් දීගෙන සිටියහ.

"ඒවගෙ ලෙඩ මතුවෙන්නෙ මහ දවාලෙ නෙමෙයි... අන්දකාරෙ මැද්දෙ?"

WWW.SINHALAELIBRARY.COM 7
Uploaded By Paba

ඇසිලින් හෝනාගේ වචනයට වෙදමහත්තයා කීවේ එපමණකි. වැඩිමනත් දෙයක් නොකියා ඇ නිහඬ වූවාය. එහෙත් ඇගේ සිතේ ඇතිවූ නුරුස්සනා බව මුහුණෙන් මෙන්ම ඉරියව්වලින්ද පෙනෙන්නට පටන් ගත්තේය.

"ඇසිලින් හෝනේ... මම වෙදමහත්තයව ලොකු කොල්ලට කියල බයිසිකල් එකෙන් ගෙනත් බස්සවන්නං..."

ඇසිලින් හෝනාගේ අකමැත්ත ඉවෙන් මෙන් තේරුම්ගත් විලිසොං පුටුවෙන් නැගී සිටිමින් තරමක උස් හඬකින් කීවේය.

"අනේ විලිසොං... උඹලගෙ හැටි මම නොදන්නවයැ..."

ඇසිලින් හෝනාට පිළිතුරු දෙන්නට වෙදමහත්තයා හෝ විලිසොං ඉක්මන් වූයේ නැත. එහෙත් "ලෙඩෙකුට පිහිට වෙන්ඩ වෙලාවක් අවේලාවක් නෑ ඇසිලින් හෝනෙ..." යි වෙදමහත්තයා කීවේ අත් දිග මේස් බැනියම ඇඳ උරහිස මත තුවායක් දමා ගන්නා ගමන්ය.

"මහ ඒ දෙගොඩ හරියෙ බීල බීල එයි..."

වෙදමහත්තයාට ඇසෙන නෑසෙන හඬින් තමාටම කියාගත් ඇසිලින් හෝනා කාමරයෙන් පිටව කුස්සිය පැත්තට ගියේ පුළුවු කරගත් මුහුණින් යුතුවය. ජිනසෝමට මෙන්ම කුසුමලතාටද ඇසිලින් හෝනාගේ නුරුස්නා මුහුණ හොඳින්ම පෙනිණි.

"තාත්ත ආපුවාම එක එක ඒව කියන්ඩ යන්ඩ එපා අම්මෙ... දන්නවනෙ හැටි... එදා මතකනෙ..."

කුසුමලතා කීවේ නුරුස්නා මුහුණින් කුස්සියට යන ඇසිලින් හෝනාට ඇසෙන්නටය.

කුසුමලතා සිහිපත් කළේ දවස් දහයකට දොළහකට පෙර දවසක් බත් පිඟාන පොළොවේ ගැසූ සිද්ධියක් ගැනය. බීගෙන පැමිණි වෙදමහත්තයා සමඟ එකට එක කියන්නට යාමෙන් ඇසිලින් හෝනාට සිදුවූයේ එම රාත්තිරියේ කඳුළු පිස දමමින් පිගන් කෑලි අහුලන්නටය.

"ඔව ඔව අලුත් දේවල් නෙමෙයි... උඹලගෙ වැඩක් උඹල බලා ගනිල්ල..." යි කීමට ඇසිලින් හෝනාට සිතුණු නමුත් ඇ නිහඬවම කුස්සියට ගියාය. මේවා ගැන කිසිත් නොදත් ගුණසෝම ඇ පසුපසින් කුස්සියට ගියේ නිදිමැට කඩමිනි.



කුසුමලතා ඉගෙන ගත්තේ පිටියේගෙදර ඉස්කෝලේ නමවැනි කැලෑසියේය. ජිනසෝම හතරවැනි පන්තියේ ඉගෙනුම ලැබී. ගුණසෝම දෙවැනි කැලෑසියට සමත් වුණේ මේ අවුරුද්දේය.

කුසුමලතා මැහුමට ගෙතුමට මිසක පොතපතේ වැඩට එතරම් සමත්කමක් දක්වූයේ නැත. එදිරිසිංහ හෝනාමහත්මයා කියන පරිදි ජිනසෝම නම් පොත පතේ වැඩට බොහොම දක්ෂයෙකි.

"කොලුවට හොඳට මතක හිටිනව..."

සමූපකාරය අසලදී මුණගැසුණු එදිරිසිංහ හෝනාමහත්මයා ඒ ටික ඇසිලින් හෝනාට කීවේ පසුගිය සතියේ දවසකය.

පැයක් හමාරක් ගිය නමුත් වෙදමහත්තයා ආපසු පැමිණියේ නැත. ගුණසෝම ඇඳට ගොස් බොහෝ වේලාවක් ගත වී තිබිණි.

"තාත්ත කොයි වෙලාවෙ එයිද කියල කවුද දන්නෙ.. උඹල කාල නිදාගනිල්ල..."

පිඟානකට බත් ටිකක් බෙදාගෙන ගුණසෝමට කැවීම පිණිස කාමරයට යන ගමන් ඇසිලින් හෝනා, කුසුමලතාට කීවාය. කාමරයට ගිය ඇ ඒ වන විටත් හොඳ නින්දක පසුවූ ගුණසෝමව අවදිකොට බත් කටක් දෙකක් කවන්නට උත්සාහ ගත්තාය. බලකරනවා වෙනුවට ඇස් පියාගෙනම බත් කටක් දෙකක් ගිල දැම්මා මිසක නැගිට බත් කෑමට ඔහු උනන්දුවක් දක්වූයේ නැත. ඇසිලින් හෝනාද ඔහුට කරදර කරන්නට ගියේ නැත. වෙදමහත්තයා පැමිණි පසු කෙසේ හෝ ඔහුට බත් කටවල් හත අටක් කවන බැව් ඇ දැන සිටියාය.

කුසුමලතා පොත වසා තබා ටිපෝව අසලින් නැගිට කුස්සියට ගියාය. ඉවසාගත නොහැකි කුසගින්නක් නැතත් තාත්තා එන්නට පෙර තිබෙන දෙයක් කා අවසන් කොට ඇඳට වැටෙන එක හොඳ යැයි කුසුමලතාට සිතුණේ එළියේ පහළියේ සිටියොත් ඔහු බීමතින් දොඩවන වචනද ඇතැම්විට අම්මා සමඟ බැණ අඬ ගසා ගන්නා විට පිටවෙන වචනද අසා සිටින්නට සිදුවෙන නිසාය. කුසුමලතා පසුපසින් ජිනසෝමද ගියේය.

වෙනදා මෙන්ම වෙදමහත්තයා පැමිණියේ දෙගොඩහරි පාමයේය. එහෙත් පදමයකට මෙන් ඔහු බීමත්ව සිටියේ නැත.

WWW.SINHALAELIBRARY.COM 8
Uploaded By Paba

''සරණේලිස් ගොයියගෙ ගෙවල් පැත්තෙ ගියා හරකෙක් ඉල්ලගන්ඩ ඒ යකාගෙ කයිවාරුවට කොල්ලුණගෙම ගැලවෙන්ඩම බෑ''

මෙස් බැනියම ගලවමින්ම ඇසිලින් හෝනාට කීවේ ප්‍රමාදයට සාධාරණ හේතුවක් දක්වන්නට ලැබෙන විරල අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට වෙදමහත්තයාට සිතුණ හෙයිනි.

''ළමයි කාලද බුදිය ගත්තෙ?''

''ලොකු දෙන්න නෑව... පොඩි එකා නින්දෙන් කටක් ගිල්ල මිසක බඩට වැටෙන්ඩ කෑවේ නෑ... විලිසොංගෙ කෙලීට මොකද?''

ඇසිලින් හෝනාද වෙනදා නොඅසන ප්‍රශ්න අසන්නට සිතුවේ නොයි පැමිණීම ගැන වෙදමහත්තයාට යහපත් ප්‍රතිචාරයක් දක්වීමක් ලෙසිනි.

''පෙරේත බැල්මක් වාගෙ තමයි. පිදේනි තට්ටුවක් දීල ඇප නූලක් දාපුවාම හරි යයි. ඒ ළිඳ ළඟ පෙරේතයො නෙමෙයි යක්කුත් ඇති. ඒ තරමට අකුල් ගාලක්...''

එසේ කියමින් කාමරයෙන් පිටතට පැමිණි වෙදමහත්තයා ඉස්තෝප්පුවට ගියේ හුළං ටිකක් වදිනු පිණිසය.

''තියෙන දෙයක් බෙදල ගනිං... බඩගිනියි හොඳටම...''

ඉස්තෝප්පුවේ සිට නැවත කුස්සියට ගිය වෙදමහත්තයා පපඩමක් බදිමින් සිටි ඇසිලින් හෝනාට කීවේය.

''ළිඳ ළඟට යනවද? වතුර එකක් තියන්ඩද?''

''වත්න ඔය වතුර ටිකක් දීපං... ළිඳ ළඟට යන්ඩ කම්මැලියි...''

ඇසිලින් හෝනා විසින් කුස්සිය පිළිකන්නේ දිය මැස්ස මත තැබූ වතුර කොරහෙන් යමතමින් මුහුණ අතපය තෙමාගත් වෙදමහත්තයා සරම පොටින්ම මුහුණ පිසදාගෙන කුස්සියේ තිබෙන පුටු කබල මත හිඳ ගත්තේය. ඇසිලින් හෝනා දූන් බත් පිගාන අතට ගත් වෙදමහත්තයා පපඩම් කෑල්ලක් ගෙන දත් අතර තබා හැපුවේය.

''හරකද අපේ දරුවොත් ඉංගිරිසි පන්තියකට ඇරියොත්...?''

පැය ගණනාවක් තිස්සේ සිතෙහි දුවටෙමින් තිබුණු කාරණාවක් ඇසිලින් හෝනා, වෙදමහත්තයා ඉදිරියේ මුදා හැරියේ එසේ කරනතට හොඳම අවස්ථාව එළඹ ඇතැයි සිතුණ නිසාය.



''එදිරිසිංහ හෝනමහත්තය කිච්ච කියල දෙන දේවල් ජිනසෝමට හොඳට මතක හිටිනව කියල''

වෙදමහත්තයා ඉංග්‍රීසි පන්තිය ගැන කිසිවක් නොපැවසූ හෙයින් යළිත් වරක් ඔහුගේ අවධානය යොමු කරගැනීම පිණිස ඇසිලින් හෝනා එසේ කීවාය.

''ඒක නං හොඳ තමයි... කුසුමලතාට නං එච්චර දුර ඉගෙනගන්ඩ පුළුවන්ද කියල හිතන්ඩ අමාරුයි... ජිනසෝම නං අකුරු සෑත්තරේට බොහෝම උනන්දුයි තමයි''

''එහෙම නං මං එදිරිසිංහ හෝන මහත්තය හම්බ වෙලාම අහන්නං එහෙම හොඳ පන්තියක් තියෙනවද කියල''

ඒ කතා බහ ඒ විදියට අවසාන විය. එසේ වුවද කලක පටන් වෙදමහත්තයාගේ හිතට කරදර දුන් සිතුවිල්ලක්ද මේ අවස්ථාවෙහි ම මතු වූයේ රාත්‍රී නිසංසල බව විසින් කරන ලද පෙළඹවීමද හේතු කොටගෙනය.

''ඒ ඔක්කොම හරි... මං කල්පනා කෙරුවෙ මගෙන් පස්සෙ මේ සාත්තරේ ගෙනියන්ඩ එකෙක් හදාගන්නෙ කොහොමද කියල... ඒවත් තියෙන්ඩ එපායැ...''

වෙදමහත්තයා ඒ කාරණාව මීට පෙරද කිහිප වතාවක්ම ඇසිලින් හෝනා සමඟ පවසා ඇත. ඒ හැම අවස්ථාවකම නිහඬ බව විසින් කතා බහ අවසන් කළා විනා විසඳුමකින් හෝ වෙනත් පියවරකින් අවසන් වූයේ නැත.

''ඔය දෙහි කපන්ඩයි... නූල් බඳින්ඩයි දූන් කාලෙ කොල්ලො කැමැති නෑ... උන් කැමැති මොකක් හරි ආණ්ඩුවෙ රස්සාවක් කරන්ඩ...''

''ලොකු එකා ගැන නං මගෙ කිසිම බලාපොරොත්තුවක් නෑ... ඒත් පොඩි එකා මොනව හරි කරාවි කියල මට හිතෙනව. ඌ ඔය ගොක්කොළ... කෙහෙල් පතුරු... දිහා බලන විදියෙන් මට පේනව...''

වෙදමහත්තයාගේ කතාවට ඇසිලින් හෝනාගේ මුවග මඳ සිනාවක්ද මතු විය.

''ඒකා නාම දෙකේ කැලෑසියෙ... ඌ මොනවද දන්නෙ...''

''මට හිතෙනව ඔය හෝනකරේකට යන වෙලාවක පොඩි එකාවත් එක්කරගෙන යන්ඩ''

WWW.SINHALAELIBRARY.COM 9
Uploaded By Paba

"විකාර නැතුව උඹට ඉගෙන ගන්ඩ දෙන්ඩ"

"බලාපංකො අර අල්මාරියෙ නිකං දිරන පුස්කොළ පොත් ටික.. මම පිළිවෙළකට වෙදකම නොකළට ඕව හොඳ වෙද පොත්.. ඒවට යන කලඳුත් තියෙන්ඩ එපායැ..."

අල්මාරියේ තට්ටුවක් පුරා ඇති පුස්කොළ පොත් ගැන ඇසිලින් නෝනාට නොසිතෙනවා නොවේ. එහෙත් ආණ්ඩුවේ රස්සාවක් නොමැතිව මේ වැඩවලින් ජීවත් විය හැකි යැයි ඈට නම් සිතෙන්නේ නැත.

"මේක විකාරයක් නෙමෙයි ඇසිලින් නෝනො... බොහොම වැදගත් සාස්තරයක්. මං මොනිටර් ගුරුකම අත ඇරියෙත් මේ දේවල් කවුරු හරි කොරන්ඩ ඕනෑ හින්ද"

වෙදමහත්තයා කතා කරන්නේ කලකිරීමක් වැනි හැඟීමකින් යුතුව යැයි සිතුණ හෙයින් ඇසිලින් නෝනා ඒ ගැන ඊට වඩා දෙයක් කියන්නට ගියේ නැත.

තමා මොනිටර් ගුරුවරයෙකු වශයෙන් අවුරුද්දක් හමාරකටත් වැඩි කාලයක් කරණැකමුල්ල ප්‍රාථමික පාඨශාලාවේ සේවය කළ අයුරුත් පියාගේ කීම අනුව ගුරු රස්සාව අතහැර යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන්නට පටන්ගත් අයුරුත් වෙදමහත්තයා මීට පෙර කිහිප වතාවක්ම ඇසිලින් නෝනා සමඟ පවසා ඇත.

"පිටියෙගෙදර ඉස්කෝලෙ දූත් ඉන්න විතානගේ ලොකු මහත්තයාත් ඒ කාලෙ මොනිටර් ගුරුවරයෙක්. පස්සෙ මිනිහා අවසානෙත් පාස් වෙලා ට්‍රේනිං කොලීජියටත් ගියා"

ගුරු රස්සාව අත්හැරීම ගැන වෙදමහත්තයා දුක් පසුතැවෙනවාද යන්න තේරුම් ගැනීමට ඇසිලින් නෝනා උත්සාහ ගත් නමුත් මේ තාක් ඒ පිළිබඳව පැහැදිලි අදහසක් ඇති වී නැත.

"මං පරාණ තීයක් ගොඩදාල තියෙනව ද බං"

වෙදමහත්තයා නිතර නිතර කියන කතාවක්ද ඇසිලින් නෝනාට සිහිපත් විය.

× × × ×

# 3

වෙද මහත්තයා එන තෙක් විලිසොංගේ ගෙදර ඉස්තෝප්පුවට වී මග බලාගෙන සිටි හත් අට දෙනාගේම වාගේ මුහුණු මත මඳ සිනාවක් ඇඳී ගියේ ඔහු පසුපසින් ගාටන ගුණසෝමගේ දර්ශනය දකින්නට ලැබීමත් සමඟය.

"අද චූටි වෙදමහත්තයත් එක්කරගෙනම ඇවිල්ල වාගෙ"

විලිසොංගෙ පවුල ගුණසෝමගේ හිස අතගාමින් කිවාය.

"නැතුව ඉතිං... වෙදමහත්තයගෙන් පස්සෙ මේ සාත්තරේ ගෙනියන්ඩ කෙනෙකුත් ඉන්ඩ එපායැ"

සීටිං ගොයියා, විලිසොංගේ පවුලගේ කතාවට තවත් වචනයක් එකතු කළේය. ගුණසෝම ලජ්ජාවෙන් සිනාසෙමින් ඇඟිල්ල හපමින් වෙදමහත්තයාගේ ඇඟට තව තවත් හේත්තු විය.

"මිනිහ බොහොම කැමැතියි ගොක් කොළ වැඩවලට"

වෙදමහත්තයා එසේ කීවේ සියුම් ආඩම්බරයක්ද සහිතව ගුණසෝමගේ හිස අතගාමිනි. ආගිය විගතුග කතා කිරීමෙන් පසු හොඳින් සීනි දැමූ තේ එකක් පානය කළ වෙදමහත්තයා විලිසොංගේ පවුල එලූ පැදුර මත වාඩිවී පිදේනි තටුව හැදීමේ කටයුත්ත පටන්ගත්තේය. තමන්ට ලැබුණු තේ කෝප්පයෙන් උගුරු කුන හතරක් පමණක් බීව ගුණසෝමද ඔහු අසලින්ම ඉඳගත්තේය.

"ඕනෑ කරන දේවල් ලැස්ති ඇතිනෙ"

"එහෙමයි... ඔක්කොම හරි. කුකුළ තමයි තාම නැත්තෙ.. උක්කුං දුන් ගිහින් සැහෙන වෙලාවක් ඒමිස් අයියලගෙ ගෙදරින් කුකුළෙක් ඉල්ලගෙන එන්ඩ"

WWW.SINHALAELIBRARY.COM 10

Uploaded By Paba

ගුණසෝම, විලිසොංගේ කට දිහාම බලාගෙන සිටියේය. කුකුළා පිළිබඳ කතාව ඔහුගේ හිතට ඇල්ලුවේ නැත.

යකුන් ඇවිත් කුකුළු බිල්ලගෙන බෙල්ල කඩා ලේ බොන කතාවක් ගුණසෝම අසා තිබුණේය. ඒ කවුරුන් හී කතාවක්දැයි ඔහුට හරිහැටි මතක නැත. ඇතැම්විට එය කුසුමලතා, ජිනසෝමට පැවසූ කතාවක් විය හැකිය. කෙසේ වුවද විලිසොංගේ කුකුළු කතාවෙන් පසු ගුණසෝමගේ සිත සෙමින් ගැහෙන්නට පටන් ගත්තේය. ඔහු වෙදමහත්තයාගේ ඇඟට තව තවත් ළංව හේත්තු වන්නට උත්සාහ කළේය.

"චූටි පුතේ පොඩ්ඩක් එහාට වෙලා ඉඳගන්ඩකෝ"

ගුණසෝමට එසේ කියූ වෙදමහත්තයා කෙහෙල් කොටය ළඟට ගෙන පතුරු අරින්නට පටන් ගත්තේය.

"ලොකු පුතා එන්ඩ හැදුවෙ නැද්ද වෙදමහත්තයෝ?"

ඒ ප්‍රශ්නය ඇසුවේ විලිසොංගේ ලොකු අයියා වන එච්නිස් සිංඤෝය. ඉහළගම් පේරුවේ වෙසෙන ඔහු විලිසොංලාගේ ගෙදර එන්නට ඇත්තේ මේ කටයුත්තට උදව් කිරීම පිණිස වෙන්නට ඇතැයි වෙදමහත්තයාට සිතිණි.

"මිනිහ මේ වැඩවලට ඒතරං මනාපයක් නෑ එච්නිස් අයියෙ... පාඩං පොත්වල වැඩම තමා"

"ඒක කොච්චර එකක්ද? දරුවෙක් පත පොතේ වැඩට උනන්දුයි කියන්නෙ ලොකු දෙයක්"

එච්නිස්ලා සිතන්නේද ඇසිලින් තෝන්ලා සිතන විදියටම නොවේදැයි වෙදමහත්තයාට සිතුණේය. පොත පත පාඩම් ඉගෙන ආණ්ඩුවේ රස්සාවට යන එක එකම ඉලක්කය වී තිබේ. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වැඩවලට වඩා ආණ්ඩුවේ රස්සාවල් බොහෝ උසස්ය. එවැනි සිතුවිලි වෙදමහත්තයාගේ සිතට ඇතුළු වූ නමුත් එච්නිස් සිංඤෝ, ජිනසෝම පිළිබඳව පැවසූ දේ ඔහුගේ සිත තුළ සියුම් ආඩම්බරයක් මතු කිරීමටද සමත් විය.

"වෙදමහත්තය මොනිටර් ගුරුකමේ හිටිය නම් මෙලාකට ලොකු ඉස්කෝලෙ මහත්තයෙක් නේ..."

"එහෙම වුණා නං යකෙක් බැඳගන්ඩ උඹලට කට්ටඩියෙක් මාතරින් ගේන්ඩ වෙනව"



සිට්ටං ගොයියාගේ කතාවට වෙදමහත්තයා කෙහෙල් පතුර දෙස බලාගෙනම පිළිතුරු දුන්නේය. ඒ වචන හත අටෙන් පසු ඒ කතාව අවසන් වූවා පමණක් නොව හදිසි නිහඬතාවක්ද පැතිර ගියේය. කවුරු කවුරුත් කටයුත්තට උදව් පදව් වෙන්ට උත්සාහ ගත්ත.

සිට්ටං ගොයියා පැත්තකින් දමා තිබූ කොස් අත්ත ගෙන කොළ කඩමින් ගොටු ගහන්නට පටන් ගත්තේය. එච්නිස් අයියා විලක්කු දෙක තුනක් සෑදීමේ කටයුත්ත පටන් ගැනීම සඳහා පිරුවට කෑල්ලක් දෙකක් ගෙනෙන්නට ගෙතුළට ගියේය. විලිසොංගේ ලොකු කොලුවා කුකුළු නාම්බෙක් උස්සාගෙන බයිසිකලයෙන් පැමිණියේ මේ අතරතුරේය. සිට්ටං ගොයියලා පමණක් නොව වෙදමහත්තයාද තම වැඩකටයුතු මොහොතකට නවත්වා දෙපා ගැටගසා සිටි කුකුළු නාම්බා දෙස බැලුවේය.

කුකුළු නාම්බා දුටු සැණින් ගුණසෝමගේ සිත යළි ගැහෙන්නට පටන් ගත්තේය. වෙදමහත්තයාගෙන් මේ ගැන අසන්නට දෙතුන් වතාවක් උත්සාහ කළ නමුත් ඒ සෑම අවස්ථාවකම අහලින් පහළින් කවුරුන් හෝ සිටි නිසා තවදුරටත් කට වසාගෙන සිටින්නට ගුණසෝමට සිදුවිය. එහෙත් කුකුළු නාම්බා තටු ගසා හැඬලූ විට ඔහු බියෙන් ගැහෙන්නට පටන් ගත්තේය.

"තාත්තෙ යක්කු ඇවිත් කුකුළගෙ බෙල්ල කඩල ලේ බොනවද?"

තවදුරටත් ඉවසා දරාගෙන සිටිය නොහැකි තැන ඔහු වෙදමහත්තයාට හොඳටෝම ළංවී සෙමින් ඇසුවේය. වෙදමහත්තයා කෙහෙල් පතුරු කපන ගමන්ම ගුණසෝම දෙස බැලුවේය. ගුණසෝම බියට පත්ව ඇති බව එක්වරම ඔහුට පෙනිණි.

එහෙත් ඒ බවක් නොපෙන්වූ වෙදමහත්තයා ගොක්කොළ හත අටක් මිටට ගෙන දුනු පිහියෙන් කැටයමක් කපා පසෙකින් තැබුවේය. ඔහු ඉන්පසු ගුණසෝමගේ හිස අතගාමින් මුහුණ දෙස බැලුවේ මඳ සිනාවක්ද මවා ගනිමිනි.

"කවුද චූටි පුතාට එහෙම කිව්වෙ?"

"දවසක් අක්ක... අයියත් එක්ක කිව්ව"

"නෑ පුතේ... මේ වාගෙ වැඩවලදී එහෙම පරාණඝාත කරන්නෙ නැහැනෙ... අපි කරන්ඩ යන්නේ හොඳ වැඩක්නෙ... බලාගෙන ඉන්ඩකෝ"

WWW.SINHALAELIBRARY.COM 11
Uploaded By Paba

වෙදමහත්තයාගේ පිළිතුරෙන් ගුණසෝමගේ සිතෙහි ඇති බිය සම්පූර්ණයෙන්ම ඉවත්ව ගියේ නැතත් ඔහු ඊට පසු ඒ ගැන ප්‍රශ්න අසන්නට ගියේ නැත. ගෙදරදී "උඹ... බං.. මොලං" කියා දරුවන්ට කතා කරන නමුත් වෙදමහත්තයා පිට තැනකදී කතා කළේ "එන්ඩ... යන්ඩ... ගන්ඩ... පුතා" ආදී වචන හිතාමතාම යොදාගනිමිනි.

"එච්චිස් අයියෙ විලක්කු ඔතල ඉවරනං පොල් තෙල් පෙරහුවත් නං හරි... සීටිං ගොයියො ගොටු හතක් ඇති... දැන් ඕවගේ කුකුල් ලේ ටික ටික ගාපං..."

වෙදමහත්තයාගෙන් ඒ වචන පිටවෙත්ම සීටිං ගොයියා නැගිට පිළිකන්න පැත්තට ගියේය. එකත් එකටම ඒ උල් පිහියක් වැනි දෙයක් ගෙන එන්නට විය හැකි යැයි ගුණසෝම සිතුවේය. මුලින් තිබූ තරමටම බියක් ඇති නොවූ නමුත් කිසියම් චකිතයක් හා ගැස්මක් ගුණසෝමගේ සිතට ඇතුළු විය. එහෙත් සීටිං ගොයියාගේ අතේ තිබුණේ දෙහි කටු තුන හතරකි. මෙතෙක් සිතේ තිබූ බිය පහව ගොස් කුතුහලයකින් සිත පිරෙන්නට වූ හෙයින් ගුණසෝම සීටිං ගොයියා දෙසම බලා සිටින්නට විය.

කුකුළාගේ දෙපාවලින් ඔසවා තමන් අසලින් තබාගත් සීටිං ගොයියා කොස්කොළ ගොටු හත අවද ළං කරගත්තේය. කුකුළා ඔසවන විට හැඬලූ හඬට කුස්සිය පැත්තේ සිටි ගැහැණු දෙදෙනෙක්ද සාලය දෙසින් පැමිණ ඉස්තෝප්පුවට මුහුණ එබූහ.

දෙහි කටුවක් ගත් සීටිං ගොයියා කුකුළාගේ කරමලය සිදුරු කළේය. ඒ මොහොතේ නම් කුකුළා තටු ගසමින් දඟලවේය. එහෙත් උගේ දෙපාවලින් තදින් අල්ලාගත් සීටිං ගොයියා කරමලයෙන් මතුවෙන ලේ බිංදු කොස්කොළ ගොටුවල තැවරුවේය. මෙතෙක් ගුණසෝමගේ සිත කලබලයට මෙන්ම බියට පත්කළ කාරණය අවසන් වූයේ එසේය.

"කරමලේ තුවාලෙට දුම්මල ටිකක් තවරල මය සතාව පැත්තකින් තියාපං... හාල් මිටක් දෙකක් දීපල්ල උගට කන්ඩ.. උත් ඉඹිං අපි වගේම නිදිමරන්ඩ එපායැ..."

වෙදමහත්තයා කීවේ සිනාසෙමිනි. සීටිං ගොයියාද තරමක උස් හඬකින් සිනාසුනේ වෙදමහත්තයාගේ සිත සතුටු කිරීමටත් එක්කය.

"මං හතුවෙ කුකුළගෙ බෙල්ල කඩල ලේ බොනව කියල"



ඉඩක් ලද මොහොතක ගුණසෝම, විලිසොංගේ ලොකු කොලුවාට කීවේ කාටවත් නොසෙන පරිද්දෙනි.

"කවුද? වෙදමහත්තයද?"

"නෑ යකෝ.."

"තාත්තගෙ හුස්මක් වැටෙන පැත්තක පලාතකටවත් යක්කු එන්නෙ නෑ... කුකුල් බිල්ලක් තියා කුකුල් කුඩුවක් දෙනව කිව්වත් තාත්තා අවසර දුන්නොත් විතරයි එන්නෙ..."

තාත්තා මහා වීරයෙකැයි ගුණසෝමට සිතුණේ විලිසොංගේ ලොකු කොලුවාගේ කතාවලින් පසුවය.

පිදේනි තට්ටුව මත මල් පස් වර්ගය ද පුළුටු පස් වර්ගය ද කැවිලි පස් වර්ගය ද තැබූ වෙදමහත්තයා විලක්කු හතර පත්තු කොට පිදේනි තට්ටුවේ හතර කොණ ගැසුවේය. ගිනි කබලට කට්ටකුමංජල් ටිකක් දමා පිදේනි තට්ටුවට දුම් ගස්වා ඉන්පසු දුහාදින් අත් පිස දමාගෙන පිදේනි තට්ටුවේ දවටා තිබූ කහ තැවිරූ නූල අත් දෙකෙහි ඇඟිලි තුඩුවලින් අල්ලාගෙන මතුරන්නට පටන් ගත්තේය. ඒ වන විට දෙගොඩහරි ජාමයද උදා වී තිබිණි.

වෙදමහත්තයා මතුරන්නට ගත්විට මෙතෙක් ගේ පුරා ඇසුණු කෑකොස්සත් ගැහිල්ල එක්වරම නැවතිණි. මැතිරිල්ලේ මුනු... මුනු... හඬ මිසක අන් කිසිදු සද්දයක් ඇසුණේ නැත. කුස්සියේ සිටි ගැහැනියක් පවා තවකෙකුට යමක් කීවේ නම් ඒ කණට කොට රහසිනි.

තාත්තාගේ මැතිරිල්ලේ ඉවරයක් නැතැයි ටික වේලාවක් යනවිට ගුණසෝමට සිතෙන්නට පටන්ගත්තේය මැතිරිල්ල ඉක්මනින් අවසන් වෙනවා නම් කොයිතරම් දෙයක්දැයි ඔහුට සිතෙන්නට වූයේ නිදිමත දරාගත නොහැකිව නිදිකිරා වැටෙන්නට වූ හෙයිනි. මැතිරිල්ල එක තත්පරයකට නතර කළ වෙදමහත්තයා නිදා නොගන්නා ලෙස ගුණසෝමට රහසින් කීවේය.

"පුතාව ඇඳක නිදිකරවන්ඩ ද වෙදමහත්තය?"

විලිසොං පැමිණ වෙදමහත්තයාගේ කණට කොට ඇසීය.

"බෑ... එපා"

ගුණසෝම එසේ කියමින් වෙදමහත්තයාගේ ඇඟට හේත්තු විය. ඔහුට සිත් සේ හේත්තු වෙන්නට ඉඩ සැලසූ වෙදමහත්තයා

WWW.SINHALAELIBRARY.COM 12
Uploaded By Paba

නැවතත් මැතිරිල්ල පටන් ගත්තේය. ඒක වේලාවකින් ගුණසෝම නැවතත් මැතිරිල්ල පටන් ගත්තේය. වෙදමහත්තයා මතුරන ගමන් ඔහුගේ හඬින්නට පටන්ගත්තේය. වෙදමහත්තයා මතුරන ගමන් ඔහුගේ හිස අත ගෑවේය. එහෙත් මැතිරිල්ල යටපත් කරමින් ගුණසෝමගේ හැඬිල්ල ඇසෙන්නට විය. එතැන සිටි කාගේත් අවධානය ගුණසෝම වෙත යොමු විය. විලිසොංට ළඟට එන ලෙස වෙදමහත්තයා හිසෙන් සංඥා කළේය.

"දන් ඉතිං ඇසිලින් නෝනට මිසක කාටවත් නලවගන්ඩ බෑ..."

"මං ලොකු කොලුවට කියන්නං බයිසිකලෙන් ගිහින් ඇරලවන්ඩ කියල"

වෙදමහත්තයා හිස වනා ඒ අදහස අනුමත කළේය. විලිසොංගේ ලොකු කොලුවා බයිසිකලේ පොල්ලේ හිඳුවාගෙන ගුණසෝමව ගෙදර ඇරලුවේය. 'ආරක්ෂා නූල' මතුරා අවසන් කළ වෙදමහත්තයා විලිසොංගේ ලොකු කෙලිව කැඳවා පැදුර මත වාඩි කරවාගෙන ඇගේ ගෙල වටා නූල බඳිමින් තරමක් උස් ස්වරයෙන් මතුරන්නට පටන්ගත්තේය. ගෙදරට පැමිණ සිටි සියල්ලෝම වාගේ එතනට එක්රොක්ව නූල බඳින ආකාරය බලා සිටින්නට වූහ. වෙදමහත්තයා නොපෙරෙන බසින් මතුරා අන්තිමට "සබ්බීතියෝ විවජ්ජන්තු" ගාථාව කියා අවසන් කොට පිදේනි තටුව මත ඒ වන විටත් දල්වෙමින් තිබූ පහනින් ඇඟිලි තුඩුවලට තෙල් ටිකක් ගෙන ලොකු කෙලීගේ හිසෙහි ගෑවේය.

ඉක්බිති ඇඟිලි තුඩුවල ඉතිරි වූ තෙල්වල තෙතමනය තමන්ගේ හිස කෙස් අතරින් ඇඟිලි යවමින් පිස ගත්තේය.

"දන් ඉතිං මළ පෙරේතයෙක් නියා මහසෝනවත් මේ කෙල්ලට බැල්ම හෙලන්නෙ නෑ... හැබැයි ඉතිං හත් දොහක් යනකල් කළුවර වැටෙන්ඩ ඉස්සෙල්ල පානක් පත්තු කරපල්ල..."

එසේ උපදෙස් දෙමින් වෙදමහත්තයා නැගී සිටින විට විලිසොං පමණක් නොව පීරිං ගොයියාද සුසුමක් හෙළුවේය.

"ඕක්කෝටම ඉස්සෙල්ල විලිසොං ඔය ළිඳ ළඟ තියෙන අකුල්.. ගාල්.. කපල දාල සුද්ද පවිත්තර කරපල්ල... ඔය වේවැල් ගාල එතනින් අයින් කරපල්ල... වතුර ළඟ තියෙන අකුල් ගාල්වලට යක්කු පෙරේතයො බොහොම කැමතියි..."

විලිසොංටත් වඩා ඒ උපදෙස් සිතට ගත්තේ විලිසොංගේ පවුලය.



"කී දොහක් මං කිව්වද ඕක..."

ඈ නෝක්කාඩුවක් ද කීවාය.

"මම නං නාන්නෙ කළුවරේමයි"

සර්ණෙලිස් කටහඬත් සමඟ ඉස්තෝප්පුවේ එතෙක් පැවැති බැරෑරුම් වාතාවරණය ඉක්වරම බිඳී ගියේය.

"කසිප්පු ටිකක් කටේ ගා ගත්තම උඹ ළඟට මළ යකෙක් නියා පෙරේතයෙක්වත් ළං වෙන එකක් නෑ"

එච්චිස් සිංඤෝගේ කතාවට එතැන සිටි සැමදෙනාම පාහේ සිනාසුණහ.

"වෙදමහත්තය එහෙම නං කෑම ටිකක් කමු"

විලිසොංගේ පවුල කීවාය.

"දන් කන්ඩ බෑ... මට තේ එකක් දීපල්ල"

වෙදමහත්තයා එසේ කියද්දී විලිසොං සහ පීරිං ගොයියා ඉස්තෝප්පුවේ කොණකට වී "මුනු මුනු" ගාන්නට පටන් ගත්හ. මේ මුනු මුනුව කිසිවෙකුටවත් නොඇසුණ නමුත් විලිසොංගේ පවුලට ඔවුන්ගේ ඉරියව් තේරුම් ගැනීමට අපහසු වූයේ නැත. හිසෙන් සංඥාකොට විලිසොංව සාලයට කැඳවූ පවුල "ඔය දහ ජරාව වෙදමහත්තයට එහෙම දෙනව නෙමෙයි" යි කීවාය.

"උඹ කැනෝගහ හිටපං... වෙදමහත්තයගෙ කැමැත්ත අකමැත්ත දන්නෙ අපිනෙ..."

"මෙච්චර අගේට වැඩක් කරල අන්තිමේදී..." විලිසොංගේ පවුල මොනවාදෝ තමාටම කියා ගනිමින් ගෙතුළට ගියාය. ඒ නෝක්කාඩුව විලිසොංට ඇසුණ නමුත් ඔහු සිටියේ නොඇසුනාක් මෙනි.

"වෙදමහත්තය පොඩි පඬුරක් තියෙනව"

ගෙතුළ සිට යළිත් ඉස්තෝප්පුවට පැමිණි විලිසොංගෙ පවුල බුලත් කොළයක ඔතා තිබුණු රුපියල් දහයක් වෙදමහත්තයාට දිගු කළාය. ඔහු එය දිග හැර බලා "ගුරු පඬුරක් හැටියට කීයක් හරි දීපල්ල... මෙච්චර මුදලක් ඕනෑ නෑ.... මේක ඉතිං කොඩිවින කැපිල්ලක් වගේ ලොකු වැඩකුත් නෙමෙයිනෙ..." යි කියමින් බුලත් කොළය පිටින්ම විලිසොංගේ පවුලට ආපසු දුන්නේය.

WWW.SINHALAELIBRARY.COM 13
Uploaded By Paba

"මේ වගෙ වැඩවලින් මගෙ හිතෙත් මොකක් හරි සන්තෝෂයක් ඉතුරු වෙන්ට ඕනැ... ඔහොම සල්ලි ගන්නකම ඒක නැතිවෙලා යනව... හිතේ සන්තෝසේ ගැන මිසක සල්ලි ගැන හිතල මේව කරන්ට ගියොත් මේ වැඩවල තියෙන බලේ නැතුව යනව..."

තමා එම මුදල ප්‍රතික්ෂේප කළ කාරණාව වෙදමහත්තයා අවට සිටියවුනට තේරුම් කර දුන්නේ එසේය. කෙසේ වුවද වෙදමහත්තයා එදින ගෙදර ගියේ හතර ගාතයෙනි. විලිසොංලාගේ ගෙදරින් පිටවෙන විට ඉදිරියට පැමිණි සීටිං "මං වෙදමහත්තයව ටිකක් දුර ඇරලවන්නං" යි කියමින් ටෝච් එකත් දල්වාගෙන මිදුලට බැස්සේය. ඔවුන් දෙදෙනාම ඉන්පසු ගියේ ගුණපාල මලයාගේ දර මැස්ස පැත්තටය.

හැළි අරක්කු බීමෙන් පසු සියල්ල අමතක වූ සීටිං ටෝච් එකත් දල්වාගෙන ඔහුගේ ගෙවල් පැත්තට ගියේය. වෙදමහත්තයා කැලි කැපෙන කළුවර මැද්දේම දෙවට දෙසට පා එසවීය. රුවිනංලාගේ ගෙදරට හැරෙන හන්දියේදී ඔහු පය පැකිලී විසි වී ගොස් බිම වැටුණේය. ලොකු මඩ තලියක් ද සරමේ පසුපස පැත්තේ තැවරිණි.

x x x x

UNLIMITED

# 4

තුංමං හන්දියේ තබා තිබෙන පිදේනි තට්ටුවක් දුටුවිට කුඩා කාලයේදී නම් ජිනසෝමගේ සිතෙහි පමණක් නොව කුසුමලතාගේ සිතෙහි ද ඇති වූයේ සියුම් ආඩම්බරයකි. නමුත් කල්යාමේ ඒ හැඟීම නැතිවී කිසියම් ලජ්ජා සහගත හැඟීමක් ඇති වෙන්නට පටන් ගත්තේය. ඉස්කෝලෙ ළමයින්ගේ සමහර වචන නිසා එක්තරා කේන්තියකින්ද සිත පිරියන්නට විය.

"කුසුමලතාගේ තාත්තා ඊයේ රෑත් යකෙක් බැඳල..."

ඉස්කෝලේ එනවිට තමන් දුටු පිදේනි තට්ටුවක් ගැන ඔලොක්කු කතා හදමින් පද්මාවතී එසේ කීවේ උදේ සීනුව නාදවෙන්නට පෙර පිට්ටනියේ කෙළවර සිසුන් එක්රොක් වෙන අඹගහ යටදීය. කුසුමලතාට එය පැහැදිලිව ඇසුණු නමුත් නෑසුණාක් මෙන් එතැනින් ඉවත්ව ගියාය. එහෙත් ඉස්කෝලය ඇරී ආපසු එන විට තුංමං හන්දියේ තබා තිබෙන පිදේනි තට්ටුව ගැන විශේෂයෙන් බලන්නට ඇට සිතිණි.

කාක්කෙක් ඒ වන විටත් පිදේනි තට්ටුව උඩ වසා එහි තිබෙන දේවල් ඉවතට ඇද දමමින් සිටියේය. ගොක්කොළ පරවී ගැලවී එල්ලෙමින් තිබිණි. මුළු පිදේනි තට්ටුවම ඇදවී තැනින් තැන ගැලවී විකාරයක් බවට පත්ව තිබුණේය.

එහෙත් පසුගිය සතියේ මහනුවරට ගිය අධ්‍යාපන ගමන සඳහා රුපියල් පනහළාවක් දුන්නේ තාත්තාය. මේ දවස්වල ගොයම් කැපිල්ලක්වත් නැති බැවින් තාත්තා ඒ මුදල උපයන්නට ඇත්තේ

WWW.SINHALAELIBRARY.COM 14
Uploaded By Paba

මෙවැනි ඉරුකම්වලින් විය යුතුය. වෙදමහත්තයා පිළිබඳව මෙවන් සිතුවිලි ගලා එන්ම කුසුමලතාගේ සිත ඔහු ගැන උපන් අනුකම්පාවකින් පිරෙන්නට විය. පද්මලතාලා කියන කතා අම්මාට කිව යුතු යැයි කුසුමලතා තීන්දු කළේ තාත්තා පිළිබඳව උපන් මේ අනුකම්පාවත් සමගමය.

''මංකඩ කඩේ ගෙදර පද්මලතා එක එක දේවල් කියනවා...''

ඒ වන විට ඇසිලින් නෝනා සිටියේ කුසුමලතාගේ හිසේ උකුණන් බලමිනි. ජිනසෝම හෝ ගුණසෝම පෙනෙන්නට සිටියේ නැත. ඇතැම් විට ඔවුන් ටයර් රෝද කරකවන්නට ගුරු පාර පැත්තට යන්නට ඇත.

''මොනවද ඊකුන්ට කියන්ඩ තියෙන්නෙ?''

''කුසුමගෙ තාත්ත තවත් යකෙක් බැඳල කිය කියා හිනාවෙනව''

කුසුමලතාගේ මුවින් පිටවූ වචන එක්වරම ඇසිලින් නෝනාගේ සිතෙහි ගැස්මක් ඇති කළ නමුදු ඒ බවක් නොහඟවා දිගටම උකුණන් බලන්නට වූවාය. වෙදමහත්තයා මෙවැනි අළුගුත්තේරු කතා අසමින් මේ දේවල් කරන්නේ දරු පවුල ගෙනියන්නට නොවේදැයි ඇට සිතිනි. වෙදමහත්තයා පිළිබඳව උපන් අනුකම්පාව කෙමෙන් කෙමෙන් කෝපයක් බවට පත්වන්නට පටන් ගත්තේය. සිතෙහි උපන් කෝපය තවදුරටත් නිහඬව දරා සිටින්නට ඇසිලින් නෝනාට නොහැකි විය.

''ඔය පඩත්තල කෙල්ලන්ගෙ කටවල් වහන්ඩ අපිට පුළුවනැයි... අම්මගේ වගේ නැතැයි දූගෙ කටත්''

ඇසිලින් නෝනා කෝපයෙන් පුපුරු ගසන්නට වූවාය.

''ඊකුන්ටත් මොකක් හරි වුණාම තමයි වෙදමහත්තය... වෙදමහත්තය... කියාගෙන එන්නෙ... ඔය මහ ගෑනිට හිනෙන් යක්කු ජේන්ඩ පටන් අරගෙන උඹලගෙ තාත්තා නූලක් දම්මට පස්සෙ තමයි නතර වුණේ... ඊට පස්සෙ මහ එකා මේ මනුස්සයට බොන්ට දීල නතරගානෙන් තමයි ගෙදර එව්වෙ... උඹලගෙ තාත්තටත් ලැජ්ජ නෑ... යක්කු නෙමෙයි මහසෝන හිනෙන් පෙණුනත් නොයා ඉන්නෙ නැතුව... කිසිම ගුණයක් නැති එවුන්...''

''සමහර වෙලාවට පද්මා එච්චර දෙයක් හිතන්නෙ නැතුව කියන්ඩ ඇති...''



කුසුමලතා එසේ කීවේ ඇසිලින් නෝනාගේ සිතේ ඇති කේන්තියට තවත් පිදුරු නොදැමිය යුතු යැයි සිතිනු නිසාය.

මේ කතාබහ... අවකැපනෙ විගිළ... සියල්ල හදිසියේම නැතිවී ගියේය. ඒ ජිනසෝම පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ බවට ඉස්කෝලෙ මහත්මයාට ලැබුණු ලියුමත් සමගය. එදා හැන්දෑ වෙන විට ගමේ සෑම තැනකම වාගේ මේ ආරංචිය පැතිර ගියේය. ඇසිලින් නෝනා කීවේ ශිෂ්‍යත්ව විභාගයට පෙර දවසේ පහළගම දේවාලයට ගොස් කපු මහත්තයා ලවා දෙවියන්ට කළ කන්නලව්වත් ජිනසෝමගේ සමත් වීමට හේතු වෙන්නට ඇත කියාය.

''ඕක කොල්ලගෙ වාසනාව බං...''

වෙදමහත්තයා ක්ෂණිකව පිළිතුරු දුන් නමුත් ''හැබැයි ඉතිං පහළගම දේවාලෙත් බොහොම අනුහස් තියෙන තැනක් තමයි'' යනුවෙන් පසුව පැවසීය. එහෙත් ගමේ ඇතැම් දෙනා පැවසුවේ වෙදමහත්තයා හොඳ ගුරුකමක් කරන්නට ඇත කියාය.

''වෙදමහත්තය හොඳ සෙත් කවියක් කියන්ඩ ඇති... මොකක් හරි ගුරුකමකුත් කරන්ඩ ඇති... නැතුව අහල ගං හතක එකෙක් සිස්සත්තෙං පාස් වුණා කියල අහල තියෙනවද...''

මාටින් මුදලාලිගේ කඩයේදී පවා මේ ගැන කතා වී ඇති බව වෙදමහත්තයාට කීවේ සිරිසේන ඉලන්දාරියාය.

''ඒව මොනාද බං...''

සිරිසේන ඉලන්දාරියාට එසේ කීවා මිසක වෙදමහත්තයා වැඩි විස්තර කියන්නට ගියේ නැත.

කුසුමලතා ඉස්කෝලයේදී පද්මලතාගෙ මුහුණ දෙස කිහිප වරක්ම ඕනෑවටත් වඩා කෙලින් බැලූ නමුත් පද්මලතා ඒ සෑම අවස්ථාවකදීම බිම බලාගත්තාය.

''තාත්ත ගුරුකමක් කරන්ඩ ඇතිනේ...''

කුසුමලතා බලාගෙන සිටියේ පද්මලතාගේ මුවින් එවැන්නක් පිටවෙන තෙක්ය.

''ඔව්... අපේ තාත්තට පුළුවන් තමයි''

WWW.SINHALAELIBRARY.COM 15
Uploaded By Paba

පද්මලතාට දිය යුත පිළිතුර තොල් අග රඳවාගෙන සිටි නමුත් කුසුමලතාට එය මුදාහරින්නට ඉඩක් ලැබුණේ නැත. ඒ පද්මලතා සිසුවක්ම නොකී නිසාය.

"ජිනසෝම ළමයා අපේ ඉස්කෝලෙට ලොකු ගෞරවයක්..."

ලොකු මහත්මයා ඊට පසුදින උදේ රැස්වීමක් කැඳවා පාසලේ සියලුම ළමයින්ට ඇසෙන්නට කීවේය. උදේ රැස්වීම අවසන් වූයේ පමණි. එදිරිසිංහ නෝනාමහත්මයා පැමිණ ජිනසෝමගේ හිස අතගෑවාය.

"බොහොම හොඳයි දරුවා"

ඉන් නොනැවතුණු එදිරිසිංහ නෝනාමහත්මයා ජිනසෝමගේ අතින් අල්ලාගෙන ගුරුකාමරය වෙත කැඳවාගෙන ගියාය.

"මෙන්න අපේ පුතෙක්... අවුරුදු තිස් දෙකක් ගුරු රස්සාව කෙරුව... අද තමයි හැබෑවටම සතුටක් ඇති වුණේ..."

එදිරිසිංහ නෝනාමහත්මයා ගුරු කාමරයේ සිටින අනෙක් අයට ද ඇසෙන ලෙස කීවාය.

"බොහොම ලොකු දෙයක්..."

විජේපාල මහත්මයා කීවේය.

"ඉස්කෝලෙටත් ලොකු නම්බුවක්... ලොකු මහත්තයට හරිම සතුටුයි"

එසේ කීවේ ප්‍රේමවතී නෝනාමහත්මයාය. උසස් පන්තිවලට ඉංග්‍රීසි උගන්වන මැටිල්ඩා වීරර් තම අත් බෑගය ඇර ජෑම් තවරනු ලැබූ පාන් පෙති දෙකක් ගෙන එකක් ජිනසෝමට දිගු කළාය. ඔහු ලජ්ජාවෙන් ඇඹරෙන්නට විය.

"ගනිං පුතේ"

එදිරිසිංහ නෝනාමහත්මයා කීවේ ඔහුගේ හිස පිරිමදිමිනි.

පන්තියේ යහළුවන් හත් අට දෙනෙක් ජනේලයෙන් පිටත සිට ගුරු කාමරයට එබී බැලූහ. ජිනසෝමගේ මුහුණ රතු වී ගියේය. එදිරිසිංහ නෝනාමහත්මයා ඒ බැව් දුටුවාය.

"ජිනසෝමගේ යාළුවෝ බලාගෙන ඉන්නව වගේ... ඒ අයටත් සන්තෝස ඇති... එහෙනං පලයං පුතේ... අම්මා තාත්තත් එයාට මහට අතිද්ද වරෙං..."



එදිරිසිංහ නෝනාමහත්මයාගේ වචන ටික අවසාන වෙත්ම ගුරු කාමරයේ සිටි අනෙකුත් මහත්තුරු නෝනාමහත්තුරු දෙස බැලූ ජිනසෝම ගුරු කාමරයෙන් පිට විය.

දවස් තුන හතරකට පසු ඇසිලින් නෝනා, ජිනසෝමත් සමඟ එදිරිසිංහ නෝනාමහත්මයා හමුවන්නට බණ්ඩාරවත්තට ගියාය. ඇගේ ගෙදර පිහිටා තිබුණේ බණ්ඩාරවත්ත හන්දියේ සිට හැතැප්ම භාගයක් පමණ ඔබ්බෙන් වූ කොස්පිල්ලෑවට යන ගුරු පාරට මායිම්වය.

"දූත් ඉතින් සැන්ට්‍රල් කොලීජියකට යවන්ඩ වෙනවනෙ.. මෙහෙදි වගේම ඉගෙනීමට තමයි හිත යොදවන්ඩ ඔනෑ... නෑ... ඉතිං ජිනසෝම කොහොමටත් වැඩි කලබලයක් ඇති ළමයෙක් නෙමෙයිනෙ..."

එදිරිසිංහ නෝනාමහත්මයා අවවාද පෙළක තවත් අවවාදයක් අවසන් කළේ ඒ විදියටය. ඇසිලින් නෝනා ඈ දෙස බලාගෙන හිස වනමින් ඒ සියල්ල අනුමත කළ අතර ජිනසෝම බිම බලාගෙනම සිටියේය.

"ළමයෙකුට උගන්වනව කියන එක බොහොම වැදගත් දෙයක්.. ඉගෙන ගත්තු දරුවෙක් ඉන්න එක පවුලටම ශක්තියක්... උසස් තානාන්තරයකට ගියොත් මුළු ගමටම එළියක්..."

"එහෙමයි නෝන මහත්තය... තියෙන දෙයක් විකුණල හරි ජිනසෝමට උගන්නන්ඩ තමයි හිතාගෙන ඉන්නෙ..."

"ජිනසෝමට වියදම් කරන සල්ලි අහක යයි කියල මම හිතන්නෙ නෑ..."

"එහෙමයි නෝන මහත්තය"

"මොනව හරි ඕනෑකමක් වුණොත් මටත් කියන්ඩකො"

"එහෙමයි නෝන මහත්තය"

එදිරිසිංහ නෝන මහත්තයා නැගිට ගෙතුළට ගියාය. ඈ ආපසු ඉස්තෝප්පුවට පැමිණියේ රුපියල් දහයේ මුදල් නෝට්ටු පහක්ද අත මිට මොලවාගෙනය.

"ජිනසෝම මේක තියාගන්ඩ... වුවමනා කරන අඩුපාඩුවක් ගන්ඩ සල්ලිත්තෙ..."

WWW.SINHALAELIBRARY.COM 16

Uploaded By Paba

තරමක් ලජ්ජාවට පත්ව ඇඹරෙන්නට වූ ජිනසෝම පසුව එදිරිසිංහ හෝනාමහත්තයාට දණ ගසා වැඳ නැගී සිට මුදල් නෝට්ටු ටික ඇතිත්ම ගත්තේය. වත්ත පහළ වැඩක් කරමින් සිටි එදිරිසිංහ මහත්මයා කරවටා දමාගෙන සිටි තුවායෙන් මුහුණේ දහඩිය පිසමින් ඉස්තෝප්පුවට ගොඩවූයේ ඒ මොහොතේදීය.

"කෙහෙල්ගස් දෙකක් කඩා වැටිල... මං තාවකාලිකව ලී දෙකක් හේත්තු කළා.. සියලු ආපුවාම දෙබල් තියන්ඩ වෙනව ගස් දහයකට පහළොවකට විතර"

එදිරිසිංහ මහත්මයා ඇසිලින් හෝනාලා දෙස බැලුවේ ඒ ටික කියා අවසන්වීමෙන් පසුවය. ඉන්පසු ඔහු ප්‍රශ්නාර්ථයක් මුහුණට නංවාගනිමින් හෝනාමහත්මයා දෙස බැලුවේය.

"මේ අර මං කිව්ව ශිෂ්‍යත්වෙන් පාස් වෙච්ච ළමය..."

"බොහොම හොඳ දෙයක්... ශිෂ්‍යත්වෙන් පාස්වෙනවයි කියන එක බොහොම වටිනා දෙයක්... ඉතිං හිටගෙන ඉන්නෙ... වාඩිවෙන්ඩ..."

එදිරිසිංහ මහත්මයා දෙස ගෞරවාන්විත බැල්මක් හෙලූ මුත් ඇසිලින් හෝනා හෝ ජිනසෝම ඉඳගත්තේ නැත.

"මේ දෙන්න ඇවිත් දන් හුගක් වෙලා... යන්ඩ කියල එළිබහින්ඩ හදනකොට තමයි මහත්තය ආවෙ"

"ටවුමට ගිහින් අඩුපාඩු ටිකක් ගන්ඩත් එක්ක තමයි ආවෙ"

"ඒක හොඳයි... ඔහොම පොඩ්ඩක් ඉන්ඩකෝ"

එදිරිසිංහ මහත්මයා එසේ කියා ගෙතුළට ගියේය. ඇසිලින් හෝනා එදිරිසිංහ හෝනාමහත්මයා දෙස බැලුවාය. ජිනසෝම කකුළේ මාපටැඟිල්ලෙන් සිමෙන්ති පොළොව හාරන්නට උත්සාහ ගත්තේය.

එදිරිසිංහ මහත්මයා ආපසු පැමිණියේ මලලසේකර ශබ්ද කෝෂයක් ද රැගෙනය.

"ඉංගිරිස් ටිකත් ඉගෙන ගත්තොත් ඔය ළමයට බොහොම ප්‍රයෝජනවත් වේවි. මේක මම ඉස්කෝලෙ යන කාලෙ පාවිච්චි කරපු පොතක්..."

එදිරිසිංහ මහත්මයා ශබ්දකෝෂය ජිනසෝම වෙතට දිගු කරමින් කීවේය. දණගසා ආචාර කොට ඔහු පොත පිළිගත්තේය.



එදිරිසිංහ හෝනා මහත්තේලාගේ වත්තේ ගේට්ටුවෙන් පිටවෙන විට ඇසිලින් හෝනාගේ සිත උතුරා යන සතුටකින් පිරී තිබිණි. ඈ ජිනසෝමගේ හිස පිරිමැද්දේ සිතාමතා නොවේ. එය නොසිතාම සිදුවූවකි.

එදිරිසිංහ මහත්මයා මුල් ගුරුවරයෙකුව සිට විශ්‍රාම ලැබුවෙකි. දන් ඔහු දවසින් වැඩි කාලයක් ගත කරන්නේ වත්තේ මොන මොනවා හෝ වැඩක් කරමිනි. දරුවන් නොමැතිකම නිසා ජීවිතයේ ඇති වී ඇති පාළුව ඔවුන් නැති කරගත්තේ වත්ත පිටිය ගහට කොළට සාත්තු කිරීමෙන් සහ ඔරුනොට පන්සලට උදව් පදව් කිරීමෙනි.

"ලස්සන වත්ත..."

වැලි පාරට පය ගසා ආපසු වත්ත දෙස බැලූ ඇසිලින් හෝනාට ඉබේම වාගේ කියැවුණේය. අක්කර දහයක දොළහක පොල්වත්ත ඉතා පිළිවෙළට සකස් කොට තිබිණි. තැනින් තැන වූ මැංගුස් ගස් ද ඇඹරැල්ලා ගස් දෙක තුන ද පොල්ගස් අතරින් ඈතට ද පෙනිණි. වත්තේ තැනින් තැන කිරිහරක් තුන් හතර දෙනෙක්ම බැඳ සිටිනු ජිනසෝම ද දුටුවේය.

"එදිරිසිංහ හෝනා මහත්තය උඹට හරි ලෙංගතුයි වාගෙ" ඇසිලින් හෝනා එලෙස පිට කෙළේ බොහෝ වේලාවක් තිස්සේ සිතේ තෙරපෙමින් තිබුණු හැඟීමකි. එහෙත් ජිනසෝම සිත සතුටකින් මෙන්ම සාංකාවක් වැනි හැඟීමකින්ද පිරෙමින් තිබිණි. ඒ නිසාම එදිරිසිංහ හෝනාමහත්මියගේ කරුණාවන්ත මුහුණ හරහා පමණක් නොව වත්තේ පොල් රුප්පාව හරහා ද ඔහුගේ සිතට ඇතුළු වූයේ එක්තරා විදියක දුකකි. ඔහු ගුරුපාරේ බොහෝ දුරක් යනතෙක් වචනයක් හෝ කතා නොකළේ එහෙයිනි.

× × × ×

තමන්ට හුරුපුරුදු පරිසරය අතහැර සෙන්ට්‍රල් කොලීජියට යායුතු දිනය ළංවෙත්ම සිතේ ඒ වන විටත් තිබූ සාංකාව තව තවත් වැඩිවීම නිසා ජිනසෝම තරමක හෝන්දු මාන්දු ගතියකින් පෙළෙන්නට විය. අන් කවරකුටවත් වඩා ඇසිලින් හෝනා මේ වෙනස දුටුවාය. ඒ අතර ඈට ඇසෙන්නට වූ ආරංචි ඔස්සේ ජිනසෝම පිළබඳව කිසියම් බියක් ඇගේ සිත තුළට කාන්දු වෙන්නට විය.



Uploaded By Paba

''මල්ලි ගැන ඉස්කෝලෙ හැමෝම කතාවෙනව... රත්නාවලි ටීචර් කිව්ව මුළු ඉස්කෝලෙටම ගෞරවයක් කියල...''

කුසුමලතා, ඇසිලින් නෝනා සමග කීවේ දිනක් පාසල් ඇරී අවුත් දවාලට කෑම කන අතරතුරේදීය. ඇසිලින් නෝනාගේ සිත එක්වරම ආඩම්බර හැඟීමකින් පිබිදී ගිය නමුත් තවත් මොහොතකට පසු වෙනත් ආකාරයේ සිතුවිලි ඇගේ සිතට ඇතුළු වන්නට පටන් ගත්තේය. රාත්‍රිය වනවිට ජිනසෝම පිළිබඳව ඇතිවූ බියකින් ඇය පෙළෙන්නට වූවාය.

''කොලුවට දෙහිගෙඩි ටිකක් කැපුවොත් නරකද...? නිකං හෝන්දු මාන්දු වෙලා වාගෙ ඉන්නෙ... වැඩි කතාවකුත් නෑ... කල්පනා කරනවත් වැඩියි වාගෙ... කට වහ වදිනවත් ඇති''

එදා රාත්‍රියේ ඇසිලින් නෝනා, වෙදමහත්තයාට කීවාය.

''මමත් ඔක ගැන හිතුව...''

''මං කෝකටත් හෙට අනිද්දම පහළගම දේවාලෙට ගිහිල්ල බාරෙ ඔප්පු කරන්ඩයි හිතාගෙන ඉන්නෙ... වැඩිය කල් අරින එක හොඳ නැහැ වගේ...''

''ඕව වෙලාවට කරන්ඩ ඕනෑ දේවල් තමයි... ඔය දෙයියො එක්ක ගනුදෙනු කරනකොට ටිකක් පරිස්සමට කරන්ඩ ඕනෑ... හොඳ වගේම තමයි නරකත්...''

වෙදමහත්තයා ඒ වචන ටික පිට කෙළේ ඇසිලින් නෝනාගේ අදහස්වලට පිළිතුරු වශයෙන්ම නොවේ. ඒ වන විට ඔහුගේ සිතට ද යම් යම් දේවල් ඇතුළු වෙමින් තිබිණි. වෙනදා නිතර නිතර ගෙදරට නොඑන උදවිය පවා ජිනසෝමගේ සාමාර්ථය ගැන සතුට පළ කරන්නට පැමිණීම ඇසිලින් නෝනාගේ සිතෙහි ඇති කළේ සතුටක් නොව සැක මුසු බියකි.

''අපේ ගමට මොන ගවුරවයක් ද ඇසිලින් අක්කෙ. ළමයෙක් සිස්සත්තෙං පාස් වෙනවයි කියන එක එසේ මෙසේ වැඩක්යැ... අපෙ ගං හතකවත් එකෙක් සිස්සත්තෙං පාස් වුණා කියල අපි නම් අහල නෑ... හතරවරං දෙයියන්ගෙ ආරක්ෂාවරණය ලැබෙන්ඩ ඕනෑ කොලුවට''

දිනක් හැන්දෑවක පේමාවතී පැමිණ එසේ කියූ මොහොතේ සිට ඇසිලින් නෝනාගේ සිතේ ඒ වනවිටත් තිබූ නොසන්සුන්තාවය



දරාගත නොහැකි තරමට වැඩි වූයේය. පේමාවතීගේ කටවහ ගැන මුළු ගමම දනී. සෝමාවතීලාගේ කුස්සිය පැත්තේ තිබූ සරුසාර දෙහි ගසේ ගෙඩි පැලී පැලී වැටෙන්නට පටන්ගත්තේ පේමාවතීගේ කටවහ නිසාය යන්න ගමේ කාටවත් රහසක් හෝ පුදුමයක් නොවිය.

සෝමාවතී හදිසියේම වෙදමහත්තයා මුණගැහෙන්නට පැමිණියේ දෙහි ගසට වී ඇති විපත්තියට පිළිසරණක් ලබා ගන්නටය.

''දෙහි ගහට ඉහින්ඩ වතුර ටිකක් මතුරව ගන්ඩයි වෙද මහත්තයො තකහනියක්ම ආවෙ''

''ඒ මොකද සෝමාවතියේ?''

''දෙහි ගහේ ගෙඩි පැලි පැලි වැටෙනව''

''ලෙඩක් වෙන්ඩ ඇති බං''

''නෑ... වෙදමහත්තයො... පහුගිය දොහක දෙහි ගෙඩියක් ඉල්ලගන්ඩ පේමාවතිය ඇවිල්ල දෙහි ගහ දිහා බලල ආයෙ මදි නොකියන්ඩ දෙහි හැදිල තියෙන්නෙ කියල කිව්ව''

''පේමාවතියටත් ගස් කොළං පෙන්නනව ද බං''

එදා තමා ද ඒ කතා බහට එක්වූ අයුරු ඇසිලින් නෝනාට සිහිපත් විය.

''පේමාවතිය ඇවිල්ල ගියා... ජිනසෝම ගැනත් කිව්ව. නරකද දෙහි ටිකක් කපන එක ඉක්මන් කළොත්. දන්නෙ නැද්ද ඒකිගෙ කට... කටවහ ගුහාව''

රාත්තිරියේ කෑම කා අවසන්වූ පසු කුස්සියේදීම ඇසිලින් නෝනා, වෙදමහත්තයාට කීවාය.

''ඒකිගෙ කට නම් වස නපුරුයි තමයි''

බොහොම ඉක්මනින් ජිනසෝමට දෙහි ටිකක් කැපිය යුතු යැයි වෙදමහත්තයාද සිතා ගත්තේය.

''ඔය කටවහ කතාවල් ඇත්තද අම්මෙ?''

පසුදින හවස් වරුවේ දෙහි කැපීම සඳහා ලක ලෑහැස්ති වෙනු දුටු කුසුමලතා ඇසුවාය.

''ඕව ගැන මං දන්නෙ නෑ... අහපං තාත්තගෙන්...''

WWW.SINHALAELIBRARY.COM 18

Uploaded By Paba

තාත්තාගේ හැටි දන්නා කුසුමලතා දෙහි කැපිල්ලට උදව් කළා

මිසක ඒ ගැන ඔහුගෙන් ප්‍රශ්න කරන්නට ගියේ නැත.

තමාට දෙහි කැපීම සඳහා ඇඟ සෝදා පිරිසිදුව සුදු සරමක් ඇඳ මල්බුලත් පුටුව අසලට වී පැයක හමාරක සිට දෙහි ගෙඩි මතුරන තාත්තා දුටු විට ජිනසෝමගේ සිත තුළ අලුත් සෙනෙහසක් ඉපදී තිබිණි. ඒත් ඒ සමගම කිසියම් අසීරුතාවක්ද සිතට ආගන්තුක වෙනු ඔහුට දැනිණි. මේ හැඟීම් අතර කොටුවුනු ජිනසෝම හවස් වරුවේම සිටියේ වැඩිපුර කතාබහක් නොමැතිව නිහඬතාවට නිමග්න වෙමිනි. එහෙත් ගුණසෝම හවස් වරුවම වාගේ සිටියේ වෙදමහත්තයාට උදව් පදව් කරමිනි. සැබැවින්ම ඔහු වෙදමහත්තයාගේ සහායකයෙකුගේ කාර්යය ඉටු කළේය.

"මට දෙහි කැපුවයි කියල ළමයි දැනගත්තොත් තමයි වැඩේ.."

ඉවත් ලැලුණු මොහොතක කුසුමලතාගේ කණට ළං වූ ජිනසෝම ඇට රහසින් මෙන් කීවේය.

"මොනව වුණත් තාත්ත ගැන දුකත් හිතෙනව..."

කුසුමලතා ඒ වචන දෙක තුන පිට කෙළේ සිත තුළ ඇති හැඟීම් පෙළක් සිත තුළ දරා ගනිමින් බව ජිනසෝමට තේරුම් නොගියා නොවේ. ඒ නිසාම ඔහු නැවත වතාවක් නිහඬතාව රැකගෙන පසෙකට වී සිටින්නට උත්සාහ කළේය.

දෙහි ගෙඩිවලට මැතිරීමේ කටයුත්ත අවසන් වීමට ආසන්න බව වෙදමහත්තයාගේ හඬේ ස්වරය වෙනස් වීමෙන්ම දැනගත් ඇසිලින් නෝනා, ජිනසෝමගේ ඇඟට කමිසයක් දැම්මාය. ගුණසෝම ඒ වන විටත් සිටියේ වෙදමහත්තයා ළඟින්ම ඉඳගෙන මෙතෙක් වෙලා මල්බුලත් පුටුවෙහි ඇති දෙහි ගෙඩි දෙස බලා ගෙනම සිටි වෙදමහත්තයා මැතිරිල්ල අවසාන කොට පසුපස බැලුවේය.

"ලොකු පුතේ එහෙම නං ඇවිත් වාඩිවෙයංකො... ඇසිලින් නෝනා තෙල් තාච්චියට ගින්දර ඩිංගක් දාපංකො"

ජිනසෝම ඇවිත් වෙදමහත්තයා අසලින්ම වාඩිවී දෙතුන් විටක් හරි බරි ගැහුණේය. ඇසිලින් නෝනා ඉස්තෝප්පුවේ පැත්තකට වෙන්නට තාවකාලික ළිපක් උඩ තබා තිබුණු තෙල් තාච්චියට ගිනි දැල්වූ පොල් කොළ දෙක තුනක් ඇතුළු කළේය.



ගුණසෝමද වෙදමහත්තයා අසලට වී සිදුවන්නේ කුමක්දැයි කුතුහලයෙන් යුක්තව බලාසිටියේය. සම්බෝලයක් හදමින් කුස්සියේ සිටි කුසුමලතා ද සියලු වැඩ නවතා සාලයට වී උත්සුකව හෝන්නු වුණාය. ජිනසෝම ඇ දෙස යටැසින් බලා බිම බලාගත්තේය.

"ලොකු පුතේ වැඳ ගන්ඩ" යි ජිනසෝමට පැවසූ වෙදමහත්තයා මල්බුලත් පුටුවේ තිබූ දෙහි ගෙඩි හතෙන් එකක් ගෙන එහිම පැත්තකින් තැත්පත් කොට තිබූ හිරයේ රඳවා දැතින්ම හිරය අල්ලාගෙන ජිනසෝමගේ නළල මත තැබුවේය. ඉන්පසු වඩා උස් ස්වරයකින් මතුරන්නට පටන් ගත්තේය. "ඕං... ඊං..." යනුවෙන් පටන්ගෙන විනාඩියකටත් අඩු කාලයක් මතුරා "ඒස්වාහා" යනුවෙන් නිම කළේය. හිරය තද කොට දෙහි ගෙඩිය දෙපළු කළ වෙදමහත්තයා පළු දෙක ගුණසෝමගේ අතට දී 'පරෙස්සමින් තාච්චියට දමන්නැ" කීය. ගුණසෝම අමුතු පණක් ලද්දාක් මෙන් නැගිට දෙහි ගෙඩි දෙක හෙමින් සීරුවට තාච්චියට දමන විට නැගුණු "චරාස්" හඬින් තිගැස්සී පස්සට විසිවී නමුත් දෙවැනි දෙහි පළු දමන විට ඔහු එදෙස සතුටින් බලා සිටියේය. දෙහි ගෙඩි හතම කපා අවසන් කළ වෙදමහත්තයා "සබ්බීතියෝ විවජ්ජන්තෝ" ගාථාවද කියන්නට පටන් ගත්තේය. එයද අවසන් කළ වෙදමහත්තයා "ඔන්න ඇස්වහ කටවහ ඔක්කොම ඉවරයි" යි පවසා මල්බුලත් පුටුවේ දල්වෙමින් තිබූ පහනෙන් තෙල් ඇඹිත්තක්ද ජිනසෝමගේ හිසෙහි ගෑවේය.

× × × ×

දෙහි කැපීම අවසන් කළ වෙදමහත්තයා හුන් තැනින් නැගී සිට කාමරයට ගොස් සුදු සරම ඉවත්කොට හවස ඇඳ සිටි සරම යළි ඇඟට දාගත්තේය.

"මම මාටින් මුදලාලිගෙ කඩේ පැත්තෙ ගිහින් එනව..."

වෙදමහත්තයාගේ අරමුණ කුමක්දැයි ඇසිලින් නෝනාට එක්වරම තේරුම් ගිය නමුත් ඇ නිහඬව සිටියාය.

"ඔය ජරාව කට ගාගෙන අනංමනං කියවන්ඩ යන්ඩ එපා"

ඊට පිළිතුරු නොදුන් වෙදමහත්තයා ඇඳ විට්ටමේ දමා තිබුණු කුවායද කරට දමාගනිමින් කාමරයෙන් පිටතට පැමිණියේය. ඒ [illegible] මල්බුලත් තට්ටුව අසලට වී ගිනි කබලට කට්ට කුමංජල් දමමින් මතුවෙන සුවඳ දුමාරය දෙස බලා සිටින ගුණසෝම අසලට

WWW.SINHALAELIBRARY.COM 19
Uploaded By Paba

ගිය මනු "උඹත් සිස්සන්තෙං පාස්වෙයංකො... එතකොට මං උඹටත් දෙහි කපන්නංකො" යි කියමින් ගෙදරින් පිට විය.

ඇසිලින් නෝනා කුස්සියට ගියාය. කුසුමලතාද ඒ පසුපසින් ගිය නමුත් ජිනසෝම කාමරයට ගොස් අඳුරේම ඇඳෙහි ඇල වුණේය.

"උඹලගෙ තාත්ත දෙහි කැපුවට පස්සෙ මොනම කටවහක්වත් වදින්නෙ නෑ... මගෙ හිතට සැනසිල්ලක් ආවෙ දූන් තමයි..."

"ඔක්කොම හරි අම්මෙ... බොන එක තමයි වැරැද්ද...?"

"බීගත්තහමනං අමුතුම මිනිහෙක් තමයි. ඔව අපට හදන්ඩ පුළුවන් දේවල් නෙවෙයි"

ඇසිලින් නෝනා ඒ සියල්ල කීවේ ළිපටය.

"මේ හොද්ද බලාපං. දවල් ඒව තමයි. රත්වුණාට පස්සෙ මල්ලිලාටත් කන්ඩ දීලා බුදිය ගනිල්ල... තාත්ත කොයිවෙලාවෙ එයිද දන්නෙ නැහැ..."

ඇසිලින් නෝනා එසේ පවසා කාමරයට ගොස් වෙදමහත්තයාගේ ඇඳෙහි ඇල වුණේය.

x x x x

ජී දෙගොඩහරියේ ගෙදර පැමිණි වෙදමහත්තයා දොරට තට්ටු කොට ඇසිලින් නෝනාට කතා කරනවිට දරුවන් පමණක් නොව ඈද සිටියේ නින්දේය. එහෙත් දොරට තට්ටු කරන හඬ ඇට සිහිනයෙන් මෙන් ඇසිණි. කඩා හැලෙමින් තිබූ කොණ්ඩය යළි පිරකොට බැඳ ගනිමින් කාමරයෙන් පිට වූ ඇසිලින් නෝනා දොර හැරියේ විශාල ඇනුමක් ද හරිමිනි.

වෙදමහත්තයා දොරෙන් ඇතුළට පැමිණෙන විටම හැළි අරක්කු ගඳින් සාලය පිරී ගිය නමුත් ඇසිලින් නෝනා වචනයක්වත් කතා කළේ නැත. ඔහු වැනි වැනී ගොස් බැනියම පිටින්ම ඇඳෙහි වැතිරුණේය.

"බොනව සියලත් මච්චර බීවෙ?"

ඇසිලින් නෝනා එසේ පැවසුවේ වෙනදා මෙන් සිතේ කේන්තියකින් ඉවත බලාගෙන නොවේ. බැනියම ගලවා දමන්නට වෙදමහත්තයාට උදව් වෙමිනි.



"කේන්ති ගන්ඩ එපා බං... මට අද ටිකක් වැඩි වුණා... මටත් මොකක් හරි යමක් ලැබෙන්ඩ ඕනෑ බං... මේ ජීවිත කාලෙදී මම මිනිස්සුන්ට එච්චරට දේවල් කරල තියෙනව..."

"දැන් ඉතිං කාල බුදිය ගන්න... දවාලෙ ඉඳලම මහන්සි වුණානෙ"

වෙදමහත්තයා බීමතින් දොඩවන්නට පටන්ගෙන ඇති බැව් දැනගත් ඇසිලින් නෝනා ඔහුව නින්දට පෙලඹවූයේ මේ දෙඩවිල්ල ලෙහෙසියෙන් නොනවතින බව දන්නා හෙයිනි. එහෙත් ඇසිලින් නෝනාගේ හඬ වෙදමහත්තයාට ඇසුණේ නැත.

"මං සල්ලි හොයාපු මිනිහෙක් නෙමෙයි බං... ඒත් මං මිනිස්සු හම්බ කරල තියෙනව... ජීවිත කාලෙම මං මිනිස්සුන්ට කෙරුව... අද තමයි මං අපේ පවුලෙ එකෙකුට යමක් කෙරුවෙ... ලක්ෂයක් හම්බ කළාට වැඩිය වටින්නෙ නැද්ද බං කොල්ල සිස්සත්තෙං පාස්වෙච්ච එක... ඕක තමයි බං මිනිස්සුන්ට උදව් කරන්ඩ ඕනෑ කියන්නෙ... මේ ආත්මෙදීම ලැබෙනව... මං ඇල්බොට ගොයියට බැන්න... ඒ යකා කියනව කොල්ල පාස්වුණේ මගෙ ගුරුකමක් හින්දලු... මං කොරාපු ගුරුකමක් නැනෙ බං... හැබැයි මං හිතිං හිතුව... මං විතරක් නෙමෙ උඹත් හිතිං හිතන්ඩ ඇති... හිත තරං බලසම්පන්න දෙයක් නෑ බං... හිත හයියනං මළ යකෙක්වත් කිට්ටු වෙන්නෙ නෑ..."

"කොහොම හරි කොල්ල පාස් වුණානෙ... වෙදමහත්තයා දැන් කාල බුදියගන්ඩ..."

"කන්ඩ බෑ බං... වහල තියාපං... හෙට උදේට කන්නං... උඹලගෙ අම්මටත් කියල ඇරපං... උන්දත් බොහොම සන්තෝස වෙයි... උන්දැ කොල්ලන්ට හරි ආදරෙයිනෙ... මගේ තාත්තයි අම්මයි හිටිය නං උන්දලත් සන්තෝස වෙනව... හැම දෙමව්පියෙක්ම තමන්ගෙ දරුවන්ගෙ දේවල් ගැන කොයිතරං සන්තෝස වෙනවද බං... ඇසිලින් නෝනෙ... අපි හරි වාසනාවන්තයි බං..."

වෙදමහත්තයා දිගටම දොඩවන්නට පටන් ගත්තේය. ඔහුට දොඩවන්නට ඉඩදී හොඳි මාළු පිඟිනි ටික වසා දැමූ ඇසිලින් නෝනා නොනාම පැදුරෙහි ඇලවුණාය.

x x x x

WWW.SINHALAELIBRARY.COM 20
Uploaded By Paba

# 5

ගලහිටියාවේ සෙන්ට්‍රල් කොලීජියේ විදුහල්පතිතුමා එවා තිබුණ ලිපියක් ලොකු මහත්තයා ජිනසෝමට දුන්නේ ඊළඟ සතියේ සඳුදාය. එහි සඳහන් වූයේ කස්තුරිආරච්චිගේ ජිනසෝම ශිෂ්‍යත්වලාභියකු වශයෙන් විදුහලට ඇතුළත් කර ඇති බවත්, නේවාසිකාගාරයේ නැවතීම පිණිස සූදානම්ව පැමිණෙන ලෙසත්ය. එදිනට රැගෙන යා යුතු බඩු භාණ්ඩ ලැයිස්තුවක්ද ඒ ලිපියට අමුණා තිබූ අතර පිඟානක් කෝප්පයක් මෙන්ම බුරු ඇඳක් ගැනද ඒ ලැයිස්තුවේ සටහන්ව තිබිණි.

කොට්ට උර කමිස කලිසම් ආදිය හැරෙන්නට අනෙක් බඩු ගම්පහ වටුමෙන් මිලදී ගත යුතු ඒවා විය. එහෙත් බුරු ඇඳ ලොකු ප්‍රශ්නයක් බවට පත්විය. දවස් තුන හතරකින් බුරු ඇඳක් සාදවා ගැනීමට ද නොහැකිය. අහල පහළ දන්නා කියන ගෙදරක බුරු ඇඳක් තිබුණේ ද නැත. ගුණපාල මලයාගේ ගෙදර බුරු ඇඳක් තිබුණ නමුත් ඔහුගේ පියා නිදාගන්නේ එහිය. ඒ නිසා ඒ ගැන ගුණපාල මලයා සමග කතා කරන්නටවත් වෙදමහත්තයා කැමැති වූයේ නැත. ඉල්ලා ගන්නට හොව මුදලක් දී මිලදී ගන්නටවත් හැකි තැනක් ගැන තොරතුරක් ලැබුණේ නැත. පන්සලේ පරණ බුරු ඇඳන් දෙකක් දානශාලාවේ බිත්තියට හේත්තුකොට තිබෙන බවට තමාට මතකයක් ඇතැයි කීවේ තේමානිස් උපාසක උන්නැහේය.

"දන් ඇබිත්තයොත් ඉන්නෙ එකයිනෙ... වෙදමහත්තය ගිහින් කාරණේ කිව්වොත් ලොකු හාමුදුරුවො බොහොම කැමැත්තෙනේ දෙයි..."



තේමානිස් දුන් ආරංචිය වෙදමහත්තයා තුළ විශාල බලාපොරොත්තුවක් ඇති කරවීමට සමත් විය. ඔහු එදිනම හවස් යාමයේ ලොකු හාමුදුරුවන් මුණගැසෙන්නට පන්සලට ගියේය.

"වෙදමහත්තයගෙ දරුවෙක් ශිෂ්‍යත්ව විභාගයෙන් සාමාර්ථ වුණාය කියල අපටත් ආරංචි වුණා. ඒක අපටත් ලොකු සතුටක්... දෙමාපියන්ටත් ආඩම්බර වෙන්ට කාරණාවක්"

වෙදමහත්තයා දුටු සැණින්ම ලොකු හාමුදුරුවෝ ජිනසෝම ගැන කියමින් කතාව පටන්ගත්හ. උන්වහන්සේගේ අවසරය පරිදි වෙදමහත්තයා මිටි බංකුව මත ඉඳගත්තේය.

"අනිත් එක ඉතිං වෙදමහත්තයත් මිනිස්සුන්ට බොහොම ලොකු සේවයක් කරන කෙනෙක්නෙ... ඒව මතු ආත්මවලදී නෙමෙයි මේ ආත්මවලදීම විපාක දෙනව වෙදමහත්තයෝ"

"එහෙමයි හාමුදුරුවනේ..."

"වෙදමහත්තය තකහනියක්ම ආපු කාරණේ?"

ලොකු හාමුදුරුවන් ඒ අත්‍යවශ්‍ය ප්‍රශ්නය ඇසුවේ ආගිය කතාබහ බොහෝදුර ගියාට පසුවය.

"සැන්ට්‍රල් කොලීජියට යනකොට බුරු ඇඳක් ගෙනියන්ට කියල දන්වල එවල තියෙනව. බෝඩිමට ඇතුල් කරන්ට වෙන්ට ඇති. ගම පුරාම ඇවිද්ද හාමුදුරුවනේ..."

වෙදමහත්තයා කියන්නට ගිය දේ අවසන් කරන්නට පෙර හාමුදුරුවෝ නැගී සිටියහ.

"වෙදමහත්තය එමුකො... බුරු ඇඳන් දෙකක් තිබුණ.. මං දන්නෙ නෑ පාවිච්චි කරන්ට පුළුවන් තත්ත්වෙක තියෙනවද කියල..."

ලොකු හාමුදුරුවෝ දන් ගෙට වැඩියහ. වෙදමහත්තයාද පසු පසින් ගියේය. බුරු ඇඳන් දෙක දන්ගෙයි මුල්ලක බිත්තියට හේත්තු කොට තිබිණි. ලොකු හාමුදුරුවෝ එය අතපත ගෑහ.

"සුද්ද පවිත්තර කරල ගත්තහම වරදක් නැතුවා වාගෙ... වෙදමහත්තය ඔතෑ එකක් අරගෙන යන්ට... හැදෙන ගහකට වතුර බිංදුවක් දාන්ට ලැබීමත් වාසනාවක්නෙ..."

"එහෙමයි හාමුදුරුවනේ..."

WWW.SINHALAELIBRARY.COM 21
Uploaded By Paba

දත් ගෙයි මුල්ලක තිබුණ කොස්සක් ගත් වෙදමහත්තයා එයින් බුරු ඇඳක සුද්ද පවිත්තර කොට පිටතට මසවාගෙන ගියේය.

"සීන්ත ටිකක් එහෙම ගාල ගත්තම අපූරුවට තියේවි. හොඳ හයිහත්තියට හදාපු එකක්නෙ..."

වෙදමහත්තයා ලොකු හාමුදුරුවන්ට නමස්කාර කොට බුරු ඇඳ කරට ගන්නා විට උන්වහන්සේ කීහ. බුරු ඇඳත් කර තබාගෙන වෙදමහත්තයා ගුරු පාර දිගේ ආපසු එනවිට හමුවූ තුන් හතර දෙනාම "මොකද වෙදමහත්තයා බුරු ඇඳකුත් කර තියාන?" යි එකම ප්‍රශ්නය ඇසූහ. වෙදමහත්තයාද "පොඩි වුවමනාවක්" යි එකම ආකාරයෙන් පිළිතුරු දුන්නේය.

"බොහොම හොඳ බුරු ඇඳක්... මෙවගේ හයිහත්තියට දැන් හදන්නෙ නෑ..."

ගෙදර ගිය වෙදමහත්තයා, ඇසිලින් නෝනාට බුරු ඇඳෙහි වරුණාව කියා පාන්නට විය. කුසුමලතා පමණක් නොව ජිනසෝම ද පැමිණ එය අතපත ගෑවේය. ගුණසෝම සිටියා නම් එය දිග හැර දුවිලි පිරිත්ම එහි වැතිරෙනු නියත යැයි වෙදමහත්තයාට සිතුණේ කුසුමලතාත් ජිනසෝමත් එය අතපත ගෑ විලාශය දුටු නිසාය.

"හෙට උදෙන්ම වවුමට ගිහිල්ල සීන්ත බෙලෙක්කයක් ගෙනාවනං හවස් වෙනකොට ගාල වේලගන්ඩත් පුළුවන්..."

පසුවදා උදෙන්ම ගම්පහට ගිය වෙදමහත්තයා දුඹුරුපාටට හුරු සීන්ත බෙලෙක්කයක් ගෙනාවේය. සල්ලි දුන්නේ ඇසිලින් නෝනාය. හොඳටම මෝරාපු කොනු තිබෙන පොල් ලෙල්ලක් තලා බුරුසුවක් සාදාගත් වෙදමහත්තයා හවස තුන හතර වෙන විට සීන්ත ගා අවසන් කළේය. පොල් ලෙලි බුරුසුවකින් සීන්ත ගෑ නිසා තැන තැන ඉරි මතු වී අපිළිවෙළ ගතියක් පෙනෙන්නට තිබුණ ද ඒ ගැන කිසිත් නොකීමට ඇසිලින් නෝනා ඉටාගත්තාය. එහෙත් ජිනසෝම ඒ ගැන කුසුමලතා සමඟ කීවේය.

"බුරුසුවක් ගෙනාගෙන ගෑව නම් එහෙම වෙන්නෙ නෑ" කුසුමලතා ඇසිලින් නෝනාට කීවේ ජිනසෝම පෙන්වූ අපිළිවෙළ ඇයටද එතරම් පෙනුණ බැවිනි.

"මට හොඳටම ඇති..."

ඇසිලින් නෝනාගේ හඬ තරමක් තියුණුව ඇසුණු හෙයින් කුසුමලතා බුරු ඇඳේ අඩුපාඩු සොයන්නට ගියේ නැත.



"ලොකු හාමුදුරුවෝ මට දුන්න මිසක ලේසි පාසු කෙනෙකුට දෙන්නෙ නෑ... අනිත් එක ජිනසෝම ගැනත් ලොකු හාමුදුරුවන්ට ආරංචි වෙලා... ඒ ගැනත් බොහොම සන්තෝසෙකින් කතා කෙරුවෙ"

වෙදමහත්තයා සාලයේ බිත්තියට හේත්තු කොට තිබූ බුරු ඇඳ ළඟට ගොස් දබරැඟිල්ල ඒ මත තැබුවේය.

"දැනටමත් වේලෙන්ඩ ඇවිල්ල... හෙට උදේ වෙනකොට හොඳටම වේලිලා තියෙයි"

"දැන් බොහොම පෙනුමයි"

ඇසිලින් නෝනා එවැන්නක් වැඩිපුරම කීවේ වෙදමහත්තයාගේ සිතේ මතු වී ඇති පිබිදීම තවත් වැඩි කරනු පිණිසය. සේනාරත්න මිසිලාගේ ගෙදරින් ඉල්ලාගත් ට්‍රන්ක පෙට්ටිය ටිකෙන් ටික පිරෙමින් තිබේ. බණ්ඩාරවත්ත හන්දියේ චාර්ලිස් ටේලර් මැසූ කලිසම් කමිස සූට් දෙක හොඳ මිම්මට මැසී ඇතැයි ඇසිලින් නෝනා වෙදමහත්තයාට කීවේ රාත්තිරියේ කුස්සියේදීය.

"සපත්තු දෙකක් තමයි අඩු..."

වෙදමහත්තයා කීවේ ඇසිලින් නෝනාට ඇසෙන්නටය. මන්දයත් තමා ළඟ මුදල් නැති හෙයින් එවැනි ප්‍රශ්න ඇසිලින් නෝනාට ඉදිරිපත් කිරීම හැරෙන්නට අන් කළ හැකි කිසිවක් නොවූ හෙයිනි.

"මං හිතාගෙන ඉන්නෙ කරාබු දෙක රත්තරං බඩු කඩේට උගස් තියල කොල්ලට සපත්තු දෙකක් අරගෙන දෙන්ඩ"

"ඔව්... ඒක හොඳා... බේරගන්න එක පස්සෙ කරන්ඩ පුළුවන් වැඩක්නෙ..."

වෙදමහත්තයා නිහඬව සිටි හෙයින් ඇසිලින් නෝනා නැවතත් කීවාය. වෙදමහත්තයා හිසවනා ඒ අදහස අනුමත කළේය.

x x x x

ගලහිටියාව සෙන්ට්‍රල් කොලීජියේ නේවාසිකාගාරයට යනු පිණිස වෙදමහත්තයාත් ජිනසෝමත් ගෙදරින් පිටත් වූයේ ඉරිදා සවස එකට පමණය. ජිනසෝමගේ ඇඳුම් පැළඳුම් සහ බඩු බාහිරාදිය ට්‍රන්ක පෙට්ටියේ පිළිවෙළට අසුරා දුන්නේ කුසුමලතා

WWW.SINHALAELIBRARY.COM 22

Uploaded By Paba

විසිනි. විශේෂයෙන් පිළියෙළ කළ වැලිතලප පාර්සලය පොඩි නොවන සේ සියල්ලටම උඩින් තබන්නට ඈ අමතක නොකළාය.

ජිනසෝම ගෙදරින් පිට වෙන්නට ද පෙර වෙදමහත්තයාටත් ඇසිලින් නෝනාටත් දණගසා වැන්දේය. කුසුමලතාට වඳින්නට සැරසුණ මුත් ඈ හඬා ගෙන කාමරය තුළට දිව්වාය. ගුණසෝම, ඇසිලින් නෝනාගේ චීත්ත පොටේ එල්ලී සිටියා මිස ජිනසෝම අසලටවත් ගියේ නැත.

''පුතේ හොඳට ඉගෙන ගනිං'' යැයි කියන්නට ඇසිලින් නෝනාට අවශ්‍යකමක් තිබුණද ඇගේ දෑස්වලින් කඳුළු පිටවුණ නමුත් වචන පිටවූයේ නැත.

වැදගත් ගමනකට ඇඳීම සඳහා පමණක් පාවිච්චි කරන සුදු සරමත් ජාතික බැනියමත් ඇඳ සිටි වෙදමහත්තයා බුරු ඇඳ කරට ගෙන පළමුවෙන් මිදුලට බැස්සේය. බණ්ඩාරවත්තේ චාර්ලිස් ටේලර් අලුතෙන් මැසූ නිල්පාට කොට කළිසමක් සහ සුදු පාට කමිසයක් ඇඳ සිටි ජිනසෝම ට්‍රන්ක පෙට්ටියත් එල්ලාගෙන ඔහු පසුපසින් පියවර මනින්නට විය. චීත්ත පොටින් කඳුළු පිසමින් ඇසිලින් නෝනා ගෙදරින් ඈත්ව යන වෙදමහත්තයා සහ ජිනසෝම දෙස බලා සිටි අතර ගුණසෝම පමණක් නොව කුසුමලතාද ඇගේ චීත්තයෙහි එල්ලී සිටියාය.

දෙවැට දිගේ පල්ලම් බැස බස්නා ඇලෙල් ඒදණ්ඩෙන් එගොඩවී වෙල්යාය ඉස්මත්තේ මහ නියරට පය තැබූ වෙදමහත්තයා ට්‍රන්ක පෙට්ටියත් එල්ලාගෙන ගාට ගාටා එන ජිනසෝම දෙස බැලුවේය. මහ නියර දිගේ ගොස් ඉහළගම ඇනිකට් හන්දියෙන් රේල්පාරට ගොඩවූ වෙදමහත්තයා දෙවැනි වතාවටද පසුපස බැලුවේය.

''ට්‍රන්ක පෙට්ටිය බරද?''

''නෑ...''

ජිනසෝම එසේ කීවූ නමුත් ට්‍රන්ක පෙට්ටිය ඔහුට බර ඇතැයි වෙදමහත්තයාට සිතිණි. ජිනසෝම සහ තමා තනිව සිටින මොහොතක් බැවින් ඔහුට අවවාදයක් දෙකක් දෙන්නට වෙදමහත්තයාට ඕනෑකම තිබිණි. එහෙත් කුමක් කිව යුතුදැයි පැහැදිලි කමක් තිබුණේ නැත. ඔහු නිහඬවම ගමන් ගත්තේය. බුරු ඇඳ කර තබාගත් වෙදමහත්තයා ඉදිරියෙන්ද ට්‍රන්ක පෙට්ටිය



එල්ලාගත් ජිනසෝම පසුපසින් ද රේල්පාර දිග ගමන්ගත්තේ අඩි හතරක පහක පරතරයක් ඇතිවය. ඉහළගම සිට ගම්පහ දුම්රිය පොළට යන තෙක්ම මේ පරතරය අඩු වැඩි වූයේ නම් ඒ අඟල් ගණනකිනි.

ගම්පහ දුම්රිය පොළට ළඟා වෙන විට වෙදමහත්තයාගේ පිට පෙදෙස දහඩියෙන් තෙත්ව තිබිණි. බුරු ඇඳ උරෙන් උරට මාරු කරමින් පැමිණි නිසා ජාතික බැනියමේ දෙවුරේම තීන්ත පැල්ලම් ඇඳී තිබුණේය. ජිනසෝමගේ සිතෙහි වෙදමහත්තයා පිළිබඳව මින් පෙර කෙදිනකවත් ඇති නොවූ තරමේ අනුකම්පාවක් ඇති විය. ඕගත් ඇතැම් විට වළං පිඟන් පොළොවේ ගසන්නට තරම් කේන්ති ගන්නා නමුත් මේ මොහොතේ ඔහු කෙතරම් අහිංසක පුද්ගලයෙක් බවට පත්ව ඇත්තේ දැයි සිතුණ විට ජිනසෝමගේ දෑස් වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තේය.

''මොකද? අමාරුද?''

''නෑ...''

ජිනසෝම කල්පනා ලෝකයෙන් මිදුනේ වෙදමහත්තයා ඇසූ ඒ ප්‍රශ්නයෙනි.

''තාත්තාගේ බැනියමේ තීන්ත ගෑවිලා...''

''වේලීලා කියල හිතුවට සමහර තැන් තාම ඇලෙනව...''

වෙදමහත්තයා එසේ කියමින් දුම්රිය වේදිකාවට ගොඩ වී බුරු ඇඳ පසෙකින් වූ අරලියා ගසකට හේත්තු කොට ජිනසෝම එල්ලාගෙන සිටි ට්‍රන්ක පෙට්ටිය ගෙන වේදිකාවට නගින්නට ඔහුට උදව් කෙළේය...

''කොච්චිය කීයටද දන්නෙ නෑ...?''

ජිනසෝම ඒ ප්‍රශ්නය ඇසුවේ දුම්රියේ වේලාව දැන ගැනීමේ වුවමනාවටත් වඩා තමා සිටින්නේ සැහැල්ලු සිතකින්ය යන්න තාත්තාට දන්වන්නට තිබුණු අවශ්‍යතාව නිසාය. තාත්තාගෙන් සමුගන්නා අවස්ථාව ටිකෙන් ටික සමීප වන හෙයින් ඔහුගේ සිත හැඟිම්බර නොකර සිටින්නට ජිනසෝම ඉටා ගත්තේ රේල් පාර ඔස්සේ ඔහු පසුපසින් ගමන් ගන්නා අවස්ථාවේය.

ටිකට් කවුන්ටරයට ගොස් ගණේමුල්ලට ටිකට් එකහමාරක් ගත් වෙදමහත්තයා ආපසු එනවිට වේදිකාවේ සිටි පෝටර්

WWW.SINHALAELIBRARY.COM 23

Uploaded By Paba

කෙනෙක් මිනුගේ ටිකට් එක ඉල්ලා අඬුවකින් සිදුරු කරමින් "බුරු ඇඳ ලගේජ් කරන්ඩ වෙයි" යි කීවේය. වෙදමහත්තයා උත්සාහයෙන් මතුකරගත් සිනාවකින් යුක්තව පෝටර් දෙස බැලුවේය. එය අසරණ වූ කෙනෙකුගේ මුහුණට නැඟෙන බලහත්කාර සිනාවක් නොවේදැයි පෝටර්ට සිතුණේය.

"ගණේමුල්ලට විතරයි යන්නෙ... මේ ළමය සිස්සත්තෙං පාස්වෙලා.. සෙන්ට්‍රල් එකේ බෝඩිමට යන්නෙ... කාටවත් කරදරයක් නොවෙන්ඩ පෙට්ටියකට දාගන්නං"

වෙදමහත්තයාගේ බියාදු මුහුණ දෙස පෝටර් නැවතත් බැලුවේය.

"එහෙම නං සද්ද නැතුව දාගන්නව... මහත්තුරු දැක්කොත් එහෙම මට තමයි ලෙඩේ"

පෝටර් එසේ කියමින් ජිනසෝම දෙසද බලා එතැනින් ඉවත්ව ගොස් මදක් ඈතින් තිබූ පුටුවක ඉඳගත්තේය.

"හොඳ පෝටර් මහත්තයෙක්... නැත්තං රුපියල් එකයි පණහක් විතර යනව ලගේජ් කොරන්ඩ"

වෙදමහත්තයා, ජිනසෝමට කීවේ විශාල ජයග්‍රහණයක් අත්කරගත් පරිද්දෙනි.

සවස දෙකයි තිස් පහේ කෝච්චිය ගම්පහට එනවිට තුනටත් ආසන්න විය. වෙදමහත්තයා කලබලයක් නොමැතිව ට්‍රන්ක පෙට්ටිය ගෙන ජිනසෝමට නගින්නට ඉඩහැර එය කෝච්චි පෙට්ටිය තුළින් තැබුවේය. ඉන්පසු බුරු ඇඳ ඔසවා සිරුවට දුම්රිය මැදිරියට දමාගත්තේය. එය තරමක් අසීරු කාර්යයක් වූ අතර ඒ වන විටත් වේලි නොතිබුණු නිසා සුදු බැනියමෙහි තවත් පැල්ලම් කිහිපයක් ඇඳුණේය.

අවේලාවක පැමිණි කෝච්චියක් නිසා දුම්රිය මැදිරියේ මගීහු හත් අට දෙනකුට වඩා නොසිටියහ. බුරු ඇඳකුත් ඔසවාගෙන දුම්රිය මැදිරියට ගොඩ වූ පිය පුතු දෙදෙන දෙස ඒ මගීහු මුවමනාවෙන් බලන්නට වූහ. ජිනසෝමගේ ඇස් යොමු වී තිබුණේ වෙදමහත්තයාගේ බැනියමෙහි ඇඳුනු තීන්ත පැල්ලම් දෙසටය. ඔහු අසල සිටි මහත්මයා ද ඒ දෙස බලනු ජිනසෝම දුටුවේය.



"පුතා සිස්සත්තෙං පාස්වෙලා... සෙන්ට්‍රල් කොලීජියේ බෝඩිමට එක්කරගෙන යනව... බුරු ඇඳකුත් ගේන්ඩ කිව්ව... සමහරවිට ඇඳන්වල අඩුපාඩුවක් ඇති"

ඉදිරිපස අසුනේ සිටි මහත්මයා ප්‍රශ්නයක් අසන්නටත් පෙර වෙදමහත්තයා සියලු විස්තර කීවේය.

වෙදමහත්තයාගේ කතාවෙන් පසු දුම්රිය මැදිරියේ ඒ අසල සිටි කිහිපදෙනෙක්ම ඔහු දෙසත් ජිනසෝම දෙසත් බුරු ඇඳ දෙසත් බලන්නට වූහ. දෙතුන් දෙනෙක් ජිනසෝම දෙස විශේෂයෙන් බලා ඔහු සමඟ සිනාසුණහ.

"කොච්චර දෙයක්ද දරුවෙක් ශිෂ්‍යත්ව විභාගෙන් පාස්වෙනවයි කියන එක..."

යාබද අසුනේ සිටි මැදිවියේ කාන්තාවක් ජිනසෝම දෙස කෙළින්ම බලා සිටිමින් කීවාය. වෙදමහත්තයා ඈ දෙසට ස්තුති පූර්වක බැල්මක් හෙළුවේය. කාන්තාව තමා අත තිබූ බෑගය විවෘත කොට එතුළට අත දමා පවුන්ටන් පෑනක් පිටතට ගත්තාය.

"පුතා මේක ගන්ඩ... හොඳට ඉගෙන ගන්ඩ"

ඈ පවුන්ටන් පෑන ජිනසෝම වෙත දිගු කළාය. එහෙත් ජිනසෝම ලජ්ජාශීලීව ඇඹරුණා මිසක අත දිගු කළේ නැත. වෙදමහත්තයාගේ සිත ජිනසෝම පිළිබඳ වූ ආඩම්බරයකින් මෙන්ම මහත් වූ ආදරයකින්ද පිරීගියේය.

"ගන්ඩ පුතා"

"මමත් ටීචර් කෙනෙක්. අපේ ඉස්කෝලෙන් කවුරුවත් පාස් වෙලා නැහැ. මේ පාර ශිෂ්‍යත්වෙන් පාස් වෙච්ච දරුවෙක් ගැන ඇහුවමයි..."

කාන්තාව වට පිට බලමින් පැවසුවේ මැදිරියේ සිටි අනෙක් මගීන්ටද ඇසෙන පරිදිය.

"ගන්ඩ පුතා"

වෙදමහත්තයා යළිත් කීවේය.

ජිනසෝම නැගිට දැතින්ම පෑන ගත්තේය.

"බොහොම ස්තුතියි"

WWW.SINHALAELIBRARY.COM 24
Uploaded By Paba
www.sinhalaelibrary.com

ජිනසෝම පැන ගත් ආකාරයත් ඉන්පසු "බොහොම ස්තුතියි" කියා පැවසූ ආකාරයත් පිළිබඳව වෙදමහත්තයා එක්තරා අන්දමකින් තුෂ්ණිම්භූත වූයේය. කම්බා නොදන්නා නමුත් තමා සිතාගෙන සිටියාටත් වඩා තමාගේ දරුවා ඉතා යහපත් ගති සිරිත් පුරුදු පුහුණු වී ඇතැයි යන ආඩම්බර සිතුවිල්ලකින් ඔහුගේ සිත පිරීගියේය.

ගණේමුල්ල දුම්රිය ස්ථානයෙහි දුම්රිය නැවැත්වූ විට බුරු ඇඳත් ට්‍රන්ක පෙට්ටියත් රැගෙන මැදිරියෙන් බැස ගන්නට මගීන් කිහිප දෙනෙක්ම වෙදමහත්තයාටත් ජිනසෝමටත් උදව් කළහ. ජිනසෝම ට්‍රන්ක පෙට්ටියත් එල්ලාගෙන බසින්නට සූදානම් වූ විට මැදිරියේ සිටි එක් මහත්තයෙක් එය අතට ගෙන දුම්රිය වේදිකාවට බැස්සේය. ඉන්පසු ජිනසෝමට බසින්නටද අත දුන්නේය. ඒ මහත්තයා ආපසු දුම්රියට ගොඩවූයේ ජිනසෝමගේ කමිස සාක්කුවට රුපියල් දෙකේ නෝට්ටුවක්ද දමමිනි. ජිනසෝම බොහොම ස්තුතියි කියා නොකීවූ නමුත් පෙරළා ඔහු දුන් සිනාව පුරාම පිරී තිබුණේ එවන් හැඟීමකි. දුම්රිය යළි ගමන ආරම්භ කෙළේය. මැදිරියේ සිටි හැමදෙනාම වාගේ ජිනසෝමටත් වෙදමහත්තයාටත් අත වැනූහ. දුම්රිය වංගුවෙන් හැරී නොපෙනී යනතෙක්ම ජිනසෝම ඒ දෙස බලා සිටියේය. වෙදමහත්තයා බුරු ඇඳ යළිත් කරටගත් අතර ජිනසෝම ට්‍රන්ක පෙට්ටිය අතින් ගත්තේය. ඉන්පසු දුම්රිය මාර්ගය පැන ගුරු පාරට වැටී සෙන්ට්‍රල් කොලීජිය දෙසට ගමන් කරන්නට වූහ.

අතරමගදී මුණගැසුණ ඇතැම් කෙනෙක් බුරු ඇඳ කරින් ගෙන යන තාත්තා දෙස ආපසු හැරී බලන අයුරු පසුපසින් පැමිණි ජිනසෝම දුටුවේය. ජාතික බැනියමේ නැතිනම් නැන තිබූ පැල්ලම්ද නිසැකවම ඔහුගේ ඇසට ලක්වන්නට ඇතැයි ජිනසෝම සිතුවේය. තාත්තා පිළිබඳව උපන් අනුකම්පාව ඔහුට දරාගත නොහැකි තරමට වැඩිවෙමින් පැවතිණි.

ගණේමුල්ල දුම්රිය ස්ථානයෙහි සිට සෙන්ට්‍රල් කොලීජියේ නේවාසිකාගාරය තෙක් එක හුස්මට පැමිණීම නිසා වෙදමහත්තයාත් ජිනසෝමත් හොඳ ගණනට වෙහෙසට පත්ව සිටියහ. නේවාසිකාගාරයේ ගේට්ටුව අසලදී බුරු ඇඳ බිමින් තැබූ වෙදමහත්තයා නැවත දෙසද බැලුවේය. නේවාසිකාගාරයේ කොරිඩෝවේ සිටි ළමුන් අවිමින් ජාතික බැනියමේ පැල්ලම් දෙස බලා ඉස්මිනි ජිනසෝම

WWW.SINHALAELIBRARY.COM 25



පිරිසක් තමන් දෙස බලා සිටින බව ජිනසෝම දුටුවේ ඒ මොහොතේය.

"බෝඩිමේ ළමයි වෙන්න ඇති"

වෙදමහත්තයා එසේ කියා අමුතු ප්‍රාණියෙක් ලැබුණාක් මෙන් බුරු ඇඳ යළිත් කරට ගත්තේය. එවර වෙදමහත්තයා ජිනසෝමට ඉස්සර වෙන්නට ඉඩ හැරියේය. නේවාසිකාගාරය දෙසට එන අමුත්තන් දෙදෙනා දෙස කොරිඩෝවේ සිටි ළමෝ බලා සිටියහ. ඔවුන් අතර සිටි එක් වැඩිහිටි ළමයෙක් ජිනසෝම ඉදිරියට පැමිණියේය.

"මල්ලී බෝඩිමට අලුත් වෙන්ඩද?"

"ඔව්"

ජිනසෝමට "මල්ලී" යනුවෙන් ආමන්ත්‍රණය කරනු ඇසීමත් සමගම වෙදමහත්තයාගේ ගතෙහි තිබූ වෙහෙස සම්පූර්ණයෙන්ම වාගේ හැකිවී ගොස් පුදුමාකාර ලෙස සැහැල්ලුවක් දනෙන්නට පටන් ගත්තේය. වැඩිහිටි ශිෂ්‍යයා කොරිඩෝවේ සිටි ළමයින්ට අතවැනුවේය. දෙතුන් දෙනෙක්ම ඔහු වෙත දිව ආහ.

"මේ ඇඳයි... ට්‍රන්ක පෙට්ටියයි ඇතුළෙන් ගිහින් තියන්ඩ... ඔය කොරිඩෝවට වෙලා පාර දිහා බලාගෙන ඉන්ඩ එපා... ඇතුලට වෙලා වැඩක් කරගන්ඩ..."

වැඩිහිටි ශිෂ්‍යයා නියෝගයක් දුන්නාද... උපදේශයක් දුන්නාද නැත්නම් ඉල්ලීමක් කළාදැයි කියා තෝරා බේරාගැනීමට වෙද මහත්තයාට නොහැකි විය. කෙසේ වුවද ඒ ශිෂ්‍යයන් ඔහුට අවනත වූ අයුරු වෙදමහත්තයා තුළ එක්තරා අන්දමක විශ්මයක් ඇති කෙළේය. බුරු ඇඳත් ට්‍රන්ක පෙට්ටියත් ඔසවාගත් ළමයි නේවාසිකාගාරය තුළට ගියහ.

"එන්ඩ මාත් එක්ක"

වැඩිහිටි ශිෂ්‍යයාගේ උපදෙස් පරිදි පළමුව ජිනසෝමත් දෙවනුව වෙදමහත්තයාත් ගමන් කරන්නට වූහ.

"නේවාසිකාගාරයේ පාලක" යනුවෙන් නාම පුවරුවක් සවිකර තිබූ කාමරයක් ඉදිරියේ වැඩිහිටි ශිෂ්‍යයා නැවතුණේය.

"රණවීර සර්... අපට තවත් මල්ලී කෙනෙක් ඇවිල්ල"

Uploaded By Paba

ඔහු එසේ පවසා විනාඩියක් පමණ ගත වූ පසු දොරගුළු ඇරගෙන නේවාසිකාගාර පාලකතුමා පෙනී සිටියේය. කණ්ණාඩි යුවළක් පැළඳ සිටි ඔහු තට්ටය පෑදුණ හිසකින්ද තරමක් ඉදිරියට නෙරා තිබූ උදරයකින් ද යුක්ත වූ මැදිවියේ මහත්මයෙකි. ඔහු අත ඉංග්‍රීසි පත්තරයක්ද විය. පාලකතුමා ජිනසෝම දෙස බැලුවේය.

ජිනසෝම සිටින්නේ සිරුවෙනි. ඔහුගේ අත්දෙක පිළිවෙළට පහළට දමාගෙන ඇත. කොණ්ඩය තරමක් අවුල්ව ඇති මුත් කමිසය අවුල් වී නැත. ගේට්ටුව ළඟදී කමිසය හදාගන්නැයි තමා දුන් උපදේශය කෙතරම් වටින්නේදැයි වෙදමහත්තයාට සිතිණි.

"මොකද්ද පුතාගෙ නම?"

"කස්තුරිආරච්චිගේ ජිනසෝම"

ජිනසෝම කිසිදු පැකිළීමක් නැතුව පිළිතුරු දුන්නේය.

"එහෙනම් කරුණාරත්න තැනක් බලල මෙයාටත් ඇඳයි බඩු විකයි තියල දෙන්ඩ... රෑ කෑමෙන් පස්සෙ අලුත් ළමයි ඔක්කොම කෑම ශාලාවට රැස්කරවන්ඩ... මේ ශිෂ්‍ය නායක අයිය කෙනෙක්... ඔිනෑ කරන හැම දෙයක්ම එයා කරල දේවි... ජිනසෝමගෙ තාත්ත ඇතුලට යන්ඩ ඕනෑ නෑ... ළමය ගාව වැඩිපුර සල්ලි තියෙනවනං අරගෙන යන්ඩ"

නේවාසිකාගාර පාලකතුමා වෙදමහත්තයා දෙස බලමින් කීවේය. ඉන්පසු ඔහු කාමරය තුළට ගොස් දොර වසා ගත්තේය. ශිෂ්‍ය නායකයා පසුපසින් වෙදමහත්තයාත් ජිනසෝමත් ආපසු කොරිඩෝවට පැමිණියහ.

"මල්ලි දැන් තාත්තට යන්ඩ කියන්ඩ"

ශිෂ්‍ය නායකයා එසේ කීවේ ඇත්තටම ජිනසෝමට නොව තමාට බැව් තේරුම් ගැනීමට වෙදමහත්තයාට අසීරු වූයේ නැත. ඔහුගේ සිත එක්වරම ගල්ගැසී ගියේය. ඔහුට දැනුණේ සති ගණනාවක් පුරා පැවති පවුලේ සාමූහික සංවේදී කටයුත්තක අවසානය ළඟා වී ඇති බවය.

ජිනසෝම පැමිණ වෙදමහත්තයාට දණ ගසා වැන්දේය. ඒ බව දුටු ශිෂ්‍ය නායකයා පියවර කිහිපයක් ඈතට ගොස් ඉවත බලාගත්තේය. වෙදමහත්තයා ජිනසෝමගේ හිසට අත තැ...



"මටත් වඩා අම්ම උඹ ගැන දුක්වෙනව... අම්ම බලාගෙන ඉන්නෙ උඹ හොඳට ඉගෙන ගෙන ලොකු මිනිහෙක් වෙලා එනකල්..."

එවැනි දෙයක් කියාගන්නට වෙදමහත්තයාට හැකියාවක් තිබුණේ නැත. ඒ වෙනුවට ඔහුගෙන් පිටවූයේ "මහත්තුරුන්ටත් අයියලාටත් කීකරු වෙලා හොඳින් ඉන්ඩ" යන වචන කිහිපය පමණි. ඉන්පසු ඔහු ජාතික බැනියමේ යට සාක්කුවට අත දැම්මේය. එහි තිබුණේ කාසි දෙකක් පමණි. එකක් රුපියලේ කාසියකි. අනෙක ශත පණහේ කාසියකි. ගණේමුල්ලේ සිට ගම්පහට දුම්රිය ගාස්තුව ශත තිස් පහකි. වෙදමහත්තයා රුපියලේ කාසිය ජිනසෝමගේ කමිස සාක්කුවට දමා ශත පණහේ කාසිය යළි තම සාක්කුවට දමාගත්තේය.

"පුතේ මල්ලිව බලාගන්ඩ"

ශිෂ්‍ය නායකයාට එසේ පැවසූ වෙදමහත්තයා මිදුලට බැස නේවාසිකාගාරයේ ගේට්ටුව දෙසට පා නගන්නට විය. ජිනසෝම ඉවත්ව යන වෙදමහත්තයා දෙස බලා සිටියේය. ඔහුට එක්වරම පෙණුනේ වෙද මහත්තයාගේ බැනියමේ ඇඳී තිබුණු තීන්ත පැල්ලමය.

× × × ×

වෙදමහත්තයා පැමිණෙන තුරු ඇසිලින් නෝනා පමණක් නොව කුසුමලතා ද කළුවර වැටී බොහෝ වේලාවක් යන තෙක්ම ඉස්තෝප්පුවට වී මග බලා සිටියාය. එහෙත් වෙදමහත්තයා පැමිණියේ නැත.

"කුසුමෝ උඹ ගිහින් නිදාගනිං... මේ මනුස්සය කියට එයිද කවුද දන්නෙ? නිච්චියටම කොහාට හරි වෙලා බොනව ඇති..."

ඇසිලින් නෝනා කීවේ මෙතෙක් අන්ධකාරයට යොමුව තිබූ දෑස් එසේම තිබෙන්නට ඉඩහරිමිනි. "තාත්තටත් දුක ඇති අම්මේ" යි කියන්නට කුසුමලතාට සිතුණ නමුත් ඇ කිසිවක් නොකියා කාමරයට ගියාය.

වෙදමහත්තයා පිටට පෙනෙන්නට කඳුළු නොසැලූ නමුත් ජිනසෝම ගෙදරින් පිටවීම ගැන විශාල සාංකාවකින් පසුවෙන බව ඇසිලින් නෝනා නොදන්නවා නොවේ.

WWW.SINHALAELIBRARY.COM 26
Uploaded By Paba

සූංවි සන්දියේ ජිනසෝම යකඩ ඉන්නක් ඇනගෙන සතුල කුවාල කරගත් මොහොතේ වෙදමහත්තයා ඔහුවත් මසවාගෙන අඹුඩය පිටින්ම ගම්පහ ඉස්පිරිතාලෙට හතිලමින් දිව ගිය අපූරු ඇසිලින් නෝනාට හදිසියේම මතක් විය. ඒ වන විට මහ ගෙදර හොඳටම අබලන්ව තිබිණි. මහ වැස්සකට එහි කුස්සියේ බිත්තියක කොටසක් කඩා වැටුණේය. මහගෙදර තිබෙන ලී දඬු උපයෝගී කොට ගෙන කුඩා නිවෙසක් තනන්නට වෙදමහත්තයාත් ඇසිලින් නෝනාත් කතා කරගත්තේ ඒ බිත්තිය කඩා වැටුණු දවස්වලමය.

"දැන් මේ ගෙදර මුක්කු තියල හරියන්නෙ නෑ... බිත්ති ඔක්කොම තෙමිල බුරුල් වෙලා... පරාල හොඳටම දිරල... දැන් කොච්චර කාලයක්ද... සීයගෙ තරුණ කාලෙ හදපු ගෙයක්නෙ..."

ඊළඟ සතියේ සඳුදාම රපියෙල් බාස්උන්නැහේ ලවා ලනු අද්දවාගෙන පංචාංග ලිත ඇසුරෙන් සාදාගත් සුබ නැකතකින් "අච්චුවාරම" කැපූ වෙදමහත්තයා ඒ මොහොතේ සිට අනෙක් සියලුම වැඩකටයුතු නතරකොට අලුත් ගෙදර ගොඩනැගීම කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කළේය.

"ටිකක් රෑවෙලා එන්නං... කොහොමටත් තව තාප්ප වටයක් තියල තමයි එන්ඩ වෙන්නෙ"

ගුරුකමක් කරවා ගන්ඩ පැමිණි කෙනෙකුට වුවද වෙදමහත්තයා පැවසුයේ එවැන්නකි. හොඳ තැනක් බලා පස් කපා මැටි ඇනුවේ වෙදමහත්තයා විසිනි. ඇසිලින් නෝනා කළගෙඩි දෙකකින් වතුර ඇද්දාය. මැටි ගුලි කළේ ද ඇසිලින් නෝනා විසිනි. වෙදමහත්තයා අඹුඩයක් ගසාගෙන පලංචිය උඩට නැග තාප්පය ගොඩනැංවීය. ඇසිලින් නෝනා සාදන මැටි ගුලි වෙදමහත්තයා අසලට ගෙන ගියේ කුසුමලතා විසිනි. ජිනසෝම ද ඉඳහිට මැටි ගුලියක් දෙකක් ගෙන ගොස් දුන් නමුත් බොහෝවිට ඔහු ඒ අවට ගැවසෙමින් අනම් මනම් දේවල් කරන්නට කැමැත්තක් දැක්වීය.

මැටි ගුලි කරන තැනට මදක් ඔබ්බෙන් දමා තිබුණු පොල් කොටයකට ඔහු යකඩ ඉන්නකින් අනිමින් සිටියදී පොල් කොටයෙහි පැත්තක වැදුණු යකඩ ඉන්න ජිනසෝමගේ පතුලෙහි පතිත විය. සතුල සිදුරුවී ලේ ගලන්නට වූ අතර ජිනසෝම ලතෝනි දෙමින් කෑගසන්නට පටන් ගත්තේය. ඒ මොහොතේ



වෙදමහත්තයා සිටියේ අඩි හත අටක් උස පලංචියක නැගී තාප්ප බිත්තිය ගොඩ නංවමිනි. වෙදමහත්තයා දෙවරක් සිතන්නේ නොමැතිව පලංචියෙන් බිමට පැන්නේය. ජිනසෝමව මසවාගෙන අඹුඩය පිටින්ම පාරට දිව්වේය. ඇසිලින් නෝනා ද ඒ එක්කම වාගේ යමතමින් චිත්තයක් පටලවාගෙන මාටින් මුදලාලිගේ කඩේ පැත්තට දිව්වාය. ඇ එහි යන විටත් කඩේ ළඟ සිටි ගුණපාල මලයා වෙදමහත්තයාවත් ජිනසෝමවත් තම බයිසිකලයේ තබා ගෙන ගම්පහ ඉස්පිරිතාලය පැත්තට ගොස් තිබිණි.

"අම්මේ මහතුන් මල්ලිලාගෙ බල්ල බුරනව... තාත්ත එනව වෙන්ඩ ඇති..."

කුසුමලතාගේ හඬින් ඇසිලින් නෝනා තිගැස්සී බැලුවාය.

"මට මොකවත් ඇහුණෙ නෑ..."

"ඒ බල්ල ඔය විදියට බුරන්නෙ කවුරුහරි පාරෙ යනකොට තමයි"

ඇසිලින් නෝනාත් කුසුමලතාත් අන්ධකාරය දෙස බලා සිටියහ. වෙදමහත්තයාගේ ඡායාව කුප්පිලාම්පු එළියෙන් යම්තමට පෙනිණි.

"අදත් එන්නෙ හතර ගාතෙන්... අද වගේ දවසකවත් මේ මිනිහට බෑනෙ සිහියකින් ගෙදර එන්ඩ..."

"අනේ අම්මෙ කෑගහන්ඩ එපා ඔන්න... තාත්තටත් දුක ඇතිනෙ..."

කුසුමලතා කීවාය. "දුකට බීල හරියනවද"යි අසන්නට නොහැකිව ඇසිලින් නෝනාගේ තොල් පොටවල් ගැහෙන්නට විය.

"හතර ගාතෙන් ඇවිල්ලද... බැනියමේ ගන්ඩ දෙයක් නෑ..."

ඇසිලින් නෝනාගේ නෝක්කාඩුවට පිළිතුරු නොදුන් වෙදමහත්තයා දෙපසට වැනෙමින් ඇසිලින් නෝනා දෙස බලා සිටියේය. කුසුමලතාට සිතුනේ ලාම්පු කුප්පිය පොළොවේ ගසාවි කියාය.

"ඇසිලින් නෝනෙ ඒ බුරු ඇඳේ තිත්ත පැල්ලං ඒක උස්සගෙන ගිහිල්ල උර පන්නක් හම ගිහිල්ල... බොන්ඩ මගෙ ගාව සල්ලියක් තිබුණෙ නෑ බං... ගත පහළොවයි තිබුණෙ... උඹට මොකටද බොරු

WWW.SINHALAELIBRARY.COM 27
UNLIMITED
The spirit of Sri Lankan e-
www.sinhalaelibrary.com
Uploaded By Paba

කියන්නෙ ණයට හරි අරක්කු ටිකක් බොන්ඩ තමයි ගුණපාල ළමය ගාවට ගියේ... ජිනසෝම බෝඩිමේ නැවැත්තුව කිව්වාම ගුණපාල ළමය මට අරක්කු ටිකක් නිකං දුන්න. උගේ සන්තෝසෙට"

"ලැජ්ජ නැද්ද?"

"මොකටද ලැජ්ජ වෙන්නෙ...? ඌ හැළි අරක්කු විකුණනව තමයි... ඒත් උගේ හිත හොදයි... හිත හොඳ මිනිහෙකුගෙන් කෑවට බිව්වට මට ලැජ්ජාවක් නෑ බං... හැබැයි හිතේ කහට තියෙන එවුන්ගෙන් රාජභෝජනයක් දුන්නත් මට එපා... හැළි අරක්කු විකුණුවත් ඌ හිතේ කහටක් නැති එකෙක්"

වෙදමහත්තයා ලණු ඇඳ මත ඇලවුණේය. කුසුමලතා කාමරයට ගියාය.

"දරුවෙක් බෝඩිං කරන එක හොඳයි තමයි. ඒත් ඉතිං උපන්දා ඉඳල ගෙදර හිටපු කොල්ල දකින්ඩ නැතිකොට හිතට මොකක්ද වාගෙ... උන්ගෙ දියුණුවටනෙ... ඒකට ඉතිං හුඟක් දේවල් කැප කරන්ඩ වෙනව තමයි ඇසිලින් නෝනෙ... මෙලාකට ඌ බුරූ ඇඳේ තනියම බුදි ඇති.. හිතට දුකයි තමයි... ඒත් එච්ච එහෙම තමයි"

වෙදමහත්තයා තව තවත් මොනවාදෝ කීවේය. ඇසිලින් නෝනා චිත්ත පොටින් කඳුළු පිසිමින් කුස්සිය පැත්තට ගියාය.

× × × ×

## 6

ඇස්. ඇස්. සී. විභාගයෙන් අසමත් වූ හෙයින් කුසුමලතාට ගෙදර නැවතීමට සිදුවිය. ගෙදර වැඩවලට ඇගේ නැවතීම පහසුවක් වුවද ඇසිලින් නෝනාගේ හිතට නම් එය දැනුණේ බරක් ලෙසිනි. ඒ බර වඩාත් දැනෙන්නට වූයේ කමතේ ගෙදර ශ්‍රියානි නර්සිං විභාගයෙන් සමත්ව ඇතැයි යන ආරංචිය ලැබීමත් සමඟය. ශ්‍රියානි ඇස්. ඇස්. සී. විභාගයෙන් සමත්වී අවුරුදු දෙක තුනකට වඩා නැත. ඇස්. ඇස්. සී. විභාගයෙන් සමත්වී නම් කුසුමලතාටත් ඊළඟ නර්සිං විභාගයට පෙනී සිටින්නට ඉඩකඩ ලැබෙනවා නොවේදැයි සිතෙනවිට සිතෙහි තිබුණ බර කළකිරීමක් බවට පත්විය.

"ඉගෙන ගන්ඩ බැරිනං අපි කොටල පොවන්ඩද බං... මය ගෙදර වැඩපොළක් උගන්නපං"

වෙදමහත්තයා මේ ප්‍රශ්න දෙස බලන්නේ බොහොම සැහැල්ලුවෙනි. එහෙත් දරුවෙකුගේ ප්‍රශ්නයක් කෙරෙහි මීට වඩා උනන්දු විය යුතු නොවේදැයි ඇසිලින් නෝනාට සිතිණි. උස් මහත්වූ ගෑණු දරුවෙක් ඉගෙන ගන්නේත් නැතුව රස්සාවක් කරන්නේත් නැතුව ගෙදර සිටීම ඇසිලින් නෝනාට නම් දිනෙන් දින වැඩි වෙමින් දැනෙන මහා බරක් බවට පත් විය.

කුසුමලතාව ගම්පහ ටයිපිං පන්තියකට යවන්නට ඇසිලින් නෝනා ඉටා ගත්තේ ඒ නිසාය.

"ටයිපිං පන්තියක්" පිළිබඳ අදහස මුලින්ම ඇගේ සිතට දැම්මේ පීරිස් හාමිනේ විසිනි. ගම්පහ ඉස්පිරිතාලයේ "ඇටැන්ඩන්" කෙනෙකු වූ ඈ ගමේ අනිත් ගැහැණුන්ට වඩා කාරණා කාරණා දන්නා කෙනෙකැයි ඇසිලින් නෝනාට සිතුණේ මේ ගැන වැඩිදුර

SL UNLIMITED
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 28
Uploaded By Paba

කතාකරන්නට වූ පසුවය. පීරිස් හාමිනේ ඇගේ ලොකු දුවද ගම්පහ නොතාරිස් කෙනෙක් ළඟ ටයිපිං රස්සාවක් කරයි.

"ආණ්ඩුවේ රස්සාවල් හොයනවයි කියන එක ලේසි පාසු නාටියක්යැ. අනික් එක ගෑණු දරුවො ගෙදර නාකිවෙන්ඩ දෙන්ඩත් බැනෙ.. විජේසුන්දර නොතාරිස් මහත්තය පද්මිණීට පෑණෙන මුදලක් දෙනව... පිට වැඩත් හම්බවෙනවනෙ... මට හිතෙනව අවුරුදු ගණනාවක් කැත කුණු අතගාලා මම ගන්න පඩියට වඩා මුදලක් පද්මිණී හොයාගන්නවද කියලත්... අඩුගානෙ දීග කල යනකොට ඕනෑ කරන බඩු ටිකවත් ඒකි හදාගන්නවනෙ..."

පීරිස් හාමිනේගේ ටයිපිං වරුනාව ඇසිලින් නෝනාගේ සිතට තදින්ම කාවැදුණේය. රාත්තිරියේ කෑම කා අවසන්ව ඉස්තෝප්පුවට වී බුලත් විටක් හපමින් සිටි වෙදමහත්තයා අසලින්ම වූ පුටුවේ ඉඳගත් ඇසිලින් නෝනා මේ අදහස ඔහුට දැම්මාය.

"ඕව නරක දේවල් නෙමෙයි. ගෙදර නිකං නාකිවෙනවට වඩා යමක් කමක් ඉගෙනගන්න එක හොඳා තමා... හැබැයි ඉතිං ගෑණු ළමයෙක් ටවුමෙ පන්තියකට යවනවයි කියන එක පරිස්සමින් කරන්ඩ ඕනෑ වැඩක්.. ඔය පීරිස් කාරයගෙ දුව ගැනත් එක එක කයිකතන්දර තියෙනවනෙ. නොතාරිස් කාරයා එක්ක යාළුයි කියල"

තමාගේ කතාවෙන් ඇසිලින් නෝනා බලාපොරොත්තු කඩකර ගෙන නිහඬ වූ බව වෙදමහත්තයාට දැනිණි. වෙදමහත්තයා ඊළඟ විනාඩියෙ කටහඬ අවදි කෙළේ කුසුමලතා ගැන සිතා නොව ඇසිලින් නෝනා ගැන ඇතිවූ සානුකම්පික හැඟීමක් නිසාය.

"නෑ ඉතිං ඕව කටකතා වෙන්ඩත් බැරි නෑ. දන්නෙ නැද්ද ගමේ එවුන්ගෙ හැටි. පීරිසියා කාරයොනෙ. උඹ කුසුමලතා එක්ක කතා බහ කරල බලපංකො. හැබැයි ඉතිං වියදං තමයි"

වෙදමහත්තයා එසේ කියමින් මඳක් ඉදිරියට නැමී මිදුලට වැටෙන සේ බුලත් කෙළ පාරක් විද්දේය.

"එහෙම වුණොත් මාංකඩේ කඩේටත් කඩයප්පං ටිකක් යවන්ඩයි හිතාගෙන ඉන්නෙ..."

"ඒකට මාටින් මුදලාලි කැමති වෙන එකක් නෑ..."

"අනේ මන්ද.. ආප්ප වට්ටියක් අරගෙන කඩගානෙ යන්ඩ [illegible] කියල කුසුමලතා දෙතුන් දවසක්ම කිව්ව..."



"ඔව් ඉතිං... ඒකිත් දැන් හොඳටම උස් මහත් වෙලානෙ...දැන් හැදෙන ළමිස්සියො ඕවගෙ දේවල්වලට කැමැති නෑ තමයි. එහෙම වුණොත් ගුණසෝමට කියාපං..."

වෙදමහත්තයා නැවතත් බුලත් කෙළ පාරක් විද්දේය.

"කොල්ලෙක් නං රස්සාවක් නැතුවත් හොඳ තැනක් බලල දීග දෙන්ඩවත් බැරියැ. මම මේ කල්පනා කෙරුවෙ ගුණසෝම ගැන. පොත පතේ වැඩට කිසි උනන්දුවක් නෑ වාගෙ... කොල්ලො එක්ක නැටිල්ලම තමයි... මේ සැරෙත් පන්තියෙ හොඳටෝම පල්ලම් බැහැල කියල කුමාරපේලි මහත්තය සමුපෙ ළඟදි හම්බවෙලා කිව්ව... මඩ පෝර ටික ගන්ඩ බලන්ඩ ගිය වෙලාවෙ හම්බවෙලා..."

වෙදමහත්තයා පවසන්නේ සැබෑවකි. ගුණසෝමගේ වැඩවල කිසි පිළිවෙළක් නැත. ඔහු ජිනසෝමගේ අනික් පැත්තය. ඉස්කොලෙ ඇරී ආපසු පැමිණි වෙලාවේ පටන් හැන්දෑ වෙනතුරුම කරන්නේ ගමේ කොල්ලන් සමග නටන එකය. අටේ පන්තියේ වුවද පහේ පන්තියේ ළමයෙකුගේ තරම්වත් දැනුමක් නැත. ජිනසෝම මේ කාලයේ ලියූ රචනා ඇස්. ඇස්. සී. පන්තියේ ළමයෙකුටවත් ලියාගත නොහැකි තරම් වූ ඒවා බව කුසුමලතා කිහිපවරක්ම පැවසූ බව ඇසිලින් නෝනාට සිහිපත් විය. එහෙත් ඇ ඒ බැව් වෙදමහත්තයාට කියන්නට ගියේ නැත.

ගුණසෝමගේ වැඩ ගැන වෙදමහත්තයා තුළ තිබූ ඉවසීම අවසන් වූයේ පුංචි බණ්ඩාගේ සිද්ධියත් සමඟය.

මේ සිද්ධිය වූ දවසේ වෙදමහත්තයාගේ වැස්සිය බැඳ සිටියේ දංගොල්ලෑවේය. සුවාරිස්ගේ අවසරය ඇතිව දංගොල්ලෑව පැත්තක ඇති ඕවිටේ පුංචි බණ්ඩා විසින් පාත්ති හත අටකින් යුක්ත වූ බුලත් කොටුවක් වවා තිබිණි. ඔහු බුලත් වගාවෙන් සෑහෙන ආදායමක් ලබාගත් නමුත් බිං කුලිය වශයෙන් තමාට දෙන්නේ බොහොම සුළු මුදලක් යැයි සුවාරිස් කිහිපදෙනෙක් සමගම කියා තිබිණි.

ගුණසෝම වැස්සිය බැඳීමට යන විටද පුංචි බණ්ඩා බුලත් පාත්තිවලට වතුර දමමින් සිටියේය. මාටින් මුදලාලිගේ කඩේ [illegible] අයිස්ක්‍රීම් වැන එකක නලාහඬ ගුණසෝමට ඇසුණේ කැබැල්ල මුලක ගැටගසා තිබුණ තැනින් වැස්සිය ලිහා ඒව ඔබ්බෙන්

WWW.SINHALAELIBRARY.COM 29

Uploaded By Paba

වූ දවට ගහ ළඟින් බදින්නට ඇදගෙන යන අතරේය. ඒ අසලම තිබූ ඇඹිල්ල ගසක වැස්සිය යම්තමින් ගැටගැසූ ගුණසෝම සුපුරුදු දෙවැට දිගේ නොගොස් පුංචි බණ්ඩාගේ බුලත් කොටුව අසලින් වූ අඩිපාරෙන් දුවගොස් ඔව්රේට බඩවැටියෙන් රිංගුවේය. ඉන්පසු මාටින් මුදලාලිගේ කඩය දෙසට එක හුස්මට දිව්වේය. තිලකෙ මාමලාගේ වත්තේ තිබුණු බැබිල ගාලක පැටලී බිම ඇද වැටුණු නමුත් වහාම නැගී සිටි ඔහු දණහිස අත ගැවේද දුවන ගමන්මය. ඒ වනවිටත් අයිස්ක්‍රීම් වෑන් එක වටා කොල්ලන් කෙල්ලන් හත්අට දෙනෙක්ම ගැවසෙමින් සිටියහ.

බයිසිකල් කාරයින්ගේ අයිස් පලමක් ගත පහකි. වෑන් එකේ අයිස් පලමක් ගත දහයකි. එහෙත් බයිසිකල් කාරයින්ගේ අයිස්පලම මෙන් දෙගුණයක් තරම් විශාලය. ක්‍රීම් රස මෙන්ම ශීතල ද වැඩිය. සව් කඩදාසියකින් ඔතා ඇති අයිස් පලමේ කෝටුවද සවිමත්ය. මටසිළිටුය.

බයිසිකල් කාරයන් සතියකට වතාවක් දෙකක් ගම හරහා නලා හඬවමින් යන මුත් අයිස් පලම් වෑන් එක මාසයකට වතාවකට වඩා පැමිණෙන්නේ නැත.

අයිස්පලම් වෑන් එක ළඟ නොරැඳී ගුණසෝම ගෙදර දිව්වේ ඇසිලින් නෝනාගෙන් ගත දහයක් ඉල්ලා ගන්නටය. බයිසිකල් කාරයන්ගේ අයිස් පලම් කනවාට එතරම් කැමැත්තක් නොදක්වන ගැමි කාන්තාවෝ අයිස්ක්‍රීම් වෑන් එක පැමිණි කල්හි තම දරුවන්ගේ ආසාවට ඉඩදෙති. ඇතැම් විට වැඩිහිටියෝද අයිස් පලම්වල රස බලති. ගුණසෝම ඉල්ලා සිටි සැණින්ම වාගේ ඔහුට ගත දහයක් ලැබුණේ ඇසිලින් නෝනා තුළද මේ අදහස තිබුණු හෙයිනි. ගත දහය අත මිට මොළවාගත් ගුණසෝම නැවතත් එක හුස්මට අයිස්ක්‍රීම් වෑන් එක ළඟට දිව්වේය. අයිස්පලම් ලෙවකමින් වෑන් එක අසලම රැඳී සිටිමින් සිටි කොල්ලන් අතරට ගුණසෝමද එකතු විය.

තමන්ගේ අයිස්පලම් අවසන් වුවද ඇතැම් දරුවෝ එතැනින් ඉවත්ව නොගියහ. තව තවත් යාළු මිත්‍රයින් පැමිණ අයිස් පලම් මිලදීගන්නා දෙසත් ඔවුන් රස බලන දෙසත් බලා සිටියහ. ඇතැම් දරුවෝ අයිස්පලම් ගත් සැණින් මොහොතකවත් එතැන නොරැඳී [illegible] ගෙවල්වලට දිවූහ. එසේ කළෝ වැඩිපුරම ගැහැණු දරුවෝය. ඇතැම් විට ගෙදර සිටින තරුණියක් තම නැගණිය අයිස් පල[illegible]



රැගෙන එනතෙක් ගෙදරට වී බලා සිටියාය. කෙසේ වුවද අයිස්ක්‍රීම් වෑන් එක පැමිණෙන මොහොත ගමේ දරුවන්ගේ සිත්පුරා මහත් වූ සතුටක් ගලා යන මොහොතක් වන්නේය. ගමේ දරුවන් ඒ හඬ ඇසුණු කල්හි ''පිස්සුවෙන් මෙන්'' ඒ දෙසට දුවන්නෝ වෙති.

අයිස්පලම් ලෙව කා අවසන් වූ කොල්ලන් ගෙන් කොටසක් ආපසු නිවෙස්වලට ගිය නමුත් හත් අටදෙනෙක් ජිල්බෝල සෙල්ලම පටන්ගත්හ. ගුණසෝම ළඟ ජිල්බෝල නොතිබූ නමුත් ඔහු ආපසු ගෙදර නොගොස් ජිල්බෝල කොටුව අසලට වී බලා සිටින්නට විය.

''ගුණසෝම... ගුණසෝම...''

වෙදමහත්තයාගේ කටහඬ ඇසුණේ ගුණසෝම ජිල්බෝල සෙල්ලම දෙස එසේ බලා සිටින අතරතුරේය.

''අන්න ගුණසෝමට අඩ ගහනව... අදනං වෙදමහත්තයාගෙන් කෝටුපාර කන්ඩ වෙයි...''

බයිසිකලයේ ඉඳගෙනම ජිල්බෝල සෙල්ලම දෙස බලා සිටි සෝමසිරි අයියා කීවේය. ගුණසෝමගේ සිතට ද බියක් දනෙන්නට පටන්ගත්තේය. තාත්තාගේ ''අඬගැසීම'' වෙනදා නොවූ තරම් උස් හඬකින් පිටවූ බවක් ගුණසෝමට දැණිනි. ජිල්බෝල සෙල්ලමට කොහොමටත් වෙදමහත්තයා කැමැති නැත. ඔහු එය හඳුන්වන්නේ සූදුවක් ලෙසිනි. මීට පෙරද තමාට ඒ ගැන තරවටු කළ සිද්ධියක් පිළිබඳව ගුණසෝමට සිහිපත් විය.

ඔහු හෙමින් සීරුවේ ගෙවල් පැත්තට යාමට පටන් ගත් නමුත් එය සුළු වේලාවකින් දිවිල්ලක් බවට පත්විය. වෙදමහත්තයා සාලයේ සිටි නමුත් ඔහුගේ කටහඬ ගුරුපාරේ ඇතට ඇසෙන තරමට වේගවත්ව තිබිණි. ගුණසෝමගේ සිත තුළ යම්තමින් ඇතිවූ භීතිය ගේ ආසන්න වෙත්ම දෙපා අඩපණ වන තරමටම උත්සන්න වී තිබුණේය.

''කොහෙද තෝ ගියේ?''

සාලයේ පුටුවක සිටි වෙදමහත්තයා එක්වරම නැගිට ගුණසෝමගේ ඇගට පැන අතින් අල්ලා ඇද්දේය. වෙදමහත්තයා සිටිගේ [illegible]වෝම බීමත්වය. සාලයේ තවත් පුටුවකට බරව් සිටි

WWW.SINHALAELIBRARY.COM 30
Uploaded By Paba

පුංචි බණ්ඩාද හිස වනමින් සිටියේය. ඔහුද සිටියේ බිමතිනි. වෙදමහත්තයා පුටුව අස්සේ තිබුණ ජේර කෝටුව අතට ගත්තේය.

"වෙදමහත්තය ඕකට ගහන්ඩ ඕනැ නෑ... ඉස්සෙල්ල අහල බලමු... මට සල්ලි ඕනැකමක් නෑ... පිහිය තිබුනාම ඇති"

පුංචි බණ්ඩා ඒ වචන ටික පිට කොළේ ගොත ගසමිනි. ඒ කිසිවක් නෑසුනාක් මෙන් ජේර කෝටුව එසවූ වෙදමහත්තයා "කියාපිය කෝ සල්ලියි පිහියයි" යි කියමින් ගුණසෝමගේ පිට හරහා පහරවල් කිහිපයක්ම ගැසුවේය.

"අනේ තාත්තෙ... අනේ තාත්තෙ... මං ගත්තෙ නෑ..." යි කෑගසමින් ගුණසෝම බිම පෙරළෙන්නට විය. මෙතෙක් වේලා සිදුවන්නේ කුමක්දැයි බලා සිටි ඇසිලින් නෝනා වෙදමහත්තයා වෙතට පැන අතෙහි එල්ලුනාය.

"මොකද යකෝ එක එකාගෙන් බීල ඇවිල්ල මගෙ කොල්ලව මරන්ඩ හදන්නෙ... මේක මගෙන් ගත දහයක් ඉල්ලගෙන අයිස් පලං කන්ඩ ගියේ"

එහෙත් වෙදමහත්තයා ඇගේ අත ගසා බසා දමා බිම පෙරළෙන ගුණසෝමගේ තට්ටමට තවත් පහරවල් කිහිපයක්ම ගැසුවේය. මේ සිද්ධිය තවත් බලා සිටිය නොහැකි වූ තැන කුසුමලතා අත් දෙකින්ම මුහුණ වසාගෙන කාමරයට දිව්වාය. ඇසිලින් නෝනා නැවතත් අතේ එල්ලුනාය. ඒ අවසරයෙන් ගුණසෝම ගෙයින් පිටතට පැන කෑගසමින්ම දුවන්නට පටන් ගත්තේය. වෙදමහත්තයා ද ඔහු පසුපස පැන්නුවේය. ටික දුරක් දුව ගිය ගුණසෝම පය පැකිලී බිම ඇද වැටුණේය. වෙදමහත්තයා ඔහු අතින් අල්ලාගෙන නැවතත් පහර දෙන්නට පටන් ගත්තේය.

"කියාපිය කෝ සල්ලියි පිහියයි"

ගුණසෝමගේ ලතෝනියට උඩින් වෙදමහත්තය කෑගසන හඬ මාටින් මුදලාලිගේ කඩයටත් ඇසුණේය. ජිල්බෝල සෙල්ලම නැවැත් වූ කොල්ලෝ බියපත්ව මේ දෙස බලා සිටියහ. ගුරුපාර දිගේ යමින් සිටි ඇක්මොන් අයියා බයිසිකලය වැටඉන්නකට හේත්තු කොට අඩියට දෙකට වෙදමහත්තයා ළඟට විත් කෝටුව උදුරා ගත්තේය.

"ළමයින්ට මෙහෙමත් ගහනවද වෙදමහත්තයා? හරකුන්ට වාගෙ..."



"පුංචි බණ්ඩගෙ සල්ලියි පිහියයි හොරකං කරල... මේක මටත් ගමේ ඉන්ඩ දෙන්නෙ නෑ... ලොකු එකා සිස්සත්තෙං පාස්වෙලා බෝඩිමේ... මේක ගම වටේ හොරකං කර කර ඇවිදිනව..."

මාටින්ගේ කඩයට පැමිණ සිටි දෙතුන් දෙනෙක්ම වෙදමහත්තයාගේ කෑ හඬ ඇසී එතැනට ආහ.

"මං ගත්තෙ නෑ ඇක්මොං මාමේ..."

ගුණසෝම ඉකිගසමින් කීවේය. ඇක්මොන් අයියා ගුණසෝමව තමන් ළඟට ඇද ගත්තේය.

තිලකෙ පුංචි එතැනට ආවේ මේ අතරවාරයේදීය. ඈ වෙදමහත්තයා දෙසත් ගුණසෝම දෙසත් ඇක්මොන් අයියා දෙසත් බැලුවාය.

"මොකද මේ වෙදමහත්තය කවදාවත් නැතුව?"

තිලකෙ පුංචිගේ ප්‍රශ්නයට වෙදමහත්තයා පිළිතුරක් දෙනවා තබා මුහුණ ඔසවා බැලුවේවත් නැත. ඔහු දූන් මිනිත්තු කිහිපයක් තිස්සේම සිටින්නේ බිම බලාගෙනය.

"සල්ලියි පිහියයි හොරකං කරල"

වෙදමහත්තයා වෙනුවට පිළිතුරු දුන්නේ පුංචි බණ්ඩාය.

"කාගෙද?"

"මගෙ"

තිලකෙ පුංචි වටපිට බලා අන්තිමේදී පුංචි බණ්ඩා දෙස කෙළින්ම බලා සිටියාය.

"ඔහොම හිටිමු පොඩ්ඩක්"

තිලකෙ පුංචි එසේ කියා ප්‍රශ්නාර්ථ බැල්මක් ඇක්මොන් අයියාට යොමු කොට වැට පැන ඇගේ ගෙවල් පැත්තට ගියාය. තිලකරත්න බාප්පා මියගිය පසුව වුවද ඔහු මෙන්ම ගමේ කොයි කවුරුත් සමඟ කතා බහ කරමින් මඟුල් තුලාවලදී කාට කාටත් උදව් පදව් කරමින් තනිපංගලමේ ජීවත් වන්නට වූ ඇට 'තිලකෙ පුංචි' යනුවෙන් බාල මහළු කොයි කවුරුත් පාහේ පොදුවේ ඇමැතූහ.

"තිලකෙ පුංචි මොකක් හරි දන්නව"

ඇක්මොන් අයියා වට පිට බලමින් කීවේ කාටත් ඇසෙන [illegible] ගහනයේදී ඔහු වෙදමහත්තයා දෙස බැලුවේය. මෙතෙක්

WWW.SINHALAELIBRARY.COM 31
Uploaded By Paba

… බිම බලාගෙන සිටි වෙදමහත්තයා පිල්බෝල ගසන හිටගෙන බිම බලාගෙන සිටින්නට පාවිච්චි කොල්ලන් තමන්ගේ වාරය එනතෙක් ඉඳගෙන සිටින්නට පාවිච්චි කරන කොට කැල්ල මත ඉඳගෙන බිම බලාගෙන සිටියේය. කුසුමලතා නොපැමිණියද ඇසිලින් නෝනා පැමිණ වෙදමහත්තයා දෙසත් අවසානයේදී ඇක්මොන් අයියා දෙසත් බැලුවාය.

"තිලකෙ පුංචි මොකක් හරි දන්නව... ගෙවල් පැත්තට ගිහින් එන්ඩ ගියා..."

තිලකෙ පුංචි ආපසු පැමිණියේ උල් පිහියක්ද රුපියල් දෙකේ පනේ නෝට්ටු හතරක් පහක්ද අතැතිවය.

"මේකද පිහිය?"

"ඕක තමයි..."

පුංචි බණ්ඩා පිළිතුරු දුන්නේය. වෙදමහත්තයා හිස ඔසවා බැලුවේම නැත. තමාට කුමක් හෝ වැරදීමක් සිදුව ඇති බැව් මේ වන විට ඔහුට දැනෙන්නට පටන්ගෙන තිබිණි.

"පොච්චියේ වෙදමහත්තයො... ඇයි මේ දරුවට ගැහුවෙ?"

තිලකෙ පුංචි ගුණසෝමව තමන් වෙතට ඇදගත්තාය. ඇසිලින් නෝනා පුදුමයට පත් වී බලා සිටියාය.

"අපේ දර මැස්ස එහා පැත්තෙ බල්ලො දෙන්නෙක් පොරකනව ඇහිල මම නිකමට බැලුව පොල් ගෙඩියක් ලෙලි ගහ ගහ ඉන්න කොට. එතකොට මම දැක්ක එකෙකුගෙ කටේ මොකක් හරි තිබිල විසිවෙනව. මම කෑගහපුවාම බල්ලො දෙන්න දිව්ව එතන තිබුණෙ මෙන්න මේ පිහියයි සල්ලි කොළ ටිකයි. පිහිය තිබුණේ බිම ඇනිල"

වෙදමහත්තයාගෙ හිස හොඳටෝම පහළට කඩා වැටී ඇත. පුංචි බණ්ඩාද බිම බලාගෙන සිටියා මිස හිස ඔසවා බැලුවේ නැත.

"ගිහින් බලාපල්ල තවත් එතන සල්ලි තියෙනවද කියල"

ඇක්මොන් අයියා කීවා පමණි. කොල්ලො හත් අට දෙනෙක්ම තිලකෙ පුංචිලාගේ වත්තට දිව ගියහ.

"දැන් තමුසෙ කියනවකො බලන්ඩ මොකද වෙලා ඇත්තෙ කියල"



ඇක්මොන් අයියා කීවේ පුංචි බණ්ඩා දෙස තියුණු බැල්මක් හෙලමිනි. එහෙත් පුංචි බණ්ඩා කතා කරනවා තබා හිස ඔසවා බැලුවේවත් නැත.

තිලකෙ පුංචිලාගේ වත්තට දිව ගිය කොල්ලන් විනාඩියකින් දෙකකින් ආපසු දුව ආවේ ජයග්‍රාහී හඬක්ද නගමිනි.

රුපියල් දෙකේ නෝට්ටුවක්ද බල්ලන් විසින් අඩක් කා දමා තිබුණ හම් කොපුවක්ද ඔවුහු ඇක්මොන් අයියා අත තැබීය. ඔහුගේ මුහුණ කළු වී ගියේය.

"ඔයි... පුංචි බණ්ඩො... තමුසෙගෙ දාඩිය ගඳට බල්ලො මේක අරගෙන ගිහින් පොරකන කොට ඒක ඇතුලෙ තිබුණ සල්ලියි පිහියයි විසිවෙලා... ඒකනෙ ඔයි වෙලා තියෙන්නෙ... තමුසෙ වෙදමහත්තයට බොන්ඩ දීල අපරාදෙ මේ ළමයට ගැස්සෙව්ව... ඔයි තමුසෙත් බැඳල දරුමල්ලො හිටියනං මේ අපරාදෙ කොරන්නෙ නෑ... දරුවෙක් කෑගහනකොට වේදනාව දැනෙන්නෙ දෙමව්පියන්ට ඔයි..."

ඇක්මොන් අයියා පුංචි බණ්ඩාගේ මූණටම කීවේය. එහෙත් ඔහුගේ කතාව ඊ පහරක් මෙන් පැමිණ සිදුරු කෙළේ වෙදමහත්තයාගේ පපුවය. ඔහු ඉකිගසන්නට පටන්ගත්තේය. එය වෛරී මරගාතේ කරන ඉකි ගැසීමක් නොව ඊට වඩා දෙයක් යැයි පොඩි උන්ට ද වැටහිණි.

"දැන් ළමයි යනවල ගෙවල්වලට"

සෝමසිරි එතැන බලා සිටි ළමයින් පන්නා දැමීය. ළමයින් ඉදිරියේ වෙදමහත්තයා ඉකිගැසීම එතරම් හොඳ දෙයක් නොවේ යැයි ඔහු සිතුවා විය හැකිය.

"වෙදමහත්තයටත් මේවා හොඳ පාඩම් එක එක වාහෙලගෙන් බොන්ඩ යනවට"

එසේ කියමින් ඇක්මොන් අයියා යන්නට ගියේය.

පුංචි බණ්ඩා රුපියල් පනේ නෝට්ටු දෙකක් ගෙන ගුණසෝම දෙසට දිගු කළේය.

"මිනිහට බොන්ඩ දීල කොල්ලට ගස්සෝල... දැන් මෙතන එනව සල්ලි දික්කරන්ඩ..."

ඇසිලින් නෝනා කඩා පැන්නාය.

WWW.SINHALAELIBRARY.COM 32
Uploaded By Paba

ගෙවල් පැත්තෙ..."

"අපි යමු අපේ ගෙවල් පැත්තෙ..."

තිලකෙ පුංචි ගුණසෝමගේ අතින් අල්ලා ගනිමින් කීවේ ඇසිලින් නෝනාට හොඳටම කේන්ති ගොස් ඇති බවට පෙනුණ හෙයිනි. පුංචි බණ්ඩා දෙස අවසාන වරටත් රවා බැලූ ඇසිලින් නෝනා තිලකේ පුංචි පසුපසින් ගොස් ඇත් සමගම වැටෙන් රිංගුවාය. ගෙදරට ගොඩ වූ සැණින් ගෙතුළට ගොස් තෙල් කුප්පියක් ගෙන ආ තිලකෙ පුංචි එයින් ටිකක් අත්ලට ගෙන ගුණසෝමගේ පිටෙහි තිබුණු තෝටු පාරවල් මත තැවරුවාය.

"මේ මිනිහ හරකෙකුට වගේ ගහල තියෙන්නෙ"

"හිත හොඳ මිනිස්සුන්ට කේන්ති ගියාම ඔහොම තමයි ඇසිලින් නෝනෙ... වෙදමහත්තය නපුරු මිනිහෙක් නෙමෙයි. ඒත් ඉතිං ටිකක් කට ගා ගත්තම හරි වෙනස් කියල ගමේ උන් දන්නව. ඒත් මමත් දැකල නෑ මෙච්චර කේන්ති ගිය දවසක්... ඔන්න බලාපං මං කියන්නං මේ ගැන වෙදමහත්තය හොඳටෝම දුක් වෙනව... හෙට උදේ වෙරි නැතිවුණාම"

ගුණසෝමගේ පිට පිරිමදිමින් තිලකෙ පුංචි බොහෝ දේවල් කියවන්නට පටන් ගත්තාය. ගෙදර තනිපංගලමේ සිටින නිසා කවුරුන් හෝ කතාවට අසුවුවහොත් ලෙහෙසියෙන් අත් නොහරින බැව් ගමේ කවුරුත් දන්නා දෙයකි. සිදුවූයේ කුමක්දැයි නොදන කුසුමලතා තවමත් බියට පත්ව ගෙදර තනියම සිටින හෙයින් ඇසිලින් නෝනාට අවශ්‍ය වූයේ හැකි පමණ ඉක්මණින් ගුණසෝමත් සමග ගෙදර යාමටය.

"ඔය පුංචි බණ්ඩා කියන එකා කොහෙන් ආපු එකෙක්ද කවුද දන්නෙ ඇසිලින් නෝනො... ආපු රටක් ගමක් කවුරුවත් දන්නෙ නෑ... ඉස්සෙල්ල පන්සලට ආවා... එතන හාමුදුරුවො රවට්ටගෙන කාලයක් හිටිය... ඊට පස්සෙ කුලී වැඩ කර කර ගම පුරා ඇවිද්දා... අන්තිමට පුවාරිස්ව රවට්ටගෙන දංගොල්ලැවෙ බුලත් හිටවන්ඩ පටන් ගත්ත.... කසාදයක් නෑ... තෑදෑයෙක් නෑ... ඔය මිනිහ ගැන එක එක කතා හැදිලත් තියෙනවනෙ... අපට ඕව වැඩක් නෑ... ඒත් මේ කොල්ලට ගස්සෙපු එක ගැන තමයි මට කේන්ති..."

තිලක පුංචිගෙ කතාවලට හුම්ටි තබන්නට ගියහොත් කතාව දිග්ගැසෙන්නට ඉඩ ඇති හෙයින් ඇසිලින් නෝනා නිහඬවම සිටියාය.



"එහෙනං මේ තෙල් කුප්පියත් අරගෙන පලයං"

"ගෙදරත් ඇති තිලකෙ පුංචි... කුසුමලතා මෙලාකට බයවෙලා ඇති"

ගෙතුළට ගිය තිලකෙ පුංචි කෙසෙල් ගෙඩි දෙකක් ගෙනැවිත් ගුණසෝමට දෙමින් "උඹ ඕව ගණං ගන්ඩ එපා පුතේ" යි කියමින් හිස අතගෑවාය.

ඇසිලින් නෝනා මිදුලට බැස්සේ "තිලකෙ පුංචි නැත්නං කොල්ල තාමත් ගුටිකනව" යි කියමිනි.

"මං බයවෙලා හිටියෙ මොකද පරක්කු කියල"

ඇසිලින් නෝනාත් ගුණසෝමත් ගෙට ගොඩවදින විටම කුසුමලතා කීවාය. ඇසිලින් නෝනා එයට පිළිතුරු දෙන්නට ගියේ නැත. "වෙනිවැල්ගැට ටිකක් ලිපේ තියාපං" යි කියමින් ගුණසෝමට ලඟු ඇඳේ මුනින් අතට හාන්සි කරවූ ඇසිලින් නෝනා කාමරයේ රාක්කයේ තිබුණු තෙල් කුප්පියක් ගෙනැවිත් ඔහුගේ පිටෙහි තවරා ඇතිල්ලුවාය.

"හැමතැනම පලූ... මේ මිනිහට මොන යකා වැහුනද මන්ද..."

ඇසිලින් නෝනා තමාටම කියාගත්තාය. කුසුමලතා කුස්සියේ සිට ඉස්තෝප්පුවට ආවාය. ගුණසෝම දෙස මොහොතක් බලා සිට යළි කුස්සියට ගියාය. කිහිප විටක්ම මෙසේ එහා මෙහා ගිය නමුත් ඇගේ සිතේ ඇතිවූ චංචල බව අඩුවූයේ නැත. සීනි බෝතලයත් සමග වෙනිවැල් ගැට කෝප්පය ලඟු ඇඳ අසලින් තැබූ ඈ ඒ අසලම තිබූ පුටුවෙහි ඉඳගත්තාය. රෑ බෝ වූ නමුත් වෙදමහත්තයා ගෙදර ආවේ නැත. ඇසිලින් නෝනා ලඟු ඇඳ මත ගුණසෝම සමග ඇල වී සිටි අතර කුසුමලතා පුටුවට වී ඉරුපාර දෙස බලා සිටියාය.

"තියෙන දෙයක් කාල උඹ බුදිය ගනිං..."

එහෙත් කුසුමලතා කාමරයට ගියේ නැත. පුටු බාපත මත ඇලවූවාය. කුප්පි ලාම්පුවේ සිල සුළඟට නිවී ගියේය.

වෙදමහත්තයා කෙඳිරිගාන හඬ කුසුමලතාට ඇසුණේ සිහිනයෙන් මෙනි.

"අම්මෙ තාත්තා කෙඳිරිගාන සද්දයක් ඇහෙනව..."

WWW.SINHALAELIBRARY.COM 33
Uploaded By Paba

ඇසිලින් නෝනා ලඳු ඇඳේ සිට නැගී සිටින සද්ද බද්ද ඇසිණි.

"ලාම්පුව සුළඟට නිවෙන්ඩ ඇති... මටත් නින්ද ගියා දන්නෙම නැතුව"

"කුස්සියට ගිහිං පත්තු කරගෙන වරෙං..."

"අම්මාපල්ල මේ මනුස්සය නින්ද අපට තියෙන කරදරයක්"

ඇසිලින් නෝනා ලඳු ඇඳ අතපත ගාමින් නැගී සිටියාය. කුසුමලතා ලාම්පු කුප්පිය දල්වාගෙන ඉස්තෝප්පුවට පැමිණ එය තබා මිදුලෙන් එපිට බැලුවාය. වෙදමහත්තයා වැටී සිටිනු ඇට පෙනිණි.

"අම්මේ අතන තාත්ත වැටිල..."

කුප්පිලාම්පුවත් රැගෙන අඩියට දෙකට එතැනට ගියාය. වෙදමහත්තයාට සිහියක් නැත. ගොර ගොර හඬින් හුස්ම ගන්නා හඬ නැගෙයි. මධ තැවරුණු සරම බුරුල්වී ගැලවී තිබිණි.

සරම සකස් කළ ඇසිලින් නෝනා "කුම්පි ලාම්පුව ඉස්තෝප්පුවෙන් තියල ඇවිත් පැත්තකින් අල්ලපං" කීවාය. වෙදමහත්තයාව වත්තන් කරගෙන පැමිණි ඇසිලින් නෝනාත් කුසුමලතාත් පැදුරක් එලා ඉස්තෝප්පුවේම නිදාගන්නට සැළැස්වූවාය. වෙදමහත්තයා ගොරවන්නටත් ඉදහිට දොඩවන්නටත් පටන්ගත්තේය. දොඩවන කිසිවක් පැහැදිලිව නැති වූ නමුත් "පුංචි බණ්ඩ බල්ල... මං මගේ කොල්ලට ගැහුව... හාමුදුරුවනේ..."

වැනි වචන අතරින් පතර ඇසුණේය.

× × × ×

# 7

ගුණසෝමට පහරදීමේ සිද්ධියෙන් පසු වෙදමහත්තයාගේ හැසිරීම බොහෝ සෙයින් වෙනස් විය. ඔහු වේල් දෙක තුනක්ම කෑවේ නැත. කා සමඟවත් කතා කළේ නැත. ගුණසෝමගේ මුහුණ දෙස පමණක් නොව ඇසිලින් නෝනාගේ මුහුණ දෙසවත් කෙළින් බැලුවේ නැත. පැවසිය යුතු දෙයක් වී නම් කුසුමලතාට කීවේය. පිඟානට කෑම බෙදා අවසන් වූ විට "කුසුමෙ තාත්තට කන්ඩ කියාපං" යි ඇසිලින් නෝනා, වෙදමහත්තයාට ඇසෙන්නට කීවාය.

වෙදමහත්තයාගේ හදිසි වෙනස්වීම ගැන ඇසිලින් නෝනා තුළ කේන්තියක් වෙනුවට එක්තරා අන්දමක කම්පාවක් ඇති විය. තමාට පමණක් නොව ගුණසෝම වැනි පොඩි එකෙකුටවත් මුහුණ දීමට නොහැකිව ඔහු සිතින් විඳින වේදනාව ඇසිලින් නෝනාට වටහාගැනීමට එතරම් අසීරු නොවීය.

"සුවාරිසා, පුංචි බණ්ඩට බුලත් කොටුවත් ගලවගෙන යන්ඩ කියලලු... වෙදමහත්තයට බොන්ඩ දීල ළමයට ගස්සෝල ගමේ මිනිස්සු මැද්දෙ වෙදමහත්තය වගේ රත්තරං මනුස්සයෙක්ව හැල්ලු කරපු එකෙකුට බිමක පස් පාගන්ඩවත් දෙන්ඩ හොඳ නෑ කියල තමයි සුවාරිසා ගමේ කිය කියා යන්නෙ... හැබැයි ඉතිං ඕකා බුමියෙං ආදායම ගන්නව මිසක බිංකුලිය දෙන්නෙත් සොච්චමයි කිය කියා හුඟ දවසක් ඉඳල සුවාරිසා පුංචි බණ්ඩට බැන බැන හිටියලු. ගමේ කතාව යන්නෙ කවුරුත් නැති වෙලාවට ගෙට රිංගන එක ආරංචිවෙලා ළුව යවාගන්ඩ මොකක් හරි වෙන හේතුවක් හොය හොයා හිටියයි කියල..."

WWW.SINHALAELIBRARY.COM 34
Uploaded By Paba
SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com

බුලත් විටක් කන්නට ඉඳහිට ගෙට ගොඩවෙන ලිලී නෝනාක්කා පසු දවසක කියා පෑ ඕපාදූපය වෙදමහත්තයාගේ කණේ තියන්නට ඇසිලින් නෝනාට සිත් දුන්නේ ද නැත. "සුවාරිස්, පුංචි බණ්ඩට ඔච්චෙං යන්ට කියලලු" යනුවෙන් කතාවක් අරඹන්නට ඇට දෙතුන් විටක්ම සිතිණි. එවැන්නකින් වෙදමහත්තයාගේ සිත තවදුරටත් සසල වනු මිසක සැහැල්ලු නොවන බැව් ඇසිලින් නෝනා හොඳින්ම දනී. තමන්ගෙන් සිදුවූ වරදක් අනියමින් හෝ තවත් කෙනෙකු මත පටවා සිත සෝදා ගැනීමට වෙදමහත්තයා කිසිසේත්ම සූදානම් නැති බව ඇට සක්සුදක් සේ පැහැදිලිය. ඇසිලින් නෝනා තවදුරටත් නිහඬව සිටියේ ඒ නිසාය.

එහෙත් මේ පීඩාකාරී නිහඬතාව බිඳින්නට හැකි හොඳම අවස්ථාවක් කිසි විටෙක බලාපොරොත්තු නොවූ අයුරින් උදාවිය. ඒ ඉස්කෝලේ ක්‍රීඩා උත්සවයේ යාර සීයේ තරගයට ගුණසෝම තෝරා ගැනීමත් සමඟය.

"ගුණසෝම දුවන්ඩ තේරිලා කියල දුවන කලිසමක් ඕනෑලු"

රාත්තිරියේ කෑම කන අතරේ ඇසිලින් නෝනා කීවාය.

"පුංචි මල්ලිට හොඳට දුවන්ඩ පුළුවන් කියල රෝහිණී මා එක්කත් කිව්ව... රෝහිණී තමයි මල්ලිලාගෙ නිවාසෙ නායිකාව"

කුසුමලතා ද කල්වේලා නොහැර කතාවට එක්වූයේ ගෙදර පවතින පීඩාකාරී වාතාවරණය අවසන් කරන්නට හොඳම අවස්ථාව උදාවී ඇතැයි ඇට ද තේරුම් ගොස් තිබුණ බැවිනි.

"ඌ පොත පතේ වැඩට කම්මැලි වුණාට දුවන්ඩ පනින්ඩ දක්සය. එදාට වියාරෝ මහත්තයත් එනවලු"

"ලවුස් පීකර එහෙම දාල මරු එකට තියේවි. රෝහිණී කිව්ව මටත් එන්ට කියල එදාට"

ඇසිලින් නෝනාත් කුසුමලතාත් තරගයට මෙන් ක්‍රීඩා උත්සවය ගැන කියවන්නට වූහ. වෙදමහත්තයා වචනයක්වත් පිට නොකළ නමුත් ඔහුගේ මුහුණේ තිබුණු මලානික පෙනුම ක්‍රමයෙන් අඩුව ගිය බවක් ඇසිලින් නෝනාට මෙන්ම කුසුමලතාටද දැනිණි.

"ගුණසෝම දිනන්ඩත් බැරි නෑ..."



ඇසිලින් නෝනා ඒ වචන ටික පැවසුවේ වෙදමහත්තයාගේ සිත හදන්නටම නොව සැබැවටම ඇගේ සිත තුළ සියුම් ලෙස ඇති වූ ආඩම්බරය නිසාය.

"අනේ අම්මෙ මමත් යනව එදාට"

කුසුමලතා ද ඒ ටික කීවේ වයසට නොගැළපෙන තරමට හොඳොල් වෙමිනි. එහෙත් වෙදමහත්තයා කෑම කා අවසන්ව ලොකු වතුර වීදුරුවක් බී වචනයක් හෝ නොදොඩා ඉස්තෝප්පුවට ගියේය.

ඇසිලින් නෝනාත් කුසුමලතාත් ක්‍රීඩා උත්සවය පිළිබඳව බොහෝ දේ පැවසුවේ තමාගේ සිත සැහැල්ලු කිරීමට බැව් තේරුම් ගැනීම වෙදමහත්තයාට අසීරු නොවීය. ඒ කෙසේ වෙතත් ගුණසෝම පිළිබඳව ලැබුණු ආරංචිය සැබැවටම ඔහුගේ කලකිරුණු මානසික තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්නට සමත්විය.

ඇසිලින් නෝනා සහ කුසුමලතා විසින් කලින් සිතා මතා නොවූවද ඒ මොහොතේ සැළසුම් සහගතව ඉදිරිපත් කළ ආරංචි නිසා පසුදා පහන් වෙන විට වෙදමහත්තයාගේ සිත හොඳටම මෘදු වී එසේම ප්‍රබෝධමත් වී තිබිණි. ඉස්කෝලේ යාමට සූදානම්ව සිටි ගුණසෝම වෙදමහත්තයා ළඟට විත් දණ ගසා වැන්දේය. ඔහු ගුණසෝමගේ හිස අතගෑවේය. ඉන්පසු ඉස්තෝප්පුවෙන් පිටව පිළිකන්නට ගොස් දැසින් ගලන කඳුළු සරම් පොටින් පිසදාගත් ඔහු එතැන නොනැවතී වත්ත පහළට ගියේ දිගින් දිගටම දැසින් ගලන කඳුළු ගෙදර අයගෙන් සඟවාගන්නට අන් ක්‍රමයක් කල්පනා නොවූ හෙයිනි.

පසුගිය දිනවල උදේ වෙදමහත්තයා කාමරයෙන් පිටතට පැමිණියේ ගුණසෝම ඉස්කෝලෙ ගියාට පසුවය. එසේ වූයේ ගුණසෝමගේ මුහුණ බලන්නට බැරි තරමට ඔහුගේ සිත කඩා වැටී තිබුණ බැවිනි. එහෙත් ගුණසෝමගේ පැත්තෙන් බැලූ විට එය මොන තරම් වැරදි ක්‍රියාවක් දැයි වෙදමහත්තයාට සිතෙන්නට විය. ඉස්කෝලෙ යාමට පෙර සිරිතක් වශයෙන් මාපියන් වඳින ගුණසෝම පසුගිය දවස්වල ද කාමරයට එබී බලා තමන් තාමත් අවදිව නැතැයි සිතා ඇසිලින් නෝනාට පමණක් වැඳ ඉස්කෝලේ යන්නට ඇතැයි වෙදමහත්තයාට සිතිණි. ඔහු ඒ දර්ශනය සිතින් මවා ගන්නට උත්සාහ කළේය. සියල්ල තේරුම් ගොස් කඳුළු

WWW.SINHALAELIBRARY.COM 35
Uploaded By Paba
www.sinhalaelibrary.com
SL UNLIMITED The spirit of Sri lankan

නවතින තෙක්ම ඔහු බඩවැටියෙන් එහා පෙනෙන කුඹුරුයාය දෙස බලාසිටියේය.

කුසුමලතා කතාකරන හඬ... රෙදි සෝදන සද්ද බද්ද... ළිඳ දෙසින් ඇසෙන්නට වූයේ මේ මොහොතේදීය. වත්ත පහළ කැරකෙමින් සිට ආපසු පැමිණි වෙදමහත්තයා කුසුමලතා ඇදූ දුන් වතුර බාල්දියෙන් යමිනමින් මුහුණ සෝදාගෙන සරම්පොටින් පිසිමින්ම ඉස්තෝප්පුවට විත් යළිත් ලණු ඇඳෙහි ඇලවුණේය.

ඇසිලින් නෝනා කතාවක් බහක් නොමැතිව කුස්සිය අස්පස් කළාය. ගවුම් දෙක තුනක් සෝදා වැලට දැමූ කුසුමලතා එහෙන් මෙහෙන් ඇඳ පැළඳ සම්බෝල සමඟ හීල් බත් කටවල් හත අටක් කා ටයිපිං පන්තියට යනු පිණිස ගෙයින් පිට වූවාය. වෙදමහත්තයා මිදුලට බැස පාර දෙසට ගියේ කුසුමලතා පිටව ගොස් තවත් පැයක් හමාරක් ගත වූ පසුවය.

කුසුමලතා විසින් ඉහිරි කරන ලද රෙදි ද කාමරවල තැනින් තැන දමා තිබුණු කිළුටු රෙදිද එකතු කරගත් ඇසිලින් නෝනා ළිඳ ළඟට ගියාය. ඒවා සෝදා අවසන් වෙන විට ඉර මුදුන් වෙන්නටත් පටන් ගෙන තිබිණි. පසුගිය දින තුන හතරේදී කඩයප්පන් සෑදීම නතර වූ හෙයින් මාටින් මුදලාලිගේ කඩයෙන් මෙන්ම මංකඩේ කඩයෙන් ද පණිවුඩ එවා තිබුණ බව ඇට සිහිපත් වූයේ මෙසේ රෙදි සෝදන අතරතුරේදීය. වෙදමහත්තයා ගියේ මාටින්ගේ කඩය පැත්තේ නම් ඔහු අත පණිවිඩයක් යවන්නට තිබිණි. එහෙත් යන තැනක් ගැන වෙදමහත්තයා කිවේ නැත. සවස් වරුවේ කඩ දෙකටම ගොඩවැදී පැමිණිය යුතු යැයි ඇසිලින් නෝනා සිතා ගත්තාය.

වෙදමහත්තයා ආපසු ගෙදර පැමිණියේ ගිනි මද්දහන් පැයේය. ඔහු පපුව හරහා ගලන දහඩිය පිසිමින් කෙළින්ම ගියේ කුස්සියටය. ඇසිලින් නෝනා ඒ වන විටත් පොල්ගාමින් සිටියාය.

"හොඳවැයිං කරෝල කෑල්ලක් හම්බවුණා... ඒකත් උයල ගනිං"

බොහෝ දවසකට පසු වෙදමහත්තය නිර්ලෝභීව කටහඬ පිටකරනු ඇසුණ විට ඇසිලින් නෝනා පොල් ගෑම නවත්වා ඔහු දෙස බැලුවේය.

"කල්පිටි කරෝල කියල මාටින් මුදලාලි දුන්නෙ"



ඔහු නැවතත් කවේය.

"කල්පිටි කරෝල නං හොඳා..."

ඇසිලින් නෝනා පොල් ගෑම නතර කොට නැගිට කරවල කෑල්ල ඒ මේ අත හරවා බලා "හොඳා වාගේ" යි කියමින් ඇතිළියකට දමා නෑඹිලියකින් වැසුවේ කොහේදෝ සිට පැමිණි බැළලිය ඉව අල්ලන්නට වූ හෙයිනි.

"මෙතන රුපියල් හතළිහක් ඇති... උඹ කොල්ලට ඕනෑ කරන දේවල් අරං දීපං... සල්ලි ඉතුරු වුණොත් කෙල්ලටත් ගවුං රෙදි කෑල්ලක් අරං දීපං..."

සරම් පොටේ ගසාගෙන තිබූ රුපියල් දහයේ නෝට්ටු ගුලියක් අතට ගත් වෙදමහත්තයා එය ඇසිලින් නෝනා දෙසට දිගු කළේය. ඇසිලින් නෝනා විශ්මයට පත්ව දෑස් උඩ හිදවාගෙන වෙදමහත්තයාගේ මුහුණ දෙස තත්පර කිහිපයක්ම බලා සිටියාය.

"වෙදමහත්තයට හදිස්සියෙන් කොහෙන්ද මෙච්චර සල්ලියක්?"

ඇසිලින් නෝනාගේ ප්‍රශ්නයට පිළිතුරක් නොදුන් වෙදමහත්තයා මඳ සිනාවක් පමණක් ඇට දී ඉස්තෝප්පුවට ගොස් බුලත් හෙප්පුව අතට ගනිමින්ම පුටුවෙහි ඉඳගත්තේය. තේරුම්ගත නොහැකි දෙයක් සිදුවී ඇති හෙයින් පුදුමයට පත්වූ ඇසිලින් නෝනා කුස්සියේ වැඩ සියල්ල නවතා දමා සල්ලි ගුලියත් රැගෙන වෙදමහත්තයා පසුපසින්ම වාගේ ඉස්තෝප්පුවට පැමිණ උළුවස්සට හේත්තු වූවාය.

"වෙදමහත්තය ඇත්තටම කොහෙන්ද සල්ලි?"

"කෙල්ලට දූනගන්ඩ තියන්ඩ ඕනෑ නෑ... මම හවඩිපොට මාටින් මුදලාලි ගාව තියල රුපියල් පණහක් ඉල්ලගත්ත... ඒක හෙමින් සීරුවෙ බේරගන්ඩ බැරුවයෑ... ගුණසෝමගෙ වැඩේ ඉස්සෙල්ල කරන්ඩ එපායෑ"

වෙදමහත්තයා කීවේ ඉතාමත් සැහැල්ලු ආකාරයකින් නමුත් ඒ ක්‍රියාව හරහා ඇසිලින් නෝනාගේ සිතට ඇතුළු වූයේ බරකි. ඇසිලින් නෝනාගේ දෑස් තියුණු ලෙස වෙදමහත්තයාගේ ඉත දෙසට යොමු වූයේ ඉබේමය. වෙදමහත්තයාටද එය නොපෙණුනා නොවේ.

"නෑ ඉතිං... ඔය මාසෙකින් දෙකකින් බේරගන්නව... වැඩි පොලියක් දාන එකකුත් නෑ... ඩියාරෝ මහත්තයත් එන එකේ

WWW.SINHALAELIBRARY.COM 36
Uploaded By Paba

කොල්ලව පිළිවෙළකට යවන්ඩ එපායැ... බැරිවෙලාවත් කොල්ල දිනුවොත් තැගි ගනඩ වෙන්නෙත් ඩියාගෝ මහත්තය අතින්නෙ..."

වෙදමහත්තයා කතා කරන්නේ ඉතාමත් ප්‍රබෝධයකින් යැයි ඇසිලින් නෝනාට සිතිණි. ඇගේ සිතේ මෙතුවක් දවස් තිබුණු "බර" එක් මොහොතකදී සැහැල්ලු වී ගියේය. එදා තමාගෙන් සිදු වූ වැරැද්ද නිසාම නොව ගුණසෝම පිළිබඳව අලුත් බලාපොරොත්තු වක් ඇතිවීම නිසා වෙදමහත්තයා මෙවන් දෙයක් කරන්නට ඇතැයි ඇසිලින් නෝනා සිතුවාය. ඈ ආපසු කුස්සියට පැමිණියේ සියල්ල සංසිඳී ගියේය යන සැහැල්ලු සිතුවිල්ලත් සමඟය.

ඊට පසුදිනම ගුණසෝමත් සමඟ ගම්පහ ගිය ඇසිලින් නෝනා 'දුවන කලිසමට' අවශ්‍ය රතුපාට පොප්ලින් කැල්ලකුත් අත්කොට මේස් බැනියමකුත් සුදුපාට කැන්වස් සපත්තු දෙකකුත් ගත්තාය. කුසුමලතාට හීන් කොට්ටු තිබෙන ගවුම් රෙද්දකුත් ගැනීමට අමතක නොකළ ඈ ඉන්පසු මාර්කට් එකට ගොස් මූදු මාළු පෙත්තක්ද ගත්තාය. ශිෂ්‍යත්ව විභාගයට පෙර ජිනසෝමත් සමඟ පහළගම දේවාලයට ගිය ගමන තුළින් ලැබුණ සතුට මෙන්ම සතුටක් ගුණසෝම සමඟ ගිය ගමන නිසාද ඇසිලින් නෝනාට ලැබිණි. යාපනයේ කඩයට ගිය ඇසිලින් නෝනා වෙදමහත්තයාට හොඳ රට දුම්කොළයක්ද ගත්තේ ඒ සතුට විසින් ඇති කරන ලද අලුත් ප්‍රබෝධය නිසාය. ඕං කළුවරත් සමඟ පසුගිය දිනවල පැමිණි මූසල බව වෙනුවට ගේ පුරාම ප්‍රබෝධය පැතිර ගොස් තිබිණි.

මූදු මාළු ගෙනාපු එකත් බොහොම හොඳා... ඔය දුවන පනින කොට වැඩිපුර හයියක් හත්තියක් තියෙන්ඩත් ඕනෑ. මම නිකමට ආරංචි කොරල බැලුව... පීතරගෙ කොලුව කිව්ව "මාමෙ ගුණසෝම මල්ලී තං දිනන්ඩම ඕනෑ කියල" මහත් උද්දාමයකින් මෙන් එසේ පැවසූ වෙදමහත්තයා "පොත පතේ වැඩ මිසක ජිනසෝමට යාර සීය දිනනව තියා හිතන්ඩවත් බෑ" යි කීවේ මඳක් සිනාසෙමිනි. වෙදමහත්තයා හීන් අඩියක් ගසා ඇති බව ඇසිලින් නෝනා දැනගත්තේ ගඳින් නොව ඔහු කතා කරන විලාශයෙනි.

"නෑ ඉතිං ජිනසෝම එක පැත්තක... ගුණසෝම තවත් පැත්තක... දුවේ දැන් උඹත් මොකක් හරි පැත්තකින් යන්ඩ ඕනෑ... කොහොමද දැන් ටයිපිං පන්තිය...?"



වෙදමහත්තයා ඒ ප්‍රශ්නය ඇසූ අපූරු විලාශය නිසා කුසුමලතාගේ මුවග සිනාවක්ද මතු විය.

"තාම ඉතිං ඒ තරං කාලයක් නැතෙ තාත්තෙ... දැන් ටික ටික පුළුවන්..."

"ඔව් ඉතිං... ඔව ටිකෙන් ටික මිසක හිතේ වේගෙට කරන්ඩ පුළුවන් දේවල් නෙමෙයිනෙ... ඉවසීම තමයි තියෙන්ඩ ඕනෑ"

"වෙදමහත්තයට හාල් මැස්සෙක් බැදල දෙන්වද"

"ඕකට තෙල් ලිපේ තියන්ඩ ඕන නෑ... මට ඔය උම්බලකඩ කැල්ලක් දීපංකො"

වෙදමහත්තයා රතු ඇඳුණු වට්ටිය ළඟට ඇද ගනිමින් කීවේය.

"දැන් ඇසිලින් නෝනත් යනවද ක්‍රීඩා උත්සවේ බලන්ඩ...? ලොකු මහත්තය අම්මල තාත්තලටත් එන්ඩ කියයි නිච්චියටම... ඩියාගෝ මහත්තයත් එනවනෙ..."

"අනේ මට ඕවයෙ යන්ඩ බෑ... වෙදමහත්තය ගියානං තමයි හොඳ..."

උම්බලකඩ කැල්ලක් වෙදමහත්තයාගේ අතෙහි තබමින් ඇසිලින් නෝනා කීවාය.

"ජිනසෝමටත් කියල ඇරියනං එන්ඩත් පුළුවන්"

වෙදමහත්තයා එසේ කීවේ නිකමට මෙනි.

"ඒ ළමයට මේ අවුරුද්දෙ විභාගෙ"

ඇසිලින් නෝනාගෙන් පිටවූයේ වෙද මහත්තයා බලාපොරොත්තු වූ වචන ටිකමය.

"නෑ... මං නිකමට කිව්වෙ... ඔව් හැබැට විභාගෙත් ළඟයි නෙව... තරකද වැලිතලප ටිකක්වත් හදාගෙන ගිහිල්ල ජිනසෝමව බලල ආවොත්"

"වැඩක් නෑ... බෝඩිමෙ කොල්ලො ටික වටවෙලා කනව මිසක මල්ලිට කැල්ලක්වත් හම්බවෙන්නෙ නැහැල්ලු"

[illegible]දා මෙන් නොව කුසුමලතා හරි හරියට මේ කතාබහට එක්වූයේ ඇගේ සත තුළද අමුතු ප්‍රාණවත් බවක් මෙන්ම [illegible] තිබුණ බැවිනි. කෝන්තියෙන් පුපුරණ විට ඇහිලි

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 37
Uploaded By Paba
UNLIMITED The spirit of Sri Lankan e-community

වළං පොළොවේ ගසනා තාත්තා විහිළුවෙන් තහළුවෙන් හැසිරෙන විට මොන තරම් අපූරුද්දයි ඇට සිතිණි.

"කොල්ලො එහෙම තමයි බං... ඒකනෙ උන්ට කොල්ලො කියන්නෙ"

වෙදමහත්තයා කොලොම්බු කොටයෙන් නැගිට්ටේ එසේ කියමිනි. ඔහුගේ මුහුණ පුරාම අපූරු සිනාවක් ඇඳී ඇති බව කුසුමලතාට පමණක් නොව ඇසිලින් තෝනාටද පෙනිණි.

× × × ×

යාර සියේ තරගයෙන් ගුණසෝමට හිමිවූයේ දෙවැනි තැනය. ප්‍රථම ස්ථානය හිමිවූයේ විජය නිවාසයේ ජේමසිරිටය.

"එකායි... දෙකායි... කියන කොටම ජේමසිරි පැන්න. මල්ලි පටන්ගත්තෙ තුනායි කිව්වට පස්සෙ... හැබැයි මල්ලි අල්ලගෙන... අල්ලගෙන ගියා... පරාක්‍රම නිවාසෙ කොල්ලො පුළුවන් තරං කෑගැහුව... තව යාර දෙකක් තිබුණනං මල්ලි එක වෙනව... පී. ටී. සර් පස්සෙ ඇවිල්ල මල්ලිගෙ ඔලුව අතගාල කිව්වලු ඇයි ගුණසෝම පැන්නෙ නැත්තෙ කියල. විජය නිවාසෙ ළමයි පුරුදු කෙරුව සුදර්ශන සර්. ඒ සර් ට්‍රේනිං කොලීජියේ කප් ගහපු එක්කෙනෙක්ලු නෙ... ඒ සර් තමයි ජේමසිරිට පනින්ඩ උගන්නල තියෙන්නෙ... මල්ලිට පුරුදු කෙරුවෙ චිත්‍රකර්ම මහත්තයනෙ ඒ මහත්තය කිව්වලු තුනායි කියන කල් පනින්ඩ එපා කියල.. ඒකලු නීතිය..."

කුසුමලතා ක්‍රීඩා උත්සවය අවසන් වී ගෙදර පැමිණ විස්තර කියන්නට වූවාය. ගුණසෝම පැමිණියේ කළුවර වැටෙන්නට ඔන්න මෙන්න කියා තිබියදීය. ඔහුගේ අතේ සහතිකයක්ද තිබිණි. ගුණසෝම ගෙට ගොඩවෙන විටම වෙදමහත්තයා එය ඉල්ලා ගත්තේය.

"යාර සියය... 15 න් පහළ සමතලා දිවීම... දෙවැනි ස්ථානය... පරාක්‍රම නිවාසයේ කේ. ඒ. ගුණසෝම ශිෂ්‍යයා දිනාගත් බව සහතික කරමු"

සහතිකයත් රැගෙන කුස්සියට ගිය වෙදමහත්තයා ඇසිලින් තෝනාටත් කුසුමලතාටත් ඇසෙන්නට එය හඬ නගා කියවීය.

"චීයාරෝ මහත්තය අත්සන් කොරලනෙ... බොහොම වටිනා සහතිකයක්. ඕකෙ කුණුගාන්නෙ නැතුව අරන් තියපල්ල... යක්කල පොළට යන වෙලාවක අරගෙන ගියා තං රාමු කරගන්ඩ තිබුණා"



වෙදමහත්තයා එසේ කියා සහතිකය කුසුමලතා අතට දී නැවත ඉස්තෝප්පුවට ගොස් ලණු ඇඳෙහි ඇලවුණේය. ටික වේලාවකින් කුසුමලතා ඉස්තෝප්පුවට පැමිණි නමුත් ඒ වන විට වෙදමහත්තයා ඇඳෙහි සිටියේ නැත.

× × × ×

"ඉහළගම කංකානමගෙ ලොකු පුතාගෙ කොලුව පැනල තියෙනවනෙ එකායි... දෙකායි... කියන කොටම... ගුණසෝම පැනල තියෙන්නෙ තුනායි කිව්වටත් පස්සේ... හැබැයි මිනිහ අල්ලල තියෙනව හොඳ ඇල්ලිල්ලක්... තව යාර දෙකක් තිබුණ නම් මිනිහ තමයි එක..."

වෙදමහත්තයා ගුණපාලගේ දරමැස්සේ සිටි දෙතුන් දෙනාට ඇසෙන්නට කීවේය.

"යාර දෙකක් තිබුණ නම් වෙදමහත්තයගෙ පුතා එක... ඒකෙ දෙකක් නෑ..."

හොඳටෝම බීමත්ව සිටි සුගතන් කීවේය. ඔහු ක්‍රීඩා උත්සවය බලන්නට ගියේවත් ඒ ගැන මොකුත් දන්නේවත් නැත. එහෙත් ඕනෑම කෙනෙකුගේ ඕනෑම කතාවක අග ඇල්ලීම ඔහුගේ පුරුද්දය.

"අපි දන්නැද්ද වෙදමහත්තය කංකානමලගෙ හැටි... හොර සූත්තර කාරයොනෙ... අර මැගිලින් උන්ද මැරුණාට පස්සේ ඒ ඉඩං කෑල්ලත් අපූරුවට අල්ලගත්තෙ... මුනුබුරාත් එහෙම නැතෑ... හැබැයි වෙදමහත්තයගෙ පුතාට තව යාර දෙකක් තිබුණ නං කංකානමගෙ මුනුබුරා සුනේ සුං...නැද්ද මං අහන්නෙ..."

සුගතන් සුපුරුදු පරිදි දොඩවන්නට පටන් ගත්තේය. උදේ වරුවේ පොල්ගස් හත අටකට නැග පොල් කඩා සොයා ගන්නා තුට්ටු දෙක සුගතන් වියදම් කෙළේ හැළි අරක්කු බොන්නටය. මුදල් අවසන් වූවද ඔහු දරමැස්සෙන් යන්නේ නැත. තවත් තුන් හතර දෙනකුගෙන්වත් ටික ටික ලැබෙන තෙක් රැඳී සිටියි.

"අනිත් එක අපේ එකා දෙවැනිය වුණේ නීතියට දූවල... අපේ එකෙක් බොරු කරල පළවෙනිය වෙනවට මං කැමැති නෑ සුගතං"

"රජ වුණත් මොකටද වෙදමහත්තය බොරු කරල..."

"ගුණපාල ළමයො... මගෙ ගානට දාල සුගතංට තව වීදුරුවක් දීපං..."

WWW.SINHALAELIBRARY.COM 38
Uploaded By Paba

සුගතන්ට අරක්කු වීදුරුවක් දිගු කරන ගමන් ගුණපාල ළමයා වෙදමහත්තයා දෙසට හැරුණේය.

"වෙදමහත්තයගෙ ගාණිත් දූන් ටිකක් වැඩිපුර එකතු වෙලා"

"මොනවද බං තව සුමාන දෙකයි... ගොයම් කැපිච්ච ගමන් උඹේ ගාන තමයි ඉස්සෙල්ල ගෙවන්නෙ..."

"වෙදමහත්තයගෙ ලියැද්ද මේ පාර බෝම සාරයි... ඇස්වහක් කටවහක් නෑ... එක කරලක වී හුණ්ඩුවක් ඇති"

ගුණපාල ළමයාගේ දර මැස්සට ඇතුළ් වෙමින් සිටි සරනේලිස් ගොයියාට සුගතන්ගේ කතාවට සිනා නොවී සිටිය නොහැකි විය.

"අද නං වෙදමහත්තයට හොඳ ගෝලයෙක් හම්බවෙලා"

"නෑ... සරනේලිස් අයියෙ මම කිව්වෙ තව යාර දෙකක් තිබුණ නං වෙදමහත්තයගෙ පුතා එක... කංකානමගෙ මුනුබුරා දෙක. හැබැයි වෙදමහත්තයගෙ පුතාගෙ හොර බොරු නෑ... බොරු කුරල රජ වුණත් මොකටද සරනේලිස් අයියේ..."

සුගතන්ගේ කතාවට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ සරනේලිස් ගොයියා ගුණපාල ළමයා දෙසට හැරුණේය.

"එකහමාරෙ වීදුරුවක් දාපංකො"

කට ළඟටම පිරවූ විට එය එකහමාරේ වීදුරුවකි. එකහමාරේ වීදුරුව අතට ගත් සරනේලිස් ගොයියා ඉත් හරි අඩක්ම එක උගුරට බී අවසන් කොට කණේ රඳවාගෙන තිබුණ බීඩියක් ගෙන පත්තු කරගත්තේය.

"සරනේලිස් අයියේ මටත් බීඩි කොටයක් දීපංකො තියෙනව නං"

සුගතන් අත පෑවේය. සරනේලිස් ගොයියාගේ මුහුණ එක්වරම තුරුස්නා පෙනුමක් ගත්තේය.

"ඔන්න ඕක තමයි උඹලගෙ වැරැද්ද... අරක්කු ටිකක් බොන්ඩ එන මිනිස්සුන්ට කරදරයක් වෙන්ඩ එපා... කෑව නං බිව්ව නං ගෙදර පලයල්ල..."

සරනේලිස් ගොයියාගේ කතාවට සුගතන් දිගු කළ අත ඉබේම පහතට වැටිණි.



"ඉදා... බීල පලයං ගෙදර..."

පත්තු කරගත් බීඩිය සුගතන්ට දුන් සරනේලිස් ගොයියා උඩ සාක්කුවෙන් තවත් බීඩියක් ගෙන දල්වා ගත්තේය. වීදුරුවේ ඉතිරිව තිබූ අනිත් කොටස එක දිගට උගුරට හලාගත් ඔහු කාරා මිදුලට කෙළ ගසා කට පුරා බීඩි උගුරක් ඇද්දේය. ගුණපාල ළමයාගේ ගාස්තුව ගෙවූ සරනේලිස් ගොයියා "වෙදමහත්තයා මං ගිහිල්ල එන්නං" යි කියමින් දර මැස්සෙන් මිදුලට බැස්සේය.

සරනේලිස් ගොයියා අන්ධකාරයේ නොපෙනී ගියේය.

"සරනේලිස් මාමගෙන් කිසි කරදරයක් නෑ... ගාණට බිව්ව... සල්ලි ගෙව්ව... ගියා..."

ගුණපාල ළමයා එසේ කීවේ වෙදමහත්තයාට එල්ල කරන ලද ඇනුම් පදයක් වශයෙන් නම් නොවේ. සරනේලිස් ගොයියාගේ පැවැත්ම සැබෑවටම කිසිවකුට හෝ කරදරයක් නැති එකකැයි වෙදමහත්තයාටද සිතිණි.

"සරනේලිස් ගොයියගෙ වැඩ කොහොමටත් පිළිවෙළයිනෙ... ඒක නෙ අවුරුදු දෙක තුනක් තිස්සේ මරණාධාර සමිතියේ භාණ්ඩාගාරික වෙලා ඉන්නෙ..."

වෙදමහත්තයා ගුණපාල ළමයාගේ අදහසට එකඟ විය.

"සරනේලිස් අයියගෙ භාණ්ඩාගාරිකකම කාටවත් කඩන්ඩ බෑ... මෙදා පාරත් ශුවර්... මොකද ඒ තරමට වැඩ පිළිවෙළයි"

සුගතන්ගේ කතාවට ගුණපාල ළමයාට පමණක් නොව වෙදමහත්තයාටද සිනාවක් ගියේය.

සරනේලිස් ගොයියා සී. ජී. ආර්. එකේ පාරේ වැඩකට්ටියේ කම්කරුවෙකි. දවල් කාලයේ ගිනි මද්දහනේ රේල් පීලිත් කළු ගල් කැලිත් සමඟ ඔට්ටු වෙන සරනේලිස් හැන්දෑවේ වැඩ අවසන්ව ගෙදර පැමිණි වහාම බස්නා ඇලට බැස නා ගනියි. ඉන්පසු ගෙදර ගොස් සරමක් කමිසයක් ඇඟට දාගත් ගමන් පුරුද්දකට මෙන් යන්නේ ගුණපාලගේ දර මැස්සටය. එහෙත් එකහමාරේ වීදුරු [illegible]ට වඩා අරක්කු නොබොන ඔහු බීඩියක් පත්තු කරගෙන දෙතුන්වරක් කාරා කෙළ ගසයි. ඔහු හැමදාමත් කෙළ ගසන්නේ [illegible] කොනකටය. ඉන්පසු අඳුරේ නොපෙනී යයි. පඩිගත්

WWW.SINHALAELIBRARY.COM 39
Uploaded By Paba

දවසට පමණක් සාමාන්‍ය වීදුරු දෙකක් පානය කරන සරනේලිස් ගොයියා මාසයේ එකතුව ගුණපාල ළමයාට ගෙවා පිටව යයි. මෙනිසා ගුණපාල ළමයාට ඔහුගෙන් කිසිම කරදරයක් නැත.

"නෑ මං කියන්නෙ සරනේලිස් අයියා වගේ එක පිළිවෙළකට අපටත් බොන්ඩ බැරි ඇයි...? අපට මාසෙ අන්තිමට දෙන්ඩ පඩියක් නැනෙ...නැද්ද වෙදමහත්තයා?"

සුගතන්ගේ දෙඩවිල්ල මැදින්ම වෙදමහත්තයා දර මැස්සෙන් එළියට බැස්සේය.

× × × ×

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

# 8

"සරනේලිස් මාමගෙන් කිසි කරදරයක් නෑ.. ගාණට බීලා... සල්ලි ගෙවලා... ගියා..." යනුවෙන් ගුණපාල ළමයා කී කතාවද, "සරනේලිස් අයියා වගේ පිළිවෙළකට අපට ඉන්ඩ බැරි ඇයි?" යනුවෙන් සුගතන් මතු කළ ප්‍රශ්නයද දවසක් දෙකක් නොව සතියක් දෙකක් යනතුරුම වෙදමහත්තයාගේ සිතට කරදර කෙළේය. ඒ ප්‍රකාශ හරහා පැමිණි කළකිරීමක්... පසුතැවිල්ලක්... වැනි හැඟීම ගණනාවක් එක් රොක්ව තමාව පීඩාවකට පත්කරන බවක් ඔහුට නිතර නිතර දැනෙන්නට විය.

සරනේලිස් ගොයියා ඉස්කොලේ ගියේ හතරේ කැලැසියට පමණී. ඔහු අද සී. ජී. ආර්. කම්කරුවෙකි. එහෙත් ඔහු ගමේ කවුරුත් පිළිගන්නා අන්දමට පිළිවෙළකට ජීවත් වන්නෙකි. සැබෑවටම මරණාධාර සමිතියේ භාණ්ඩාගාරික තනතුරට ඔහු වසර කිහිපයක් තිස්සේම නිතරගයෙන් පත්වූයේ එබැවිනි.

එහෙත් තමා වැටී සිටින්නේ ගමේ ඇවිද පොල්ගස් හත අටක් නැග උපයාගන්නා මුළු මුදලම හැළි අරක්කු බීමට වැය කරමින් තමා පමණක් නොව දරුවන් දෙදෙනෙක් ඇති පවුලක්ම කාලකණ්ණි තත්ත්වයට පත් කළ සුගතන්ගේ තත්ත්වයටය.

"සරනේලිස් අයියා වගේ පිළිවෙළකට අපට බොන්ඩ බැරි ඇයි...? මාසේ අන්තිමට පඩියක් නැති හින්ද... නැද්ද වෙදමහත්තයා?"

කිසි ලෙසකින්වත් සුගතන්ගේ කතාව ඔස්සේ මතුව එන කළකිරීමෙන් සහ පසුතැවිල්ලෙන් මිදෙන්නට වෙදමහත්තයාට නොහැකි විය. "නැද්ද වෙදමහත්තයා?" යනුවෙන් සුගතන් කීවේ

WWW.SINHALAELIBRARY.COM 40
www.sinhalaelibrary.com
Uploaded By Paba

තමාත් සුගතනුත් සිටින්නේ එකම තත්ත්වයක බැව් කියා පෑමට නොවේදැයි යන සිතුවිල්ල වෛද්‍යමහත්තයාගේ සිතට මහා වදයක් විය.

පන්සලට ගිය විටෙක මොන තරම් කලබල අවස්ථාවකදී වුවද වෛද්‍යමහත්තයාට හුටුවෙන් ලොකු හාමුදුරුවන් පැමිණ ආගිය තොරතුරු කතා කරයි. ඉලව් ගෙදරකට ගිය විටෙක වෛද්‍යමහත්තයාට පුටුව දීමට හතර පස්දෙනෙක් තමන් සිටි පුටුවලින් නැගිටිති. මඟුල් තුලාවකදී එක්කෝ මනමාලිය පෝරුවට ගොඩකරවයි. නැතිනම් ගමේ පාර්ශ්වය වෙනුවෙන් උපදේශාත්මක කතාවක් පවත්වයි.

එහෙත් උදේ සිට රෑ වෙන තෙක්ම හැලි අරක්කු බොන සුගතන් පවසන්නේ තමාත් වෛද්‍යමහත්තයාත් එක මට්ටමේ බවය.

කෙසේ වුවද වෛද්‍යමහත්තයා සති දෙකකට පමණ පසු ගුණපාල ළමයාගේ දර මැස්සට ගියේ එතෙක් එකතුව තිබූ මුදල ගෙවා දමන්නටය. ගුණපාල ළමයාගේ දර මැස්සට යාම නවතා දැමූ වෛද්‍යමහත්තයා මාටින් මුදලාලිගේ කඩයට ගොස් පත්තරය බැලීමටත් එතැනට නිතර යන එන අය සමඟ කතා කරන්නටත් කවුරුත් නැති මොහොතක මාටින් මුදලාලි සමඟ දාම අතක් අදින්නටත් පුරුදු විය. එහෙත් ඒ කතා බහද දේශපාලනය හෝ ඕපාදූපවලට සීමාවෙන බැව් කල්යත්ම වෛද්‍යමහත්තයාට දැනිණි. ගැහැණුන් මෙන් ඕපාදූප කතා කරන පිරිමි මොනතරම් පිළිකුල් සහගතදැයි වෛද්‍යමහත්තයා දැනගත්තේ මේ කතාබහ වලදීය.

"පුංචි බණ්ඩ තාමත් රිංගනවලු සුවාරිස්ගෙ ගෙදරට. සුවාරිස්ගෙ ගෑනිට හම්බවෙන්ඩ ඉන්න ළමයත් උගෙ කියනවනෙ..."

"සුවාරිසා බීල බීල ගොර ඇද ඇද බුදි... ගෑනි දන්නව ගොරෝද්දේ අදිනකොට ලේසියෙන් ඇහැරෙන්නෙ නෑ කියල... එතකොට තමයිලු පිළිකන්නට යන්නෙ... ඒ වෙලාව එනකල් පුංචි බණ්ඩ කෙහෙල් පඳුර ළඟට වෙලා ඉන්නවලු... හැබැයි බණ්ඩ රිංගනවලු ආයෙමත් අර කෙහෙල් පඳුර අස්සට... ගොරෝද්දෙ පටන් ගත්තාම ආයිමත් එනවලු පිළිකන්නට"

මෙවැනි අවලම් කතා කියමින් ඔවුන් නගන සිනා හඬ මොනතරම් පිළිකුල් සහගතදැයි සිතෙන විට සුගතන්ලාගේ කතා කෙතරම් අවභාජ් දැයි වෛද්‍යමහත්තයාට නොසිතුනා නොවේ. මේ අවලම් ඕපාදූප රසකරමින් අසා හිටියොත් තමා වැටෙන්නේද ඒ ගණයටම නොවේදැයි වෛද්‍යමහත්තයාට සිතිණි. කළුවර වැටෙද්දී මාටින්ගේ කඩයට යන එකද වෛද්‍යමහත්තයා අඩු කළේ මේ කාරණා නිසාය.



අනෙක් අතට යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වැඩ ද බොහෝ සෙයින් අඩුවී ඇති නිසා වෛද්‍යමහත්තයා අත කීයක් හෝ නැති තත්ත්වයක් උදාවිය.

කුඹුරු කෑල්ලෙන් ලැබෙන ආදායම ගුණපාල ළමයාට පූජාකිරීම කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකිය. මෙවර ගොයම් කපාගත් අස්වැන්නෙන් වී බුසල් දෙකක් මාටින් මුදලාලිගේ වී මෝලට විකුණාගත් මුදල්වලින් ගුණපාල ළමයාගේ ණය එකතුව ගෙවීම මොනතරම් නොහොබිනා ක්‍රියාවක්දැයි සිතෙනවිට මින් පෙර තමා ගැන කිසිදා නොතිබුණු කලකිරීමක් වෛද්‍යමහත්තයා තුළ ඇති වෙන්නට පටන් ගත්තේය.

ජිනසෝම විභාග සමත්වී යම් දවසක සමාජයේ යම් තැනකට පැමිණෙනු නියතය. කුසුමලතා පංච කල්‍යාණියක් නොවුවද දුටුවෙකුගේ දෑස් ඇදගන්නා සුළු රූපකායකින් යුක්තය. ඔවුන්ගේ ආත්ම ගෞරවය වෙනුවෙන් ජීවිතයෙන් යම් කොටසක් කැප කළ යුතුය. අනෙක් අතට මේ සියලු කටයුතු කිරීම සඳහා ඇසිලින් තෝනා පාන්දර ජාමයේ සිට කඩයප්පන් හදමින්, වැටෙන වැටෙන පොල් අතු වියමින්, ගම පුරා සීට්ටු දමමින් ගන්නා වෙහෙස ද සුළුපටු නොවේ. එවන් තත්ත්වයක් තිබියදී සුගතන්ලාගේ ගණයට වැටීම කිසිසේත් යුක්ති සහගත නොවේ.

ජිනසෝම ශිෂ්‍යත්වයෙන් සමත්ව නේවාසිකාගාරයේ නවත්වා පැමිණි දවසේ බිච්චේ සතුටට මෙන්ම දුකටය. ගුණසෝමට පහරදුන් දවසේ බිච්චේ දුකට මෙන්ම කලකිරීමටය. එහෙත් සාමාන්‍ය දවස්වලද දර මැස්ස පැත්තට යන්නේ ඇයිදැයි වෛද්‍යමහත්තයා නිකමට සිතන්නට පටන් ගත්තේය.

කුඹුරේ මහන්සි වෙන සිරිංලා ද පාරේ වැඩ කරන සරනේලිස්ලා ද හැන්දෑවෙන විට බස්නා ඇළට පැන ඇඟපත සෝදා ඒ සමඟ ඇතිවන ප්‍රබෝධයත් සමඟින් ගුණපාල ළමයාගේ දරමැස්සට ගොඩ වී හීන් අඩියක් ගසති. ඉන්පසු බීඩියක් උරමින් ගෙදර ගොස් කරවල බැදුමක් හෝ වෙනයම් කටගැස්මක්ද සහිත බත් පිඟානක් ගිල දමති.

WWW.SINHALAELIBRARY.COM 41
Uploaded By Paba
www.sinhalaelibrary.com
UNLIMITED

මේ හැරෙන්නට ඔවුන්ට කරන්නට තිබෙන්නේ කුමක්ද? දරු පවුල නඩත්තු කළ යුතුය. ඉස්කෝලේ යන දරුවන්ගේ ඕනෑ එපාකම් පිරිමැසිය යුතුය. එහෙත් මේ මිනිසුන්ටද විනෝදයක් සන්තෝසයක් තිබිය යුතුය. ඔවුහු ඒ්ංකම් කාලයට පන්සලට රැස්වී ඒ අවශ්‍ය වැඩකටයුතු කරති. කුඹුරු වැඩ කාලයට කයියට එකිනෙකාගේ ගොයම් කපා ගොයම් පාගති. ගම්මඩු නටති. ඉලව් ගෙදරක් වී නම් කයිකතන්දර කියමින් හෝ කාඩ් ගසමින් රාත්‍රිය පුරාම නිදිවරමින් ගත කරති. ඒ කිසිවක් නැති විට එක්කෝ ඔවුන් ගුණපාල ළමයාගේ දර මැස්සට යා යුතුය. එසේත් නැත්නම් මාටින් මුදලාලිගේ කඩය පැත්තට යා යුතුය.

වෙදමහත්තයා මෙවැනි දේ සිතමින් ඔවුන්ගේ ජීවිතය මෙන්ම තමන්ගේ ජීවිතයද යුක්තිසහගත කරන්නට බොහෝ උත්සාහ කළේය. එහෙත් ඒ සිතුවිලිවලද කෙළවරක් නැත. ඔහු මලානික වූයේ අතමිට කිසිවක් නොමැති වූ නිසාම නොවේ. මේ සිතුවිලිවලින් ද ඔහුගේ සිත පීඩාවට පත්ව තිබූ නිසාය.

වෙදමහත්තයාගේ මේ වෙනස ඇසිලින් නෝනාට හොඳින්ම පෙනිණි. සිං කළවර වැටෙන විට වෙනදා මෙන් මේස් බැනියමක් දමාගෙන මාටින්ගේ කඩයට හෝ ගුණපාලගේ ගෙවල් පැත්තට යන පුරුද්ද දැන් නැවතී තිබේ. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වැඩද පෙර මෙන් නොලැබෙන නිසා අතමිට කාසිපණම් නැතුවා වෙන්නට ඇත. වෙදමහත්තයාගේ මේ වෙනස ඇති වී තිබෙන්නේ ඒ නිසා යැයි ඇසිලින් නෝනා සිතුවාය.

සතියකට දවසක් දෙකක් කුඹුරු කෑල්ල පැත්තට යන්නටත් උදේට... උදේට වත්ත පහළ තිබුණු කැලෑව එළිපෙහෙළි කරන්නටත් පටන්ගත් වෙදමහත්තයා දවසකට දෙතුන් විටක්ම වෙනත් ගසක වැස්සිය දිගේලි කරන්නට දංගොල්ලෑවේ ඔවිට පැත්තටද ගියේය. ඒ එනවිට ඔවිටේ කෙළවරක ඇති ගොරෝක් ගහ යට වැටී තිබෙන ගොරෝක් ගෙඩියක් දෙකක් ද ගෙනැවිත් කුස්සියේ මුල්ලකින් තැබුවේය.

වෙදමහත්තයා තුළ දකින්නට ලැබුණු වෙනස දෙස ඇසිලින් නෝනා සියුම්ව බලා සිටියාය. එහෙත් එවැන්නක් තමාට දැනී ඇති බව නොපෙන්වා සිටින්නට හැකි සෑම උත්සාහයක්ම ගත්තාය. එවන් වෙනසක් පිළිබඳව ප්‍රශ්න කළහොත් වෙදමහත්තයා අසීරු



තත්ත්වයකට පත්වෙන්නට ඉඩ ඇතැයි ඈ සිතුවාය. එහෙත් වෙදමහත්තයාට නොදැනෙන්නට මේ වෙනස තවදුරටත් වැඩි කරන්නට ඇසිලින් නෝනා සියුම් ලෙස පියවර ගත්තාය.

හරමානස්ගේ පැමිණීම ගැන දිනක් හවස් යාමයේ වෙදමහත්තයා සමග කීවේ එබැවිනි.

"ඊයේ හරමානිස් මලය ඇවිල්ල කිව්ව දවටගහලියැද්දේ හුගක් වල් හැදිලයි කියල"

"ඔය කියන තරමට නෑ... මං ටිකක් තිබිල උදුරල දැම්ම. හරමානිසා වක්කඩ වහල ද කොහෙද ලියැද්දට වතුර නැතුවයි තිබුණේ. පස්සේ මං ඒක කඩල දැම්ම. ඌ ඒක වහං කරන්ඩ වෙන්ඩ ඇති නැති හිතවත්කමක් පෙන්නන්ඩ එක්ක එක එක දේවල් කියන්ඩ ඇත්තෙ. හරමානිසා කීපසැරයක් ඕක ඉල්ලුව අඳේට වැඩ කරනඩ..."

වෙදමහත්තයා එසේ කියා තේ කෝප්පය අතට ගෙන සීනි ඇබිත්තක් අල්ලට දමනතුරු අනෙක් අත ඇසිලින් නෝනා දෙසට දිගු කරගෙන සිටියේය.

හවස් යාමයේ කුඹුරට යනවිට ගුණසෝමව කැඳවාගෙන යාමට ඔහු කල්පනා කළේ ගෙදර සිටියොත් කොල්ලන් සමග නටන්නට යන එක නවතාලන්නට හැකිවෙන නිසාය. ගුණසෝම එය කරදරයක් කොට නොසැළකුවා පමණක් නොව හත් අට දවසක් යනවිට "අද වෙලට යන්නේ නැද්ද?" යි වෙදමහත්තයාගෙන් විමසන්නටද පටන් ගත්තේය.

වෙදමහත්තයා ගුණසෝමද හවුල් කරගනිමින් ලියැද්දේ නියර දිග මෑ වැල් දහයක් පහළොවක් ඉන්දූවේය. එතැන් පටන් වෙදමහත්තයාට මෙන්ම ගුණසෝමටද කරන්නට වැඩ රැසක්ම තිබිණි. මෑ වැල්වලට වතුර දැමීම... කොළ කන පණුවන් ඇහිදීම, වැල් දික්වෙන විට කෝටු සෙවීම සහ සිටුවීම... වල් පැළ උදුරා දැමීම... ගොම රොඩු එකතු කිරීම සහ වැල් මුලට දැමීම... මේ ආදි වැඩවල ගුණසෝම නියැලුණේ මහත් සතුටකිනි.

"මෑ වැල් දැන් මරු එකට හැදිල"

ගුණසෝම, කුසුමලතා සමග කීවේය. ඒ කතා බහ ඇසිලින් නෝනා තුළ ද විශාල සතුටක් ඇති කළේය.

WWW.SINHALAELIBRARY.COM 42
Uploaded By Paba
www.sinhalaelibrary.com
SL UNLIMITED

"ගුණසෝම ගොවිතැන් වැඩට බොහොම කැමැතියි වාගෙ"

වෙදමහත්තයා, ඇසිලින් නෝනා සමග කීවේය.

"මං අහගෙන කුසුමලතා එක්කත් මෑ වැල් ගැන කියෝනව... පොත පතේ වැඩ ගැන නම් කිසි උනන්දුවක් නෑ... හැබැයි"

"ඔහොම තමයි බං... එක එක්කෙනාට පිහිටන හැටි..."

වෙදමහත්තයා හෝ ඇසිලින් නෝනා, පත පොත වැඩ ගැන ගුණසෝමගෙන් විමසන්නට ගියේ නැත.

"ගුණසෝම කැමැති නැද්ද මන්ත්‍ර ගුරුකම් සාස්තරේ ඉගෙන ගන්ඩ...?"

එක්තරා හැන්දෑවක මෑ වැල්වලට සාත්තු කරමින් සිටියදී වෙදමහත්තයා, ගුණසෝමගෙන් ඇසුවේය. ගුණසෝම එය නෑසුනාක් මෙන් සිටියේය.

"නෑ ඉතිං... අයිය නං පොත පතේ වැඩට බොහොම උනන්දුයි... උඹත් මොකක් හරි සාස්තරයක් ඉගෙනගන්ඩ එපායැ..."

ගුණසෝමගේ නිහඬතාව බිඳිනු වස් වෙදමහත්තයා යළිත් ඒ පිළිබඳව අවධානය යොමු කරවීය.

"මට ඔය මන්තර පාඩං හිටින්නෙ නෑ තාත්තෙ..."

ගුණසෝමගේ පිළිතුර ඒ තරමටම අයහපත් නැත. ඔහු පවසන්නේ මන්තර පාඩම් නොසිටීම ගැන පමණකි. නැවතත් මේ ගැන කතා කරන්නට වෙදමහත්තයා පෙලඹුණේ ගුණසෝමගේ පිළිතුර තුළ ඒ සඳහා ඉඩක් තිබුණ නිසාය.

"එකපාරට මහ දිග ඒව බෑ තමයි... පොඩි පොඩි වැඩවලට පොඩි පොඩි මන්තර තියෙනව... මතක තියාගන්ඩ ලේසියි"

මේ කතා බහ අවසන් වූයේ වෙදමහත්තයා තුළ අලුත් බලාපොරොත්තුවක් ඇති කරවමිනි. විවේක තිබෙන වේලාවට පාඩම් කරගන්ඩ කුඩා මන්තරයක් ගුණසෝමට ලියා දුන්නේ ඒ අනුවය.

"මේක උලුක්කුවකට තෙල් මතුරන මන්තරයක්. බොහොම අනුහස් තියෙන එකක්... මේක පාඩං කරගන්ඩ බලාපංකො"

වෙදමහත්තයා දුන් කොළ කැල්ල දෙස ගුණසෝම බලා සිටියා මිස කිසිවක් කීවේ නැත.



"ඔය මන්තරෙන් එකසිය අට වාරයක් මතුරල තලතෙල් ටිකක් ජීවං කරල උලුක්කු වෙච්ච පැත්තෙ හෙමෙයි අතින් පැත්තෙ ගාල තමයි උලුක්කුව අදින්නෙ... දැන් වං අතේ මැද ඇඟිල්ල උලුක්වෙලා නං මතුරපු තෙල් ගාල අදින්නෙ දකුණු අතේ මැද ඇඟිල්ල... එතකොට රිදෙන්නෙත් නැතෙ... ඊට පස්සෙ උලුක් වෙච්ච ඇඟිල්ලෙ යංතං තෙල් ටිකක් තවරනව... නැත්තං පොල්කිරි ටිකක් ගෑවත් ඇති"

ගුණසෝමට මන්ත්‍ර සාස්තරේ කියාදෙන හැටි කුස්සියේ සිට ඉස්තෝප්පුවට පැමිණි ඇසිලින් නෝනාද අසා සිටියාය. කුසුමලතාද කාමරයේ සිට පැමිණියේ කියවමින් සිටි නවකතාව ද වසා ඇඟ මතම තබමිනි.

"මේ වගේ කොච්චර හාස්කං තියෙන මන්තර තියෙනවද... දත් කැක්කුමක් හැදුනම යකඩ ඇණේකට මතුරල වහලෙ මුදුන් පරාලෙ ගහන කොට දත් කැක්කුම ඉවර වෙනව"

වෙදමහත්තයා මන්තර සාස්තරේ විස්තර කෙළේ ගුණසෝමට පමණක් නොව අනිත් දෙදෙනා දෙස ද බලමින් ඔවුන්ට ද ඇසෙන්නටය. තවත් එවැනි කතා දෙක තුනක් පැවසූ වෙදමහත්තයා හදිසියේ මතක් වූවාක් මෙන් සුදු සරමත් මේස් බැනියමත් ඇඳ තුවායක් ද කරට දමාගෙන මිදුලට බැස්සේ "අද මරණාධාර සමිතියේ රැස්වීම... මට මතක නැති වුණා" යි කියමිනි. වෙදමහත්තයා ඈතට යනතෙක් බලා සිටි කුසුමලතා, ගුණසෝමගේ කණට කොට "පුංචි වෙදමහත්තය" යි කියා සිනාසෙමින් කාමරයට ගියාය.

ගුණසෝමගේ සිතට ලජ්ජාවක් ඇතුළු වූයේ ඒ මොහොතේය. මල් බුලත් තට්ටුවක් ඉදිරිපිට ඉඳගෙන "මුණු මුණු" ගාමින් තුලක් මතුරන වෙදමහත්තයාගේ රූපය ඔහුගේ සිතේ මැවී පෙනුණේය.

"මට බෑ අම්මෙ මන්තර පාඩං කොරන්ඩ..."

ටික වේලාවකට පසු කඩදාසි කැල්ලත් අත තබාගෙනම කුස්සියට ගිය ගුණසෝම, ඇසිලින් නෝනාට කීවාය.

"උඹට බැරි නං නිකං හිටපං... හැබැයි බෑ කියල තාත්තට කියන්ඩ යන්ඩ එපා. ටික දවසක් යනකොට තාත්තාගෙ හිතෙන් ඕක අකාමකා වෙලා යාවි"

WWW.SINHALAELIBRARY.COM 43

ඇසිලින් නෝනාගේ කීම අනුව වෙදමහත්තයාට පෙනෙන්නට දවස් දෙකක් තුනක් ගුණසෝම මන්තර කඩදාසි කැල්ල දෙස බලාසිටි

Uploaded By Paba

තමුන් කිසි විටෙකත් හඬ නඟා පාඩම් කෙළේ නම් නැත. ගුණසෝම ඒ ගැන එතරම් උනන්දු නැති බව වෙදමහත්තයාට ද වැටහිණි.

"ඔව හැම එක්කෙනාටම පිහිටන්නෙත් නෑ..."

වෙදමහත්තයා, ඇසිලින් නෝනාට කීවේ බලාපොරොත්තු කඩ වූ ස්වරයකිනි.

"ඔව් ඉතිං ඒ වගෙ දේවල් බලෙන් උගන්නන්ඩත් බෑ නමයි. පුරුවේ පුරුද්දකුත් තියෙන්ඩ ඕනෑ"

ඇසිලින් නෝනාට අවශ්‍ය වූයේ වෙදමහත්තයාගේ සිත සැදීමටය. ඔහු යම් දෙයකින් කම්පාවට පත්වුවහොත් ඒ ගැන බොහෝ දුර දිගට සිතමින් සිහින් වද විඳින බව ඈ දනී.

"මිනිස්සුන්ට උදව්කරන්ඩ හිතෙන්නෙ සංසාර පුරුද්දක් තියෙන කෙනෙකුට..."

ඇසිලින් නෝනා යළිත් කීවාය. එවැනි ප්‍රකාශයකින් වෙදමහත්තයාගේ සිතට සැනසිල්ලක් ඇතිවනු ඇතැයි ඈ සිතුවාය.

"මං බැලුවේ සාත්තරේ මෙතනින් ඉවර කරන්ඩ බැරි හින්ද... පන්සල ළඟ සිරිදාස දවසක් මාත් එක්ක මේව ගැන කතා කෙරුව... මිනිහගෙ උනන්දුවක් තියෙන බව පේනව. එහෙම වුණොත් මිනිහටවත් කියල දෙන්ඩ ඕනෑ කියල මට හිතුණා. මං නැති කාලෙක හදිස්සියකට ඇප තුලක් හරි දාගන්ඩ කෙනෙක් ගමේ ඉන්ඩ එපායැ... මිනිහ මේසන් බාස් කෙනෙක් හින්ද ප්‍රශ්නෙකුත් නෑ... මිනිස්සුන්ට යහපතක් වෙන්ඩ කරනව මිසක මේක ඉතිං ජීවත්වෙන්ඩ පුළුවන් සාත්තරේකුත් නෙමෙයිනෙ..."

වෙදමහත්තයාගේ කතාව ඇසිලින් නෝනා අසා සිටියේ නිහඬවම තමුන් ඇගේ සිතට සුබක් හෝ අසුබ හැඟීමක් ඇතුළු කිරීමට ඒ වචන පෙළ සමත් විය. තම පවුල සතු පාරම්පරික වස්තුවක් පිටස්තරයකුට අයිතිවීමට යනවා නොවේදැයි පසුව ඇයට සිතිණි. දවසක් දෙකක් ගතවෙන විට ඒ සිතුවිල්ල ප්‍රබල වී සිත මතුපිටටම පැමිණියේය. කුස්සියේ උයන පිහන අතරදීද ඈ ඒ ගැන සිතුවාය. එහෙත් ඒ ගැන වෙදමහත්තයාට වචනයක් හෝ කියන්නටද ඉඩක් නැත. කෙසේ වුවද මේ තත්ත්වය වඩාත් තියුණු වූයේ එක් සැන්දෑවක ගෙදරට පැමිණි සිරිදාස, වෙදමහත්තයා බොහෝ වේලාවක් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ගැන කතා කරමින්



සිටීමත් සමගය. ඊට පසු දවස් දෙක තුනක්ම සිරිදාස පැමිණියේය. ඇතැම් දිනවල වෙදමහත්තයා ඔහු එනතෙක් බලා සිටියේය. සිරිදාස පිළිබඳව ඇසිලින් නෝනාගේ සිතෙහි සියුම් ලෙස ඇතිවූ අකමැත්ත ඔහුව නුරුස්සන තත්ත්වයක් දක්වා වර්ධනය විය.

"සිරිදාසගෙ වැඩේ මුලත් කාල මිදුලට කෙළ ගහන එක"

එක් උදේ වරුවක මිදුල අතුගාමින් සිටි ඇසිලින් නෝනා කීවාය. ඒ වන විට වෙදමහත්තයා සිටියේ ළඟ ඇඳ මත ඇලවෙලාය. ඒ වචන කිහිපය එල්ල කළේ තමාට බැව් වෙදමහත්තයාට එක්වරම වැටහිණි.

"ගෙදරට ගොඩ වෙච්ච මිනිහෙකුට මුලත්විටක් නොදී ඉන්ඩ පුළුවන්ද... අනික් එක මට කියන්ඩ පුළුවන්ද ඈතට ගිහින් කෙළ ගහල එන්ඩ කියල... අනික් එක මුලත් කෙළ කියන්නෙ අවුසදයක්... කුඩැල්ලෙක් එල්ලුනාම කරන්නෙ එතෙන්ට මුලත් කෙළපාරක් ගහන එක..."

තමාගේ වචනවලින් වෙදමහත්තයාගේ සිත රිදුණු බවක් දැනගත් ඇසිලින් නෝනා මුලත් කෙළ හෝ සිරිදාසගේ පැමිණීම ගැන ඊට පසු කතා කරන්නට ගියේ නැත.

පටන්ගැන්මේදී සුමානයකට දෙකකට වතාවක් වෙදමහත්තයා හමුවන්නට පැමිණි සිරිදාස දවස් ගතවෙත්ම දවස් දෙක තුනකට වතාවක් පැමිණෙන්නට පටන් ගත්තේය. ඉදහිට හොඳ සිංහල දුම්කොළයක්ද වෙදමහත්තයාට ගෙනැවිත් දුන්නේය.

"මේක බොහොම හොඳ දුං කොළයක්..."

සිරිදාස දුන් දුම්කොළය දිගහැර නාසයට කිට්ටුකොට මැලු වෙදමහත්තයා කීවේ දුම්කොළ පිළිබඳව විශේෂඥ දැනුමක් ඇත්තෙකු පරිද්දෙනි.

"ගම්පහ ඉස්ටේසම ළඟ පුරුට්ටු කඩේ දුංකොළ බොහොම අගෙයි. මුදලාලි හොඳම එකක් නැත්තං මට දෙන්නෙත් නෑ..."

සිරිදාස තවදුරටත් දුම්කොළය වර්ණනා කරන්නට විය.

"අදත් කයිවාරුව පටන් අරගෙන"

සාලයේ පුටුවකට වී නවකතා පොතක් කියවමින් සිටි කුසුමලතා එය වසා මේසය මතට විසිකොට කුස්සියට ගොස් ඇසිලින්



SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
Uploaded By Paba

හෝනාට නෝක්කාඩුව ඉදිරිපත් කළාය. එහෙත් ඇසිලින් හෝනා ඇගේ මුහුණ දෙසවත් හැරී බැලුවේ නැත. ඒ වෙනුවට "පොල් ටිකක් ගාපං"යි කීවාය. වැඩිහිටියන්ගේ දේවල්වලට වචන කීමට දරුවන්ට ඉඩදිය යුතු නොවේ. වචනයකින් දෙකකින් කුසුමලතාව නිහඬ කළ යුතු යැයි ඇසිලින් හෝනාට සිතුණේ එබැවිනි.

සිංහල දුම්කොළයේ වර්ණනාවෙන් පටන්ගත් කයිවාරුව කොණ්ඩදෙණියේ හාමුදුරුවන්ගේ හාස්කම් දක්වා දිග්ගැහුණේ වෙදමහත්තයාට හෝ සිරිදාසටද නොදනුවත්වය.

"දවසක් කොණ්ඩදෙණියෙ හාමුදුරුවො බැහැරක් වඩිනකොට මිනිහෙක් එනවලු විශාල කෙහෙල් කැනකුත් කරේ තියාගෙන ඉස්සරහට... හාමුදුරුවො දුර ඉඳලම දැනගත්තලු හොරෙන් කපාගෙන එන එකක් කියල. ළඟට ආපුවාම හාමුදුරුවො ඒ මිනිහගෙන් ඇහුවලු "කොහාටද ඕක අරගෙන යන්නෙ?" කියල... හාමුදුරුවන්ට රවල බලාපු මිනිහ ඇහුවලු "ඇයි ගන්ඩද?" අහන්නෙ කියල. ඊට පස්සෙ කටු කුටු ගගා යන්ඩ ගියාලු. හාමුදුරුවො එතන වැටේ තිබුණ පදුරක කොළයක් කඩල මතුරල කොළේ පොඩිකරල බිම දාල යන්ඩ ගියාලු...

"අර මිනිහගෙ කොන්ද ටික ටික රිදෙන්ඩ පටන් ගත්තලු. අමාරුවෙන් අමාරුවෙන් තව ටිකක් දුරක් ගියාලු. කොන්දෙ කැක්කුම ඉවසගන්ඩ බැරුව පාර අයිනේ ඉඳගත්තලු. අන්තිමේදී බිම වැටිල කෑගහන්ඩ පටන්ගත්තලු. පස්සෙ ඔය කැඟැහිල්ල ඇහිල අහල පහළ ගෙවල්වල මිනිස්සු දෙතුන් දෙනෙක් ඇවිල්ල කෙහෙල්කැන පාර අයිනේ තියෙද්දී මිනිහව උස්සගෙන ගෙදරකට ගෙනිච්චලු...

"එක මිනිහෙක් ඇහුවලු මොකද වුණේ කියල. කෙහෙල් කැන උස්සගෙන එනකොට එක පාරට කොන්දෙ කැක්කුමක් හැදුන කියල... එතකොටම පාරේ යමින් හිටි වයසක මනුස්සයෙක් ගොඩ වුණාලු මේ කලබලේ බලන්න...

"කෙහෙල් කැනත් උස්සගෙන එනකොට කොන්දෙ අමාරුවක් හැදිල කියල එතන හිටපු මිනිස්සු අර වයසක මනුස්සයාට කිව්වලු. හැබැයි ඒ වයසක මනුස්සයාට ටිකක් සැක හිතිල පාරෙ එනකොට කවුරුහරි මුණගැහුණද කියල ඇහුවලු...

"හාමුදුරු කෙනෙක් හම්බවුණා... මෙහෙම මෙහෙම කතාවකුත් ඇතිවුණා කියල අර මිනිහ කිව්වලු...



"මට හිතුනා... කොණ්ඩදෙණියෙ හාමුදුරුවො මටත් මුණ ගැහුණා... හාමුදුරුවන්ට මේ මිනිහ ඕනෑ නැති දෙයක් කියල... හාමුදුරුවො මතුරන්ඩ ඇති. දැන් ඉතිං හාමුදුරුවන්ගෙන් සමාව ගන්න කල් ජීවකයො ගෙනාවත් ඔය කැක්කුම නැතිකරන්ඩ බෑ..."

"එතන හිටපු ඔක්කොම මිනිස්සු කලබල වෙලා මේ මිනිහට කිව්වලු හාමුදුරුවො මෙලාකට පන්සලට වැඩල ඇති... ගිහිල්ල සමාව ඉල්ලගන්ඩ කියල... මිනිහ නැගිට්ටලු... ටිකක් විතර කොන්දෙ අමාරුව අඩුවුණාලු... ඊට පස්සෙ මිනිහ ගිහින් කොණ්ඩදෙණියෙ හාමුදුරුවන්ගෙන් සමාව ඉල්ලුවලු... හාමුදුරුවො කිව්වලු ඔය කෙහෙල්කැන ගිහින් ඒ කෙහෙල් ගහ යටින්ම තියල එන්ඩ කියල... එහෙමයි හාමුදුරුවනේ කියල දණගහල වැඳල නැගිට්ට කොට කොන්දෙ කැක්කුම තවත් අඩුවුණාලු... ආපහු කෙහෙල්කැන තිබුණ තැනට එනකොට කොන්දෙ අමාරුව හොඳටම වගෙ අඩුවුණාලු... කෙහෙල්කැන කරට ගන්නකොට කැක්කුම කොහෙන් ගිහින්ද නැහැල්ලු... මිනිහ හනස්සක් කරේ තියාගෙන යනව වගේ හැල්ලුවෙන් කෙහෙල්කැන ආපහු අර ගහ ළඟින්ම ගිහින් තිබ්බලු"

වෙදමහත්තයා කතාව හමාර කොට හොඳ බුලත් කෙළ පාරක් මිදුලට විද්දේය. ඊට තත්පර දෙක තුනකට පසු සිරිදාස ද එයම කෙළේය.

"බොහොම හාස්කම් කරන්ඩ පුළුවන් හාමුදුරු කෙනෙක් කියල මමත් අහල තියෙනව..."

වෙදමහත්තයාගේ කතාව සම්පූර්ණයෙන්ම පිළිගත් බවක් අඟවමින් සිරිදාස තවත් යමක් එකතු කෙළේය.

"හාමුදුරුවො යක්කු බැඳගෙන වැඩ ගත්ත කියලත් කියනවනෙ"

"වෙන්ඩ ඇති වෙදමහත්තය. එච්චරටම බලගතු මන්තර තිබිල තියෙනවනෙ..."

සිරිදාසගේත් වෙදමහත්තයගෙත් කතා බහ නිසා පුදුමයට පත් ගුණසෝම කතාවක් බහක් නැතුව කුස්සියට ගොස් එළිපත්ත උඩින් ඉඳගත්තේය. ටික වෙලාවකින් වෙදමහත්තයාද කුස්සියට පැමිණියේය.

"[illegible] ගියාද?"

WWW.SINHALAELIBRARY.COM 45
Uploaded By Paba

"මිනිහගෙ බොහොම උනන්දුවක් තියෙනව. එක දවසක් මං මිනිහට පුස්කොළ පොතක් දුන්න... මිනිහ ඒක සැහෙන්ඩ කියවල තියෙනව..."

වෙදමහත්තයාට පරම්පරාවෙන් උරුම වූ පුස්කොළ පොත් සිරිදාසට දෙන බව දැනගත් මොහොතේ ඇසිලින් නෝනාගේ සිත තිගැස්සුණ නමුත් ඒවා ගැන කිසිත් නොකියා සිටින්නට ඉවාගත්තාය.

"අපේ කාටවත් ආසාවක් නැත්තං පොරෝජං ගන්ඩ පුළුවන් කෙනෙකුට දෙන්ට එපායැ... අල්මාරියක් ඇතුළෙ නිකං දිරාපත් වෙන්ට අරින එක වස අපරාදයක්..."

ඒ පිළිබඳව විමසුවේ නම් වෙදමහත්තයා දෙන්නේ එවන් පිළිතුරක් බැව් ඇසිලින් නෝනා හොඳින්ම දනී. මොනවා වුවද සිරිදාස ඇසුරට වැටුණාට පසු වෙදමහත්තයා පරණ පුස්කොළ පොත් අල්මාරියෙන් පිටතට ගෙන යළි යළිත් කියවන්නට පටන් ගත්තේය.

x x x x

# 9

බටගොල්ලේ වෙදමහත්තයා ගැන සිරිදාස දවසක් වෙද මහත්තයාට කීවේය.

"බොහොම සාරෙට ඉන්න කට්ටිය. ලොකු පුතා කොළඹ කන්තෝරුවක වැඩ. එයා ගමේ ගෙයක් හදනව... ප්‍රේමරත්න බාසුන්නැහේ තමයි මේසන් වැඩ... මමත් දැන් එහෙ වැඩ... දවසක් මං වෙදමහත්තයා ගැන බටගොල්ලෙ වෙදමහත්තයත් එක්ක කතා කෙරුව... උන්නැහේට ලොකු වුවමනාවක් වෙදමහත්තයත් එක්ක කතා කරන්ඩ... දවසක එක්ක එන්ඩත් කියල කිව්ව..."

"කොහෙද ඉන්නව කිව්වෙ?"

"කිරිදිවැල බස් එකේ ගිහිල්ල රතුපස්වල හන්දියෙන් බැහැල බටගොල්ලෙ වෙදමහත්තය ගැන ඇහුවාම ඒ පැත්ත පළාතම දන්නව... මහ විශාල වත්තක් මැද්දෙ තියෙන වලව්වක් වගෙ ගෙදරක්..."

"ඔය කියන විදියට බොහොම වැදගත් පරම්පරා වෙදමහත්තයෙක් වෙන්ඩ ඕනැ..."

වෙදමහත්තයා, බටගොල්ලේ වෙදමහත්තයා ගැන වූ ආරංචිය ඇසිලින් නෝනා සමගද කීවේය. ඔහු වෙද හෙදකම් අඩංගු පුස්කොළ පොත් තෝරා බේරා කියවන්නට පටන් ගත්තේ මේ ආරංචියත් සමග සිතේ ඇතිවූ අලුත් පිබිදීමක් නිසාය. පාන්දරින් කුඹුරට ගොස් එන වෙදමහත්තයා ඉන්පසු උදේ වරුවම පුස්කොළ පොත් බැලීම සඳහා ගත කළේය.

WWW.SINHALAELIBRARY.COM 46

Uploaded By Paba

''හෙනරාජ් තෙල් හිඳින හැටි පුස්කොළ පොතක තිබුණ වගේ මට මතකයි. සීය ඉන්න කාලෙත් උත්සාහ ගත්ත මට මතකයි මට මතකයි. සීය ඉන්න කාලෙත් උත්සාහ ගත්ත ... ඒත් කරගන්ඩ බැරි වුණා. ඔය තෙල හෙනරාජ් තෙල හිඳින්න... ඒත් කරගන්ඩ බැරි වුණා. ඔය තෙල හිඳින්ඩ වාසනා ගුණයක් තියෙන්ඩ ඕනෑ කියලත් කියනව.. ඒ පොතේ තියෙන්නෙ ඔක්කොම තෙල් ජාති හිඳින හැටි... බොහොම වටිනා තෙල්... සිද්ධාර්ථ තෙල... සරුව විසාදිය... ඔය වගේ තෙල්... බටගොල්ලෙ වෙදමහත්තයත් එක්ක එකතුවෙලා හෙනරාජ් තෙලත් එක්ක නව තෙල් වර්ග කීපයක් හිඳින්ඩ හිතක් තියෙනව... කොහොටත් බටගොල්ලෙ වෙදමහත්තයව හම්බවෙලා කතාබහ කරගන්ඩ ඕනෑ...''

වෙදමහත්තයා හවුලේ කරන්නට යන්නේ ඕනෑ නැති වැඩක් දැයි ඇසිලින් නෝනාට සිතුණ නමුත් ඈ ඒ ගැන ප්‍රශ්න කරන්නට ගියේ නැත.

පසු දවසක සිරිදාසත් සමඟ බටගොල්ලේ වෙදමහත්තයා හමුවන්නට ගිය වෙදමහත්තයා ආපසු පැමිණියේ මහත් සතුටකිනි.

''බොහොම සරුසාර වෙදමහත්තයෙක්. අපි හිටපු ටිකට හත් අට දෙනෙක්ම ආවා බෙහෙත් අහගන්ඩ... සරුවාංග වෙදකම කළාට ඇඳුමට හුඟක් හොඳයි කියල තමයි කියන්නෙ...''

''පරම්පරා වෙදමහත්තයෙක් වෙන්ඩ ඇති''

''අවුරුදු හැටක් හැටපහක් විතර ඇති. හොඳ සරීරෙ... කොණ්ඩෙ බැඳල... තේජස් පාටයි. වැඩිපුර කතා බහක් නෑ... හැබැයි මාත් එක්ක නම් හුඟක් දේවල් කතා කෙරුව. වෙදකම කරන්නෙ නැති එක ගැන දොස් කිව්ව. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වැඩෙ පැත්තකින් තියල වෙදකම කරන්ඩ කියල තමයි උන්නැහේ කිව්වෙ''

''හැබැයි ඒ කතාවෙ නම් ඇත්තක් තියෙනව. ගුරුකං ඉගෙන ගන්ඩ කැමැත්තක් නැති වුණාට වෙදකම ඉගෙන ගන්ඩනං කොල්ලත් කැමති වෙයි''

''වෙදකං කරන්ඩ වෙද්දු ඕනෑ තරං ඉන්නව ඇසිලින් නෝනෙ... දෙහි ගෙඩියක් කපාගන්ඩ කෙනෙකුත් ගමක ඉන්ඩ එපායැ... අනිත් එක අවුරුදු පණස් ගණනක් වෙනකල් මේ ගුරුකංවලින් මං උඹලව ජීවත් කෙරෙව්වෙ...''



වෙදමහත්තයාගේ කටහඬ කෙමෙන් කෙමෙන් තියුණු වෙන්නට පටන්ගෙන ඇති බැව් දැනගත් ඇසිලින් නෝනා නිහඬවීම වඩාත් සුදුසුයැයි කල්පනා කළාය.

''දවස් තුන හතරකින් කුඹුර පැත්තෙ ගියෙත් නැතේද?''

ඇසිලින් නෝනා ඒ ප්‍රශ්නය ඇසුවේ හදිසියෙන් මතුවූ ගැටුම්කාරී මානසික තත්ත්වයෙන් වෙදමහත්තයා මුදවාගැනීම පිණිසය.

''ඇයි ගුණසෝම ඒයෙ හවසත් ගියානෙ?''

''ඌ ගිහින් මැකරල් අත ගෑවට කුඹුර දිහා බලන්නෙ නැනෙ...''

''හෙට දිහාවෙ යනව''

වෙදමහත්තයාගේ කතා බහ කෙටි වූයේද අඩු වූයේද තමන්ගෙන් පිටවූ අනවශ්‍ය වචන කිහිපය නිසා බැව් ඇසිලින් නෝනාට නොතේරුණා නොවේ. කෙසේ හෝ ඔහුගේ මනස සාමාන්‍ය තත්ත්වයට ගෙනෙන්නට ඈ උත්සාහ කෙළේ එබැවිනි.

''ලබන සුමානෙ දිහාවෙ ජිනසෝම බලන්ඩ යන්ඩ කියල හිතාගෙන ඉන්නෙ... දැන් විභාගෙත් ළඟයිනෙ...ලොකු හාමුදුරුවන් ගෙන් පිරිත් නූල් කැල්ලක් ඉල්ලගෙන ගියානං ඒක බැඳලම එන්ඩ පුළුවන්''

''ඔව් ඒක හොඳයි...''

වෙදමහත්තයාගේ පිළිතුරු කෙටිය. ඒවාද ඇසිලින් නෝනාගේ යෝජනාවලට කරන එකඟවීම් පමණි. එසේ වූ විට හැබැවටම කළ යුතු දේවල් වැටෙන්නේ ඇසිලින් නෝනාගේ කරපිටය.

වෙදමහත්තයා එක්තරා ආකාරයක නිෂ්ක්‍රීය පුද්ගලයෙක් බවට පත්ව තිබේ. උපදෙස් දීම හැරෙන්නට ඔහුට කළ හැකි අන් යමක් නැත. කෙතරම් ක්‍රියාශීලී පුද්ගලයකු වුවද අතමිට හිඟවූ විට එක්කෝ ප්‍රායෝගිකව අවලංගු වෙයි. නැත්නම් අවවාද පමණක් දෙන මට්ටමකට වැටෙයි.

මනම්පේරි ඉස්කෝල හාමිනේලාගේ සිටවුව වෙන්දේසියෙන් ගත් ඇසිලින් නෝනා ඉන් අඩකටත් වඩා වියදම් කෙළේ ජිනසෝමට අලුත් කමිසයක් කලිසමක් මසා දෙන්නටත් ඔහුගේ අනෙකුත් අඩු වැඩිය සපයා දීමටත්ය.

WWW.SINHALAELIBRARY.COM 47
Uploaded By Paba

"ගවුම් දෙක තුනයි අම්මෙ තියෙන්නෙ... පන්සි අඳින්ඩ එකකුත් නෑ... ඒව මාරුවෙන් මාරුවට ඇඳල දැන් හැමෝම දන්නව"

"තාත්තටත් මොකක්වත් වැඩක් නැතෙ මේ දවස්වල... මිය තියෙන දෙයක් අඳිනව මිසක කාටවත් ජෝන්ඩ ඉස්ටැයිල් කරන්ඩ අපට බැනෙ"

ඇසිලින් නෝනාගේ පිළිතුරෙන් ඇස් රතු කරගත් කුසුමලතා ඈ දෙස කෙළින්ම බලා සිටියාය. ඇගේ තොල් වෙව්ලනු ඇසිලින් නෝනාටද පෙනිණි.

"කාට හරි මළ යකෙක්වත් ගහනවනං"

කුසුමලතාගේ ප්‍රකාශය ඉතාම නපුරු එකක් බැව් ඇසිලින් නෝනාට තේරුම් ගිය නමුත් ඈ නිහඬ වූයේ කතා බහ දුරදිග ගියේ නම් දරාගන්නට බැරි තරමේ තවත් වචන පිටවෙන්නට ඉඩ තිබූ බැවිනි.

කෙමෙන් කෙමෙන් මතුවෙන මේ ප්‍රශ්නවලට විසඳුම් ඇසිලින් නෝනා සතුව නොමැත. පවුලේ නිත්‍ය ආදායම ඇගේ කඩයප්පන් වලින් ලැබෙන මුදල වුවද ඉන් මේ ප්‍රශ්න විසඳීම ගැන සිතන්නට වත් නොහැක. වත්තේ ඇති පොල්ගස් ටිකෙන්ද දැන් එතරම් ගෙඩි කැඩෙන්නේ නැත. එක මුරයකට ගෙඩි තුන්හාරසීයක්වත් පොල් මුදලාලිට දිය නොහැක. ජේරෙන ගෙඩි සංඛ්‍යාවද මුරයෙන් මුරයට වැඩිවෙයි. පොල්ගස්වලට පෝර ටිකක් දමන්නැයි වෙදමහත්තයාට කීප විටක්ම කීවූ නමුත් පුස්කොළ පොත්වලම එල්ලී සිටිනවා විනා ඔහු ඒවා කණකට ගත්තේ නැත.

"සමුපකාරෙට පොල් පෝර ඇවිල්ලලු... ගිහින් බලල වරෙන්කො තාම තියෙනවද කියල"

වෙදමහත්තයාට කියා පලක් නොවූ තැන ඇසිලින් නෝනා, ගුණසෝමව සමුපෙට යැව්වාය. එහෙත් දවස් දෙක තුනකට පෙර පොල් පෝර අවසන් වී තිබිණි.

"ලබන සඳුදා ආයිමත් එනව කියල මැනේජර් කිව්ව"

"ලබන සඳුදා මතක් කරලම ගේන්ඩ ඕනෑ... පෝර ටිකක් දැම්මොත් ටිකක් වැඩිපුර ගෙඩි කැඩෙන්ඩ පුළුවන්. ගස් හොඳටම දුර්වල වෙලා"



වත්ත පහළ පොල්ගස් දෙස බලමින් ඇසිලින් නෝනා කීවේය. දැන් ඈ ගෙදර ප්‍රශ්න ගැන කතාකරන්නේ කුසුමලතාත් ගුණසෝමත් සමඟය. වෙදමහත්තයාටද මේ බැව් නොදැනුණා නොවේ. එහෙත් ශත පහක්වත් අතේ නැතුව ගෙදර ප්‍රශ්න ගැන කතාවක් පටන් ගන්නේ කෙසේදැයි ඔහු සිතුවේය.

දරුවා වදන්නට විලිරුදාවෙන් කෑගහන ලොකු දුවට දෙන්නට තැඹිලි ගෙඩියක් මතුරවා ගන්නට අබිලීනුගේ පවුල පැමිණියේ මේ අතරවාරයේය. තැඹිලි ගෙඩිය මතුරා ඈ අත තැබූ විට අබිලීනුගේ පවුල දුන් රුපියල් පහ වෙදමහත්තයා ප්‍රතික්ෂේප කළේය.

"දරුවෙකුට ඕවගෙ දෙයක් හිත සන්තෝසෙං කරනව මිසක උඹලගෙ සල්ලි ඕනෑ නෑ... දෙයියන්ගෙ පිහිටෙන් කරදරයක් නැතුව කෙල්ලට දරුව හම්බවේවි..."

"වෙදමහත්තයට පින් සිද්ධ වෙනව..."

අබිලීනුගේ පවුල වෙදමහත්තයා දෙස පමණක් නොව ඉස්තෝප්පුවේ උලුවස්සට හේත්තු වී බලා සිටි ඇසිලින් නෝනා දෙස ද බලා මිදුලට බැස අඩියට දෙකට පාරට ගියාය.

"අපට අගහිගකං තිබුණයි කියල ඔය වැඩේට මට සල්ලි ගන්ඩ පුළුවන්ද බං... පස්සෙ වෙලාවක අබිලීනුට කියනව සමුපෙන් පෝර ටික ඇදල දෙන්ඩ කියල"

ගුණසෝමත් සමඟ තමා කරන කතාබහ වෙදමහත්තයාගේ අවධානයට ලක්වී ඇතැයි ඇසිලින් නෝනා දැනගත්තේ ඒ වචන ටික පිටවීමත් සමඟය.

සඳුදා ඉස්කෝලේ නොගිය ගුණසෝම, අබිලීනුගේ කරත්තයත් සමඟ සමුපකාරයට ගොස් පොල් පෝර ගෙන ආවේය. අබිලීනු සමඟ එක්ව පෝර ගෝනි තුන බිමට බෑවේද ඉස්තෝප්පුවේ පැත්තකින් තැබුවේද ගුණසෝම විසිනි. වෙදමහත්තයා පැත්තකින් අත ගැසුවා පමණි.

ගුණසෝමගේ අතපය මහත් වී මස් පිඬු මේරෙන්නට පටන්ගෙන ඇති අයුරු වෙදමහත්තයා හරිහැටි දුටුවේ පෝර ගෝනි බාන විටය. ඔහුගේ සිතට සියුම් ආඩම්බර හැඟීමක්ද ඇතුළු විය.

WWW.SINHALAELIBRARY.COM 48

Uploaded By Paba

පොල් පෝර ගෙන එන්නට මුදල් සොයාගත්තේ කෙසේදැයි වෙදමහත්තයා විමසුවේ නැත. ඇතැම් විට සීට්ටු සල්ලිවලින් කොටසක් ඉතිරි කොට තබන්නට ඇත. ඔහු පෝර ගෝනිවලට කට්ටුවත් දමමේ මේ කාරණාව ගැන ඇසිලින් නෝනාට සතුටත් ස්තුතියත් පළ කරනු සඳහාය.

"මේවට පොල්ගස් වටේ ඇගිලි කපන්ඩ ඕනෑ නෑ... පෝර ටික ඉහළ තුන් කට්ටුවකින් පස් ටික අවුස්සල දම්මනං ඇති"

වෙදමහත්තයා කීවේ පෝර දැමීමේ කටයුත්තට තමන්ද සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටින බව කියාපෑමට නොවේදැයි ඇසිලින් නෝනාට නොසිතුණා නොවේ. සැබැවින්ම ඒ මොහොතේ වෙදමහත්තයා පිළිබඳව සියුම් අනුකම්පාවක්ද ඇගේ සිත කොනකින් මතු විය.

"මං හිතාගෙන ඉන්නෙ සුගතංට එන්ඩ කියන්ඩ"

"උගෙත් වැඩක් ගන්ඩ බෑ.. පොල් ගහක් දෙකකට පෝර දාල බොන්ඩ යයි. ඊට පස්සෙ කතාව මිසක වැඩ නෑ... අනිත් එක ඕක ගුණසෝමටයි මටයි කරන්ඩ බැරුවයැ"

වෙදමහත්තයා කතා කළ පිළිවෙළ ගැන ඇසිලින් නෝනා තුළ ඇති වූයේ විශාල සතුටකි.

"ඕව්... ඒක හොඳා.. තුන්කට්ටුවක් කාගෙන් හරි ඉල්ලගන්ඩ බැරියැ"

"සේතන් අප්පුහාමි ගාව හොඳ තුන්කට්ටුවක් තිබුණා... ඒක ඉල්ලගන්ඩ පුළුවන්.. මිනිහ කාටවත් බඩු දෙන්නෙ නෑ... හැබැයි මට බැහැයි කියන එකක් නෑ..."

එදා හැන්දෑවෙම සේතන් අප්පුහාමිගේ ගෙදර ගිය වෙද මහත්තයා තුන්කට්ටුව ඉල්ලාගෙන ආවේය. පසුදිනම වැඩ පටන් ගත්තේය. ඉස්කෝලේ අවසන්ව ගෙදර එන ගුණසෝමද බත් පිගාන එහෙන් මෙහෙන් කා දමා පරණ කලිසම් කොටය ඇඳ පෝර දැමීමේ කාර්යයට සම්බන්ධ විය. වෙදමහත්තයාට වඩා ඉක්මනින් ගුණසෝම වැඩ කරන අයුරු ඇසිලින් නෝනා බලා සිටියේ එක්තරා ආඩම්බරයකින් සිත පුරවා ගනිමිනි.

"හැන්නෙ උදැල්ලෙ වැඩවලට ගුණසෝම දස්සය. කරදඬුත් දැන් අගේට උස් මහත් වෙලා"



වෙදමහත්තයා ඇසිලින් නෝනා සමඟ කීවේ ගුණසෝම වැඩ කරන දෙස බලා සිටින අතරතුරේය.

"පොතපතේ වැඩවලට වගේ නෙමේ... මේ වැඩවලට බොහොම කැමතියි"

"මොකක් හරි දෙයක් උත්පත්තියෙන් අරගෙන එන්ඩ එපායැ... ඇඟපතත් හැදෙන්නෙ ඒ විදියටනෙ... ජිනසෝම අයුරු සාත්තරේට සමත් වුණාට පේන්නෙ නැද්ද ඇඟපත සෝමාරියි..."

වෙදමහත්තයාත් ඇසිලින් නෝනාත් ගුණසෝම ගැන කතා කෙළේ සිත් පුරා උතුරා යමින් තිබූ සතුට විඳගනිමිනි.

"නෑ... ඉතිං මේ දේවල් බලා කියා ගන්ඩත් කෙනෙක් ඉන්ඩ එපායැ... ඉස්සරවගේ මටත් දැන් වැඩ කරන්ඩ බෑ... තුන්කට්ටුව උස්සල පොල්ගස් දෙකක් වටේ කොටන කොට කොන්ද රිදෙන්ඩ පටන් ගන්නව... තුන් කට්ටුවත් ටිකක් බරයි. සේතන් අප්පුහාමි කිව්වුව ගෙනල්ලත් වැඩිදොහක් නෑ කියල..."

"වැඩ ටික ඉවරවුණ ගමන්ම ආපහු ගෙනිහිල්ල දෙන්ඩ ඕනෑ..."

"සේතන් අප්පුහාමි නීතිකාරය තමා"

දෙවැනි දවසේ වෙදමහත්තයා තුන් කට්ටුව ගෙන පැයක් හමාරක් වැඩ කළ නමුත් "කොන්ද ඇවිලුනා" යි කියමින් ආපහු ආවේය.

"වෙදමහත්තයට දැන් ඔය බර ආයුධත් එක්ක හරඹ කොරන්ඩ බෑ... ඉස්කෝලෙ ඇරිල ආපුවාම ගුණසෝම ඕක ඉවර කරල දායි"

පොල් ගස්වලට පෝර දැමීමේ කටයුත්ත ගුණසෝම වෙත පැවරුණේ ඒ ආකාරයටය. දාඩිය පෙරාගෙන පොල්ගස් වටේ කොටන ගුණසෝමට "තේ එකක් බොන්ඩ වරෙං" යි කුස්සියේ සිට ඇසිලින් නෝනා උස්හඬින් අඬගැසුවේ අපමණ සතුටකිනි. පොල් ගසක් මුල ඇණ තියාගෙන වාඩි වී සිටි වෙදමහත්තයාද ඒ හඬින් නැගිට්ටේය.

"යමු... යමු..."

වෙදමහත්තයා ගුණසෝමගේ අවධානය තේ එකට යොමු කෙළේ ඒ වන විට ඔහු හොඳටම හෙම්බත්ව සිටින බව වැටහී ගිය හෙයිනි.

"ඔතනකට හෙනකට ගන්ඩ ඔය ගාලක් දෙකක් ඉතුරු කොරල බැඳිල පස් ටික උදුරලම දාන්ඩ ඕනෑ"

UNLIMITED
The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 49
Uploaded By Paba

තේ බොන ගමන් වෙදමහත්තයා අදහසක් දෙකක් දැම්මේය.

"අම්මෙ පල්ලෙහා හරියෙ කෙහෙල් ගස් හත අටක් හිටෙව්වනං මරු"

"සේතන් අප්පුහාමිගෙන් හොඳ කෙහෙල් පැළ දෙක තුනක් ඉල්ලගන්ඩ බැරිවෙන එකක් නෑ..."

වෙදමහත්තයාද කතා බහට එක්වීමට දැඩි කැමැත්තක් දැක්වීය. පුස්කොළ පොත් අතරටම කොටුවී සිටි වෙදමහත්තයා බලාපොරොත්තු නොවූ අයුරින් පෝර දැමීමේ කටයුත්තට පමණක් නොව වත්ත පහළ වැඩ කෙරෙහි මෙසේ අවධානය යොමු කිරීම ඇසිලින් නෝනාගේ සිතට මහත් අස්වැසිල්ලක් ගෙන දුන්නේය.

"හැබැයි ඉතිං... ගොවිතැන් වැඩට දස්සයි කියල කිව්වට ඉස්කෝලෙ වැඩ ටිකත් කොරන්ඩ කියාපං... අඩුගානෙ ඇස්. අස්. සී වැඩ දෙකතුනක්වත් පාස් වුණොත් තමයි හොඳ..."

ගුණසෝම නැති අවස්ථාවක් බලා වෙදමහත්තයා කීවේය.

"මටත් ඕක හිතුන... බොහොම සතුටෙන් තමයි පොත්පත් මේස උඩට විසි කරල වත්ත පහළට දුවන්නෙ..."

"ගොවිතැන් වැඩවලට කැමැත්තක් තියෙන හින්ද එහෙම කරනවද පොතපතේ වැඩවලින් ගැලවෙන්ඩ එහෙම කරනවද කියන එක ගැන තමයි බලන්ඩ ඕනැ"

"නැ මගේ හිතේ හැටියට උඳල්ලෙ වැඩවලට ගුණසෝම කැමැතියි"

ඇසිලින් නෝනා ස්ථිරවම කියා සිටියාය.

"නෑ... මං හිතන්නෙත් එහෙම තමයි"

වෙදමහත්තයාද ඔහුගේ අදහස කීවේ එවැනි සැහැල්ලු ස්වරයකිනි.

"මල්ලි පෙරේද ඉස්කෝලෙ ගිහින් නෑ..."

වෙදමහත්තයා හා ඇසිලින් නෝනා අතර සිදුවූ කතා බහ අසාගෙන සිටි කුසුමලතා පැවසූ ආරංචියෙන් ඔවුන් දෙදෙනාගේම මුහුණු එක්වරම වෙනස් විය. මෙතෙක් පැවැති සැහැල්ලු පෙනුම වෙනුවට ප්‍රශ්නාර්ථයක් සහිත ස්වරූපයක් මතුවිය.



"එහෙනං?"

වෙදමහත්තයා නිහඬව සිටිද්දී ඇසිලින් නෝනා කුසුමලතාගේ මුහුණ දෙසට කෙළින්ම තියුණු බැල්මක් හෙළමින් ඇසුවාය.

"පන්තියේ කොල්ලෙකුගෙ ගෙදර පොල්අතු බදින්ඩ ගිහිල්ල..."

"ඒ වගේ දේකට නම් කමක් නෑ" යි කියන්නට වෙදමහත්තයාට සිතුණ නමුත් ඒ සිතුවිල්ල පැමිණි විගසම පිටකරන්නට තරම් ඔහු ඉක්මන් වූයේ නැත.

"මට නැතත් උඹලට කියල යන්ඩ එපායැ... ඔන්න ඕවගෙ වැඩවලට මගේ කැමැත්තක් නෑ... පොල්අතු බදින්ඩ ගිය එක නෙමේ... කාටවත් නොකියා ගිය එක... අනිත් එක ඉස්කෝලෙ යන්නෙ නෑ කියන්නෙ කැලෑ පැනීමක්"

වෙදමහත්තයා එසේ කියා කුස්සියෙන් පිටව ඉස්තෝප්පුවට ගොස් ලණු ඇඳෙහි ඇලවුණේය.

"උඹ මොකටද තාත්තා ඉන්න තැන ඕව කියන්ඩ ගියේ?"

"ඒ කොල්ලන්ගෙ අක්ක මට කිව්වෙ... අපේ ටයිපිං පන්තියට එනව... නොකිය හිටියනං කියයි ඇයි කිව්වෙ නැත්තෙ කියල"

"කියාපු එක නෙමෙයි වැරැද්ද... තාත්ත හිටපු තැන කියාපු එක"

"මං ඕව දන්නෙ නෑ... මං කිව්ව එච්චරයි"

කුසුමලතා වේගයෙන් පා තබන හඬ වෙදමහත්තයාටද ඇසුණේය. කුසුමලතා දත් ටිකක් මුරණ්ඩු බවක් දක්වන්නේ යැයි ඇසිලින් නෝනාට කීපවතාවක්ම දැනුණ නමුත් ඒ හැම මොහොතකම ඒ හැඟීම යටපත් කරගන්නා විනා මතුපිටට පැමිණීමට ඈ ඉඩ දුන්නේ නැත.

"නරක වැඩකට නෙමෙයිනෙ ගිහිල්ල තියෙන්නෙ... සමහර ළමයි ඉස්කොලෙ නොගිහින් ගම්පහ ගිහින් බයිස්කෝප් බලනවලු... මේක ඉතිං එහෙම එකක් නෙමෙයිනෙ"

ඉස්තෝප්පුවට ගිය ඇසිලින් නෝනා වෙදමහත්තයාට ඒ අයුරින් හෝ [illegible] ගුණසෝම ගැන ඔහුගේ සිතේ සුළු වශයෙන් හෝ අප්‍රසාදයක් ඇතිවීම ගැන ඇගේ සිත සසල වූ බැවිනි. කුසුමලතාට [illegible] කීවේද එබැවිනි.

www.sinhalaelibrary.com
SL UNLIMITED The spirit of Sri Lankan e-commerce
WWW.SINHALAELIBRARY.COM 50
Uploaded By Paba

"ගෙදරක පොල් අතු බඳින්ඩ උදව් වෙන්ඩ යනව කියන එක නරක වැඩක් නෙමෙයි... හොඳ වැඩක්... එහෙම තමයි ළමයි හැදෙන්ඩත් ඕනැ... හැබැයි මට බැරිනං උඹට හරි කියල ඉස්කෝලෙ නොගිහින් යන්ඩ තිබුණ... ඒ ගැන ගුණසෝමට දනුමුතුකමක් දීපං..."

වෙදමහත්තයා ඒ කතාව එතැනින් නිම කළේය.

x x x x

කුසුමලතාගේ උදව් පදව් ඇතුව සව්දොදොල් කෑලි විසිපහක් තිහක් පිළියෙළ කරගත් ඇසිලින් නෝනා ජිනසෝම බලන්නට සෙන්ට්‍රල් කෝලිජියේ නේවාසිකාගාරයට ගියාය. ඇගේ එක් පරමාර්ථයක් වූයේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගෙන් ඉල්ලාගත් පිරිත් නූල ඇස්. ඇස්. සී. විභාගයට පෙර ජිනසෝමගේ අතේ ගැට ගැසීමය.

"සව් දොදොල් කෑලි වගයක් ඇති"

ජිනසෝම පාර්සලය ගත්තෙ වචනයක්වත් නොපවසමිනි. "කොල්ලො කනව මිසක මේකෙන් මට කෑල්ලක්වත් කන්ඩ හම්බවෙයිද මන්දා" යි වැන්නක් ඔහුගේ මුවින් පිටවූයේ නම් කොතරම් හොඳදැයි ඇසිලින් නෝනාට සිතිණි.

"උඹලගෙ අම්ම හදන වැලිතලප හරි රහයි බං"

යාළුවන් එසේ කියනු ඇත. ජිනසෝමද එයට සිනාවකින් පිළිතුරු දෙනු ඇත. එහෙත් ඔහු තමාගේ මූණ බලාගෙන එවැනි වචනයක් පිට නොකිරීම ඇසිලින් නෝනාගේ කණස්සල්ලට හේතු විය.

"මල්ලි ගොවිතැන්වලට උනන්දුයි කියල අක්ක ලියල එවල තිබුණා"

මිනිත්තුවක දෙකක අසීරු නිශ්ශබ්දතාව බිඳිමින් ජිනසෝම කීවේය. ඒ වචන දෙක තුන ඇසිලින් නෝනාව ඒ අසීරුතාවෙන් මුදවා ගත්තේය.

"තාත්තටත් දූන් එක දිගට වැඩක් කරන්ඩ බැහැනේ..."

"හැබැයි ඉතිං ඇස්. ඇස්. සී. විභාගෙන් වැඩ දෙක තුනක්වත් පාස් කර නොගත්තොත් මොකක්වත් රස්සාවක් හොයාගන්න බැරිවෙයි"

WWW.SINHALAELIBRARY.COM 51



ජිනසෝම කතා කරන්නේ මහා වැඩිහිටියකු මෙනි. ඔහුගේ උඩු රැවුලද කඳිමට වැවී ඇත. ඇසිලින් නෝනා එදෙස විශේෂයෙන් බලනු ජිනසෝමගේ නෙතටද අසුවිය. ඇසිලින් නෝනා ඒ සමගම ඉවත බැලුවාය.

"තාත්තාගේ බිම අඩුවෙලා කියලත් ලියල එවල තිබුණා"

"දූන් බොන්නෙම නැති ගානයි"

"ඒක නං ලොකු දෙයක්... තාත්තාගෙ බිම ගින්ද අපේ පවුල එතනමයි. කිසි දියුණුවක් නෑ..."

ජිනසෝම එවැන්නක් නොකීවා නම් හොඳ යැයි ආපසු එන අතරේ කිහිප විටක්ම ඇසිලින් නෝනාට සිතිණි.

"තාත්තාගෙ හැටි ඉතිං දන්නෙ නැද්ද... හැබැයි දූන් හුඟක් දේවල් තේරිලා"

තමා ඒ මොහොතේ ජිනසෝමට දුන් පිළිතුර ගැනද ඇසිලින් නෝනා සිතුවාය. එය වෙදමහත්තයා පාවාදීමක්ද? "තාත්ත මිනිස්සුන්ට උදව් කළා මිසක පවුලෙ දේවල් බැලුවෙ නෑ තමයි... ඒ ඉතින් තාත්තගෙ හැටි" යි කියා ජිනසෝමට පිළිතුරු නොදුන්නේ ඇයි? ජිනසෝම බලන්නට ගොස් ඇසිලින් නෝනා ආපසු ආවේ සිතේ සතුටකින් නොවේ. "තාත්තල ගාව තියෙන මනුස්සකම මෙහෙ ඉන්න හුඟක් ළමයින්ගෙ තාත්තල ගාව නෑ... ඒ මිනිස්සු බලන්නෙ ඒ අයගෙ ළමයි ගැන විතරයි" යි යනුවෙන් ඔහු කීවේ නම් හිතට මොනතරම් ශක්තියක් දැයි ඇසිලින් නෝනාට ගෙදර පැමිණ මහත්සියට ඇඳෙහි ඇලවූ මොහොතේද සිතිණි. එසේ වී නම් ඒ බව වෙදමහත්තයාටද කියන්නට ඉඩක් ලැබෙනවා නොවේද? එවැන්නක් ඇසූ ඔහුගේ සිත මොනතරම් ප්‍රබෝධමත් වන්නට ඉඩ තිබිණිද? යි සිතෙනවිට ඇසිලින් නෝනාගේ දෙනෙත් අතර කඳුලක්ද පිරුණේය. එක් අතකට තවමත් හරිහැටි රැවුලවත් නොවැඩුණු දරුවකුගේ වචන ගැන මේ තරම් දුරට සිතිය යුතු නැත. මීට වඩා කාරණා තේරුම්ගත හැකි වයසකදී ඔහු වෙදමහත්තයාගේ අගය වටහා ගනු ඇතැයි ඈ සිතුවාය. ඒ සිතුවිල්ල ඇගේ සිතට අස්වැසිල්ලක් ගෙන ආවේය.

"කොල්ල හොඳටම කෙට්ටු වෙලා"

වෙදමහත්තයා කුඹුරේ සිට ගෙදර පැමිණි මොහොතේ ඇසිලින් නෝනා කතාව පටන් ගත්තේ ඒ විදියටය...

Uploaded By Paba

''ඔය බෝඩිංවල හරි හමං විදියට කන්ඩ තියෙනවයැ... ඔහේ මොනව හරි තම්බල දෙනව මිසක...''

''මේ දවස්වල ටිකක් වැඩිපුර පාඩං කරනව කියලත් කිව්ව... නිදිමරනවත් ඇතිනෙ...''

''විභාගෙත් ළඟයි නෙ...''

''පිරිත් නූල් කෑල්ල මං දීල ආව... බැඳගන්නෙ නැතෑයි''

''ඇසිලින් නෝනට තිබුණෙ බැඳලම එන්න''

''ඔය ළමයි තලේ ඔව බඳින්ට ගියාම ජිනසෝමට ලැජ්ජ හිතෙන්ඩත් පුළුවන්නෙ...''

''ඔව්... ඒකත් ඇත්ත''

වෙදමහත්තයා, ඇසිලින් නෝනාගේ අදහස අනුමත කෙළේය. දන් සති දෙක තුනක සිට ඔහු කිසිවකට විරුද්ධ නොවෙයි. ''ඇත්ත තමයි..'' ''ඔව්... හැබෑට...'' ,''මටත් එහෙම හිතෙනව'' වැනි වචන කියමින් හැම දෙයකටම වාගේ එකඟ වෙයි.

වෙදමහත්තයාගේ මෙම අලුත් චර්යා ලක්ෂණයට ඇසිලින් නෝනාගේ වැඩි කැමැත්තක් නැත. මීට කලකට පෙර නම් වෙදමහත්තයා මීට වඩා ජවසම්පන්න යැයි ඈට සිතිණි. කළුවර වැටෙද්දී අරක්කු ටිකක් කටගාගෙන ගාථාවක්ද කියාගෙන ගෙට වදින වෙදමහත්තයාගේ ඒ දිනවල ගති සොබාව ඇසිලින් නෝනාට මැවී පෙනිණි.

''සබ්බ පාපස්ස අකරනං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං...
............ ............ ............''

ඒ ගාථාව සම්පූර්ණ නොකර වෙදමහත්තයා අතේ තිබෙන කරවල කෑල්ල ඇසිලින් නෝනා අතට දෙයි.

''මෙන්න මේකෙන් කෑල්ලක් බැදල ගනිං''

''මේ ගොම්මං වෙලාවෙ පුළුටු බදින්ඩ හොඳයෑ''

''මළ පෙරේතයෙක් කියා යකෙක්වත් එන්නෙ නෑ බං මං ඉන්න පැත්ත පළාතක... ආවොත් ආපහු යන්ඩ වෙන්නෙ න...



උන්දැල දන්නව'' එසේ කියන වෙදමහත්තයා ''ඒතං බුද්ධානු සාසනං'' යනුවෙන් කියා ගාථාව සම්පූර්ණ කරමින් කුස්සියේ තිබෙන පුටු කබලෙහි ඉඳ ගනියි.

''හෙට තියෙනව ටිකක් ලොකු වැඩක්... බලගතු බන්ධනයක් කපන්ඩ... තනිපොල්ගස්වත්තේ මිනී පිට්ටනියෙ තමයි මෝල්ගස් දෙකක් දපන්නෙ... ඒකට කිරිකිත්තෙ ගුණේරිස් ගුරුන්නාන්සෙ එනව''

''යන දිහාක ගෙදරට ආරස්සාවක් කරල ගියොත් හොඳයි නේද?''

''කොහොමටත් එහෙම කරන්ඩ තමයි හිතාගෙන ඉන්නෙ''

තමා ඒ දවස්වල එවැනි ඉල්ලීමක් කළේ කෙතරම් ගෞරවයකින්දැයි ඇසිලින් නෝනාට සිතිණි. ඒ බලසම්පන්න ආරක්ෂකයා දන් ''ඇත්ත තමයි... ඒක තමයි'' වැනි වචන භාවිතා කරන මට්ටමකට පත්වීම පිළිබඳව ඇසිලින් නෝනා සිටින්නේ කණස්සල්ලෙනි. ඔහු ගුණසෝමටවත් යමක් නොකියන තරමටම 'හැල්දු ලෙස' හැසිරෙයි.

''ඇඟටත් හරි මහන්සියි බං... තියෙනවනං රුපියල් තුන හතරක් දීපංකො.. කඩේ පැත්තෙ ගිහිල්ල එන්ඩ''

එවැන්නක් කියමින් තමන්ගෙන් කීයක් හෝ ඉල්ලනතෙක් ඇසිලින් නෝනා බලා සිටියාය. එහෙත් වෙදමහත්තයා එවැනි ඉල්ලීමක් කරන්නේ නැත. අතමිට තඹයක් නොවූවද එසේ බාල්දු ඉල්ලීමක් නොකිරීම ගැන ඇසිලින් නෝනා එක් අතකින් සතුටු වූවද ඔහු එසේ නොඉල්ලන්නේ ඒ තරමටවත් දහිරියක් සිතේ නොමැති වීම නිසාදැයි සිතෙන විට යළි කණස්සල්ලක් නොව හැබෑවටම දුකක් ඇති වෙයි.

× × × ×

ජිනසෝම ඇස්. ඇස්. සී. විභාගයට පිළිතුරු ලියා ගෙදර පැමිණියේය. ඔහු වැඩිපුරම කාලය ගත කළේ ඉස්තෝප්පුවේ පුටුවක වාඩි වී ගුරුපාරේ යන එන මිනිසුන් දෙස බලා සිටිමිනි. සමහරුන් ඔහුට අඳුනාගන්නටවත් නොහැකිය. කුසුමලතා අසලක සිටින විට නම් ඔහු පාරේ යන එන අය ගැන ඇගෙන් විමසුවේය.

''ඒ රංජනී අක්ක... ඉස්සර මහකඳ ඉස්කෝලෙ ජසයා ලෙන්චිනා හැටුවෙ. ලෙන්චිනාට රගපෑවෙ... දන් බැඳල... ළඟදි බැන්දෙ... [illegible]ස්සනායිනෙ... ඒ වුණාට මනුස්සය කැතයි''

WWW.SINHALAELIBRARY.COM 52
Uploaded By Paba

"ඒ සුමනදාස... මගේ පන්තියේ හිටියෙ... දැන් අවුරුදු දෙකකට විතර ඉස්සර තාත්තා මැරුණ... ගෙහින් වැටිල... දැන් සුමනදාස තමයි පවුල රකින්නෙ..."

"රස්සාවක් කරනවද?"

"තාත්තගෙ රස්සාව තමයි... ගස් යන එක... හැබැයි හරි හොඳයි... දුක්ක හැනදි කතා කරනව... බොන්නෙ එහෙමත් නෑ... හම්බකරන සතපහ හරි අම්මට ගිහින් දෙනවලු"

මින් පෙර ගෙදර පැමිණි අවස්ථාවල මෙවැනි වෙනස්කම් ජිනසෝමට දනුණේ නැත. ගමේ විස්තර කුසුමලතාගෙන් හෝ වෙන කාගෙන් වත් අසන්නට ගියේද නැත. මෙතෙක් ගම වසාගෙන සිටි තිරපටක් විභාගය අවසන් වී ගෙදර පැමිණීමත් සමගම විවර වී ඇති බවක් ජිනසෝමට දැනිණි. දවසක් දෙකක් යනවිට ගුරුපාර දෙස බලාසිටීමද ඒකාකාරී ක්‍රියාවක් බවට පත්විය. එහෙත් ඔහු ඉස්තෝප්පුවට වී බලාගෙන සිටියේය.

"මල්ලිට කම්මැලි ඇතිනෙ?"

කුසුමලතා ලණු ඇද මත ඉඳගනිමින් ඇසුවාය. ජිනසෝම ඇ දෙස නොබලාම යම්තමින් සිනාසුනේය.

"කරන්ඩ වැඩක් තියෙනවනං ගානක් නෑ..."

"පොඩි මල්ලිට නං හෝගාල වැඩ... දැන් නියම ගොවියා"

"ඉස්කෝලෙ යන්නෙම නැද්ද දැන්?"

"යනවට වඩා නොයනව... මම නං කවදාවත් දැකල නෑ පොතක පතක වැඩක් කරනව.."

"අක්කගෙ ටයිපිං පන්තිය කොහොමද දැන්?"

"වැරැද්දක් නෑ... ඒත් ඉතිං අරමුණක් නැතෙ... නිකං ගෙදර ඉන්ඩ බැරිකමට යනව වගේ තමයි. මල්ලි මොනව කරන්ඩද හිතාගෙන ඉන්නෙ?"

"ඒක ඉතිං ප්‍රතිඵල ආපුවාම බලමුකො"

ජිනසෝම පිළිතුරු දුන්නේ මඳ සිනාවක්ද දෙතොල'ග රඳවා ගනිමිනි. ඔහු තරමක් ආඩම්බර වී ඇතැයි කුසුමලතාට සිතිණි.

තමාගේ පිළිතුරෙන් කුසුමලතාගේ සිත රිදෙන්නට ඇතැයි ජිනසෝමටද සිතිණි. මෙතෙක් වෙලා පාර දෙස බලාගෙන සිටි



ඔහු ඇ දෙස බලා සිනාසුනේ තමන්ගේ වචන ගැන කණගාටුව ප්‍රකාශ කරන්නාක් මෙනි.

"විද්‍යාව කරන්ඩ කියල තමයි කවුරුත් කියන්නෙ... කොහොමවත් විද්‍යාව මට ලේසියි. මගේ හොඳම යාළුවො දෙන්නත් දෙකත් විද්‍යාව කරන්ඩ තමයි හිතාගෙන ඉන්නෙ... අනික් එක හොඳට පාස් වුණොත් සල්ලි හොයන එකේ ප්‍රශ්නයක් නැනෙ..."

"මල්ලි හොඳට පාස්වෙයි... අම්මල හරි ලොකුවට හිතාගෙන ඉන්නෙ..."

"ප්‍රතිඵල අතට එනකල් මොකුත් කියන්ඩ බැනෙ..."

විභාගයට පෙර ජිනසෝම ගෙදර පැමිණි අවස්ථාවල මේ තරමට සමීපව කතා කරන්නට කුසුමලතාට අවස්ථාවක් ලැබුණේ නැත. ඒ දවස් ඔහු බොහෝවිට ගත කළේ නේවාසිකාගාරයේ සිට ගෙදර ගෙන එන පොත පත බැලීමටය.

"මං මල්ලිට කියවන්ඩ හොඳ නවකතාවක් අරගෙන ආවා..."

දිනක් ටයිපිං පන්ති ගොස් ගෙදර පැමිණි කුසුමලතා ඇඳුම් මාරුකිරීමටත් පෙර කරුණාසේන ජයලත්ගේ "ගොළු හදවත" නවකතා පොත ජිනසෝමට දුන්නාය.

"මම මේක එක පාරක් කියෙව්ව... දෙපාරක් වුණත් කියවන්ඩ පුළුවන්... කම්මැලිකමක් නෑ..."

ජිනසෝමගේ කතාවෙන් කුසුමලතා පළමුව පුදුමයටත් දෙවනුව සතුටටත් පත් වූවාය. ඇ සිතා සිටියේ ජිනසෝම විභාග පොත් හැර නවකතා වැනි පොත් අතින්වත් අල්ලන්නේ නැති කෙනෙකු ලෙසිනි. එහෙත් තමා මෙන්ම ඔහුත් ගොළු හදවත වැනි පොත්වලට කැමැතිය.

"සුගත්ට වෙන දේ ගැන මට නං හරි දුකයි"

කුසුමලතා පොත රස කරන්නට පටන් ගත්තාය. එහෙත් ජිනසෝමගේ මුව'ග තිබුණේ උපහාසාත්මක සිනාවක්දැයි සිතුණ විට ඇ ඒ ගැන වැඩිදුරට විස්තර කරන එක නැවැත්තුවාය.

"හිතෙන් මවාගත්තු චරිතනෙ... අපි මොකටද දුක්වෙන්නෙ...? හැබැයි ඉතිං දුක්වෙන්ඩ තොමෙ කියවන්ඩ ආසයි"

WWW.SINHALAELIBRARY.COM 53
Uploaded By Paba
www.sinhalaelibrary.com
SL UNLIMITED The spirit of Sri Lankan e-commerce

වයිසිං පන්තියට යන අතරතුර ගම්පහ නගර සභා පුස්තකාලයට ගොඩවැදී නවකතා පොතක් ගෙන ඒම කුසුමලතාගේ පුරුද්දකි.

"මල්ලි කැමැති පොතක් තියෙනවනං කියන්ඩ ගෙනත් දෙන්ඩ"

"එහෙම විශේෂයක් නෑ..."

ජිනසෝමගේත් කුසුමලතාගේත් කතා බහට ගුණසෝම සම්බන්ධ වූයේ නැත. ඔහු බොහෝවිට ඒ සමාගමය මග හැරියේය. එහෙත් වෙල පැත්තට හෝ දංගොල්ලෑව ඔව්ට පැත්තට ගොස් එනවිට මොනවා හෝ ගෙන ඒමට නම් අමතක කළේ නැත.

දවසක් ඔහු ඉදී ලේපාට වුණු ගොරෝක් ගෙඩි හත අටක් ඉරටුවක අමුනාගෙන විත් කුසුමලතාට දුන්නේය.

"ඕවා වැඩිපුර කන්ඩ එපා... බඩේ අමාරුවක් එහෙම හැදුනොත් ඉස්පිරිතාලෙන් මෙහා නතර වෙන්ඩ හම්බවෙන්නේ නෑ..."

ඇසිලින් නෝනා ගොරකා ගෙඩි දෙස බලමින් පැවසූ මුත් එය ගණනකට නොගත් කුසුමලතා ගෙඩියක් පලා ඇඟිලි තුඩින් මදයක් ගෙන ජිනසෝමගේ අත්ල මත තැබුවාය.

"ඉදල හිටල ගොරෝක් මදයක් කෑවට කමක් නෑ... නැත්තං මල්ලිට ගමේ දේවල් අමතක වෙනව"

කුසුමලතා කීවාය. ගොරකා මදවල අගුණ කීවද ජිනසෝම සහ කුසුමලතාට ගොරකා ගෙඩි අහුලා ගෙනැවිත් දීමෙන් ගුණසෝම කෙළේ තමන් තුළ ඇති ඇල්ම ප්‍රකාශ කිරීමක් නොවේදැයි සිතුණ විට ඇසිලින් නෝනා මහත්සේ සතුටට පත්වූවාය.

ජිනසෝම ආපසු නේවාසිකාගාරයට යාමෙන් වැඩිපුරම පාළුවක් දැනුණේ කුසුමලතාටය. නවකතාවක තිබෙන චරිතයක් ගැන කතා කරන්නට දත් කෙනෙක් නැත. ජිනසෝම ගිය පසුවද ගුණසෝම ගඩාගෙඩි ගෙනැවිත් කුසුමලතාට දුන්නේ ඒ නිසාදැයි ඇසිලින් නෝනා කල්පනා කළාය.

ජිනසෝමගේ පැමිණීමත් දින ගණනාවක් නැවතී සිටීමත් නිසා ඇතිවූ සමීපතාව ඔහු ගිය පසුවද ඉතිරි වී තිබීම ගැන වඩාත් සතුටු වූයේ ඇසිලින් නෝනාය. ඔවුන්ගේ මේ වෙනස ගැන ඈ වෙදමහත්තයාටද කීවාය.

× × × ×



# 10

බොහෝ දවසකට පසු වෙදමහත්තයා මුණගැහෙන්නට සිරිදාස පැමිණියේය. ඔහු අත විශාල ආනමාලු කෙසෙල් ඇවරියක්ද විය. එහෙත් ඒ මොහොතේ වෙදමහත්තයා ගෙදර සිටියේ නැත. සිරිදාස වෙදමහත්තයාට කතා කරන විට ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට පැමිණියේ ඒ නිසාය.

"සිරිදාස හුඟ දවසකින් මේ පැත්තෙ ආවෙ...?"

"මේ දවස්වල අලව්වෙ වැඩ... එහෙ නැවතිලා ඉන්නෙ... වෙදමහත්තය කොහාට හරි ගිහින්ද?"

"මාටින් මුදලාලිගෙ කඩේ පැත්තෙ යන්ඩ ඇති... සිරිදාස වාඩිවෙන්ඩ"

"අලව්ව පැත්තෙ කෙසෙල් හරිම ලාබයි. මම එනකොට ඇවරි දෙක තුනක්ම අරගෙන ආවා... කොහෙ හරි දුරක ගිහින් එනකොට මොනව හරි අරගෙන එනවනං අම්ම හරි කැමැතියි. වෙදමහත්තයටත් ඇවරියක් ගෙනාවා"

කෙසෙල් ගෙඩි පාර්සලය ඇසිලින් නෝනා අතට දෙමින් සිරිදාස කීවේ කටපුරා පැතිරුණ සිනාවක්ද සහිතවය. ඔහු ඉඳගත්තේ දෙවැනි වතාවටත් ඇසිලින් නෝනා පැවසූ පසුවය. සුදුපාට සරමක් ඇඳ ලා නිල්පාට කමිසයක් උඩින් දමා කමිස කොලරය යටින් ලේන්සුවක්ද රඳවා සිටි සිරිදාසගේ පෙනුම වෙනදාට වඩා කැපී පෙනෙන්නේ යැයි ඇසිලින් නෝනාට සිතිණි.

"කුසුමලතා... මල්ලි වත්ත පහළ ඉන්නවනං කතා කරන්ඩ"

WWW.SINHALAELIBRARY.COM 54
Uploaded By Paba

කුසුමලතා කාමරයේ සිට කුස්සිය පැත්තට යන අඩි ශබ්දය සිරිදාසට පැහැදිලිව ඇසුණ නමුත් සාලය දෙස බලන්නට ඔහුට ශක්තියක් තිබුණේ නැත. පුපුරුහු පරිදි ඈ දිගු කෙස් වැටිය කරල් දෙකකට ගොතාගෙන ඇතැයි සිරිදාස සිතුවේය. ඈ කුස්සියට ගිය හැටි සිහින් මවා ගත්තේය.

"අම්මෙ ඔන්න මල්ලි එනව පිළිකන්න පැත්තෙන්"

කුසුමලතා කුස්සියේ සිට උස් හඬින් පැවසුවාය. ඒ හඬින් සිතේ ඇතිවූ වෙනස මුහුණින් නොපෙන්නා සිටින්නට සිරිදාස දැඩි උත්සාහයක් ගත්තේය. ගුණසෝම පිළිකන්න පැත්තෙන් මතු විය. ඔහු අත උදැල්ලක් මෙන්ම කැත්තක්ද තිබිණි. ගත දහඩියෙන් තෙත්ව ගොසිණි. ගුණසෝම හදිසියේ ගජ ඉලන්දාරියකු වී ඇතැයි සිරිදාසට සිතිණි. ඔහු, ගුණසෝම සමග සිනාසුණේ වෙනදා මෙන් ළමයෙකු සමග සිනාසෙන ආකාරයට නොවේ. පවුලේ වැඩිහිටි සාමාජිකයෙකු සමග සිනාසෙන ආකාරයටය.

කඩේ පැත්තේ ගිහින් බලාපං තාත්ත ඉන්නවද කියල... කියාපං සිරිදාස අයිය ඇවිල්ල කියල... දාම් අදින්ඩ පටන් අරගෙන නං වරුවකට නැගිටින්නෙ නෑ... හොයන්ඩ ගියේ නැත්තං"

ඇසිලින් නෝනාගේ වචනයට එකග වූ නමුත් ගුණසෝම පිටව ගියේ එතරම් කැමැත්තකින් නොවේ. කම්සයක් නොමැතිව පාර පැත්තට යාමට දන් ගුණසෝම එතරම් කැමැත්තක් නොදක්වයි. ඇසිලින් නෝනාට ඔහුගේ අකමැත්ත නොදනුණා නොවේ. ඒ ගැන අවධානය යොමු නොකළ ඈ ගුණසෝම දෙස නොබලාම "කියාපං සිරිදාස අයිය ඇවිල්ල කියල" යි කීවාය.

ඇසිලින් නෝනාගේ හඬෙහි වෙනදාට වඩා සමීප බවක් ඇත. "කියාපං සිරිදාස අයිය ඇවිල්ල කියල" යි කී අයුරු යළි සිහියට නගා ගැනීමට සිරිදාස උත්සාහ ගත්තේය. "සිරිදාස අයියා" යන වචන දෙක ඇසිලින් නෝනාගේ හඬින් ඒ අයුරින් සිරිදාස මින් පෙර අසා තිබුණේ නැත. බොහෝ දවසකින් නොපැමිණි නිසා මෙවැනි සමීපතාවක් දක්වනවා වෙන්නට ඇතැයි සිතුණ පසු ඇතිවූ සැහැල්ලුවක් සමග ඔහු ඇසිලින් නෝනාගේ මුහුණ දෙස කෙළින් බැලුවේය.

"ගුණසෝම මල්ලි දන් ගජ ඉලන්දාරියෙක් වෙලා..."



සිරිදාස තමන්ට හැකි පමණ ලෙන්ගතු හඬකින් කීවේය. "ගුණසෝම මල්ලි" යනුවෙන් පැවසීම සඳහා ඒ වචන දෙක එකතු කරගන්නට සිතේ ශක්තිය ලැබුණේ "සිරිදාස අයියා" යනුවෙන් ඇසිලින් නෝනා ඔහුව හඳුන්වා දීමත් සමගය. ඒ හැඟීම ඔහු සඟවාගන්නට උත්සාහ ගත්තේ නැත. නිරායාසයෙන් මුහුණෙන් ප්‍රකාශවෙන්නට ඉඩ හැරියේය.

සිරිදාස ඉස්තෝප්පුවේ සිටියදී "වතුර ටිකක් ලිපේ තියන්නං" යි කියමින් ඇසිලින් නෝනා කුස්සියට ගියාය. කුසුමලතා කුස්සියේ උළුවස්සට හේත්තු වී වත්ත පහළ පොල්ගස් පෙළ දෙස බලාගෙන සිටියාය.

"ඔතන බලාගෙන හිටියේ... වතුර ටිකක්වත් ලිපේ තියන්ඩ එපායැ"

ඇසිලින් නෝනාගේ කතාවට පිළිතුරක් දෙනවා තබා ඈ හැරී බැලුවේවත් නැත.

"තාත්තා දන් ඔය ගුරුකං අතැරල ගොවිතැන් කරන්ඩ පටන් අරගෙන තියන එක නවත්තල ආයිමත් ගුරුකං වැඩ පටන් ගනීද දන්නෙ නෑ..."

කුසුමලතා ආඩාපාලියක් කියමින් විත් පුටුවේ ඉඳගත්තාය.

"තාත්ත ගුරුකං නොකරන්නෙ එපාවෙලා හින්ද නෙමෙයි... වැඩ අඩු හින්ද... හැබැයි සිරිදාසගෙ ආස්සරේ හින්ද වෙදමහත්තයාගෙ හිත තෙල් බෙහෙත් හැදිල්ලටයි වෙදකමටයි ඇදෙන්ඩ පුළුවන්. එහෙම වෙනවනං හොඳා"

ඇසිලින් නෝනාගේ කතාවෙන් කුසුමලතාගේ අඳුරු මුහුණ තවදුරටත් අඳුරු වී ගියේය.

"මට නං ඔය මනුස්සයව අල්ලන්නෙ නෑ"

කුසුමලතා හදිසියෙන්ම වාගේ කීවාය. ඇසිලින් නෝනා එයට පිළිතුරු වචනයක් දෙන්නට ඉක්මන් වූයේ නැත. කොහොමටත් මුලසිටම සිරිදාසට මුහුණදීමට කුසුමලතාගේ එතරම් මනාපයක් නොතිබූ බැව් ඇසිලින් නෝනා ඇගේ ඉරියව්වලින් තේරුම්ගෙන සිටියාය.

සිරිදාස සමඟ කතාබහ කිරීමෙන් වෙදමහත්තයා විශාල සතුටක් ලබන බැව් ඇසිලින් නෝනා දනියි. දන් වෙදමහත්තයා ගුණපාල

WWW.SINHALAELIBRARY.COM 55

Uploaded By Paba

ළමයාගේ නිජ්පොලට යන්නේ නැත. මාටින් මුදලාලිගේ කඩයට වුවද යන්නේ ඉඳහිටය. ඒ නිසා තමන් කැමති දෙයක් පිළිබඳව කතාබහ කරන්නට කෙනෙක් සිටිය යුතුය. කුසුමලතාලාට මේ දේවල් ගැන කිසිදු වැටහීමක් නැත.

මෙවැනි සිතුවිලි රැසක්ම ඇසිලින් හෝතාගේ සිතට පැමිණී නමුත් ඈ ඒ එකක්වත් මුවින් පිට නොකෙළේ කුසුමලතාගේ පිළිතුරු සිතනවාටත් වඩා වේගවත් විය හැකි යැයි සිතුණ හෙයිනි.

"මට ඔය මනුස්සය යටින් බලන බැල්ම අල්ලන්නෙ නෑ" යි කීමට කුසුමලතාට වුවමනාවක් තිබිණි. එහෙත් ඈ එවැන්නක් නොපවසා සිතේ වේගය පිටවෙන්නට නොදී දරා සිටියේ එවැනි වචනයක් පිටවුවහොත් බොහෝ දුරදිග යන සිද්ධියක් ඇතිවීමට ඉඩ ඇති නිසාය.

"තාත්තත් ඇවිල්ල" යි කියමින් ඈ කාමරයට ගියේ මේ මොහොතේ සිටිය යුතු හොඳම තැන කාමරය යැයි සිතුණ නිසාය.

"ජිනසෝම ඇස්. ඇස්. සී. විභාගෙට ලිව්වනෙ"

වෙදමහත්තයා උගුරේ රැල් බුරුල් හරිමින් කීවේය.

"මං ඒ ගැන අහන්ඩත් කියල හිටියෙ. මොකද මං වැඩ කරන ගෙදර මහත්තයගෙ බාල පුතත් මේපාර විභාගෙට ලිව්ව. ඒ ළමය නං පාස්වෙයි. ඉගෙන ගන්න එක මිසක වෙන වැඩක් තියෙනවයැ"

සිරිදාස ද පිළිතුරු කතාවක් පටන් ගත්තේය. එවැනි කතාබහ නම් කමක් නැතැයි කාමරයේ ඇඳෙහි වැතිර ඉස්තෝප්පුවේ සිදුවෙන කතාබහට සිරුවෙන් සවන් දීගෙන සිටි කුසුමලතා සිතුවාය.

"ජිනසෝමත් පාස්වෙයි. මිනිහට කියලත් වෙන වැඩක් තියෙනවයැ. ඒ දවස්වල මාසෙකට සැරයක්වත් ගෙදර ආවෙත් නෑ... අනික් එක ජිනසෝම විභාග පාස්වෙලා ආණ්ඩුවෙ රස්සාවක්ම කරන්ඩ ඕනෑ... කැත්තෙ උදැල්ලෙ වැඩටත් කම්මැලියිනෙ... ඒකට ගුණසෝම...! වයසෙ තරමට නෙමෙයි මිනිහගෙ වැඩ. දූන් ගෙවල්වල පොල් අතුත් බඳින්ඩ යනව. එහෙම නැතුව ගම්වල ජීවත්වෙන්ඩත් බෑ... ජීවත්වෙලා වැඩකුත් නෑ..."

කතාව පටන්ගත්තේ ජිනසෝම ගෙන් වුවද වෙදමහත්තයා වැඩිපුර කතා කෙළේ ගුණසෝම ගැනය.



"මං දක්ක... මිනිහ දූන් ගජ ඉලංදාරියෙක් වගේ.. මිනිහ මේසන් වැඩට එහෙම කැමැත්තක් තියෙනවනං මට පුළුවන් එක්කරගෙන යන්ඩ"

"ඔය කරදඬු උස ගියාට තාම නමෙ පංතියෙනෙ... ඇස්. ඇස්. සී. විභාගෙවත් ගන්ඩ එපායැ"

සිරිදාසට, වෙදමහත්තයා දුන් පිළිතුර කාමරයේ සිටි කුසුමලතාට පැහැදිලිව ඇසිණි.

"උගෙ මේසන් බාස්කම"

කුසුමලතා තමාටම කියාගත්තේ තරහෙන් පිපිරෙමිනි. පවුලේ කටයුතුවලට ඇඟිලි දාන්නට එන එක නම් එතරම් හොඳ නැත. පළමුවෙන්ම තාත්තාවද දෙවනුව අම්මාවද දූන් ගුණසෝමවද අල්ලාගන්නා සිරිදාස බූවල්ලෙකු මෙන් අඬු විහිදා යම් දිනෙක තමාවද අල්ලාගනු ඇතැයි කුසුමලතා සිතුවාය. යම් මොහොතක මේ සියල්ල විස්තර සහිතව අම්මා සමඟ කතා කරන්නට සිතුණු නමුත් එයින් මෙතෙක් කලක් පවුලේ නොතිබුණ ප්‍රශ්නයක් උදාවේවි දැයි නැවත නැවතත් සිතුණ හෙයින් තවදුරටත් ඉවසිය යුතු යැයි ඈ ඉටා ගත්තාය.

වෙදමහත්තයාත් සිරිදාසත් කිනම් මාතෘකාවක් ඔස්සේ කතාබහ ආරම්භ කළද එය අවසන් වන්නේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් මාතෘකාවට පැමිණීමෙන් පසුවය.

"අලව්වෙ වැඩේ හින්ද අර වෙදපොත ඉවර කරගන්ඩත් බැරිවුණා"

"ඔව් ඉතිං... මහන්සි වුණාම නිදාගන්නව ඇරෙන්ඩ වෙන දෙයක් කරන්ඩ හිතෙන්නෙ නැතෙ..."

"ඒකමත් නෙමෙ වෙදමහත්තය.. පිට තැනක ඔහොම ඉන්නකොට හිතට එකලාසයක් නෑ... අනික් දෙන්නනං හැන්දෑවට අඩියක් ගහනව... මම ඉතිං ඒකටත් නැතෙ..."

සිරිදාස තමන්ගේ චරිත සහතිකය ඉදිරිපත් කරන්නේ යැයි කුසුමලතාට සිතිණි. කතාබහ ඇසෙන මානයේ ගේ තුළ කොතැනක හෝ තමා සිටිනු ඇතැයි ඔහු සිතනවා විය හැකිය. මෙවැනි දේවල් කියා පාන්නේ ඒ නිසාය. කතාබහ තව දුරදිග යනවිට මේසන් වැඩේට තමා කෙතරම් දක්ෂයෙක් ද යන්න ගැනත් තමන් උපයන

WWW.SINHALAELIBRARY.COM 56

Uploaded By Paba

ආදායම ගැනත් කියාපාන්නටද ඉඩ තිබේ. කුසුමලතා කාමරයෙන් පිටව තුස්සිය හරහා වත්ත පහළට ගියේ මේ හැඟීම්වලින් මිදී සිත නිදහස් කරගන්නටය.

කුසුමලතා පිටව යනු සිරිදාසට නොදනුණා නොවේ. එහෙත් මොහොතකටවත් ගෙතුළට දෑස් යොමු නොකරන්නට ඔහු වගබලා ගත්තේය.

"වෙදමහත්තය මම මේ පොඩි කාරණාවක් කියන්ඩයි කියල හිටියෙ..."

හදිසියේම සිරිදාසගේ කටහඬ වෙනස් විය. ඔහු ගෙතුළට දෑස් යොමු කෙළේය. වටපිට බැලුවේය. සිරිදාසගේ ඉරියව්වල හදිසි වෙනස්වීම වෙදමහත්තයාටද තේරුම්ගත නොහැකි විය. ඔහු සිරිදාසගේ මුහුණ දෙස කෙළින්ම බලා සිටියේය.

"වෙදමහත්තය දන්නවනෙ ඒබ්‍රං මාමා... අපේ අම්මගෙ මල්ලිනෙ... එයාට මොකක් හරි බැල්මක් වැටිල තියෙනවා. කෙම්මුර දවස්වලදී හැන්දෑවෙන කොට ගැහෙන්ඩ පටන් ගන්නව... හරියට දිස්ටි වෙලා වාගෙ... ඊට පස්සෙ දොඩවන්ඩ පටන්ගන්නව... කිසිම දෙයක් තේරුම් ගන්ඩ බෑ... විනාඩි පහකින් විතර ගැහෙන එක නැවතෙනව... දූන් නැන්ද පන්සලෙන් පිරිත් වතුර ඉල්ලගෙන ඇවිල්ල තියෙනව... ඒව මූණට ගහපුවාම තමයි ඇස් අරින්නෙ... අලව්වෙ ඉඳල ආපු ගමන් මට නැන්ද කිව්වෙ වෙදමහත්තයව එක්කරගෙන ඇවිල්ල පෙන්නන්ඩ කියල..."

සිරිදාස පැවසූ කතාව වෙදමහත්තයා ප්‍රවේශමෙන් අසා සිටියේය. ඔහුගේ මුහුණ බැරෑරුම් පෙනුමක් ගත්තේය.

"මොකක් හරි බැල්මක් වැටිල ඇති. සමහර වෙලාවට මළගිය ප්‍රාණකාරයෙක් ඇවිල්ල ආරූඪ වෙන්ඩත් පුලුවන්... එහෙම එකද්ද දන්නෙත් නෑ... වෙලාවක බලමු... හැබැයි ගැහෙනකොට බලෙන් තවත්වන්ඩ හරි වතුර ගහන්ඩ හරි යන්ඩ එපා... වතුර පොවනව නියා ඒ පැත්තටවත් වතුර ටිකක් ලං කරන්ඩ එපා"

ඒබ්‍රං පිළිබඳව සිරිදාස පැවසූ කතාව වෙදමහත්තයා තුළ හදිසි වෙනසක් ඇතිකිරීමට සමත් විය. රාත්තිරියේ ඉඩක් ලැබුණ විට ඔහු ඇසිලින් නෝනා සමගද ඒ ගැන විශේෂයෙන් කතා කළේ ඒ නිසාය.



"පෙරේත බැල්මක් වෙන්ඩ ඇති"

ඇසිලින් නෝනා ඒ ආරංචියට එතරම් වැදගත්කමක් නොදුන්නේ සිතාමතාය. සිරිදාස පිළිබඳව ඇගේ සිත තුළ තිබුණු පැහැදීම දෙදරා ගියේ මේ සිද්ධියත් සමගය. තම දරුවන් නොකැමති ඉසව්වකට වෙදමහත්තයාව අදින්නට සිරිදාස දනුවත්ව හෝ නොදනුවත්ව උත්සාහ කරන බවක් ඇසිලින් නෝනාට දනිණි.

පසුදිනෙක වෙදමහත්තයා, සිරිදාසගේ මාමා බලන්නට ගියේය. ඒ ගමනින් පසු ඔහු තුළ ඇතිවූ වෙනස පැහැදිලිව පෙනෙන්නට පටන්ගත්තේය. ඔහු නැවතත් කතාබහ අඩුකළ අතර ලණු ඇඳෙහි ඇලවී සිටින්නට වැඩි කැමැත්තක් දක්වන්නට විය. ඇසිලින් නෝනා ඇසූ සමහර ප්‍රශ්නවලටද "හ්ම්" යන පිළිතුර පමණක් දුන්නේය. ඇතැම්විට නැහුනාක් මෙන් නිහඬවම සිටියේය. දෙවැනි වතාවටත් ඔහු ඒබ්‍රං සිංඤෝ බලන්නට ගියේය.

"දේව බැල්මක් වාගෙ වැටිල තියෙන්නෙ... මොනව හරි කියන්ඩ පූර්වන් කමකුත් තියෙනව... මට කිව්වනෙ ජිනසෝම ගැන..."

කුසුමලතා නොසිටි වෙලාවක් බලා ඇසිලින් නෝනාට රහසින් මෙන් කීවේය.

"ඒ මොන ඉලව්වක්ද ජිනසෝම ගැන කියෙව්වෙ?"

ඇසිලින් නෝනා කලබලයට පත්ව ඇසුවාය.

"දරුවන්ගෙන් සතුටුදායක ආරංචියක් ලැබෙයි කියල තමයි කිව්වෙ. ජිනසෝමගෙ නම කිව්වෙ නෑ... මම හිතුවෙ එහෙම..."

"මළ පෙරේතයො කියන්ඩ ඕනෑ නෑ... ජිනසෝම ගැන... ඌ පාස් වෙන බව අපි දන්නව... අනික් එක මළපෙරේතයන්ට නෙමෙයි දෙයියන්ට බාරවෙලා තියෙන්නෙ..."

ඇසිලින් නෝනා කතා කෙළේ තදබල කෝන්තියකිනි. එය කෙතරම් ප්‍රබල එකක් වීද යත් කිසිදාක නොවුණු අන්දමට ඇව වචන පටලැවෙන්නටත් ගොත ගැසෙන්නටත් විය.

"උඹට ඔය තරං කෝන්ති ගන්ඩ දෙයක් කිව්වෙ නෑ..."

"මං කැමති නෑ... දරුවන්ගෙ දේවල් එක්ක ඔය මළපෙරේතයොයි මළ යක්කුයි ගාව ගන්නවට"

WWW.SINHALAELIBRARY.COM 57
Uploaded By Paba

කෝපයෙන් දෙනෙත් රතුකරගත් ඇසිලින් නෝනා නැවතත් ගොත ගසමින් කියා අවසන් කොට හතිලන්නටද වූවාය. ඇගේ නපුරු වචන කිහිපය තමන්ගේ මුළු ජීවිතයම පොළොවට සමතලා කළ බවත් වෙදමහත්තයාට දැනිණි.

"මෙච්චර කාලයක් අපි ජීවත් වුණේ මළපෙරේතයොයි මළයක්කුයි හින්ද තමයි ඇසිලින් නෝනෙ..."

එසේ පැවසූ වෙදමහත්තයා බිම බලාගෙනම ඉස්තෝප්පුවෙන් මිදුලට බැස්සේය.

"වෙදමහත්තයො... වෙදමහත්තයො" කියමින් පිළිසරණක් පතා තමන් වෙත විත් එකත් පස්ව සිටි මිනිසුන්ගේ ගැහැණුන්ගේ අසරණ මුහුණු වෙදමහත්තයාට මැවී පෙනෙන්නට පටන්ගත්තේය. ඔවුන්ගේ "දුකට... මෙන්ම බියට" පිළිසරණක් වන්නට තමාට හැකිවූ අයුරුත් ඉන්පසු බයාදු සිනාවක් සහිතව ගෞරවයෙන් යුක්තව තමා දෙස බැලූ අයුරුත් සිහිපත් විය.

"ඔය මළපෙරේතයො... මළයක්කු මගෙ දරුවන්ගෙ දේවල්වලට ගාව ගන්නට මං කැමති නෑ..." යි ඇසිලින් නෝනා උස් හඬින් පැවසූ වචන කෙතරම් නපුරු ඒවා දැයි නැවත නැවතත් සිහිපත් වෙන්නට පටන්ගත්තේය. ඒ සමගම තමන්ගේ පිහිට පතාගෙන පැමිණි ගැමියන්ගේ අසරණ මුහුණුද යළි යළිත් මැවී පෙනෙන්නට පටන් ගත්තේය. නූලක් බැඳ... දෙහිගෙඩි කීපයක් කපා ඔවුන් මහත් භක්තියකින් දෙන රුපියල් තුන හතරක ගුරු පඬුර ගෙනවිත් ඇසිලින් නෝනා අතට දුන් අවස්ථා ගැනද ඔහුට සිහිපත් විය. තමාටත් නොදැනීම ගලායන කඳුළු සරම්පොටින් පිසදාගත් වෙදමහත්තයා ගුණපාල ළමයාගේ ගෙවල් පැත්තට නොහැරී ඒබරං සිංඤෝගේ ගෙවල් පැත්තට ගියේය.

ඒබරං සිංඤෝගේ ගෙදර දේවාරූඪයෙන් සාත්තර කියන්නට පටන්ගත්තේ මේ කතාබහ සිදුවී දවස් හත අටකට පසුවය. දිස්විවූ පසු ඒබරංගේ ආවතේවකාරයා ලෙසින් කටයුතු කෙළේ වෙද මහත්තයාය. බදාදා සහ සෙනසුරාදා දිනවල හැන්දෑවෙන විට සුදු සරමක්ද අත්දිග මේස් බැනියමක් ඇඳ සරම වටා රතුපාට රෙදි තැල්ලක් බැඳ ගෙදරින් පිටවෙන වෙදමහත්තයා ඒබරං සිංඤෝට ආවතේව කොට ආපසු ගෙදර පැමිණෙන්නේ දෙගොඩහරි ජාමයේය.



ඒබරං සිංඤෝ දේවාරූඪයෙන් සාත්තර කියනවා යන ආරංචියටත් වඩා ඉක්මනින් වෙදමහත්තයා ඔහුගේ ආවතේව කාරයා ලෙසින් කටයුතු කරනවාය කියන ආරංචිය අහල පහළ ගම්වල පවා පැතිර ගියේය. ඒබරං සිංඤෝ කෙනෙක් ගැන ඔවුහු නොදැන සිටි නමුත් වෙදමහත්තයා ගැන දැන සිටියහ. එනිසා සාත්තර කියන ඒබරං සිංඤෝටත් වඩා ආවතේව කරන වෙදමහත්තයා ගැන කතා කරන්නට වූහ. ඒ කතා බොහොමයක් අපහාසයෙන් මෙන්ම අවඥාවෙන් කියූ කතා බව වෙදමහත්තයාට දැනගන්නට ලැබුණේ නැත. එහෙත් කුසුමලතාට එවැනි ආරංචි ලැබිණි.

"ලැජ්ජාවෙ බෑ පාරෙ බැහැල යන්ට... එක එකා එක එක දේවල් කියනව..."

පන්ති ගොස් පැමිණි කුසුමලතා දිනක් ඇසිලින් නෝනාගේ ඇඟට කඩා පැන්නාය.

"අම්මෙ තාත්තට ඕවට නොගිහිං ඉන්ඩ කියන්ඩ"

පවුලේ කිසිම දෙයක් ගැන වචනයක්වත් කතා නොකරන ගුණසෝමද ඒ ගැන කතා කෙළේය. කුසුමලතාගේ ආඩපාලියට වඩා ගුණසෝම බොහෝ සෙමින් පැවසූ වචන කිහිපය ඉතා ප්‍රබල ලෙස ඇසිලින් නෝනාගේ සිතට කාවැදුනේය. එහෙත් වෙදමහත්තයා සමඟ මේ දේවල් ගැන කතා කරන්නට තරම් ඇසිලින් නෝනාගේ සිත ශක්තිමත් නොවීය. කුසුමලතාගේත් ගුණසෝමගේත් චෝදනා දරා ගනිමින් ඈ නිහඬව සිටියාය.

"දැන් සාත්තර අහන්ඩ දහයක් පහළොවක් විතර එනව... මැණික් මුදලාලි කෙනෙක් ආව රත්නපුරේ ඉඳල... කොහොම ආරංචිවෙලාද මන්ද..."

වෙදමහත්තයා මේ තොරතුරු ඇසිලින් නෝනා සමඟ පැවසුවේ මහත් සතුටකිනි. එහෙත් කුසුමලතා හෝ ගුණසෝම සිටින තැන ඒ කිසිවක් ගැන කතා නොකර සිටින්නටද වගබලා ගත්තේය.

එහෙත් එක් සෙනසුරාදාවක ඒබරං සිංඤෝගේ ගෙදර ගොස් ඉතා ඉක්මණින් ආපසු පැමිණෙන වෙදමහත්තයා දුටු ඇසිලින් නෝනාගේ සිත තිගැස්සුණේය. ඈ ළිඳ ළඟ සිට අඩියට දෙකට කුස්සියට පැමිණියේ එබැවිනි. ඇඳ සිටි ඇඳුම පිටින්ම ලණු ඇඳෙහි වැතිරගත් වෙදමහත්තයා දෙස විමතියට පත්ව බලා සිටියාය.

WWW.SINHALAELIBRARY.COM 58
Uploaded By Paba

"ඒබරංගෙ බෑන ඇවිල්ල ඔක්කොම නවත්තල දැම්ම... දුවත් ඇවිල්ල කැඟැහුව"

"වෙදමහත්තයටත් මොනව හරි කිව්වද?"

"නෑ... මං උන්ට කිව්ව... උඹල කෑගැහුවට මේ මිනිහට වැටිල තියෙන බැල්ම නැතිවෙන්නෙ නෑ කියල... ඕන්නං මට නවත්තන්ඩ පුළුවං...ඒත් මං ඒක කරන්නෙ නෑ කියල මං එළියට බැස්ස..."

වෙදමහත්තයා කෝපයට පත්ව ඇති බව ඇසිලින් නෝනා වටහාගත්තාය. කතාවේ අවසාන වචන කිහිපය පිට කළ විලාශයෙන් ඒ බව වඩාත් පැහැදිලි විය. මේ සිද්ධියෙන් පසු නැවතත් වෙදමහත්තයාගේ ස්වරූපය වෙනස් විය. කතාබහ යළිත් අඩුවිය. ඔහු ගෙයින් පිටව ගිය නමුත් ඒ යන්නේ කොහාටදැයි ඇසිලින් නෝනා දන්නේ නැත. කුසුමලතා සමඟ මේ ගැන කතා කළ විට ඇ කීවේ "හොඳ වැඩේ" යි කියාය.

"වත්ත පහළට වෙන්ට පොඩි මඩුවක් හදල මේ වැඩේ කරන්ඩයි මං හිතාන ඉන්නෙ"

වෙදමහත්තයා පසුදිනක ඇසිලින් නෝනා සමඟ පැවසුවේය. "වෙදමහත්තයාගෙ වැඩ එහෙ ගෙදර කරගන්ඩ. මළ යක්කුත් අරගෙන අපේ ගෙවල්වලට එන්ඩ එපා" යි ඒබරංගේ බෑනා පැවසූ ගුණමකු වචන නිතර නිතර ඔහුගේ මතකය වෙත පැමිණ සිතට දරාගත නොහැකි අන්දමේ වේදනාවක් දෙන්නට පටන් ගත්තේය. වත්ත පහළ මඩුවක් සාදා කුඩාවට දේවාලයක් පටන් ගැනීමට ඔහුගේ සිත වඩාත් නැඹුරු වූයේ ඒ නිසාය.

"ඒ වැඩේ කරන්ඩ එපා"

තමාගේ පිළිතුරෙන් වෙදමහත්තයාගේ සිත රිදෙන බව ඇසිලින් නෝනා දැන සිටියාය. එහෙත් මුලදීම ඒ අදහසට විරුද්ධ නොවුවහොත් පසුව විශාල අවුලක් ඇති විය හැකිය. අනෙක් අතට වෙදමහත්තයාගේ සිත කොයිතරම් රිදුනත් මේ කාර්යයට නම් ඉඩ දිය නොහැකිය.

"දරුවො දැන් ලොකුයි... අපි උන් ගැනත් හිතන්ඩ ඕනෑ" යි ඇ කීවේ එබැවිනි.

"දරුවො ලොකු වෙනකොට අපි පොඩිවෙනව තමයි ඇසිලින් නෝනෙ"



ඇසිලින් නෝනාගේ මුහුණ දෙස කෙළින්ම බලාගෙන පැවසූ වෙදමහත්තයා මිදුලට බැස බිම බලාගෙනම පාර පැත්තට ගියේය. ඒ දවස්වල මෙන් ඇඟට පැන කෑ නොගැසූ නමුත් වෙදමහත්තයාගේ වචන ඊ පහරවල් මෙන් පැමිණ පසුව පසාරු කරගෙන යනු ඇසිලින් නෝනාට දැනිණි. ඇ කුස්සියට පැමිණ කොළොම්බු කොටය මත ඉඳගත්තේ සිටගෙන සිටින්නට නොහැකි තරමට අප්‍රාණික වූ බැවිනි. දරුවන් සහ වෙදමහත්තයා අතර තමන් සිරවී සිටින බවක් ඇට දැනිණි. එක පැත්තක්වත් ගත නොහැකි නමුත් වෙදමහත්තයාට විරුද්ධ වූයේ ඔහුට එය තේරුම්ගත හැකි යැයි සිතුණ හෙයිනි. එහෙත් ඔහුගේ සිතේ ද ඇත්තේ කෝපයක් පමණි.

වෙදමහත්තයා ආපසු ගෙදර පැමිණියේ දෙගොඩහරි ජාමයේය. ඔහු සිටියේ බීමත්වය. සාලයේ තිබූ පුටුවකද හැප්පුණ වෙදමහත්තයා කාමරයට ගොස් මේස් බෑනියමවත් නොගලවා ඇඳෙහි වැතිරුණේය. ඉන්පසු සුපුරුදු ලෙස ගොරෝද්දය අදින්නට විය. අතරින් පතර දොඩවන වචනද ඇසිණි.

"අවලංගු කාසි තම සතයක් වටින්නේ නෑ. ඇසිලින් නෝනො..."

එවැනි ප්‍රකාශද අතරින් පතර ඔහුගේ මුවින් පිට විය. ඇසිලින් නෝනා කුස්සියට ගොස් ඉකිගසන්නට පටන් ගත්තේ ඒ වචන තවදුරටත් අසා සිටිය නොහැකි වූ බැවිනි.

x x x x

ඉඳහිට කුඹුර පැත්තට ගිය නමුදු වෙදමහත්තයා ඒ දේවල් ගැන වැඩිපුර සොයා බැලුවේ නැත. ගොවිතැන් කටයුතු සියල්ල ගුණසෝමගේ කරපිට වැටිණි. ඒ වනවිට ඒ සියලු වගකීම් දරාගන්නට තරම් ඔහු දැඩි වී සිටියේය. ගෙදර දොර කටයුතු ගැන මෙන්ම ගොවිතැන් කටයුතු ගැනද ඔහු කතා කෙළේ ඇසිලින් නෝනා සමඟය.

"අම්මෙ චාර්ලිස් මාමලගෙ ලියැද්දෙ හෙට ගොයම් කපනව... මටත් යන්ඩ වෙයි"

"එතකොට ඉස්කෝලෙ?"

ඇසිලින් නෝනාගේ ප්‍රශ්නයට ගුණසෝම එක්වරම පිළිතුරු දුන්නේ නැත. එක අතකට පොතපත වැඩ ගැන ඔහුගෙන් ප්‍රශ්න

WWW.SINHALAELIBRARY.COM 59

Uploaded By Paba

කිරීමද නිරර්ථක දෙයක් බවට පත්ව තිබිණි. ඇසිලින් නෝනා ඒ ගැන ප්‍රශ්න කළේ විශේෂ පිළිතුරක් බලාපොරොත්තුවෙන්ද නොවේ.

"හාත්තත් කුඹුර පැත්තේ යන්නෙ නැති එකේ චාර්ලිස් මාමා තමයි නිකමට හරි ඇවිල්ල බලන්නෙ..."

ගුණසෝම පවසන කාරණා අසත්‍ය ඒවා නොවේ. වෙදමහත්තයා පැත්තකට වී සිටියදී ගුණසෝම ගොවිතැන් බත් කරන්නේ ගමේ අනෙක් වැඩිහිටියන්ගේ උදව් පදව් ඇතුවය. මේ දේවල් ගැන තීන්දු ගැනීමට තරම් ඔහු "මහ මිනිහෙකු" වී ඇතැයි ඇසිලින් නෝනාට සිතිණි. ඇසිලින් නෝනා මේ කාරණා ගැන මුනිවත රැක්කේ එබැවිනි.

ගුණසෝම දවස් දෙකක්ම ඉස්කෝලෙ ගියේ නැත. පළමු දවසේ චාර්ලිස් මාමලාගේ ගොයම් කැපූ අතර දෙවැනි දවසේ ඒවා කමතට ඇද්දේය.

"ගුණසෝම හරියට මහන්සි වුණා"

සෝමවතී නැන්දා ගුණසෝමට තවත් ඉඹුල් කිරිබත් ගෙඩියක් බෙදමින් කීවාය.

"කොල්ලො කාලෙ හොඳට වැඩ කරන්ඩ ඕනෑ තමයි..."

චාර්ලිස් මාමාද තවත් ඉඹුල් කිරිබත් ගෙඩියක් ගනිමින් කීවේය... පාන් හෝ ඉදිආප්පවලට වඩා ඉඹුල් කිරිබත් කෙතරම් රසදැයි ගුණසෝමට සිතිණි.

"චාර්ලිස් මාමලගේ කුඹුරෙ නං බොල් හොඳටම අඩුයි"

ගොයම් පැඟිමේ වැඩ අවසන්ව ගෙදර පැමිණි ගුණසෝම කහට කෝප්පය බොන අතරතුර ඇසිලින් නෝනාට කීවේය.

"වෙන්ඩ ඇති... හැබැයි ඊකුන්ගෙ හිත බොල්... ජිනසෝම සිස්සත්තෙං පාස් වෙච්ච වෙලාවෙ ඔය මහ ගෑනි කියල තියෙනව ආරොන් වෙදාල ආකාසෙ අල්ලන්ඩ හදනව කියල... ඊට පස්සෙ සිව්වලු වෙදමහත්තය ගුරුකං කරල විභාගෙ පාස් කොරවල කියල... ගුණසෝමත් ඉස්කෝලෙ වැඩ අතෑරල කුඹුරෙ මඩටම වැටෙනවනං ඊකුං කැමැති ඇති"

වෙනදා තමාගේ කැත්තෙ උදැල්ලෙ වැඩ ගැන මහ ඉහළින් කතා කළ අම්මා හදිසියේම මෙවැනි කතා කියන්නේ ඇයි



දැයි ගුණසෝමට ප්‍රශ්නයක් විය. ගුණසෝමගේ මුහුණ අඳුරු වී යනු ඇසිලින් නෝනා නුදුටු නමුත් කුසුමලතා දුටුවාය. "අම්මා නපුරු ගෑහැනියක්ද?" යන සිතුවිල්ල කුසුමලතාගේ සිත තුළ මතු විය.

"සෝමවතී නැන්ද ඔය කියන තරං නරක නෑ අම්මෙ... මාත් එක්කත් "දූවේ" කියල කතා කරනව..."

කුසුමලතා එසේ කීවේ ඇසිලින් නෝනාට නොව ගුණසෝමට ඇසෙන්නටය.

කතාවට පිළිතුරු නොදුන් ඇසිලින් නෝනා කැත්තත් රැගෙන වත්ත පහළට ගියාය. ඈ පොල් අතු කපන ශබ්දය කුස්සියේ සිටි කුසුමලතාටත් ගුණසෝමටත් ඇසුණේය.

"අම්මගෙ වෙන මොකක් හරි තරහක් හිතේ තියෙනව. ඒක අපට කියන්නෙ නෑ... පෙන්නනව විතරයි.. අපි මොනව කරන්ඩද ඒවට"

කුසුමලතා, ගුණසෝමගේ සිතේ ඇතිවී ඇති කලබල ගතිය තුනී වෙනු ඇතැයි සිතමින් එසේ කීවාය. කෙසේ වුවද ගමේ කුඹුරු වැඩ පටන් ගැනීමත් සමගම ගුණසෝමගේ ඉස්කෝල ගමන සම්පූර්ණයෙන්ම වාගෙ ඇන හිටියේය. ගමේ බොහෝ දෙනකුගේ ගොයම් වැඩවලට ඔහු ගියේය. ඔහුගේ වයසේ අතික් ළමයි අම්බරුවන් දක්කද්දී ඔහු වැඩිහිටියන් සමග එක්ව දක්ෂ ගොයියාගෙන් "මැඩුවං" ඉවත් කෙළේය.

දහඩියෙන් තෙත්වන ඔහුගේ සිරුර අව්වට කරවෙමින් අඳුරු පැහැගනිද්දී නාඹර වියේ සියුමැලි බව ඉවත්ව ගොස් හැඩි දැඩි ගොරෝසු පෙනුමක් ගත්තේය.

"මල්ලි දැන් ඉස්කෝලෙ යන්නෙම නෑ. දැන් නියම ගොයිරාළ කෙනෙක්..."

කුසුමලතා, ජිනසෝමට ලියා යැව්වාය.

"ඔච කරල කාටද හරියන්නෙ" වැනි පිළිතුරක් බලාපොරොත්තු වූ නමුත් "ගොවිතැන කියන්නෙ නරක දෙයක් නොමේ... හැබැයි හරියට කරන්ඩ ඕනෑ"යි ජිනසෝම ලියා එවා තිබිණි. ජිනසෝමගේ පිළිතුර කුසුමලතාගේ සිත් ගත්තේ නැත.

WWW.SINHALAELIBRARY.COM 60

Uploaded By Paba

"ඒව අල්ලල දාල ඉගෙන ගන්ඩ කියන්ඩ... අඩුගානෙ ඇස්. ඇස්. සී. වත් පාස්වෙන්ඩ බලන්ඩ කියන්න... නැත්තං ගොයිරාළ කමෙන්ම තමයි කෙළවර වෙන්නෙ"

ඔහු එවැනි පිළිතුරක් ලියා එව්වේ නම් කෙතරම් හොඳ දැයි කුසුමලතාට සිතිණි. එහෙත් ගුණසෝමගේ ඉස්කෝලේ ගමන නවතා දැමීම පිළිබඳව ඈ ඇසිලින් නෝනා සමඟ කතා කළාය.

"පුළුවන් දෙයක් කරන්ඩ අරිනව මිසක බැරි දේවල්වලට බලකරන එකේ තේරුමක් නෑ... ගුණසෝමගෙ උනන්දුව තියෙන්නෙ ගොවිතැන් වැඩවලට... අනිත් එක තාත්තට ගානකුත් නෑ. මට මේ හැම දෙයක්ම හොයල බලන්ඩත් බෑනෙ"

ඇසිලින් නෝනා කීවේ ඇත්තයි. පවුලේ සියලු වගකීම් සහ කටයුතු ඇගේ උරමත පැට වී තිබේ. වෙදමහත්තයා සිටින්නේ ඇස් කන් නැත්තෙක් මෙනි. ඔහු දවසකට කතා කරන්නේද වචනයක් දෙකක් පමණි.

කුසුමලතා මෙන්ම ඇසිලින් නෝනාද වෙදමහත්තයා නැතිවිට හඬ නගා කතා කළ නමුත් ඔහු සිටින විට කතා කළේ අනෙකාගේ කණට ඇහෙන හඬින් පමණි. ගේ පුරා බොහෝ විට පැතිර තිබුණේ අමිහිරි නිහඬතාවකි. ගෙදර සියලු දෙනාම අකමැත්තෙන් ඉවසා සිටි මේ නිහඬතාව හදිසියේම වාගේ වෙනස් වූයේ එක් දිනක් මහ රාත්‍රියේ සිරිදාසගේ පැමිණීමත් සමඟය.

"ඒබ්‍රං මාමට අමාරුයි... වෙදමහත්තයට එන්ඩ කිව්ව"

කැලි කැපෙන කළුවර පසාරු කරගෙන පැමිණි සිරිදාසගේ හඬින් වෙදමහත්තයා තිගැස්සුණේය. ඇසිලින් නෝනා කුප්පිලාම්පුවත් පත්තු කරගෙන ඉස්තෝප්පුවට පැමිණියාය. සිරිදාස දුටුවිට ඇගේ මතකයට නැඟුණේ ඒබ්‍රං සිංඤෝගේ මරණාසන්න මුහුණ නොවේ. ඔහුගේ බෑනා වෙදමහත්තයාට කතා කළ නොසරුප් ආකාරයයි. කුප්පි ලාම්පුව විපෝව මත තැබූ ඇසිලින් නෝනා ආපසු කාමරයට ගියේ මේ නොකැමැත්ත සිරිදාසට මෙන්ම වෙදමහත්තයාටද දන්වීම සඳහාය.

වෙදමහත්තයා කුප්පිලාම්පුවත් රැගෙන කාමරයට පැමිණ අල්මාරි ලාච්චුවේ තිබුණු තෙල් කුප්පියක් ගත්තේය. ඉන්පසු අත්දිග මෙස් බැනියම ඇඟට දමා තුවාය කරේ දාගත්තේය.



"මං එන්ඩ ටිකක් රෑවෙයි... උඹල දොර වහල නිදාගනිල්ල"

"ගුණසෝමටත් එන්ඩ කියන්වද?"

"මොකටද? පුරුදුවෙන්ඩ යන ගමනක්යැ"

එසේ කියූ වෙදමහත්තයා කාමරයෙන් පිට වූයේ කුප්පිලාම්පුව එසේ තිබෙන්නට ඉඩ හරිමිනි.

"වෙදමහත්තයට එන්ඩ කියල හත් අට වතාවක්ම කිව්ව. අපි කාටවත් නොකියන දෙයක් වෙදමහත්තයට කියාගන්ඩ ඕනැකමක් තියෙනව වගේ..."

සිරිදාස යන ගමන් කීවේය. ඔවුන් ඒබ්‍රං සිංඤෝගෙ ගෙදරට ගොඩවෙන විට හත් අට දෙනෙක්ම ඔහුගේ ඇඳ වටා රොක්වී සිටියහ. වෙදමහත්තයා දුටු සැණින් සැමදෙනාම පාහේ ඇඳ අසලින් ඉවත්ව ඔහුට ඉඩ දුන්හ. වෙදමහත්තයා, ඒබ්‍රං සිංඤෝගේ නාඩි අල්ලා බලා රැගෙන ආ තෙල් කුප්පියෙන් ටිකක් අත්ලට ගෙන මතුරා ඔහුගේ පපුවෙහි තැවරුවේය. ඉන්පසු මුලත් කොළයක් ඉල්ලාගෙන පපුව තදින් පිරිමදිමින් "තෝමස් අයියගෙ බර බාගෙ අරගෙන වරෙල්ල" යි අවට සිටියවුනට කීවේය. සිරිදාස විදුලි පන්දම එක දිගට දල්වාගෙන තෝමස් අයියාගේ ගෙවල් පැත්තට දිව්වේය. තවත් දෙතුන් දෙනෙක් ඔහු පසුපසින් දිවගිය නමුත් ඒ කවුරුන්දැයි වෙදමහත්තයාට හරි හැටි පෙනුනේ නැත.

"ඔය බරබාගෙට දාගන්ඩ තව මෙට්ටයක් පැදුරක් ලෑස්ති කරගනිල්ල..."

වෙදමහත්තයා උපදෙස් දෙන පරක්කුවෙන් ඒ සියල්ල කෙරුණේය. ඒබ්‍රංගේ දුව වෙදමහත්තයා සමඟ සිනාසුන නමුත් බෑනා මුහුණ දෙන්නට මැලිකමක් දක්වීය.

තෝමස් අයියාගේ බරබාගය පැමිණියේය. "තෝමස් අයියෙ වළවල්වල දාන්නෙ නැතුව සීරුවට කරත්තෙ දක්කපං" යි වෙදමහත්තයා ඔහුටද උපදෙසක් දුන්නේය. බරබාගය පිටත්ව ගිය පසු එතැනට රැස්ව සිටි ඇතැමෙක් ආපසු ගෙවල් දොරවල්වලට ගියහ. එහෙත් වෙදමහත්තයා ඇතුළු දෙනෙක් නොරතුරක් ලැබෙන තෙක් නැවතුණහ. කරත්තය පසුපසින්ම බයිසිකලයෙන් ඉස්පිරිතාලයට ගිය සිරිදාස ආපසු පැමිණියේ වෙදමහත්තයා බලාපොරොත්තුව සිටි අසුබ ආරංචියත් සමඟය. එනම්

WWW.SINHALAELIBRARY.COM 61
Uploaded By Paba

ඉස්පිරිතාලයට ඇතුළු කරන විටද ඒබ්‍රහම් සිංඤෝ මියගොස් සිටි බවය.

"මම දනගෙන හිටිය... මොනව කරන්ටද... ඔය දිස්ටියක් එන්නෙ ලොකු බලයකුත් එක්ක. ඕව අපට ඕනෑ ඕනෑ හැටියට නතර කරන්ට බෑ"

ඒබ්‍රහම්ගේ බෑනා ඇතුළු කාට කාටත් ඇසෙන සේ එසේ කියූ වෙදමහත්තයා "මං යනව සිරිදාස" යි කියමින් මිදුලට බැස්සේය.

"ඕවගෙ දෙයක් වෙයි කියල මං දනගෙන හිටිය... අපේ වත්ත පහළ මඩුවක් හදන්ට හිතුවෙ ඒ හින්ද... භූත බලවේගයක් එක්ක සෙල්ලං කරන්ට අපට බෑ..."

ගෙදර ගිය විගස ඔහු ඇසිලින් නෝනා සමඟ කීවේ ඇගේ සිතද කිසියම් කම්පනයකට පත් කරවමිනි.

x x x x

SL UNLIMITED of Sri Lankan e-Community



# 11

මා මියගියේ දිස්ටියක් නිසා නොව පපුවේ අමාරුව සෑදීමත් කල්වේලා ඇතුව එයට වෛද්‍ය ප්‍රතිකාර නොගැනීමත් නිසා බව ඒබ්‍රහම් සිංඤෝගේ බෑනා කියා තිබිණි. වෙදමහත්තයාටද ඒ බැව් ආරංචි නොවූවා නොවේ. ඒවාට පිළිතුරු දෙන්නට ඉක්මන් නොවූ වෙදමහත්තයා "ඕනෑ කෙනෙකුට තම තමන් කැමැති පිළිවෙළකට හිතාගන්ට පුළුවන්" යි මාටින් මුදලාලිගේ කඩයේදී කීවේ මෙවැනි දේවල් තේරුම් කරන්නට යාම නිරර්ථක දෙයක් යැයි සිතුණු හෙයිනි. එහෙත් "ඇසට නොපෙනෙන බලවේග තේරුම්ගැනීම සඳහා බුද්ධියක් තිබිය යුතුයැ" යි ගුණරත්න ඉස්කෝල මහත්තයාට කීවේ ඔහු මේ ගැන තර්ක කරන්නට පැමිණි නිසාය.

"ගුණරත්න ඉස්කෝලය හොඳ දෙකක් අහගන්න වෙදමහත්තයත් එක්ක වාද කරන්ට ඇවිල්ල"

පසුදිනෙක මාටින් මුදලාලිගේ කඩයට රැස්වූ කිපදෙනෙකුටම ඇසෙන සේ සේතන් අප්පුහාමි විසින් කියා තිබිණි.

කෙසේ වුවද ඇසිලින් නෝනා සිතුවේ ඒබ්‍රහම් සිංඤෝගේ මරණයෙන් පසු සිරිදාසගේ පැමිණීම අඩුවී යනු ඇත කියාය. එහෙත් ඉන්පසු ඔහුගේ ගමන වැඩිවෙන්නට පටන් ගත්තේය. පළමු දවසේ ඔහු පැමිණියේ වෙදමහත්තයාට ස්තූති කිරීම සඳහාය.

"මාමගෙ මරණ කටයුතු මෙච්චර ලස්සනට සිද්ධවෙන්නෙ නෑ වෙදමහත්තය නොහිටියනං... ඒ ගැන නැන්ද විශේෂයෙං ස්තූති කරන්ට කිව්ව"

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 62
Uploaded By Paba

"ඉව මොනාද සිරිදාස... ගමේ ඉන්නකොට ඕව කෙරෙන්ඩ එපායැ... ඒබරං සිංඤොව බේරගන්ඩ බැරිවෙච්චි එක තමයි හිතට අමාරුව"

"ඒක ඉතිං මාමා පතාගෙන ආපු වයස වෙන්ඩ ඇතිනෙ"

"මය ඇත බලවේග එන්නෙ හොඳට හොයල බලල... සමහර ඒව එන්නෙ ආලවන්තකමට... සමහර ඒවනං පවුල් පරම්පරාවල් විනාශ කරන්ඩ එන ඒව... ඒව එන්නෙ ලෙඩ හැටියට... ආලවන්ත බලවේගයක් එන්නෙ මොකක් හරි බලයකුත් එක්ක. දූත් අර වනමන්දාවේ හාමිනේ බේත් කරන්නෙ එහෙම බලවේගයකින්නෙ... කීදෙනෙකුට යහපතක් වෙනවද... පරකන්දෙනියේ අංජනම් බලන තැන... මිනිස්සු පිහිට ඉල්ලගෙන යන්නෙ ඕවගෙ තැන්වලටනෙ... ඒබරං සිංඤොටත් තිබුණෙ ඒවගේ යහපත් බැල්මක්... යහපත් බැල්මක් වැටෙන්නෙ යහපත් පපුවකට විතරයි"

"දුප්පත්කමට හිටියට මාමත් කාටවත් වරදක් කරපු කෙනෙක් නෙමෙයිනෙ... තමන්ගෙ පාඩුවෙ හිටිය මිසක්... වෙදමහත්තය ගැන මාමගෙ හිතේ පුදුම ගවුරවයක් තිබුණෙ..."

"නැබැයි ඉතිං... එහෙම දිෂ්ටියක් ආපුවාම ඒකට හොඳට ගවුරව කරල සලකන්ඩ ඕනැ... එහෙම එන දිෂ්ටි බලෙන් නවත්තන්ඩ ගියාම හිතේ මහ විශාල කලබලයක් ඇති කරනව... ඒබරං සිංඤොට වුණේ ඒක... බැනණ්ඩි තමයි ඔක්කොම අවුල් කෙරුවෙ..."

"අනේ වෙදමහත්තයා ඒ මිනිස්සු ගැන කතාකරල වැඩක් නෑ... ඔය නංගි හොයාගත්තු කසාදයක්නෙ... මාමගෙ කිසිම කැමැත්තක් තිබුණෙ නෑ... නැන්ද තමයි කිව්වෙ ඔන්න ඔහේ කරගන්ඩ දෙන්ඩ කියල... ඔය කන්තෝරුවක පියුං කෙනෙක්ද කොහෙද නෙ... ආණ්ඩුවෙ රස්සාවල් කියාපුවම අපේ උන්ටත් මහා ඉහළයිනෙ... බැඳපු නැති අක්කට දෙන්ඩ හිටපු ඉඩං කොටහත් සල්ලි දීල ලියවගත්තලු... මාමා මැරෙන්ඩ ඉස්සෙල්ල"

"අන්තිමේදි බලාපුවාම තත්තාසේ... මොකටද බං... උඹ ගෙනියනවද? මං ගෙනියනවද? දූත් ඒබරං මොනාද ගෙනිච්චෙ... මල කඳත් නෑ... මෙලාකට පණුවො ගහල ඇති..."

"ඒකනං සම්පූර්ණ ඇත්ත"

සිරිදාස එසේ කියමින් ඔඳක් ඉදිරියට නැමී ඇඟිලි තුඩු අතින් මිදුලට බුලත් කෙළ පාරක් විද්දේය.



මිදුල පුරා අඳින බුලත් කෙළ පාරවල් කුසුමලතාට පෙනෙන්නට බැරිය. උදේ මිදුල අතුගාන්නට ගියවිට ඈ අප්පිරියාවෙන් මුහුණ හකුලාගනී.

"අනේ අම්මෙ බුලත් කෙළ ගහන්ඩ බාල්දියක්වත් තියන්ඩ තාත්තාට බැරියැ උදේ පාන්දර ඒව අදින්ඩ... මට බෑ ඔය එක එකාගෙ කෙළ පාරවල් පාගන්ඩ"

උඩින් මත්තෙන් මිදුල අතුගා ළිඳ ළඟට ගොස් මුහුණ අතපය සෝදා ගන්නා ගමන් ඇසිලින් නෝනාට කියයි.

කුසුමලතාගේ නොකැමැත්ත ඇත්තේ සිරිදාසගේ බුලත්කෙළ පාරවල්වලට පමණක්ම නොවේ. එසේ නම් ගමේ වෙනත් කෙනෙකු පැමිණ කෙළ ගැසුවිටද මේ කැකොස්සන් ගැසීම ඒ අයුරින්ම තිබිය යුතුය. කොහොමටත් අප්‍රලකින් මිදුල අතුගාන නමුත් මේ අන්දමින් කෑකොස්සන් ගසන්නේ නැත.

කුසුමලතාගේ නොකැමැත්ත ඇත්තේ සිරිදාසගේ බැල්මටය. සරමක් ඇඳ පපුවේ රෝම පඳුරු පවා පෙනෙන නයිලෝං කමිසයක් උඩින් දමාගෙන බෙල්ලෙන් ගලන දහඩියෙන් කමිස කොලරය බේරාගන්නට ලේන්සුවක්ද කරවටා රඳවාගෙන හොර පූසෙකු මෙන් වටපිට බලා යටැසින් හෙළන සිරිදාසගේ මනමාල බැල්ම කුසුමලතා තුළ ඇති කරන්නේ කේන්තියකි. මේ පිළිබඳව ඇසිලින් නෝනාට කියන්නට කුසුමලතා දෙතුන් වතාවක්ම සිතුවාය. එහෙත් ඒ අදහස ආපසු ගත්තේ යම් හෙයකින් ඇසිලින් නෝනා, ඒ ගැන කැගැසුවොත් එය පවුලේ ප්‍රශ්නයක් වීමට ඉඩ තිබෙනු ඇතැයි සිතූ නිසාය.

මේ වන විට වෙදමහත්තයාගේ පුස්කොළ පොත් සෑහෙන ගණනක් සිරිදාස විසින් ගෙන ගොස් තිබිණි. අල්මාරියේ පුස්කොළ පොත් තැන්පත් කර තිබූ තට්ටුව කෙමෙන් කෙමෙන් හිස්වන බවක් ඇසිලින් නෝනාටද දැනිණි.

"අල්මාරියෙ තිබ්බචි වෙද පොත් හුගක් නෑ නෙව"

"ඔය සිරිදාස එක දෙක අරගෙන ගියා"

"ඕව පරම්පරා දේවල්නෙ?"

"ඔව්... සීයගෙ දේවල්"

WWW.SINHALAELIBRARY.COM 63
Uploaded By Paba

"ඉතිං ඔහොම දෙන්නෙ? පොත් ටික නැතුව අල්මාරිය පාළුවෙලා"

"තාත්ත මට ඕව දුන්නෙ අල්මාරි ඇතුලෙ දාගෙන දිරන්ට අරින්ට නෙමෙයි... මිනිස්සුන්ට වැඩක් කරන්ට... මගෙන් පස්සෙ කවුද කොරන්නෙ...? අපේ එකෙක් නැත්තං... ඒ ගැන උනන්දුවක් තියෙන කෙනෙකුටවත් දෙන්ට එපායැ"

වෙදමහත්තයා කතා කරන්නේ සිතේ සතුටකින් නොවන බැව් ඇසිලින් නෝනාට වැටහිණි. ඒ නිසා ඇ වැඩි ප්‍රශ්න අසන්නට ගියේ නැත. කුසුමලතා ද සිරිදාස පුස්කොළ පොත් ගෙන යන කතාව මතු කළ නමුත් "තාත්තගෙ දේවල් ගැන උඹල ඕනෑවට වැඩිය හොයන්ට යන්ට එපා"යි ඇසිලින් නෝනා කිවේ ඒ නිසාය.

ගෙදර පැවති මේ කතාබහ පමණක් නොව සිතුවිලි පවා වෙනස් වූයේ පසු දවසක හැන්දෑවේ ගුණසෝම ගෙන ආ ආරංචියත් සමගය.

"හෙට බස්නාඇල බලන්ට කෘෂිකර්ම මහත්තුරු එනවලු"

ගුණසෝම ඇසිලින් නෝනා දෙස බලාගෙන කීවේ වෙදමහත්තයාටත් ඇසෙන පරිදිය. වෙදමහත්තයා ගුණසෝම දෙස බලා උපහාසාත්මක බැල්මක් මතු කරගත්තේය.

"මොනව බලන්ටද ඕකෙ.. ඇලේ වතුර බහින්නෙ නෑ... ඇනිකට් දොර ළඟ මඩ රොල්ල ගහල... උඩහින් පොඩි වැස්සක් වැටුණත් ඇල පිටාරෙ යනව... සාදිරිස් උන්නැහේ වෙල්විදානෙකං කරන කාලෙ මොන තරම් අගේට තිබුණු ඇලක්ද ඕක?"

වෙදමහත්තයා එසේ කී පසු ගුණසෝම කියන්නට සිතාගෙන පැමිණි බොහෝ දේවල් නොකියා හිරකර ගත්තේය.

"ඇල බලාගන්ට කියල අර එහා ගංගොඩේ සීලරතන කියල කොල්ලෙක් පත් කොරල ඉන්නව... ඌ මොනාද දන්නෙ ගොවිතැන ගැන... ඇස්. ඇස්. සී. වැඩ හතරක් පහක් පාස් කියල සාදිරිස් වෙල් විදානෙල කරපු වැඩ කොරන්ට පුළුවන්ද? ආණ්ඩුවෙ ඉන්නෙ හරක්..."

වෙදමහත්තයාගේ කතාවෙන් පසු බස්නා ඇලේ කතාව අවසන් විය. කුස්සියට ගිය ගුණසෝම, ඇසිලින් නෝනා සමග "කුටු



කුටු" ගාමින් තවත් මොන මොනවාදෝ කියනු වෙදමහත්තයාට ද ඇසින.

එහෙත් මේ කතාබහ අවසන් වී පැයක් හමාරක් ගතවූ පසු වෙදමහත්තයා හමුවන්නට පැමිණි සේනත් අප්පුහාමිත් සිරිං ගොයියාත් කෘෂිකර්ම මහත්තුරුන්ගේ පැමිණීම ගැන තව තවත් දේවල් වෙදමහත්තයා ඉදිරියේ තැබූහ.

"හෙට වෙදමහත්තයත් ඒ වෙලාවට බස්නා ඇලේ ඊදණ්ඩ ගාවට එන්ට ඕනෑ... ඔය තැන තැන ඒක මේක කිව්වට කෘෂිකර්මෙ මහත්තුරුන්ට අපේ ප්‍රශ්න තේරුම් බේරුම් ඇතුව කියල දෙන්ට කෙනෙක් නැතෙ... ඕන්නං විලිසෝං කතා කරයි... ඒ යකා කතා කොරුවොත් අපේ වැඩ කෙරෙන්නෙත් නෑ... මහත්තුරුත් තරහ වෙලා යන්ට යයි"

"අපි හිතාන ඉන්නෙ වෙදමහත්තයට විතරක් කතා කරන්ට දෙන්න... ඔක්කොම කට්ටිය එහෙන් මෙහෙන් හොට දාන්ට යන්නෙ නැතුව"

"නෑ... සිරිං ගොයියො මට තේරෙනව... හැබැයි මම දැන් කුඹුරු වැඩ ඔක්කොම ගුණසෝමට භාරදීල පැත්තකට වෙලා ඉන්නෙ"

"ඒක වෙනම කතාවක්... මේක ගමේ පොදු ප්‍රශ්නයක්නෙ.."

"ඔව් ඉතිං බලමුකො"

වෙදමහත්තයා දෙපැත්තටම නැති පිළිතුරක් දුන් නමුත් එතැනට යා යුතු යැයි සිත යටින් ඔහු තීන්දු කෙළේය. ගමේ මිනිස්සුන්ගෙන් පැමිණි මේ ඉල්ලීම ඔහුගේ සිතට සතුටක් මෙන්ම ශක්තියක්ද ලබාදීමට සමත්විය. එදා රාත්තිරියේදී ඔහු ඇසිලින් නෝනා සමගද මේ ගැන කතා කළේ ඒ සතුටත් ශක්තියත් විසින් ලබාදුන් මානසික ගැම්ම නිසාය.

"බලාගෙන ගියාම ඕවගෙ දේකට ඉදිරිපත් වෙන්ට කෙනෙක් නෑ තමයි"

ඇසිලින් නෝනා කීවේ තමා තුළ ඇති වූ කිසියම් සතුටත් තියා පාන්නටම නොව වෙදමහත්තයාට ගමේ මිනිස්සුන්ගේ ඇති සැලකිල්ල ගැන කියා පාන්නටය.

ගමේ ගොවින් විස්සක් තිහක් පමණ හවස තුනේ සිට බස්නා ඇලේ ඒ දණ්ඩ අසළට එක් රොක්ව සිටියද කුනාහමාර වෙන

WWW.SINHALAELIBRARY.COM 64
Uploaded By Paba

විටත් කෘෂිකර්ම මහත්තුරුන් පැමිණියේ නැත. පැමිණ සිටි පිරිස හැතින් තැනට වී අනම් මනම් දේවල් කතා කරන්නට වූහ.

"සාදිරිස් වෙල්විදානෙ මහත්තයගෙ එක මයිල් ගහක් වටිනවද සිලරතනය... කුඹුරකට බැහැල මඩ ටිකක් ගාගත්තු එකෙක් තාං නමක් නෑ..."

මහත්තුරුන් එනතුරු එතැන සිටි ඇතැම් දෙනා කතා බහ කෙළේ සිලරත්න ගැනය.

"ඕව වැඩක් නෑ... අපේ වැඩේ කරගන්ඩ බලමු"

ඒ කතා බහ දිග්ගැහෙන්නට පෙර සේතන් අප්පුහාමි මැදට පැන සියල්ල නවතා දමීම තැනේ සහ වේලාවේ හැටියට කළ යුතුව තිබූ දෙයකැයි වෙදමහත්තයාටද සිතිණි. කොහොමටත් සේතන් අප්පුහාමිගේ වචනයට විරුද්ධව යා හැකි කෙනෙක් සිටියේ නැත. මරණාධාර සමිතියේ සභාපති වශයෙන් ගම්මුන් අතර ඔහුට හොඳ පිළිගැනීමක් තිබිණි. එහෙත් සේතන් අප්පුහාමිලා පවා මෙතන සිදුවිය යුතු වැදගත්ම කාර්යය පවරා ඇත්තේ තමාට නොවේදැයි සිතුණ විට වෙදමහත්තයා තුළ සියුම් ආඩම්බරයක්ද ඇති විය. ගුණසෝමද සරමට උඩින් කමිසයක් දමාගෙන පියරත්නත් සෝමවංශ කොලුවාත් සමඟ පසෙක තිබූ වලු අඹ ගහට හේත්තු වී බලා සිටිනු වෙදමහත්තයාගේ නෙත ගැටිණි. ඔහු දූත් ගොවි සමාජයේ නියම සාමාජිකයෙකු වී ඇතැයි සිතෙන විට මඳ සිනාවක්ද මුවගින් මතු විය.

"මං තාවට නමක් නෑ... ගෝලය ඇවිල්ල ඉන්නෙ"

වෙදමහත්තයා ගුණසෝමව පෙන්වමින් පීටිං ගොයියාට කීය.

"ඕන්... එක හරක් බාහකිං බාන් දෙකක වැඩ කරයි..."

පීටිං ගොයියා පිළිතුරු දුන්නේය. වෙදමහත්තයාගේ සිත තුළ සැබෑවටම ආඩම්බරයක් ඇති විය.

කෘෂිකර්ම මහත්තුරුන් පැමිණෙන විට සවස හතරටත් කිට්ටු වී තිබිණි. ඔවුන් පැමිණියේ සිලරතනත් සමඟය. සමහර විට පාර පෙන්නාන්ට ඔහු මඟට වී සිටියා විය හැකිය.

කෘෂිකර්ම මහත්තුරුන් තිදෙනෙක්ම පැමිණි නිසා අල්ලපු ගෙදර සයිමන් සිංඤෝලාගේ ගෙදරින් තවත් පුටුවක් ගෙන ඒමට සිදුවිය.



කතාබහ පටන්ගැනීමට පෙර පැමිණ සිටින මහත්තුරුන් පිළිබඳව සිලරත්න මහ ලොකු වර්ණනාවක් කෙළේය. මෙවැනි උසස් නිලධාරීන් තිදෙනෙක්ම පැමිණීම ගමේ ගොවීන්ට කරන ලද ගෞරවයක් යැයි ඔහු පැවසුවේ සේතන් අප්පුහාමි දෙස විශේෂයෙන් බලමිනි.

කෙස්ගස් ස්වල්පයක් පමණක් ඇති කණ්ණාඩියක්ද පැළඳ සිටි මහත්මයා කතා කරන්නට පටන් ගත්තේ "උනන්දුව ඇති මෙවන් තරුණයෙකුගේ සේවය ගමට ලැබීම වාසනාවක්" යැයි සිලරත්න ගැන වර්ණනාවක්ද කරමිනි. එහෙත් ඉන්පසු ඔහු දක්වූ අදහස් රැස්ව සිටි ගැමියන්ගේ මුහුණුවලට උපහාසාත්මක පෙණුමක් එකතු කිරීමට සමත් විය.

"වතුර බහින්නෙ නැත්තෙ... පහළ තියෙන ඇනිකට් එකේ දොර ළඟ මඩ එකතුවෙලා... ඒක වැහිලා... මඩ එකතු වෙන්නෙ මෙතන මංකඩක් හැටියට පාවිච්චි කරන නිසා... රෙදි හෝදන්වයි... බල්ලො නාවන්ඩයි... හරක් නාවන්ඩයි නෙමෙයි මේ ඇලවේලි තියෙන්නෙ... කුඹුරුවලට වතුර ගන්ඩ... මෙතනින් හරක් බස්සවන්ඩ බස්සවන්ඩ ඉවුර කැඩෙනව උන්ගෙ කුරවලට... එක වතාවක් ඇලට බස්සෝල එහා පැත්තෙන් ගොඩ දක්කන කොට පස් අනුරු හත අටක්ම කැඩිල යනව... ඔය විදියට ගමේ ඉන්න හරක් ඔක්කොම මෙතනින් බස්සවන්ඩ ගියොත් ඇලේ ඉවුරට මොකක් වෙනව ඇද්ද කියල දූන් හිතාගන්ඩ පුළුවන්නෙ..."

"මහත්තය ඇලෙන් හරක් බස්සන්නෙ නැතුව පොල් ඒදණ්ඩෙන් හරක්ට යන්ඩ බෑනෙ..."

විලිසොං අස්සක සිට කියූ කතාවට හීන් හිනා හඬක් පැතිර ගියේය. සේතන් අප්පුහාමි විලිසොං අසළට ගොස් 'මුනු මුනු' ගෑවේය.

"ඕක තමයි ගම්වල මොකක්වත් කරන්ඩ බැරි... කවුද කිව්වෙ හරක්ව ඒදණ්ඩෙන් දක්කන්ඩ කියල... ඒවගෙ වැඩවලට දෙපාර්තමේන්තුවෙ සැලසුම් තියෙනවා... අපි දානව මෙතනට හරක් පැන්නිල්ලක්... ඒ කියන්නෙ අඩි දෙකහමාරක් විතර පළල කොන්ක්‍රීට් ලෑල්ලක්... එතකොට හරකුන්ට විතරක් නෙමෙයි මිනිස්සුන්ට බයිසිකලයකින් වුණත් යන්ඩ පුළුවන්... එහෙම වුණාම හරකුන්ගෙ කුරවලට ඉවුර කැඩෙන්නෙත් නෑ... ඇනිකට් දොර

WWW.SINHALAELIBRARY.COM 65
www.sinhalaelibrary.com
SL UNLIMITED The spirit of Sri Lankan e-com
Uploaded By Paba

ළඟ පස් පිරෙන්නෙත් නෑ... එතකොට වතුර පිටාරෙ යන්නෙත් නෑ...''

කෘෂිකර්ම මහත්මයා එසේ අදහස් දක්වා වටපිට බලා සියල්ල නිමාවට පත්වූයේ යැයි සිතමින් පුටුවෙහි වාඩි විය. වෙදමහත්තයා අඩියක් දෙකක් ඉදිරියට තබන විට සියල්ලන්ගේම අවධානය ඔහු වෙත යොමු විය.

''ඒක කරන්ඩ බැරි වැඩක් මහත්තය''

වෙදමහත්තයා ඒ වචන ටික පිට කෙළේ ඉතාමත් සෙමිනි.

''ඒ මොකද බැරි? හරක් ටික පාලමෙන් දක්කන්ඩ බැරිද? ඒක අමාරු වැඩක්ද?''

කෘෂිකර්ම මහත්තයාගේ හඬ තරමක් උස් වී ඇසිණි. තැන තැන තිබුණ කුටු කුටු කතා නැවතී නිහඬතාවක් පැතිර ගියේය. කෘෂිකර්ම මහත්තයාගේ උස් හඬින් වෙදමහත්තයා සිත කලබල කරගත්තේ නැත.

''කොන්ක්‍රීට් ලෑල්ලක් උඩින් හරක් දක්කන එක අමාරු දෙයක් නෙමෙයි. කෙවිටක් අරගෙන පාරවල් දෙකක් ගහපුවාම හුජ්ජ කොර කොර හරි උන් එගොඩට දුවනව. ඒක අමාරු දෙයක් නෙමෙයි. ඒත් ඒක අපේ හිතට අමාරු වැඩක්... මහත්තයො අපි හරක්ගෙන් වැඩ ගන්න ගොවියො... අපේ හැම ගෙදරකම වගේ හරකෙක් දෙන්නෙක් ඉන්නව... ඊ තිස්සෙ ගහක් මුල බැඳල තියල උදේ පාන්දරින් අපි වෙලට දක්කගෙන එනව... උන් දුවගෙන ඇවිල්ල ඇලට පනින එක ඇත්ත... හරකුන්ගෙ කුරවලට පස් අහුරක් දෙකක් කැඩෙන එකත් ඇත්ත...''

''ඒක තමයි අපි කියන්නෙ?''

''මෙතන මහත්තලට නොතේරෙන හරියකුත් තියෙනව... ඒක තේරෙන්නෙ හරක් ඇති කරන... හරකුන්ගෙන් වැඩ ගන්න... ගොවියන්ට විතරයි... මහත්තයො ඊ තිස්සෙ බැඳල හිටපු හරක් වෙලට දක්කගෙන එද්දි වතුර පාර දැක්ක ගමන් උන් හදන්නෙ වතුරට බහින්ඩ... වතුරට බැහැල... වතුර බීල... පෙරළිලා... ගොම දාල... හුජ්ජ කොරල උන් එගොඩට වෙන්නෙ රටක් රාජ්‍යයක් හම්බවුණා වගේ සනතෝසෙකින්. උන්ගෙ ඒ සන්තෝසෙ මිනෑ



කරනව මහත්තයො දවල් එක දෙක වෙනකල් හාන්ඩ... පෝරු ගාන්ඩ...''

ගුණසෝම සමඟ සිටි පියරත්නත් සෝමවංශත් ඇසෙන නෑසෙන හඬින් අප්පුඩියක් ගැසූහ. සේතන් අප්පුහාමි ඔවුන් දෙස රවා බැලුවේය.

''වතුර පෙනි පෙනී අපි කොහොමද මහත්තයො හරකුන්ව කොන්ක්‍රීට් ලෑල්ලෙන් දක්කන්නෙ... එහෙම කළොත් උන් යන්නෙ කළකිරීමෙන්... කේන්තියෙන්... උන්ටත් හිතන්ඩ පුළුවන්... බඩගින්න.. වතුර තිබහ... වගේම උන්ටත් දුක... කලකිරීම... තරහ වගේ දේවල් ඇති වෙනව... හරක් කියන්නෙ අපේ ගමේ අපිත් එක්කම ජීවත්වෙන... අපිට උදව් කරන අපෙන් උදව් බලාපොරොත්තු වෙන කොටසක්... සත්තු වුණත්. ඕක කරන්ඩ පුළුවන් වැඩක් නෙමෙයි...''

වෙදමහත්තයාගේ කතාව එතැන සිටියවුන් අසා සිටියේ තිසිදු හැල්මහොල්මනක් නැතුවය. සේතන් අප්පුහාමිගේ මුහුණට පමණක් නොව බොහෝ දෙනෙකුගේ මුහුණුවලට සිහින් සිනාවක් නැගී තිබිණි. නිහඬතාව බිඳෙමින් තැනින් තැනින් කසු කුසු නැගෙන්නට විය. අන්තිමේදී එය ඝෝෂාවක් බවට පත්විය. කෘෂිකර්ම මහත්තුරුන්ගේ මුහුණු කළුවර වී ගොසිනි. ඔවුහු සීලරත්න සමඟ මාරුවෙන් මාරුවට මොනවාදෝ කීහ.

''අපි තීන්දු කරල... සල්ලි වෙන් කරල තියෙන්නෙ කොන්ක්‍රීට් හරක් පැන්නිල්ලක් දාන්ඩ. ඒක උඩින් හරක් ගෙනියනවද නැද්ද කියන එක ගමේ අයගෙ වැඩක්. ඇළෙන් බස්සන්ට ගිහිල්ල ඇළ ගොඩ වුණාට වතුර පිටාරෙ ගියාට අපිට පැමිණිලි කරන්ඩ එන්ට එපා...''

එක් කෘෂිකර්ම මහත්තයෙක් එසේ කියද්දී අනෙක් දෙදෙනාද නැගී සිටියහ. ඉන්පසු ඔවුහු ජීප් රියෙහි නැගී ගියහ. සීලරත්නද ජීප් රියේ පසුපසින් එල්ලී නැග ගත්තේය. ගමේ සියලුදෙනාම පාහේ කීවේ වෙදමහත්තයාගේ කතාව රත්තරං වටිනවා කියාය.

කෙසේ වෙතත් මාස කිහිපයකට පසු බස්නා ඇළ හරහා අඩි දෙකහමාරක් පමණ පළල කොන්ක්‍රීට් ලෑල්ලක් ඉදිවිය. මිනිස්සු ඊයින් එගොඩ මෙගොඩ ගියහ. එහෙත් හරකුන් දක්කන ලද්දේ ඇළ හරහාය.

WWW.SINHALAELIBRARY.COM 66
Uploaded By Paba

ඊළඟ කන්නයට කුඹුරු වැඩ පටන්ගැනීමට පෙර ගමේ ශ්‍රමදානයක් සංවිධානය විය. එහි නායකත්වය ගත්තේ සේතන් අප්පුහාමි විසිනි. ඇනිකට් දොර ළඟ එක්ව තිබූ මඩ ඉවත් කළ අතර බටදල්ල ගාල්ද සුද්ද කෙරිණි. ඇලෙහි වතුර ඇගේට බැස යන්නට විය. මේ ශ්‍රමදානයේදී ගුණසෝම වෙහෙස මහන්සි වී වැඩ කළ ආකාරය ගැන ඊට පසුදිනෙක වෙදමහත්තයාට කියා තිබුණේ සේතන් අප්පුහාමි විසිනි.

"ඉලන්දාරින්ගෙ හිතේ තියෙනවලු ගම්මඩුවක් නටන්ඩ... දන් උන් තට්ටිය එයි වෙදමහත්තයව හම්බවෙන්ඩ"

"ඒක බොහොම හොඳ වැඩක්... මිය පරණ සිරිත් විරිත් ඉලන්දාරි දැනගන්න එකත් බොහොම හොඳ තමා..."

වෙදමහත්තයා කීවේ උතුරා යන සතුටකින් යුක්තවය.

× × × ×



SL UNLIMITED
The spirit of Sri Lankan e-community

# 12

ඉස්තෝප්පුවේ ලණු ඇඳේ කොට්ටය යට කිණිස්සක් වැනි උල් පිහියක් තිබෙනු ඇසිලින් නෝනා අහම්බෙන් දුටුවේ ගුණසෝම හිස තබන කොට්ටයේ උරය මාරු කරන්නට ගිය මොහොතකය. උල්පිහිය දුටු ඈ එක්වරම තිගැස්සුණාය. උරය ගැලවිල්ලත් පසෙක දමා ඈ කුස්සියට පැමිණ හිරමනා කොටය ඇද ඉඳගත්තාය.

වැසිකිළියට ගොස් සිටි ගුණසෝම ඉන් පිටතට පැමිණෙනු දුටු විට ඇසිලින් නෝනා තිගැස්සුනාය. හැඩි දැඩි පෙනුමක් සහිත ඉලන්දාරියකු ගේ රූපකායක් ඇසිලින් නෝනා ඉදිරියේ මැවී පෙනිණි. තමා සිතාගෙන සිටිනවාට වඩා ගුණසෝම උස්මහත් වී ඇති බවක් එක්වරම ඈට දැනිණි. උල්පිහිය නිසා ඇතිවූ භීතිය තව තවත් වැඩි වූයේ ගුණසෝමගේ හැඩි දැඩි සිරුර දුටුවිටය.

"ගුණසෝමගෙ කොට්ටය යට උල්පිහියක් තිබුණ..."

තහට එකක් බොන්නට කුස්සියට පැමිණි වෙදමහත්තයා සමග ඇසිලින් නෝනා කීවේ ඔහු පුටුවෙහි ඉඳගන්නටත් පෙරය. වෙදමහත්තයා මොහොතක් ඇගේ මුහුණ දෙස බලා "කාගෙ හරි එකක් වෙන්ඩ ඇති" යි කියමින් පුටුකබල මත ඉඳගත්තේය. උල්පිහියේ කතාව නිසා තත්පර කිහිපයක් ඇතුළත වෙදමහත්තයාගේ සිතද සලිත වූ නමුත් ඔහු ඒ බැව් නොපෙන්වා සිටින්නට උත්සාහ ගත්තේය.

"කාගෙවත් එකක් මොකටද කොට්ටෙ යට තියාගෙන ඉන්නෙ?"

www.sinhalaelibrary.com



Uploaded By Paba

ඇසිලින් නෝනා දිගින් දිගටම වෙදමහත්තයාගේ අවධානය ඒ පිළිබඳව යොමු කරන්නට උත්සාහ ගන්නා බවක් ඔහුට දැනිණි.

"ගොවිතැන් බත් කරන... බුලත් පුවක් කන කා ළඟත් කැලි තුන හතරේ ටෝච් එකකුයි පිහියකුයි තියෙනව තමයි... ඒක ගැන ඔය හැටි හිතන්ඩ දෙයක්යැ... මොකද ගුණසෝම ළඟ විතරයි තියෙන දෙයක්යැ"

වෙදමහත්තයා කතා කරන්නේ ඒ සිද්ධිය එතරම් ගණන් නොගන්නා බව අඟවමිනි.

"පිහියක් තිබුණට කමක් නෑ... ඒක ඉතින් වැරදියට පාවිච්චි කළොත් තමයි නරකට හිටින්නෙ... ඔන්න ගුණසෝම දඩබ්බරකං කොරන එකෙක් නං අපි බයවෙන්ඩ ඕනෑ... දැන් ගුණසෝම ඉලන්දාරියෙක්නෙ... මගෙ ළඟත් ඒ දවස්වල පිහියක් තිබුණානෙ... දැන් ඔය කඩුවකුත් තියෙන්නෙ..."

"ඒක මළකඩ කාපු මළ ඉලව්වක්නෙ... මේ පිහියෙ තලේ දිලිසෙනව..."

"කඩුවත් ඒ කාලෙ එහෙම තමයි.. හැබැයි ඉතිං ඒක පාවිච්චි කෙරුවෙ මායිම් විලේ මාළු කොටන්ඩයි... ඉඳල හිටල ලොකු තොයිලෙකදි පුහුල් ගෙඩියක් කපන්ඩයි විතරයි... නැතුව මං ඒකත් අරගෙන මරාගන්ඩ ගියායැ..."

"මං දන්නෙ නෑ... මං කිව්වෙ මං දැක්ක දේ... ඉතුරු ටික කාන්තල පූසාල බලාගන්න එකයි ඇත්තෙ..."

එසේ කියමින් කහට කෝප්පය වෙදමහත්තයා අතට දී අනෙක් අතට සීනි ඇබිත්තක්ද දම්මාය. ගුණසෝමගේ කොට්ටය යට උල් පිහියක් තිබීම ගැන වෙදමහත්තයා දුර දිගට සිතන්නට පටන් ගත්තේ කහට කෝප්පය බොන අතරතුරේය.

පරකන්දෙනියේ ජයපාල රාළහාමි පිහියා ඇණුමකින් මැරුම් කැවේ දලි රැවුලවත් හරිහැටි වැඩී නොතිබුණු කොලු ගැටයෙකු ගෙනි. ඒ කොලු ගැටයා ජීවිතාන්තය දක්වා හිරේ ගියේය. එහෙත් කොස්ඹෑව ගම්පළාතේ නම් එවැනි සිද්ධියක් ගැන කිසිදාක අසන්නට ලැබී නැත. නිතරම බිගත් ගමන් පාරපුරා කුණුහරුප කියමින් ගිය සුරබියෙල් මාමාගේ ඉණේ නිතරම උල් පිහියක් තිබුණු බවට ඒ දිනවල කතාවක් තිබිණි. එහෙත් ඒ පිහියෙන්ද ඔහු කළ



දෙයක් පිළිබඳව නම් ආරංචියක් තිබුණේ නැත. ගමේ බොහෝ දෙනා අතරින් පිහියක් සහ කැලි තුනේ ටෝච් එකක් පාවිච්චි නොකරන්නේ එහෙමත් කෙනෙක් පමණි.

සිත යටින් මෙසේ ඒ පැත්තට මේ පැත්තට තර්ක කරන්නට වූ නමුත් වෙදමහත්තයාගේ සිත තුළද අවසානයේ කිසියම් චකිතයක් ඉතිරි විය.

"නිකමට වගේ අහල බලාපංකෝ... කොහෙන්ද පිහිය කියල" යනුවෙන් ඒ කාරියත් ඇසිලින් නෝනාටම පැවරූ වෙදමහත්තයා කුස්සියෙන් පිටව ඉස්තෝප්පුවට ගියේය. ලණු ඇඳ මතින් වාඩි වූ ඔහු කොට්ටය යට අත ගෑවේය. පත්තර කවදාසි කැල්ලක මතා තිබුණු බුලත් විටක අඩුම කුඩුම මිසක උල්පිහියක් තිබුණේ නැත.

ගුණසෝමගේ උල් පිහිය පිළිබඳ කතාව යටපත් වී ගියේ ඒ සිද්ධියට දවස් තුන හතරකට පසු කුසුමලතාට, සේනානායක පෙරකදෝරු මහත්තයා ළඟ ටයිපිස්ට් රස්සාවක් ලැබීමේ ආරංචියත් සමඟය.

"ලබන පළවෙනිද ඉඳල එන්ඩ කියල තියෙන්නෙ... පත්තියේ සර්ගෙන් පෙරකදෝරු මහත්තය අහල තියෙනව ටයිපිං කරන්ඩ පුළුවන් ගෑනු ළමයෙක් ගැන... එතකොට මගෙ නම තමයි සර් දීල තියෙන්නෙ"

මෙතුවක් කලක් තමන් තුළ කිසිදු බලාපොරොත්තුවක් ඇති නොකළ කුසුමලතා එක්වරම විශාල සතුටකුත් සමඟ පැමිණ ඇතැයි වෙදමහත්තයාට සිතිණි.

"සේනානායක පෙරකදෝරු මහත්තය කියන්නේ නොමමර එකේ අද්වකාත් කෙනෙක්... උන්නැහේට නඩුවක් බාරදෙන්ඩත් ලේසි නෑ..."

වෙදමහත්තයා තමන් දන්නා තොරතුරු ටිකක්ද මේ ආරංචියට එකතු කෙළේ කුසුමලතාගේ මෙන්ම ඇසිලින් නෝනාගේ සිතේද ඇති සතුට තව තවත් වැඩි කරනු පිණිසය.

"දෙයියො බලන වෙලාවක් එනව..."

ඇසිලින් නෝනා කීවාය. මෙතෙක් "නිකමම නිකං" ලමිස්සියක් ලෙසින් පෙනුණු කුසුමලතා එක්වරම වැදගත් ගැහැනියක් බවට පත්ව ඇති බවක් ඇට දැනුණි.

WWW.SINHALAELIBRARY.COM 68
Uploaded By Paba

පළමුවැනිදා සිට කුසුමලතා රැකියාවට යන්නට පටන්ගත්තාය. උදේ පාන්දරින් අවදිවෙන ඇසිලින් නෝනාට ඉදිආප්ප තැම්බීමට අමතරව කුසුමලතාගේ දවල් කෑම පිළියෙළ කිරීමටද සිදු විය. පාන්දරින් ඇසෙන පොල් බිඳින හඬින් හෝ පොල් ගාන හඬින් අවදිවෙන වෙදමහත්තයාද ඉදහිට දවසක කුස්සියට ගියේය.

"කෝ දීපං පොල් අඩලෙ... මං ගාල දෙන්නං"

"වෙදමහත්තය හිමිං නිදාගන්ඩ... තාම පාන්දර ජාමෙ..."

"නින්ද යනවත් දැන් අඩුයි"

මුල් අවස්ථාවලදී ඇසිලින් නෝනා පොල් අඩලය ගාන්නට වෙදමහත්තයාට දුන්නේ ඔහු තුන් හතර වතාවක් ඇවිටිලි කිරීමෙන් පසුවය. එහෙත් සති කිහිපයක් යනවිට එය ඔහුටම පැවරිණි.

"කෙල්ල මේ වගේ දෙයක්වත් කරගනියි කියල මං හිතුවෙ නෑ" යි කියමින් ඒ දිනවල කතාව පටන්ගත් වෙදමහත්තයාට මාසයක් හමාරක් යනවිට "ඒකෙත් වුණේ උඹට වැඩ වැඩිවුණ එක" යි කියැවුණේ වරක් දෙවරක් නොවේ. ඇසිලින් නෝනා ඒ කතාවලට පිළිතුරු දෙන්නට නොගිය නමුත් ඇගේ සිතේ කුමක් හෝ කුහුසක් පවතින බව නම් ඔහුට දැනිණි.

පොල් අඩලය ගා අවසන් කළ වෙදමහත්තයා බොහෝ දිනවල නැවතත් කාමරයට ගොස් නිදාගනියි. එහෙත් ඇතැම් දිනෙක කුසුමලතා අවදිව කුස්සියට පැමිණෙන තුරුම ඇසිලින් නෝනා සමඟ කතා කරමින් කුස්සියේම රැඳෙයි.

මාසයේ අන්තිමට කුසුමලතාගේ අතට කීයක් ලැබෙනවාදැයි වෙදමහත්තයා හෝ ඇසිලින් නෝනා දන්නේ නැත. ඒ ගැන සොයා බලන්නට උන්නැහෙ කෙළේද නැත. එහෙත් ඇගේ ඇඳුම් පැළඳුම් කුමයෙන් වෙනස් වන අයුරු ඈ දුටුවාය. කොණ්ඩයට ගසන සාටිනය රෙදි කඩු වෙනුවට වයිවාරන්න හැඩයෙන් යුත් කොණ්ඩ කටු කිහිපයක්ම ඈ සතුව ඇත. චිත්‍ර ගවුම් නොඇඳින ඈ ඩ්‍රෙස් එක් වරිහා කියන හැට්ට සාය ඇඳ කන්තෝරු යයි. එහෙත් ගෙදර වියදමට කීයක්වත් නොදී සිටීම ගැන ඇසිලින් නෝනා, වෙදමහත්තයා සමඟ කුසුමලතාට දොස් කීවාය.

"අපි හිතන තරං මහ සල්ලියක් හම්බවෙන්නෙ නැතුව ඇති. ඇඳුම්ක් කැවුම්ක් ගන්නාම ඒක ඉවර ඇති. කන්ඩ බොන්ඩ කොහොම කෙල්ලො ඇඳුම්වලට ආසයිනෙ"



වෙදමහත්තයාට අවශ්‍ය වූයේ කුසුමලතා පිළිබඳව ඇසිලින් නෝනා තුළ මතුවෙමින් පැවති අප්‍රසන්නතාව සහ කලකිරීම දුරු කිරීමටය.

"ඒ වුණාට ගෙදරට කියල කීයක් හරි දෙන්ඩ එපායැ... ඒ අපිත් ගුණසෝම... කෙසෙල් කැනක් විත්තක් ඔක්කොම සල්ලි මගෙ අතට දීල තමයි කීයක් හරි ඉල්ලගන්නෙ. කඩයප්පං ටිකවත් දැන් කඩේට ගෙනියන්නෙ නැතෙ... ඒකත් ගුණසෝමටම පැවරිලා වෙලා... උගෙ තුට්ටු කුට්ටු ගානට ගෙවල්වලට කිරි දෙන එකයි මේකයි දෙකම කරන්ඩ බෑ කියල"

ඇසිලින් නෝනා කියාගෙන ගියාය. ඇගේ සිත තදින්ම පෑරී ඇති බවක් වෙදමහත්තයාට දැනිණි. එක අතකට ඒ සිත් රිදීම සාධාරණය. අතට ලැබෙන මුදලින් කීයක් හෝ ඇසිලින් නෝනාටත් දීම කුසුමලතාගේ යුතුකමකි. ඇසිලින් නෝනා සිතන්නේ මුදල් ගැන නොවේ. මේ යුතු අයුතුකම් ගැනය.

"උන්ගෙත් කාල ඇඳල ඉන්ඩ අපේ බලාපොරොත්තුවක් නෑ... ඒ වුණාට ගෙදරටත් සැලකිල්ලක් තියෙන්ඩ එපෑ..."

"අපි උඹල පැහිච්ච මිනිස්සු... කාරණා කාරණා තේරෙන මිනිස්සු. උන් තාම කාරණා ඉගෙනගන්න එවුන්... කලබල නැතුව ඉම්මුකො ටිකක් ඉවසල"

"පොඩි කාලෙ ඉඳලම කුසුමලතාගේ ඔය ගතිගුණේ තිබුණ... හිතන්නෙ තමන් ගැන විතරයි" යි කියමින් ඇසිලින් නෝනා ඇසිලි දෙකතුනක් එල්ලාගෙන ළිඳ ළඟට ගියාය. වෙදමහත්තයා වතුර උගුරක් ගෙන කටසෝදා වතුර ටික කුස්සියේ මිදුලටම විද පිටි අත්ලෙන් දෙතොල පිස ගත්තේය.

x x x x

ගුණසෝමද අදිමදි කළ හෙයින් උදේට උදේට කඩයප්පන් ටික මාටින් මුදලාලිගේ කඩේටත් මංසන්ධිය ළඟ කඩේටත් ගෙන යන්නට සිදු වූයේ වෙදමහත්තයාටය. බොහෝවිට ඔහු මිදුලට බසින්නේ රෑ හිස්සේ පොරවා ගෙන සිටි චිත්ත රෙද්ද පසුව වැසෙන සේ ඇඳ ගනිමිනි.

වෙදමහත්තයා චිත්ත රෙද්දකුත් පොරවා ගෙන පාරට බැසීම ගැන කුසුමලතාගේ කැමැත්තක් නැත.

WWW.SINHALAELIBRARY.COM 69

Uploaded By Paba

"උදේ පාන්දර ඔහොම යන්ඩ හොඳද අම්මෙ... මිනිහෙක් ඉස්සරහට හම්බවුණත් හැතයිනෙ... ඔය මෙස් බැනියමක්වත් ඇඳගෙන යන්නෙ නැතුව"

කඩයප්පං වට්ටියත් ගෙන වෙදමහත්තයා ගෙයින් පිට වූ පසු දවසක් කුසුමලතා කීවාය. එහෙත් ඒ බැව් නෑසුනාක් මෙන් ඇසිලින් නෝනා බත් හැලියට ගින්දර ඇතුල් කළාය.

"මං ඔය ලස්සනක් කැතක් ගැන හිතුවෙ නෑ... ඒත් ඒ මනුස්සයට පිනි බබා උදේ පාන්දර කඩ ගානෙ යන්ඩ වෙච්ච එක ගැනයි මට දුක..."

ඇසිලින් නෝනා තරමක් කාලය ගෙන පිට කළ වචන කිහිපය ඊතල හමුදාවක් සේ පැමිණ කුසුමලතාගේ හදවත පසාරු කරගෙන ගියේය. ඉන්පසු කුසුමලතා මේ ගැන කතා කරන්නට ආවේ නැත. එහෙත් "ඔය රෑ තිස්සෙ පොරවාගෙන හිටපු රෙද්ද පටලවාගෙන යන්නෙ නැතුව බැනියමක්වත් ඇඳගෙන යන්නෑ" යි ඇසිලින් නෝනා පසු දවසක වෙදමහත්තයාට කීවාය. සරමක් සහ අත්දිග මෙස් බැනියමක් ඇඳ තුවායක් පටලවා ගනිමින් හිස ආවරණය කරගත් වෙදමහත්තයා ඉදිආප්ප සහ ලැවරියා වට්ටියද රැගෙන යන දර්ශනය ගමේ කාටත් උදේ පාන්දරින් දකගත හැකි දර්ශන කිහිපයෙන් එකක් බවට පත්වූයේ ඉන්පසුවය. වෙදමහත්තයාගේ දර්ශනයෙන් පසු ඇතැම් ගෙවල්වල දරුවෝ කඩයප්පන් ගැනීම පිණිස කඩයට දුවන්නට ද පුරුදු වූහ.

වෙදමහත්තයා පළමුවෙන් යන්නේ මංකඩ කඩේටය. මාටින් මුදලාලිගේ කඩයට යන්නේ ඉන්පසුවය. එවිට මාටින් මුදලාලි සමග මිනිත්තු හත අටක් කතා කරන්නටද ඉඩක් ලැබේ. උදේ පාන්දරින් පත්තරය ලැබී තිබුණොත් එහෙත් මෙහෙත් පෙරළා බලන්නටත් වෙදමහත්තයාට අවස්ථාවක් උදාවෙයි. තමන් පෙරළා බලන්නට පෙර පත්තරය කිසිවකුට හෝ දීමට මාටින් මුදලාලි කැමැති නැත. එහෙත් "පත්තරය ආවාද"යි වෙදමහත්තයා ඇසුවොත් නොදී ඉන්නේ නැත. වෙදමහත්තයා පත්තරය ප්‍රවේශමෙන් බලා ඒ අයුරින්ම සකස් කොට ආපසු අතටම දෙන බැව් මාටින් මුදලාලි දනී.

"කඩයප්පං ගේන එකත් වෙදමහත්තයටම පංගාර්තු වුණා එහෙනං?"



දවසක් මාටින් මුදලාලි ඇසුවේ වෙදමහත්තයා මෙසේ පත්තරය බලමින් සිටි අවස්ථාවකය. ඒ ප්‍රශ්නය ඒ මොහොතේ හදිසියේ මතු වූවක් නොවන බවත් සතියක් දෙකක් තිස්සේ සිතේ තිබූ එකක් බවත් වෙදමහත්තයාට එක්වරම තේරුම් ගියේය. ඒ ප්‍රශ්නය මෙන්ම ප්‍රශ්නයත් සමගින් මාටින් මුදලාලිගෙ මුවගට නැඟුණ සිනාව ද බොහෝ දේ සිතන්නට කරුණු කාරණා මතු කළේය.

"ඔහොම තමයි මුදලාලි ජීවිතේ... කසාද බඳිනව... දරුවො ඉපදෙනව... උන් ලොකු මහත් වෙනව... උන් උන්ගෙ වැඩ... නාකි ජෝඩුව ආපහු තනිවෙලා තම තමන්ගෙ දුක සැප බලාගෙන ඉන්නව... ඒක වෙනස් වෙනව නං ඒ බොහොම කලාතුරකින්... හැබැයි අපි ඕවට කම්පා වෙන්ඩ කලකිරෙන්ඩ හොඳ නෑ..."

"ඒකනං හැබෑව... දැන් මගෙ කොල්ල වෙළෙඳාමට කැමතිම නෑ. මිනිහ කැමැති මැකැනික් වැඩවලට... දැන් ඔය කිරිඳිවැලේ ගැරේජ් එකක වැඩ ඉගෙන ගන්ඩ යන්නෙ... මං ඉතිං මතක ඇති කාලෙක ඉඳල කඩේ ඇතුළෙ..."

"හැබැයි ඉතිං මැකැනික් වැඩේත් නරක දෙයක් නෙමෙයි... කොරා බාසුන්නැහේ ඇරෙන්ඩ මේ පළාතෙ කවුරුවත්ම නැනෙ"

වෙදමහත්තයා පැවසුවේ කොරනේලිස් බාසුන්නැහේ ගැනය.

කවුරුන් හෝ කඩයට ගොඩ වැදුණුවිට වෙදමහත්තයාත් මාටින් මුදලාලිත් අතර ඇතිවෙන මේ කතාබහ නවතියි. එහෙත් ඔහු ගිය පසු නැවතත් කතාබහ ඇරඹෙයි. නමුත් ඒ වෙනත් මාතෘකාවක් ඔස්සේය.

"පත්තරේ කියන විදියට බුද්ධරක්ඛිත හාමුදුරුවො තමයි ඔක්කොම පැලැන් කොරල තියෙන්නෙ. විමලා විජේවර්ධනට කැලෑපත්තරත් ගහල කියල කවුදෝ කිව්ව"

"අනේ මංද මුදලාලි... රටක් වටින මනුස්සයෙක් මරා දමීමට පස්සෙ නඩුවලින් ඇති පොරොජ්ජනේ මොකක්ද?"

"ඕව ඉතින් බණ්ඩාරනායක මහත්තයගෙම වැරදි... සර්පයො ළං කරගත්තාම නපුරක්ම තමයි වෙන්නෙ... වෙදමහත්තයට මතකද... මං උත්පත්ති ශ්‍රී. ඇන්. පී. කාරය තමයි. ඒත් මේ පාර මං ඡන්දෙ දුන්නෙ ශ්‍රී ලංකා එකට... ඔය බණ්ඩාරනායක මහත්තය ගිය්ද..."

WWW.SINHALAELIBRARY.COM 70
Uploaded By Paba

මාටින් මුදලාලි දේශපාලනය ගැන කතා කරන්නට එතරම කැමැත්තක් නැත. එහෙත් වෙදමහත්තයා සමග කතා කරයි.

"කයිවාරුවක් හරි ගහන්ඩ ඕනෑ තමන්ට වඩා දන්න කෙනෙක් එක්ක... එතකොට කයිවාරුවට යන වෙලාව අපතේ යන්නෙ නෑ" යි මාටින් මුදලාලි නිතර පවසන දෙයක් වෙදමහත්තයාට සිහිපත් විය. ඔහුගේ සිතේ සතුටක් උපදියි. උදේ පාන්දරින් සිතට සතුට ගලා එන්නේ නම් එය මොනතරම් හොඳ දෙයක්ද? උදේ පාන්දරින් කඩයප්පං රැගෙන යාමේ කටයුත්ත වෙදමහත්තයා කැමැත්තෙන් කෙළේ ඒ නිසාය.

"කඩයප්පං ගේන එකත් එහෙනං වෙදමහත්තයාටම පංගාර්තු වුණා" යි යනුවෙන් මාටින් මුදලාලි කී බැව් වෙදමහත්තයා ඇසිලින් නෝනා සමගද පැවසුවේය.

"අපිත් කිය කිය හරි හොයන එක හිතට හොඳයි"

ඇසිලින් නෝනා දුන් පිළිතුර අපූරු එකකි. ජීවිතයේ සිදුවෙන. වෙනස්වීම් ගැන ඈ හොඳ විමසිල්ලකින් සිටින බවක් වෙදමහත්තයාට දැනිණි. ඒ වැනි කාරණා සම්බන්ධයෙන් නම් තමා සිටින්නේ ඈට වඩා බොහෝ පහළ මට්ටමකය.

කුසුමලතා රැකියාවට යයි. ඇගේ ජීවිතයේ ප්‍රධානම කාර්යය එයයි. ඒ හැරුණු මිසක අන් දේවල් ගැන ඈ සිතන්නේ නැත. මිනීමැරුම් නඩුවකදී සේනානායක අද්වකාත් මහත්තයා ඉදිරිපත් කළ තර්ක ගැනද ඈ කුස්සියට වී ඇසිලින් නෝනා සමග කතා කරයි. ඒවා නොතේරෙන නමුත් ඇසිලින් නෝනා ඒවා අසා සිටී. තමාට අලුත් ටයිප් රයිටරයක් ලැබුණ බවත් එය පැරණි එකට වඩා බොහෝ හොඳ එකක් බවත් ඈ පවසයි.

සාමාන්‍ය පෙළ විභාගයෙන් උසස් ලෙස සමත් වූ ජිනසෝම උසස් පෙළ විද්‍යා විෂයයන් හදාරයි. ඔහු ගෙදර එන්නේද මාසයකට දෙකකට වරකි. පැමිණි දිනවලද වැඩි කතා බහක් නැත. කුසුමලතා සමග සමණක් විවිධ දේ ගැන කතා කරයි. ඒවා තමාට හෝ ඇසිලින් නෝනාට සමීප විය හැකි මාතෘකා නොවේ.

ගුණසෝමට දැන් වත්ත පිටියේ කුඹුරේ වැඩවලට අමතරව කිරි දෙනුන්ගේ වැඩද තිබේ. කෙසේ හෝ ඔහු ඔහුගේ ජීවිතය සොයා ගනු ඇත.



ඔහ කාටත් පළමුව අවදිවෙයි. ඔහු අවදිව ඇති බව ගෙදර කාටත් දැනගන්නට ලැබේ. ඒ පිටතින් ඇසෙන සද්ද බද්ද නිසාය. ළිඳේ වතුර අදින හඬ... බාල්දිය සද්ද වෙන හඬ.... ගුණසෝම දෙනුන්ට කතා කරන හඬ, හැමදාමත් උදේ පාන්දරින්ම ඇසෙන සද්ද බද්ද වෙයි. දැන් ඔහුට සේප්ප දෙනුන් දෙදෙනෙක්ම ඇත. ඒ නිසා ගෙවල් කිහිපයකටම ඔහු පාන්දරින් කිරි සපයයි. දැන් ඔහුගේ අතට සෑහෙන මුදලක් ලැබේ.

දරුවන් උස්මහත් වෙමින් ඇතිවෙන මේ වෙනස්කම් ඉදිරියේ පවුලේ සාමාජිකයෙක් වශයෙන් තවදුරටත් අවලංගු නොවී සිටීමට නම් තමන්ද යම් දෙයක් කළ යුතුය. අකර්මන්‍ය වී නිෂ්ක්‍රිය වී ගියහොත් අවලංගු කාසියක් බවට පත්වෙනු නියතය. එවිට දරුවන්ගේ අතකොලු බවට පත්වීමට ඉඩ තිබේ. අසරණවීම දරාගත හැක්කක් නොවේ. අසරණවීමට එරෙව නැගීසිටිනු වස් කුමක් හෝ කළ යුතුය. ඇසිලින් නෝනා ඒ වචන තුන හතරෙන් පැවසුවේ මෙවන් බැරෑරුම් දෙයක් නොවේදැයි වෙදමහත්තයාට සිතිණි. ඇගේ කඩයප්පං සෑදීම ආර්ථික සහනයකටත් වඩා මානසික සහනයක් ලබාදෙන්නකි. එහෙත් කිසිවක්ම නොකරන තමන් පත්ව ඇත්තේ ඇසිලින් නෝනාගේ අත් උදව්කාරයෙකුගේ තත්ත්වයකටය.

මාටින් මුදලාලිගේ කඩේටත් මංකඩ ළග කඩේටත් කඩයප්පං රැගෙන ගොස් ආපසු පැමිණෙන වෙදමහත්තයා මිනිත්තු දහයක් පහළොවක් සමහරවිට පැය භාගයක් පමණ වේලාවක් ලණු ඇඳේ ඇල වී සිටියි. නොයෙකුත් අදහස් ඔහුගේ සිතට ගලා එන්නේ ඒ මොහොතේදීය. ඒ අදහස් අතරින් බොහෝ දිනක් යන තෙක් සිතේ රැඳී තිබෙන්නේ ගෙදර පරිසරය තුළ තමා නිෂ්ක්‍රිය පුද්ගලයෙක් බවට පත් වී තිබෙනවා නොවේද යන සිතුවිල්ලයි. එය වේදනාකාරී සිතුවිල්ලකි.

මේ වේදනාකාරී සිතුවිලිවලින් ගැලවෙන්න එතරම් පහසු නැත. එහෙත් ඔහු ඇඳයට ඇති ගුණසෝමගේ විදුලි පන්දම ගනී. එහි බැටරි කැලි උඩයට මාරුකොට නැවතත් දමා මූඩිය ගලවයි. එහි බැටරි කැලි උඩයට මාරුකොට නැවතත් දමා වසයි. ස්විච්ය තද නොකළද බැටරි කැලිවල බලය කිසියම් ප්‍රමාණයකින් අඩුවෙන බැව් වෙදමහත්තයා අසා ඇත. උදෙන්ම ඒවා උඩයට මාරුකොට දැමිය යුත්තේ ඒ නිසාය. මේ පිළිබඳව ගුණසෝමටද කිහිපවතාවක් පැවසූ නමුත් ඔහු ඒ කාරණා ගුණසෝමට ගත බවක් පෙනෙන්නට නැත.

WWW.SINHALAELIBRARY.COM 71
Uploaded By Paba

කඩයප්පං රැගෙන කඩවලට යාමද ගුණසෝමගේ විදුලි පන්දමේ බැටරි කෑලි මාරු කිරීමද වෙදමහත්තයාගේ දවසේ මුල්ම කටයුතු බවට පත්විය.

× × × ×

කුසුමලතා කන්තෝරුවටද ගුණසෝම වෙල පැත්තටද ගිය පසු ගෙදර පවතින්නේ දැඩි නිහඬතාවයකි. ඇසිලින් නෝනා කුස්සියේ වැඩය. ලණු ඇඳේ වැතිර සිටිනවා හැරෙන්ට වෙදමහත්තයාට කරන්නට වැඩක් නැත. බොහෝ විට ගෙදර පවතින මේ කටුක නිහඬතාව බිඳී යන්නේ ඇසිලින් නෝනා බැලේියට කෑගසන හඬිනි. එහෙත් හදිසියේම වාගේ කතාබහකට සුදුසු මාතෘකාවක් පැමිණෙයි.

"ඇල්පේනිසා ගහකින් වැටිලලු"

වෙදමහත්තයා කීවේය.

"මිකා කුසිප්පු බිගෙන ගස් යන්ඩ ඇති. මම නං ඉර හැරුනට පස්සෙ ඇල්පේනිසාව ගස් අරින්නේ නෑ"

"බොන්නෙ නැතුවාමම අල්පේනිසාගෙ අතපය වෙව්ලනවලු... කොන්ද කැඩිල කියල තමයි කියන්නෙ... දරුවොත් හතර දෙනෙක්නෙ... හැන්දෑවෙලා ඒ පැත්තෙ ගිහින් එන්ඩ යන්ඩ ඕනෑ"

"කාලකණ්ණි"

ඒ කතාබහද ඒ අයුරින් අවසන් විය. අලුත් කතාබහක් නොවූ හෙයින් වෙදමහත්තයා නැවතත් ඉස්තෝප්පුවට ගොස් ලණු ඇඳෙහි ඇළවුණේය.

වෙලපැත්තට ගියත් විශේෂයෙන් කරන්නට දෙයක් ඉතුරුව නැත. ගුණසෝම ඒ සියල්ල අවශ්‍ය පරිදි කරගෙන යයි. ජේතන් අප්පුහාමි හෝ පුබිතේරිස් ගොයියා වෙලපැත්තේ සිටියොත් කයිවාරුවක් ගසන්නට පුළුවන. එහෙත් ඔවුන් නොසිටියොත්...? වෙදමහත්තයා යළිත් සිතුවේය.

ඇඳ තුලක් බැඳගන්නට හෝ තෙල් ටිකක් ජීවම් කරගන්නට දුන් කිසිවෙක් නොපැමිණෙන තරමය. ඉඳහිට පැමිණියහොත් ඒ පිටගමනිනි.

"නිතර නිතර ආරස්සා නූල් බඳිනකොට... නිතර නිතර මතුරන හඬ ඇහෙනකොට යක්කු පෙරේතයො බය වෙනව. උන්

කන්ද පමුල 

ගමේ හතර මායිමකටවත් එන්නෙ නෑ... ඒකයි මේ වෙලා තියෙන්නෙ... මගේ අතට කියක්වත් නොලැබුණාට කමක් නෑ. එහෙම ශාන්තියක් ගමට වෙලා තියෙනව නං..."

වෙදමහත්තයා ඇසිලින් නෝනා සමඟ කීවේය. ඊට පෙරද ඔහු එවැන්නක් කියා ඇති බව ඇට මතකය. වෙදමහත්තයා අත කියක්වත් නැතුව ඇතැයි සිතුණු විට ඇගේ සිත කම්පා නොවූවා නොවේ. එහෙත් "වෙදමහත්තාගෙ අතේ කියක්වත් නෑ නේද?" යි අසා සල්ලියක් අතේ තබන්නටද ඇට නොහැක.

"රුපියල් පහක් හයක් තියෙනවනං දීපංකො" කියා ඔහු ඉල්ලන්නේ ද නැත. ජිනසෝම සාමාන්‍ය පෙළ විභාගය උසස් අයුරින් සමත් වූ බැව් ආරංචි වූ දවසේ නම් වෙදමහත්තයා ඇගෙන් රුපියල් දහයක් ඉල්ලාගත්තේය. ඔහු එදින රාත්‍රියේ බිමතින් පැවසූ දේවල් ඇසිලින් නෝනාට අද වගේ මතකය.

"අහල ගං හතක එකෙක්වත් මහොම සාරෙට පාස්වෙලා නැතුව ඇති කියල මාටින් මුදලාලි කිව්ව. හරියට කෙරුවොත් දොස්තර විභාගෙත් ගන්ඩ පුළුවන්... එතකොට වෙදමහත්තයගෙ පුතා දොස්තර"

"කා ගැනවත් අපි ඕනෑවට වඩා හිතන්ඩ ඕනෑ නෑ..."

"ඒකත් ඇත්ත ඇසිලින් නෝනෙ... හැබැයි ඉතිං මොනව වුණත් හිතට සන්තෝසයි... දරුවෙකුගෙ සාමර්ථයක් දවසට නොබොන අරක්කු මොකටද කියල සුගතං කිව්ව... ඌ ඉතිං ඔව කිය කියා අනුන්ගෙන් බොන එකානෙ... ඒ වුණාට උන් හරි හොඳයි බං... බිල නැමෙහන කාලකණ්ණි තමයි... වෙදමහත්තයාගෙ පුතා දොස්තර කෙනෙක් වුණොත් මුළු ගමටම ආඩම්බරයක් කියලත් ඌ කිව්ව... ඌ ඒව කිව්වෙ මගෙන් තව අරක්කු වීදුරුවක් බොන්ඩ බලාගෙනම නෙමෙයි. උන්ට එහෙමත් හිතෙනව ඇති"

එදා මුදලක් ඉල්ලාගත් නමුත් ඊට පසු වෙදමහත්තයා එසේ කිසිදු මුදලක් ඉල්ලුවේ ද නැත.

ඔහු යළිත් පුස්කොළ පොත් බලන්නට පටන් ගත්තේය. ඇසිලින් නෝනා සිතුවේ කරන්නට වෙනත් වැඩක් නොමැති නිසා එසේ කරන්නට පෙළඹී ඇත කියා. එක අතකට ලණු ඇඳ මතට වී කල්පනා කර කර සිටිනවාට වඩා මොකක් හෝ දෙයක් කරන එක හොඳ යැයි ඇ සිතුවාය.

WWW.SINHALAELIBRARY.COM 72
Uploaded By Paba

අණ්ඩක් කැඩුන කණ්ණාඩිය වෙදමහත්තයාගේ දෑස්වල රැඳී තිබුණේ ගැට ගැසූ කම්බි කැල්ලක් ආධාරයෙනි. ඔහු ඉඳහිට කුස්සියට පැමිණ පුස්කොළ පොතේ පිටු අතරේ දුටු දෙයක් ගැන ඇසිලින් නෝනා සමග කතා කරන්නටද පටන් ගත්තේය.

"මහා බලගතු තෙල් ගැන මේ පොතේ තියෙනවා... හෙණරාජ තෙල් හිඳින හැටිත් තියෙනව"

"ඒක තේන්නං සිරිදාස අරගෙන ගිය පොත්වල මොන මොනව තියෙන්ඩ ඇද්ද?"

"බලගතු අඳුන් හදන හැටිත් තියෙනව"

දින කිහිපයක් තිස්සේ පුස්කොළ පොත් පෙරලමින් බැලූ වෙදමහත්යා යම් යම් දේවල් ඇක්සැයිස් පොතක ලියා ගන්නටද විය. මෙතෙක් දවසක් ඉලක්කයක් හෝ අර්ථයක් නොමැතිව මගේ බලාගෙන සිටි ඔහුගේ මුහුණ නැවත වතාවක් ප්‍රාණවත් වී ඇති බවක් ඇසිලින් නෝනාට දැනිණි. එක්තරා අඳුනක් ගැන නිතර නිතර කතාකරන්නට පටන්ගත් වෙදමහත්තයා එහි තිබෙන බලගතුකම ගැන ඇට විස්තර කරන්නට පටන් ගත්තේය. ඔහුගේ දෑස් නැවතත් ප්‍රාණවත් වී ඇති බව ඈ දුටුවේ ඒ විස්තරය කියාපාන අතරතුරේය.

"මම හිතාගෙන ඉන්නෙ ශ්‍රී විෂ්ණු අඳුන හදන්ඩ"

දින කිහිපයකට පසු වෙදමහත්තයා කීවේය.

"වැඩි වියදමක් යන්නෙත් නැ... හැබැයි ගොඩමස් දියමස් පුළුටුවලින් ඇත්වෙලා හොඳට පේ වෙලා කරන්ඩ ඕනෑ වැඩක්"

"ඒකනං බොහොම හොඳා තමා... අඳුන මොනව වුණත් මස් මාළු නොකා පේ වෙලා ඉන්න එක කොයිකටත් හොඳයි"

"මෙහෙම කිව්වට උඹට හිතාගන්ඩ බැ... විෂ්ණු අඳුනකට අංජනම් දේව් වඩින්ට පටන් ගත්තොත් වෙන මොකවත් ඕනෑ නැ... අංජනං බලලම ජීවත්වෙන්ඩ පුළුවන්... දන් අර කැන්දලියද්ද පාරමෙ නාමිනේ ගෙවල් දොරවල් හැදුවෙත් අංජනං බලලා..."

ජීවත්වීම සඳහා කිසිදිනෙක යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් නොකළ වෙදමහත්තයා මුදල් ගැන සිතමින් අංජනමක් බැලීම ගැන පැවසීම ඇසිලින් නෝනා තුළ විමතියක් මෙන්ම කණස්සල්ලක්ද ඇති කළේය. එහෙත් ඒ ගැන යමක් කියා වෙදමහත්තයාගේ [illegible] බිඳීමට



අදහස් නොකළ ඈ සියල්ල නිහඬවම අසා සිටියාය. "කාට හරි මනුස්සයෙකුට යහපතක් වෙනව නම් ඒ මදැයි" යනුවෙන් වෙනදාට වෙදමහත්තයාගේ මුවින් පිට වෙන වචන ටික කියා පාන්නට ඇට සිතුණ නමුත් එයින් ඔහුගේ සිත රිදෙන්නට ඉඩ ඇතැයි සිතුණ හෙයින් ඒවා මුවින් පිට නොකළාය.

"සිරිදාසටත් එන්ඩ කියන්ඩ ඕනෑ... මිනිහත් මේ වැඩේට සම්බන්ධ වෙන්ඩ කැමැති වෙයි"

වෙදමහත්තයා සිරිදාස ගැන කීවේ කුමක් නිසාදැයි එක්වරම ඇසිලින් නෝනාට තේරුම්ගත නොහැකි විය. එහෙත් පසුදිනෙක ඔහුත් සමඟ යක්කලට ගිය වෙදමහත්තයා අඳුන සෑදීමට අවශ්‍ය වූ ද්‍රව්‍ය කිහිපයක් ගෙනැවිත්, "සිරිදාසට සෑහෙන ගාණක් වියදම් වුණා..." යි පැවසූ විට සිරිදාස සම්බන්ධ කරගැනීමට හේතු වූ කාරණාව ඇසිලින් නෝනාට වැටහිණි.

"සිරිදාස ලවා මොකට වියදං කෙරෙව්වද? මගෙන් ඉල්ලුව නම් වෙදමහත්තයට සල්ලි දෙනවනෙ"

"නෑ ඉතිං මිනිහ බොහොම කැමැත්තෙන් වැඩේට සම්බන්ධ වුණේ..."

එහෙත් ඔහුගේ පිළිතුරෙහි එතරම් ප්‍රාණවත් බවක් තිබුණේ නැත. අඳුන ගැන විස්තර කියන විට "යන ගාණත් මං දෙන්නං... වෙදමහත්තය අඳුන හදන්ඩ පටන්ගන්න" යි කියමින් තමා ඉදිරිපත් නොවීම ගැන ඔහු කිසියම් සිත් කළකිරීමකින් සිටිනවාදැයි ඇසිලින් නෝනාගේ සිතෙහි සාංකාවක් ඇතිවිය. එහෙත් ඒ ගැන දැන් කතා කිරීමෙන් වැඩක් නැත. ඔහුගේ හැසිරීම ගැන මීට වඩා විමසිල්ලෙන් සිටිය යුතුය. මුවින් පිට නොකළද ඔහුගේ සිතෙහි පිටනොවන බොහෝ දේ ඇති බවත් ඇට දැනෙන්නට විය.

"ආයිමත් මොකක් හරි පටන්ගන්ඩ වාගෙ"

කුසුමලතා ඒ ගැන කතා කරන්නේ තුරුස්නා ස්වභාවයකිනි.

"තාත්තගෙ වැඩ තාත්තට කරගන්ඩ දීපල්ලා. උඹල ඒවට කට ගහන්ඩ යන්ඩ ඕනෑ නෑ..."

"වැඩක් ඇති වැඩක්යැ"

"උඹලට වැඩක් නැති වුණාට තාත්තට වැඩක් ඇතිනෙ..."

WWW.SINHALAELIBRARY.COM 73
Uploaded By Paba

ඇසිලින් නෝනා ඒ වචන ටික පිට කෙළේ කිසියම් තද ස්වරයකිනි. ඉන්පසු ඒ ගැන කුසුමලතා ප්‍රශ්න කරන්නට පැමිණියේ නැත.

"සෙනසුරාදා උදේට පූජාවට තියන්ඩ කැවිලි හතර පහකුයි... කිරිබත් කෑලි දෙක තුනකුයි තිබුණොත් හොඳා"

වෙදමහත්තයා ඇසිලින් නෝනාට කීවේය. ඒ වචන කිහිපයත් සමග ඇගේ සිතේ තිබුණ පීඩනය ඉවත්ව ගොස් එක්වරම සැහැල්ලුවකින් පිරියනු ඇට දැනිණි. වෙදමහත්තයාගේ කටයුතුවලට තමාද සම්බන්ධ කරගැනීමට ඔහු කැමැත්තෙන් සිටිනවාය යන සිතුවිල්ල ඔස්සේ මේ සැහැල්ලුව ඇගේ සිතට ගලා ආවේය. පසුගිය දින දෙක තුන තුළදී තමන්ට දැනුණ තනිකම දුරුවී සිත යළිත් ප්‍රාණවත් වී ඇති බවක් ඇට දැනිණි.

වෙදමහත්තයාගේ සිතට කරදර දුන්නේ ඇසිලින් නෝනාටත් නොදන්වා සිරිදාසත් සමග ගොස් අඳුන සෑදීමට අවශ්‍ය අඩුවැඩිය ගෙන ඒම පිළිබඳව ඈ කිසියම් සිත් වේදනාවකින් සිටිනවාද යන කුකුසයි.

සිරිදාස සෙනසුරාදා උදේ පාන්දරින්ම වෙදමහත්තයාගේ ගෙදරට පැමිණියේය. වෙදමහත්තයා ඒ වන විටත් මුහුණකට සෝදා පිරිසිදු සරමක් බැනියමක් ඇඳ සුබ මොහොතින් අඳුන ඇඹරීමේ කටයුත්ත ආරම්භ කිරීමට සූදානම්ව සිටියේය.

කුසුමලතා කන්තෝරු යන්නට සූදානම්ව වෙදමහත්තයාගේ කටයුත්ත අවසන් වෙනතුරු බලා සිටියාය. ගුණසෝම සුබ වේලාව උදාවෙන්නට පෙර පැමිණෙන බව පවසා කිරිබෝතල්ද රැගෙන පිටව ගොසිනි.

වෙදමහත්තයා මල් මුලත් තට්ටුවේ තිබිය යුතු කලමනා හරිදැයි නැවතත් බැලුවේය. අඳුන සකස් කරන්නට අවශ්‍ය බෙහෙත් ගස්වල කොළ කිහිපයක්ද පිරිසියකට දැමූ තෙල් වර්ග කිහිපයක්ද එසේම කැවිලි පහක් සහ කිරිබත් කෑල්ලක් කෙසෙල් ගෙඩියක් වැනි ද්‍රව්‍ය ද එහි තිබිණි. සුබ මොහොත යෙදී තිබුණේ හතයි පහටය. හත වෙන්ම වෙදමහත්තයා විත් මල් මුලත් පුටුව ඉදිරිපිට තබා තිබුණ අනෙක් පුටුවෙහි ඉඳගත්තේය. සිරිදාස, ඇසිලින් නෝනා පමණක් නොව කුසුමලතාද පැමිණ ඒ අසළින්ම සිටගත්තාය.



කුසුමලතා වෙතින් වහනය වෙන පියරු සුවඳ සිරිදාස දරා සිටියේ ඉතා අසීරුවෙනි.

"වෙදමහත්තය දන්නම් වේලාව හරියාගෙන එන්නෙ"

සිරිදාස එසේ කියමින්ම කුසුමලතා දෙස බැලුවේය. එවර නම් ඇගේ දෑස් හසුකර ගැනීමට ඔහුට හැකිවිය. එහෙත් ඒ සමගම ඈ දෑස් ඉවතට ගත්තාය. සිරිදාස අත්ඹරලෝසුවට නෙත් යොමු කළේ සිත තුළ ඇති කලබලය පිළිබඳව කිසිවක් මුහුණෙන් හෝ ඉරියව්වලින් පිට නොවන්නට වගබලා ගනිමිනි. වෙදමහත්තයා මල් මුලත් පුටුවේ තිබුණ තෙල් පිරිසියෙන් ඇඹිත්තක් ඇඟිලි තුඩුවලට ගෙන බෙහෙත් කොළයක් දෙකක් අතට ගත්තේය.

"වේලාව හරි"

සිරිදාස එසේ කියනවාත් සමගම "ඕං රීං" යනුවෙන් මතුරන්නට පටන් ගනිමින් ඇඟිලි තුඩුවලට ගත් කොළ දෙක පොඩි කරන්නට විය. විනාඩි පහකට හයකට පසු මැතිරිල්ල නතර කළ වෙදමහත්තයා ඇඟිලි තුඩු අතර තිබූ පොඩි වුණ කොළ දෙක පිරිසයක් මත තබා නැඟී සිටියේය.

"එහෙම නම් සිරිදාස තේ එකක් බීල ඉමු"

වෙදමහත්තයා සිරිදාසට කීවේය. ඔහු හිස වනා එය පිළිගනිමින් ඒ තත්පර කිහිපය තුළදී කුසුමලතාගේ දෑස් හසුකර ගන්නට මොහොතක ඉඩක් ලබාගත්තේය. ඇගේ දෑස්වල සිනාවක් නම් තිබුණේම නැත.

"අම්මෙ මං යනව"

කුසුමලතාගේ හඬ සිරිදාස තුළ තිගැස්මක් ඇති කෙළේය. මේ තරම් සමීපව ඈ දුටු අවස්ථාවක් ගැන ඔහුට මතක නැත. ඇගේ නිකට දෙසට ළංවෙන්නට තිබුණ කුඩා කුරුලෑව පවා ඔහුට හොඳින් පෙනිණි.

"ඇයි උඹ කන්නෙ නැද්ද?"

"කිරිබත් කෑලි තුන හතරක් ඔතාගත්ත. කන්තෝරු ගිහිල්ල කනව"

කුසුමලතා පිටව ගියාය.

සිතේ ඇතිවූ විශාල කම්පනය සඟවා ගනිමින් සිරිදාස සාලයේ නිවසේව අසලට ගොස් කිරිබත් කෑල්ලක් සහ කෙසෙල් ගෙඩියක් අතට ගත්තේය.

SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 74
Uploaded By Paba

"කුකුළ අඩලපු වෙලාවෙ ඉඳල ඉරපායන වෙලාව එනකල් දවස් තුනක් අඹරන්ඩ ඕනෑ...."

වෙදමහත්තයා කිරිබත් කෑල්ලක් හපමින් සිරිදාසට අඳුන පිළිබඳව විස්තර කරන්නට විය. කිරි බෝතල් බෙදා අවසන් වූ ගුණසෝම ආපසු පැමිණියේ මේ අතරවාරයේය. තේ බී අවසන් වූ පසු සිරිදාස "මේ දවස්වල ඉබුල්ගොඩ වැඩ" යි කියමින් පිටව ගියේය. ගුණසෝමද එක හුස්මට කිරිබත් කෑලි හතරක් පහක් ගිල දමා වෙල පැත්තට ගියේය. ඇසිලින් නෝනා කුස්සිය අස්පස් කරන්නට වූවාය. වෙදමහත්තයා සාලයේ තිබුණ මල් බුලත් පුටුව කාමරයට ඕසවාගෙන ගියේය.

"කුස්සිය අස්කරල මං ඒක පවිත්තර කරල දෙන්නං" යි ඇසිලින් නෝනා කියද්දීත් වෙදමහත්තයා පිළිකන්නේ පැත්තක දමා තිබුණු ඇඹරුම් ගල සහ අත්ගල ළිඳ ළඟට ඔසවාගෙන ගියේය. එහෙත් ඇසිලින් නෝනා ඔහුට එය සෝදන්නට ඉඩ දුන්නේ නැත. කුස්සියේ වැඩ පසෙකට දමූ ඈ ඇඹරුම් ගල සෝදන්නට පටන් ගත්තාය.

මෙවැනි දේ කිරීමට වෙදමහත්තයාට ඉඩදිය යුතු නැත. ඔහු ඊට වඩා වැදගත් එසේම වෙනත් කෙනෙකුට කළ නොහැකි කටයුත්තක් කිරීමට සූදානම්ව සිටින්නෙකි. අනෙක් අතට අඳුන සෑදීමේ කටයුත්තේදී තමාට ඉටුකර දිය හැක්කේ මෙවැනි සුළු සුළු අතිරේක වැඩ පමණි.

"ඇසිලින් නෝනට ඕක උස්සගෙන යන්ඩ පුළුවනැ" යි වෙදමහත්තයා කියද්දීත් ඇඹරුම් ගල ඔසවාගත් ඇසිලින් නෝනා එය කාමරයට ගෙන ගියේ ඇගේ සිත එවැනි සිතුවිලිවලින් පිරී තිබුණ නිසාය.

විවිධ තෙල් වර්ග... කොළ දඬු වර්ග... බෙහෙත් වර්ග මිශ්‍රකරමින් වෙදමහත්තයා හිමිදිරි තුනක් අඳුන ඇඹරීමෙ කටයුත්තෙහි නියැලුනේය. කඩයප්පන් සෑදීම සඳහා අවදිවෙන ඇසිලින් නෝනා වෙදමහත්තයාව අවදි කිරීමෙන්ද, ඒ වන විට කිරි දොවා නොතිබුණ බැවින් කෝපි කෝප්පයක් පිළියෙළ කර දෙමින්ද, මුහුණකට සෝදාගන්නට උණුවතුර බේසමක් සකස් කර දෙමින්ද මේ කටයුත්තට උදව් දුන්නාය.



සෑම හිමිදිරියකම දකින වෙදමහත්තයාගේ බලාපොරොත්තු සහිත ප්‍රාණවත් මුහුණ ඇගේ සිතට මහත් අස්වැසිල්ලක් ගෙන ආවේය.

අඳුන ඇඹරීමේ කටයුත්ත ඉර පායන්නට පෙර අවසන් කරන වෙදමහත්තයා කඩයප්පං වට්ටියද කඩවලට ගෙන යයි.

හිමිදිරි තුනක ඇඹරිල්ල අවසාන වෙන විට කුඩා අග්ගලා ගෙඩිය ප්‍රමාණයේ ගුලියක් සකස් කරගැනීමට වෙදමහත්තයාට හැකි විය. ඉතා හොඳින් පිරිසිදු කරගත් පිරිසියක පතුලෙහි ඇති කුඩා කවය ඇතුළත අඳුනින් කොටසක් තැවරූ ඔහු ඉතිරි කොටස බුලත් කොළයක ඔතා අල්මාරියේ මුල්ලකින් තැන්පත් කෙළේ මහානර්ඝ වස්තුවක් තැන්පත් කරන්නෙකු මෙන් ප්‍රවේශමිනි.

හිමිදිරි හතක් එක දිගට අඳුන ජීවම් කළ යුතුය. එය ඉතා භක්තියෙන් කළ යුත්තකි. ඇසිලින් නෝනාත් සමගම වාගේ අවදිවෙන වෙදමහත්තයා පිරිසිදුව් මල් බුලත් පුටුවේ ඇති අඳුන ජීවම් කරයි.

"මන්තරේ එකසිය අට වාරයක් මතුරන්ඩ ඕනෑ"

මැතිරිල්ල අවසන් කොට කුස්සියට පැමිණි වෙදමහත්තයා ඇසිලින් නෝනාට කීවේ පළමු දවසේමය.

"කොහොමද එකසිය අට සැරේ ගණං තියාගන්නෙ"

"ඇසිලින් නෝනෙ ඒක තමයි පුරුද්ද... පිහිටීම...ඔවගේ දේවල් පිහිටන්නෙ නැතුව මේ සාත්තරේ කරන්ඩ අමාරුයි"

ඒ දවස්වල වෙදමහත්තයාගේ මුහුණේ තිබුණ මලානික ස්වභාවය දන් පෙනෙන්නට නැත. ඇසිලින් නෝනා දෙතුන් විටක්ම ඔහු දෙස බැලුවේ මුහුණේ ඇඳී තිබෙන සෝබමාන හැඩරුව දැකගන්නටය.

x x x x

WWW.SINHALAELIBRARY.COM 75
Uploaded By Paba

## 13

පැයක් හමාරක් අඳුන දෙස බලා සිටි වෙදමහත්තයා මල් මූලත් පුටුවේ තිබුණ පහන ද නිවා දමා කාමරයෙන් පිටව කුස්සියට ගියේය. ඇසිලින් නෝනා ඔහුගේ මුහුණ දෙස විමසිල්ලෙන් බැලුවාය.

"අංජනං දේවි වැඩියෙම නෑ..."

"ඔය ඉක්මනට ඕව වෙනවයැ... අලුත් අංජනමක්නෙ"

ඇසිලින් නෝනා කතා කරන්නේ අංජනම් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇත්තියක පරිද්දෙනි. ඇට අවශ්‍ය වූයේ වෙදමහත්තයාගේ සිත තවා නොවැටී තබාගන්නටය.

"දැන් කෙම්මුර දවස් දෙකක්ම බැලුවනෙ... මං හිතාගෙන ඉන්නෙ සිරිදාසට එන්ඩ කියන්ඩ... සමහර අයට අංජනං දේවි වැඩියත් පේන්නෙ නැතිලු... සමහර වීට මං යක්කුන්ගෙ පෙරේතයින්ගෙ වැඩ කරන හින්ද වඩින්නෙ නැතුව ඉන්නවත් ඇති"

"එහෙමනං ඉතිං සිරිදාසට එන්ඩ කියලවත් බලන එක හොඳා"

සිරිදාස ගැන එතරම් මනාපයක් නැතත් වෙදමහත්තයාගේ සිතට සැනසිල්ලක් ලැබෙන පිළිතුරක් දෙන්නට ඇසිලින් නෝනා වගබලා ගත්තාය.

සිරිදාසට එන්නැයි කියන කතාව කුසුමලතාගෙන් වහං කරන්නට ඇසිලින් නෝනාට අවශ්‍ය වූයේ නැත. එහෙත් ඒ ආරංචිය කණ වැකුණු මොහොතේ කුසුමලතා කතා කළේ වියරු වැටුණකු මෙනි.

"අම්මලව මොළේ කියල කඳුළක්වත් නැද්ද... මොන එහෙකටද එක එක මූනයා ගෙවල් අස්සෙ දාගන්ඩ යන්නෙ..."



කුසුමලතා ඉදිරියේ නිහඬව සිටිනවා හැරෙන්නට ඇසිලින් නෝනාට කළ හැකි අන් යමක් තිබුණේ නැත. එය නිහඬව සිටීමකට වඩා අසරණවීමක් නොවේදැයි පසුව ඇට සිතිණි.

"මං දන්නෙ නෑ... ඒව තාත්තගෙ වැඩ... උඹල තාත්තට ඇහෙන්ඩ මොකවත් කියන්ඩ යන්ඩ එපා... ඒ මනුස්සයගෙ හිතේ තියෙන අමාරුව මමයි දන්නෙ"

"අනේ මං දන්නෙ නෑ අම්මෙ... අපිත් මේ ගෙදර තිව්හැනහිල්ලෙ ඉන්ඩ එපායැ... උඹේ ඉඳල වැඩකරල ගෙදර ඇවිත් සැනසිමක් නෑ... තාත්තා ගැන හිතන්ඩ එපා කියල මං කියන්නෙ නෑ... අපි ගැනත් හිතන්ඩ එපායැ..."

කුසුමලතා කටහඬ බාලකොට කීවාය. තමාගේ ප්‍රශ්න ඉදිරියේ ඇසිලින් නෝනා අසරණවූ බැව් ඇට නොදැනුණා නොවේ.

"මල්ලිත් මේ අංජනං වැඩෙට කැමැති නෑ... තාත්තගෙ හිත නරක් වෙයි කියල මොකුත් කියන්ඩ බැරුව ඉන්නෙ"

"මෙක තමයි තාත්තගේ ජීවිතේ... උඹල ඒකට බාධ කරන්ට යන්ඩ එපා... ඔය මනුස්සයා දවසක් දෙකක් ඇවිල්ල නවතිවි"

"බැරි වෙලාවත් ඔය කියන විදියට අංජනං දේවි ආවොත්... සිරිදාස හැම සෙනසුරාදා බදාදාම මෙහෙ රිංගයිනෙ... ඊට පස්සේ මිනිස්සුත් එයි අංජනං බලන්ඩ... අපිත් පාරෙ බැහැල යන්ඩ එපායැ... මට අංජනං දේවි කියල නොකිව්වොත් තමයි පුදුම"

තරමක තද ස්වරයකින් ඇසිලින් නෝනාට දොස් පැවරූ කුසුමලතා කාමරයට ගොස් මුණින් තලාවී ඇඳේ වැතිරුණාය. වටොර දක්වා ඉස්සී ගිය ගවුම සකස් කරගන්නටවත් ඇට අවශ්‍ය වූයේ නැත.

"සිරිදාස මේ සෙනසුරාදා එනව කිව්ව... ඊට මොනව හරි කන්ඩත් දෙන්ඩ වෙයි"

හැන්දෑවේ සිදුවූ කතාබහ කිසිවක් නොදන්නා වෙදමහත්තයා රාත්තිරියේ ඇසිලින් නෝනාට පැවසුවේ "මේවා කරදරයක් කොට නොසලකන්නැයි" යි ඉල්ලීමක් කරන්නාක් මෙන් ස්වරය බොහෝ පහත් කරමිනි. ඇසිලින් නෝනා ඒ කතාවද දරාගෙන නිහඬ වූවා විනා කුසුමලතාගේ කතා ගැන ඉඟිකරන්ඩවත් උත්සාහ ගත්තේ නැත.

SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com



Uploaded By Paba

සෙනසුරාදා සිරිදාස පැමිණියේ බිං කළුවර වැටුණාටත් පසුවය. වෙදමහත්තයා ඔහු එනතුරු ඉස්තෝප්පුවට වී සෑහෙන වේලාවක් බලා සිටියේය.

"පරක්කු වෙනකොට මං හිතුව සිරිදාසට අමතක වුණා වත්ද කියල"

වෙදමහත්තයා පුටුවෙන් නැගිටිමින් ඉස්තෝප්පුවට ගොඩවෙන සිරිදාස වෙතට ගියේය.

වෙදමහත්තයාට සිරිදාසව පෙනුණේ තමාව බේරාගන්නට පැමිණි ගැලවුම්කාරයකු ලෙසිනි.

"මං මල් බුලත් පුටුව තං හැදුව"

"මෙතන ඇති හොඳ හඳුන්කූරු වගයක්... ජාඇල දෙමළ කඩේකින් ගත්තෙ... ඉන්දියාවෙන් ගෙන්නපුව... පත්තු කළාම මුළු ගෙදරම සුවඳයි"

සිරිදාස හඳුන්කූරු පැකට් එකත් කපුරුපෙති පැකට් තුන හතරත් වෙදමහත්තයා අත තැබුවේය. වෙදමහත්තයා ඒවා පිළිගත්තේ වෙනදාට වඩා සැලකිල්ලක් පෙන්නමිනි. සිරිදාසගේ කටහඬ ඇසෙත්ම ඇසිලින් තෝනා කුස්සියේ සිට ඉස්තෝප්පුවට පැමිණියාය. කුසුමලතා ඇ පසුපසින්ම පැමිණ කාමරයට රිංගා ගත්තාය.

"වෙදමහත්තයා බලාගෙන හිටියෙ හුඟක් වෙලාවක ඉඳල... පරක්කුවෙන කොට අපි හිතුව නේන්ඩවත්ද කියල..."

ඇසිලින් තෝනාද සිරිදාසට කතා කළේ වෙනදාට වඩා හිතවත් බවක් පෙන්වමිනි.

"මේ දවස්වල ජාඇල පැත්තෙ ගෙදරක වැඩ... තට්ටු දෙකේ ගෙයක්... ගෙයක් නෙමෙයි මාළිගාවක්. ලබන පළවෙනිදට ඉස්සෙල්ල වැඩ ඉවර කරන්ඩත් ඕනෑ... ඒකයි නිවාඩුවක්වත් ගන්ඩ බැරි... ලොකු බාසුන්නැහේට කියල අද පැයක් කලින් ආවෙ... දන්නැද්ද බාසුන්නැහේ කැමැති නෑ මං එනවට... හැබැයි ඉතිං එන්ඩ එපා කිව්වත් මං එනව... මේ වැඩේ බොහොම වැදගත් කියල මං දන්නවනෙ..."

"ඇසිලින් තෝනෙ එහෙම නං කෝපි එකක් වක්කරමු... සිරිදාසටත් එක්කම ඇට උයනවනෙ..."



"අනේ බෑ වෙදමහත්තය... කීයට හරි මං ගෙදර ගිහිල්ල කන්ඩ ඕනෑ... මං එනකල් අම්ම බලාගෙන ඉන්නව... කෝපි එකත් බිපුවාම හොඳටම ඇති...."

ඉස්තෝප්පුවේ සිදුවන කතාබහ, කාමරයේ සිටි කුසුමලතා අසාගෙන සිටියේ පුපුරු ගසමිනි. කෙසේ වුවද ඒ කැමට නොසිටින බව සිරිදාසගේ මුවින් පිටවීමත් සමඟම එක්තරා සැහැල්ලුවක් ඇ තුළ ඇති වීය. ලාම්පුවත් නිවා දමූ ඇ ඇඳ මත වැතිරුණාය.

ආගිය වගතුග කතා කොට කෝපි කෝප්පයද බී අවසන් කළ සිරිදාස, වෙදමහත්තයා සමඟ ඔවුන්ගේ කාමරයේ තබා තිබුණ මල් බුලත් පුටුව ඉදිරිපිට වූ පුටුවෙහි ඉඳගත්තේය. අඳුන සහිත පිරිසියද කැවිලි දෙක තුනක්ද මල් හත අටක්ද, මල් බුලත් පුටුවෙහි විය. වෙදමහත්තයා පොල් තෙල් පහන දල්වූ අතර සිරිදාස පහන් සිලෙන් හඳුන්කූරු දෙක තුනක් දල්වා මල් බුලත් පුටුවෙහි රැඳවිය. මුළු කාමරයම අපූරු සුවඳකින් පිරී ගියේය. ඒ සුවඳ වෙදමහත්තයාගේ කාමරයේ සිට කුසුමලතාගේ කාමරයටද පාවී යතැයි සිරිදාසට සිතිණි.

පන්සිල් ගෙන අඳුනට නෙත් යොමු කළ සිරිදාස මිනිත්තු කිහිපයක් එදෙස බලා සිටියේය. පොල් තෙල් පහනින් සිල සැලෙන අපූරු අඳුන තුළින් අපූරුවට පෙනුණේය.

"සිරිදාසට පානෙ දුල්ල පේනවනෙ... ඒක දිහා ඔහොම බලාගෙන ඉන්නකොට දුල්ල අඩුවෙලා ගිහින් නැතිවෙනව... එතකොට වෙන ආලෝකයක් පේන්ඩ පටන් ගන්නව... ඒ තමයි අංජනම් දේවි වඩින සංඥාව... එතකොට ගිහින් ආරාධනා කරන්ඩ ඕනෑ... අංජනම් දේවිට වඩින්ඩ කියල... අංජනම් දේවි අඳුනට වඩින කොට ඒ පස්සෙන් හනුමන්තත් එනව... දෙන්න ඇවිත් බලාගෙන ඉඳීවි. ඊට පස්සේ සිරිදාස හිතන දේ පෙන්නන්ඩ පටන් ගනීවි"

වෙදමහත්තයා සිරිදාසගේ කණට කිට්ටු වී හෙමිහිට උපදෙස් දෙන්නට පටන් ගත්තේය. සිරිදාස ඇසිපිය නොහෙලා සෑහෙන වේලාවක් බලා සිටියේය. එහෙත් පහන් සිල වැනෙනවා විනා වෙනත් යමක් පෙනෙන්නේ නැත.

"සිරිදාස හෙමිහිට බලන්ඩකෝ"

සිරිදාස කාමරයේ සිටියදී වෙදමහත්තයා කුස්සිය පැත්තට ගියේය.

WWW.SINHALAELIBRARY.COM 77
Uploaded By Paba

"මොකද? ජේනවලුද?"

ඇසිලින් නෝනා ඇසුවේ රහසින් මෙනි.

"එහෙම එක පාරට ජේන්නෙ නෑ... ටිකක් ඉවසිල්ලෙන් බලාගෙන ඉන්ඩ ඕනෑ. අංජනං දේවි වඩම්ම ගන්නව කියන එක ලේසිපාසු වැඩක් නෙමෙයි. වාසනාවකුත් තියෙන්ඩ ඕනෑ..."

වෙනදා කුස්සියෙන් ඇසෙන සද්ද බද්ද ද අඩු වී ඇත. වෙදමහත්තයාත් ඇසිලින් නෝනාත් කතා කළේ ඇසෙන නෑසෙන ගානටය. කුසුමලතා කාමරයෙන් පිටතට ආවේ නැත. ගුණසෝම බිංකුවර වැටෙන්ටත් පෙර ගිය ගමන් නාමත් නැත.

සිරිදාසගේ දෑස් රිදෙන්නට පටන්ගත්තේය. පහන් සිල විනා අන් කිසිදු දෙයක් නැත. හඳුන් කූරුවල සුවඳ කාමරය පුරාම පැතිර ඇත. ඔහු අඳුනෙන් නෙත් ඉවතට ගෙන හොරහින් කාමරය දෙස බැලුවේය. ඇසිලින් නෝනාගේ චිත්ත හැට්ට සහ වෙදමහත්තයාගේ සරම් බැනියම් හැර වෙන ඇඳුමක් පැළඳුමක් නැත. කුසුමලතාගේ ඇඳුම් ඇත්තේ ඇගේ කාමරයේ විය යුතුය.

බොහෝ වෙලාවකට පසු වෙදමහත්තයා යළිත් කාමරයට ඇතුළු විය.

"සිරිදාස මොකක් හරි වෙනසක් දැක්කද?"

"එක පාරක් පහන් සිල අඩුවෙගෙන ගියා. හැබැයි ආයමෙත් ජේන්ඩ පටන්ගත්ත"

"සමහරවිට අංජනම් දේවි බැල්මක් හෙලන්ඩ ඇති"

වෙදමහත්තයා එසේ කියමින් ඇඳේ ඉඳගෙන ඇඳ විට්ටමේ හිස තබාගත්තේය. කාමරයෙන් ඇසුණේ සිරිදාසත් වෙදමහත්තයාත් තරගයට මෙන් හුස්ම ගන්නා ශබ්දය පමණි. මේ නිහඬතාවේ බර දෙදෙනාටම හොඳින් දැනුණි.

"සිරිදාසට දැන් එක තැන ඉඳල මහන්සිත් ඇතිනෙ... අපි තව දවසක උත්සාහ කරල බලමු"

විනාඩි අටක් දහයක් නිහඬව ඇල වී සිටි වෙදමහත්තයා ඇඳ විට්ටමෙන් හිස ඔසවමින් කීවේය. සිරිදාසද දිගු සුසුමක් හෙළමින් පුටුවෙන් නැඟී සිටියේය.



"අංජනම් දේවි ගෙන්න ගන්නව කියන එක අපි හිතන තරම් ලේසි නෑ..."

වෙදමහත්තයා පොල් තෙල් පහන නිවා දමමින් කීවේ සිරිදාසගේ සිත සැහැල්ලු කිරීමටය. සිරිදාස කාමරයෙන් පිටව ඉස්තෝප්පුවට ආවේය. මෙතෙක් වෙලාවක් සද්දයක් බද්දයක් නොමැතිව ලුණු ඇඹේ වැතිර සිටි ගුණසෝම ඉන් නැඟිට පිළිකන්න පැත්තෙන් කුස්සියට ගියේය. වෙදමහත්තයා සිරිදාස පසුපසින්ම වාගේ ඉස්තෝප්පුවට පැමිණියේය. එහෙත් සිරිදාස සමඟ දිගින් දිගට කතා කරන්නට තරම් සිතේ එකලාසයක් නොතිබිණි.

"එහෙම නං මං ගිහින් එන්නං වෙදමහත්තය"

"මම අඳුන තව ටිකක් ජීවම් කරල සිරිදාසට කතා කරන්නං..."

සිරිදාස මිදුල හරහා පාර දෙසට විදුලි පන්දම් එළිය එල්ල කෙළේය. ඉන්පසු ඔහු මිදුලට බැස නොපෙනී ගියේය. වෙදමහත්තයා ලුණු ඇඳෙහි වැතිර දෙනෙත් පියාගත්තේය.

"මොන දෙයක් වෙලාද මන්දන්නෙ නෑ... රෑ දෙගොඩහරි ජාමෙ වෙන කල් මිනිස්සු කාමර ඇතුළෙ දාගෙන... පද හැදෙන්නෙ මට. තව ටික දවසක් යනකොට පාරෙ බැහැල යන්ඩ බැරි වෙයි. කොටින්ම ඔය මනුස්සය එනවට මං කැමැති නෑ..."

සිරිදාස ගිය පසු කුස්සියට පැමිණි කුසුමලතා වටපිට බලා වෙදමහත්තයාද නොමැති බව දැන ඉස්තෝප්පුවට නෑසෙන සේ ඇසිලින් නෝනාට දොස් පවරන්නට පටන් ගත්තාය. ඇසිලින් නෝනා වචනයක් පිට කරනවා තබා ඇ දෙස බැලුවේවත් නැත. කෙසේ වුවද වෙදමහත්තයා සමඟ මේ කාරණාව ගැන කතා කළ යුතු යැයි ඇසිලින් නෝනා ඉටාගත්තේ එහි බරපතලකම ඇවද වැටහී ගිය බැවිනි.

වෙදමහත්තයා යළිත් වරක් රෑට රෑට අඳුන ජීවම් කරන්නට පටන් ගත්තේය. එහෙත් එතරම් බලාපොරොත්තු සහගත බවක් ඔහුගේ වචනවල මෙන්ම ඉරියව්වල පෙනෙන්නට තිබුණේ නැත.

"සමහර වෙලාවට හරි යන්ඩත් පුළුවන්"

"මේ වැඩේට සිරිදාස ගෙන්නන එක ගැන කුසුමලතයි ගුණසෝමයි දෙන්නම කැමති නෑ... පිට පිරිමියෙක් රාත්තිරියෙ

WWW.SINHALAELIBRARY.COM 78

Uploaded By Paba

කාමරේක ඉන්න එකට නම් කුසුමලතා කොහෙත්ම කැමති නෑ... මොකක් හරි පදයක් හැදුනොත් එහෙම..."

"එක එකා පද හදනවට බයේ නං ජීවත් වෙන්ඩ බෑ"

"අපි ඔහොම කිව්වට කෙල්ලො කැමති නෑ පද හැදෙනවට"

ඇසිලින් නෝනාගේ කතාව ඒ මොහොතේ එතරම් බරපතල ලෙස නොදුනුණු නමුත් සිරිදාසගේ පැමිණීම නිසා කතාන්දරයක් හැදෙන්නට ඉඩ තිබෙන බවක් වෙදමහත්තයාටද දැනෙන්නට පටන් ගත්තේය. එහෙත් ඔහු අඳුන ජීවම් කිරීම නැවැත්වූයේ නැත.

"මට වෙලාවකට හිතෙනව මං මේක පටන් ගත්තෙ වැරදි චේතනාවකින් කියල. අංජනම් දේවි වඩින්නෙ නැත්තෙත් ඒ නිසා වෙන්ඩ ඇති"

ඉස්තෝප්පුවට වී පැදුරක් වියමින් සිටි ඇසිලින් නෝනා අසලට පැමිණි වෙදමහත්තයා එසේ කියමින් ඇඳෙහි ඇලවුණේය. ඇසිලින් නෝනා පැදුර වියීම මොහොතකට නවත්වා වෙදමහත්තයා දෙස බැලුවේ තමක් හෝ වැදගත් දෙයක් කියන්නට ඔහුට වුවමනා වී ඇති බවක් ඇට දුනුණු බැවිනි.

"එක දවසක් ඇසිලින් නෝනා කියාපු දේ ඇත්ත කියල මට දැන් හිතෙනව"

වෙදමහත්තයාගේ කතාවෙන් ඇසිලින් නෝනා අන්දුන් කුන්දුන් වූවාය.

"මට මතකක් නෑ මොකක්ද කියල"

"මේ වගෙ වැඩ කරද්දි තත්තාසයක් හිතන්ඩ හොඳ නෑ කියල කියාපු කතාව... පොඩි තත්තාසයකුත් එක්ක තමයි අංජනම ගැන වැඩේට මගෙ හිත ගියේ. මට හිතෙන්නෙ එතන තමයි වැරද්ද... මේ වගේ වැඩ මිනිස්සුන්ගෙ යහපතට කරන දේවල් මිසක තමන්ට යමක් හරිහම්බ කරගන්ඩ කරන දේවල් නෙමෙයි. දෙවියො වඩින්නෙ යහපත් සිතුවිලි තියෙන තැනට විතරයි"

වෙදමහත්තයා ඇඳවිට්ටමට හිස තබාගෙන පසුව අනාගාමින්ද විටින් විට වටපිට බලමින්ද කීවේය.

"නෑ ඉතිං වෙදමහත්තයා ඒ තරං දෙයක් කිව්වෙ නෑනෙ..."



"කියන්ඩම ඕනෑ නෑ ඇසිලින් නෝනෙ මගේ හිතේ එහෙම දෙයක් තිබුණ... අංජනං බැලිල්ල හරිගියොත් මගේ වුණත් එකක් එක විදියකට හදාගන්ඩ පුළුවන් වෙයි කියල මගේ හිතේ පැත්තක තිබුණා... කුසුමලතාත් දැන් දිග දෙන වයසනෙ... ඒක හින්දයි මට එහෙම හිතුනෙ... ඒ වුණාට අංජනමක් බලන්ඩ එන්නෙ අමාරුවෙ වැටිච්ච කෙනෙක්නෙ... එහෙම අමාරුවෙ වැටුණු කෙනෙකුගෙන් සල්ලි බලාපොරොත්තුවෙලා යමක් කරන එක බොහොම වැරදියි. ඔය පාප චේතනා මට කොහෙන් ආවද කියල මටම හිතාගන්ඩ බෑ... පාප චේතනා කියන්නෙ කිළුටු... කිළුටු තැනකට දේවතාවො වඩින්නෙ නෑ... මම ඒක නොදන්නවා නෙමෙයි. මට දැන් හිත එකලාසයක් කරගන්ඩ බෑ..."

"තමන්ගෙ දරුවො වෙනුවෙන් යමක් කරන්ඩ හිතාගෙන ඉන්න එක පාප චේතනාවක් නෙමෙයිනෙ"

"ඇසිලින් නෝනෙ ඒක වෙනම කතාවක්. නමුත් මේ වගෙ දෙයක් කරන්ඩ ඕනෑ අසරණ වෙලා යම් කෙනෙක් ඉන්නව නං අන්න ඒ මනුස්සයගෙ යහපතට. ඒ යහපත ගැන මිසක වෙන වෙන දේවල් හිතේ තියෙන්ඩ බෑ..."

වෙදමහත්තයා එසේ කීවේ දිගු සුසුමක්ද හෙළමිනි.

"කවදාවත් ආවෙ නැති පාප චේතනාවක් කොහෙන් ආවද මන්ද?" යි පවසන විට මුළු ආත්මයම කඩා වැටුණු කලෙක මෙන් ඔහුගේ මුහුණ මැලවී ගිය අයුරු ඇසිලින් නෝනා දුටුවාය. යළිත් පැදුර පුරන්නට උත්සාහ ගත් නමුත් ඇගේ අතැඟිලි පැටලෙන්නට විය.

"මට හිතෙන්නෙ ඇසිලින් නෝනගෙ හිත මගේ හිතට වඩා පවිත්තරයි. දැන් නං මගේ හිතේත් පාප චේතනා මොකුත් නෑ... ඒත් දැන් මං මේ අඳුන ජීවම් කරන්නෙ ඇසිලින් නෝනා ගැන හිතාගෙන... මට හිතෙනව මේ අඳුනට අංජනම් දේවිය වඩම්මන්ඩ පුළුවන් ඇසිලින් නෝනට විතරයි"

"මං දන්නෙ නෑ ඔව"

"මට හිතෙන විදියට සිරිදාසගෙ වුණත් හිත එකලාසයක් වුණේ නැහැ. එකලාසයක් නැති හිතකට අංජනම් දේවි වඩම්මන්ඩ බෑ... මට දැනුණු විධියට මිනිහත් ඔහේ බලාගෙන හිටිය විතරයි"

WWW.SINHALAELIBRARY.COM 79
Uploaded By Paba

මෙතෙක් කාලයක් සිතේ තිබුණු මහා බරක් බිම තබන්නට පුළුවම වෙලාව පැමිණ ඇතැයි ඇසිලින් නෝනාට සිතිණි. කිසියම් චකිතයකින් ඇගේ සිත කම්පනය වෙමින් තිබිණි.

"මං මේක වෙදමහත්තයට කියන්ඩ කියල කීපදවසක්ම හිතුව, ඒත් මොකත් හරි හේතුවක් හින්ද කියා ගන්ඩ බැරුව ගියා"

ඇසිලින් නෝනා කතාව පටන් ගත්තේ වචන පටලවමිනි. වෙදමහත්තයා ඇ දෙස බලාසිටියේ තියුණු වූ දෑසකිනි.

"සිරිදාස දවසත් කුසුමලතාගෙ කන්තෝරුවට ගිහින් තියෙනව"

ඒ ප්‍රකාශයත් සමගම වෙදමහත්තයාගේ මුහුණ සම්පූර්ණයෙන්ම වෙනස් විය. එය ඔහු කිසිදා බලාපොරොත්තු නොවූ ආරංචියකි.

"මොකට ඒ ළමය ඉන්න තැනට ගියාද?"

"ගම්පහ ආපු ගමන් නිකං ආව කියල තමයි කියල තියෙන්නෙ... කුසුමලතාටත් කරන්ඩ දෙයක් නැතුව හිනාවෙලා කතා කෙරුවලු... මොනව වුණත් වැඩ කරන තැනට යන්ඩ වටින්නෙ නැතෙ... දැන් දවස් දෙක තුනක් වෙනව. කුසුමලතා මා එක්කවත් කතා කරන්නෙ නෑ..."

"නෑ... ඒක කොහොමටවත් වටින වැඩක් නෙමෙයි. අනික් මනස්සුරු වුණත් එක එක දේවල් හිතන්ඩ පුළුවන්නෙ..."

"කොටින්ම සිරිදාසට කුසුමලතා කැමති නෑ... සිරිදාසත් ඒක හොඳටම දන්නව"

"මට මීනැතං ඕක සිරිදාසගෙන් අහන්ඩත් පුළුවන්"

ඈඳ විට්ටමේ හිස එසවූ වෙදමහත්තයා ඇඳ මත ඉඳ ගනිමින් සීරුවේ ඇසිලින් නෝනා දෙස කෙළින්ම බලමිනි.

"වෙදමහත්තය ඕව අහන්ට යන්ඩ එපා. කන්තෝරුවට ගියා මිසක අවුගානෙ නොගැළපෙන වචනයකවත් කියලා නෑ..."

"සිරිදාස තරහ කෙනෙක් කියල මම හිතන්නෙ නෑ... මොකද මටත් මිනිස්සුන්ව තේරුම්ගන්ඩ බැරිකමක් නැතෙ... ඒ වුණත් කෙල්ලගෙ කන්තෝරුවට ගිය එක වැරදියි"

"දැනට සද්ද නැතුව ඉන්න එක තමයි හොඳ... හැබැයි අංජනං බලන්ඩ එන එක නං නවතන්ඩ වෙනව"



"ඒක නං මට හෙමිහිට නවත්තන්ඩ පුළුවන්... හැබැයි ඉතිං ගෙදර එන්ඩ එපා කියල නං කියන්ඩ බෑ... ඒක මගෙ හිතටත් විරුද්ධයි"

ඒ කතාබහ එසේ අවසන් වුවද වෙදමහත්තයාගේ සිතේ ඇතිවූ කලබලය අවසන් වූයේ නැත. ඔහු ලඟු ඇඳෙන් බැස පිළිකන්නේ ඇලේ වනා තිබුණු තුවායද කරට දමා ගනිමින් හන්දිය පැත්තට ගියේ ඒ කලබල ගතියෙන් මිදෙන්නටය. සිරිදාසගේ යම් යම් ඉරියව් සිහිපත් කරමින් ඔහු තුළ කුසුමලතා පිළිබඳ ඇල්මක් තිබුණේ දැයි විමසා බලන්නට ඔහු මාවත් මුදලාලිගේ කඩයට ආසන්න වනතෙක්ම උත්සාහ කළේය.

× × × ×

UNLIMITED The spirit of Sri Lankan e-com
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 80
Uploaded By Paba

## 14

"මහරගම ට්‍රේනිං කොලීජියට තේරිලාලු"

කුසුමලතා සන්නෝරුවෙන් පැමිණ ඇඳුම් මාරු කරන්නට වත් පමා නොවී වත්ත පැළට ගොස් එහි පොල්අතු කපමින් සිටි ඇසිලින් නෝනා සමග කීවාය. ඇසිලින් නෝනා කපමින් සිටි පොල් අත්ත එතැනම අතහැරියාය. ඉන්පසු කුසුමලතා ළඟට පැමිණියාය.

"උඹ කොහොමද දන්නෙ?"

"මට සන්නෝරුවට වැලිපෝන් කරල කිව්ව."

ඇසිලින් නෝනා පොල් අතු කැබිල්ල පැත්තකට දමා කුසුමලතා සමග තුන්පිය පැත්තෙන්ම ගෙට පැමිණියාය.

"ජිනසෝම ඒවට යන්ඩ හදපු බවක්වත් අපි දන්නෙ නෑ— එතකොට දොස්තර විභාගෙ?"

"මල්ලී මට කියල තියෙනව කොහොමහරි රජසාවක් හොයා ගන්නව කියල. ඒ. එල්. සී. පාස්වුණත් වැඩිදුර උගන්නන්ට අම්මලට හොඳේද සල්ලි කියල හම්බ ලොකු මල්ලි නැම සිස්සෙම කිව්වෙ... මල්ලී මහරගම විද්‍යා අංශෙටලු තේරිලා තියෙන්නෙ— මට අහිද්දී එහෙම කියල කිව්ව"

"ජිනසෝමට කාරණා තේරෙනවනෙ... එයාට හොඳ දෙයක් එපා කරයිද? අපි ඒව ගැන දන්නවයැ..."

"සත්තකටම මොකක්වත්ම ආදායමක් නැති එකේ අම්මට විතරක් ඒ බර අදින්ඩ බෑ කියල තමයි ලොකු මල්ලි නැමසිස්සෙම එහෙ කිව්වෙ"



"ට්‍රේනිං ගුරුවරයෙක් අපේ පරම්පරාවෙන්ම ඉඳල නැ නෙව්"

මේ ආරංචිය වෙදමහත්තයාගේ කණේ තබන තුරු ඇසිලින් නෝනාට ඉවසුමක් නැත. වෙදමහත්තයා පැමිණියේ සවස් වැලුණාවත් පසුවය.

"රුපියල් අසියට අත්තිමයිලු... තාලෙට ඉඳල ඉඳිදිනවට වඩා මැරෙන එක හොඳයි එක ... මට අම්මයි දුක් විඳිනව... ගෙදර මිනිස්සුත් දුක් විඳිනව... ගැහැනුනට පස්සෙ නොවැදගත්ද අම්මයි... මාවත් ඉඳලා කිව්වෙ ය වෙලා සිහිල්ල එළිද කියල... පුරවන් නැ සමග වැවවලට උඩ වෙච්ච මිනිහ නෙව..."

වෙදමහත්තයා ගෙට ආ ආරංචිය ඇසිලින් නෝනාට එතරම් දෙයක් නොවූ අයුරකි. ඇගෙන් ප්‍රශ්නයක් නොමැතිව වෙදමහත්තයාට පුදුමයකි. වෙනදා නම් මෙවැනි ආරංචියක් රැගෙන ආ විට ඇසිලින් නෝනා එයට තව තවත් කරුණු කාරණා එක්කරන්නීය. "ඒක හොඳයි... සිහි... පරිප්පු විකන්වත් දරා සියත තමයි හොඳ" යනුවෙන් කීවේ නැත. වෙදමහත්තයා සියලු සිහිවිලි එක තැනක ගැටගසා ඇසිලින් නෝනාගේ මුහුණ දෙස කෙළින්ම බැලුවේය.

"ජිනසෝම මහරගම ට්‍රේනිං කොලීජියට තේරිලාලු.. කුසුමලතාට වැලිපෝන් කරල කිව්වලු"

ඒ ආරංචියෙන් වෙදමහත්තයාද ගල්ගැසී සිටියේය. පළමුව පුදුමයට පත්වූ වෙදමහත්තයාගේ දෑස ලොකු වී මිය නමුත් සන්තෝෂ සිනාවක් ඇතුළත ඒවා සතුටින් පිරෙන බව ඇසිලින් නෝනාට ද දැනුණේය.

"මහරගමට තේරුණා කියන්නෙ මහා ලොකු දෙයක්.. එතකොට දොස්තර විභාගෙට ඉගෙන ගන්න එක අත් අරිනව..?"

"ජිනසෝම කියල තියෙන්නෙ මට විභාග පාස් වුණත් වියදම් කරන්ඩ අපට පුළුවන්ද කියල--"

"ඒකත් එක අතකට ඇත්ත.. මටත් කියල නම් සතේක ආදායමක් නැනෙ.. එදා අර පේදොතාමීගෙ කොල්ලට තුලක් බදින්ට තියනෙ.. ඉවරවෙලා රුපියල් දෙකක් මට දෙන්ඩ හැදුව.. උන් සත ගොන දිලා දක්කම මට පුළුවන්ද එක අරගෙන එන්න.. මං එකත් දීල

SL UNLIMITED

WWW.SINHALAELIBRARY.COM 81

Uploaded By Paba

ආවා... ඔය ඉතිං මාස ගණනකට පස්සේ ආපු වැඩේනේ... ඉතිං ඔහොම කොහොමද අපිත් දරුවන්ට උගන්නන්නෙ.

ඒ කාරණා ටික පිට කළ වෙදමහත්තයා මොහොතකට නිහඬ විය.

"එක අතකට ජිනසෝම ගත්තු තීන්දුව හරි... අනිත් එක කුසුමලතාගෙත් කලවයස හරියාගෙන එනව. අපි ඒකටත් ලෑස්ති වෙන්ට එපායැ"

වෙදමහත්තයාගේ ඒ ප්‍රකාශය ගැන ඇසිලින් නෝනා පුදුමයට පත් වූවාය. පවුලේ දේවල් ගැන වැඩිපුර කතා නොකරන වෙදමහත්තයා කුසුමලතාගේ කටයුතු ගැන මේ තරම් දුරදිගට කල්පනා කර තිබීම ඇසිලින් නෝනා තුළ පුදුමයක් මෙන්ම ලොකු සතුටක්ද ඇති කළේය.

"ජිනසෝම ආවට ගියාට දෙයක් කරන කෙනෙක් නෙමෙයිනෙ... තමන් ගැනත් හොඳට හිතල බලල යමක් කරන කෙනෙක්නෙ... සමහර වෙලාවට ගුරුකම කරන අතරේ විභාග ගන්ඩත් හිතේ ඇති..."

වෙදමහත්තයා යළිත් කීවේය. පැරණි මොනිටර් ගුරුවරයකු වූ වෙදමහත්තයා සමග ගුරු රස්සාව ගැන කතා කරන්නට තරම් දැනුමක් තේරුමක් තමන්ට නොමැති බව ඇසිලින් නෝනා දනී. ඇට කල්පනා වෙන්නේ ජිනසෝම මහරගම ගුරු විද්‍යාලට තේරී ඇති බව පමණි.

"සුමසිංහ නොතාරිස්ගෙ පුතා ඇරෙන්ට මේ ගම් පළාතෙ මහරගම ට්‍රේනිං ගුරුවරයෙක් නෑ මගේ හිතේ... එයත් ඉංග්‍රීසි නෙ... විද්‍යා ගුරුවරයෙක් මේ පැත්තෙ ඇත්තෙම නෑ මගේ හිතේ..."

"ඔව ඉතිං කඩපිල්ගානෙ කියවන්ට ඕනැ නෑ ඉතිං"

ඇසිලින් නෝනා බොහෝ වේලාවකට පසු කීවේ එපමණකි. වෙදමහත්තයාට මඳ සිනාවක්ද තිබේය.

"ඇසිලින් නෝනෙ ඒව අපි කිව්වත් නැතත් හෙට අනිද්දා වෙනකොට මුළු ගමම දැනගනීවි..."

එසේ කියූ වෙදමහත්තයා කුස්සියේ පුටු කබල මත ඉඳගත්තේය.

"මට එහෙම තං මය මොනව හරි ටිකක් දීපංකො කන්ඩ... මාටින් මුදලාලි මෙලාකටත් බලාගෙන ඇති..."



"තාම ඉදිල නැතෑ... දවල් බත් තමයි තියෙන්නෙ..."

"කමක් නෑ... මිරිස් කරලක් තලල දීපං"

ජිනසෝමගේ ගුරු පත්වීම ගැන ඊටපසු වැඩි යමක් කතා නොකළ ද මුළු කුස්සිය පුරාම මහා සතුටක් ඉසිරී පැතිර ඇතැයි වෙදමහත්තයාට සිතිණි. වැඩි කතාබහක් නැතත් ඇසිලින් නෝනාගේ මුවින්නේ සතුටක් මුසු ආඩම්බර නැඟීමකිති. වෙදමහත්තයා ඇගේ ආඩම්බර මුහුණ දෙස බලා සිනාසුණේය.

රුවිතං අයියලාගේ ගෙදර යන අතරතුර බොහෝ දේවල් කතා කළද ජිනසෝම පිළිබඳ ආරංචිය කියාගන්නට අවසරයක් නොමැතිව වෙදමහත්තයා සිටියේ දැඩි නොඉවසිල්ලකිනි.

"රුවිතංගෙ කොල්ලො දෙන්නම මගේ රස්තියාදු වෙනව මිසක මහන්සිවෙලා වැඩක් පොලක් කරන්නේ නැතෙ..."

මාටින් මුදලාලිගේ කතාවලට වෙදමහත්තයා "ඡ්ම" යනුවෙන් පිළිතුරු දී කතාව දිග්ගැස්සීම නවත්වාලන්නට නිතාමතාම උත්සාහ ගත්තේය. ඒ උත්සාහය එතරම් සාර්ථක වූයේ නැත. ඒ නිසා කතාවල් අතරමැදට පැන ජිනසෝම පිළිබඳ ආරංචිය මාටින් මුදලාලිට කියන්නට වෙදමහත්තයාට සිදුවිය.

"ජිනසෝම මහරගම ට්‍රේනිං කොලිජියට පාස්වෙලානේ..."

වෙදමහත්තයාගේ මුවින් ඒ කතාව පිටවෙත්ම මාටින් මුදලාලි නැවතුණේය. වෙදමහත්තයාගේ මුහුණ දෙස එක එල්ලේම බලා සිටියේය.

"ෂාත්... කොච්චර දෙයක්ද?"

තත්පර කිහිපයකට පසු කීවේය.

"වෙදමහත්තයාගේ බර ඔක්කොම හැල්වු වෙයි"

"නෑ ඉතිං ජිනසෝම මුල ඉඳලම ඉගෙන ගන්ට දක්ෂයිනෙ"

ඉන්පසු රුවිතංලාගේ ගෙදරට ළං වෙනතුරුම වෙදමහත්තයා කතා කෙළේ ජිනසෝමගේ ගතිගුණ... දක්ෂකම්.. ගැනය.

දවසක් දෙකක් යනවිට ජිනසෝම ගැන ආරංචිය මුළු ගම පුරාම වාගේ පැතිර ගොස් ඇති බව වෙදමහත්තයා දැනගත්තේ මඟතොටදී හමුවුණ හැම දෙනෙක්ම වාගේ ඒ ගැන කළ විමසිල්ලෙනි.

WWW.SINHALAELIBRARY.COM 82
Uploaded By Paba

"වෙදමහත්තයගෙ බල්ලො ගොඩ"

සුබතේරිස් ගොයියාද මාටින්ගේ කඩයේදී පැවසූ බව ඇසිලින් නෝනාට කියා ඇත්තේ ඒ අවස්ථාවේ බඩුගන්නට කඩයට පැමිණ සිටි ප්‍රේමරත්නගේ පවුල විසිනි.

"ඇසිලින් නෝන ගාව රුපියල් දහයක් නැතුව ඇති නේද?"

වෙදමහත්තයා මුදල් ඉල්ලන්නේ කුමකටදැයි ඇසිලින් නෝනා ඔහුගේ හිනාවෙන්ම දැනගත්තාය. එහෙත් එය හොර හිනාවක් නොව කෙතරම් අහිංසක බයාදු හිනාවක්දැයි දැනුණු විට ඈ තුළ දුකක් ද ඇති විය. කිසිදු ප්‍රශ්නයක් නොඅසාම කිසිදු උපදේශයක් නොදීම ඇසිලින් නෝනා රුපියල් දහයේ කොළයක් වෙදමහත්තයාට දුන්නාය.

"වැඩිය ඒ වෙන්ඩ එපා"

වෙදමහත්තයා මිදුලට බහින විට ඒ ටික කියන්නට නම් ඇසිලින් නෝනා අමතක නොකළේය. එහෙත් එය වෙනදා පුරුද්දට මෙන් පිටවූවකි.

ගුණපාලගේ දර මඩුව තුළදී ද කතාබහට මාතෘකාව වූයේ ජිනසෝමය. වෙදමහත්තයා එනවිට එක එක දේ ගැන කතා කරමින් සිටි සුබතේරිස් ගොයියාත් විල්මොං කාරයාත් ඔහු පැමිණි පසු සියලු කතාවල් නැවැත්වූහ.

"වෙදමහත්තයගෙ පුතා ගැන අපටත් ආඩම්බරයි... අපේ එකෙක්නෙ..."

විල්මොං මාතෘකාව පටන් ගත්තේ එසේය. විල්මොං කාරයාටත් සුබතේරිස් ගොයියාටත් හැළි අරක්කු අරගෙන දීමට ගොස් ගුණපාල ළමයාට රුපියල් පහළොවක් ණය වීමට වෙදමහත්තයාට සිදුවිය. එහෙත් ඔවුන් ජිනසෝම ගැනත් තමා ගැනත් කී දේවල් ඒ රුපියල් පහළොවට වඩා කෙතරම් වටිනවාදැයි වෙදමහත්තයා ආපසු ගෙදර එන ගමනේදී ද දිගින් දිගටම සිතුවේය. කළුවර වැටුණාට පසු වෙනදා කුස්සියට වී සිටින ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට වී බලා සිටිනු වෙදමහත්තයා දුරදීම දුටුවේය.

"ටිකක් සන්තෝස හිතුණ ඇසිලින් නෝනෙ... සුබතේරිස් ගොයියත් විල්මොං කාරයත් හිටිය... උන්වත් ටිකක් බොන්ඩ අරගෙන දුන්න... උන්ටත් සතුටුයි අපේ එකා ගැන...

WWW.SINHALAELIBRARY.COM 83



කියන්නෙ එක අතකට ගමටම ආඩම්බරයක් තමයි. මාටින් මුදලාලිත් කිව්වෙ ඒකම තමයි... දොස්තරකම හොඳ තමයි... හැබැයි ගුරු රස්සාවත් ඊට දෙවෙනි නෑ... නැද්ද මං කියන්නෙ... අනිත් එක විද්‍යා ගුරුකම"

ඇසිලින් නෝනා පසුපසින් කුස්සියට ගිය වෙදමහත්තයා පුටු කබලෙහි ඉඳගෙන කියවන්නට පටන් ගත්තේය. වෙනදා ඔහුගේ කියවිල්ල කරදරයක් වූ නමුදු ජිනසෝම ගැන කියන දේවල් ඇසිලින් නෝනාගේ සිත සතුටින් පුරවාලීය.

මහරගම ට්‍රේනිං කොලීජියට යාමට පෙර ගෙදර පැමිණි ජිනසෝම සති දෙකක්ම ගත කෙළේය. ඔහු කීපවිටක්ම කුසුමලතා සමඟ ගම්පහට ගොස් අවශ්‍ය දේවල් ගත්තේය. ඇසිලින් නෝනා ගෙන් කීයක්වත් ඉල්ලුවේ නැත. ඇතැම් විට කුසුමලතාගෙන් ඉල්ලාගන්නට ඇත.

තමන්ගෙනුත් කීයක් හෝ ඉල්ලුවේ නම් කෙතරම් හොඳදැයි ඇසිලින් නෝනාටද සිතිණි. ජිනසෝම ඉල්ලුවොත් දෙන්නට රුපියල් තිහ හතළිහක් අල්මාරියේ රෙදි අතර ඈ සඟවා තිබිණි. එහෙත් ඒවා අල්මාරියේ රෙදි අතර එසේම සැඟවී තිබිණි. ඒ ජිනසෝම මුදල් ඉල්ලා නොසිටි නිසාය. ඇසිලින් නෝනාගේ සිතක කෙළවර සියුම් වේදනාවක් හටගත්තේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ පසු ජිනසෝමත් සමඟ ගම්පහ ගොස් අවශ්‍ය ද්‍රව්‍ය ගත් හැටි සිහිපත් වීම නිසාය. ඒ දවසේ උගස් තැබූ කරාබු දෙක ආපහු බේරාගත්තේ අවුරුද්දකට දෙකකට පසුවය. එහෙත් ඒවා තමා කෙළේ කෙතරම් සතුටකින්දැයි සිහිපත් වෙන විට ඇසිලින් නෝනාගේ දෙනෙත් ඉබේම කඳුළුවලින් තෙත් වන්නට විය. ඒ තැන දැන් හිමිව ඇත්තේ කුසුමලතාටය. කුසුමලතා සමඟ ගම්පහට යන ජිනසෝම අවශ්‍ය කළමණා රැගෙන එයි. කමිස, සෙරෙප්පු, මේස් බැනියම්, දන්තාලේප, බුරුසු වැනි දේ දකින විට ඇසිලින් නෝනාට ඇති වූයේ දුකක් මුසු සතුටකි. ගුණසෝම පැත්තකට වී සිටීම ගැනද ඈ තුළ අනුකම්පාවක් ඇතිවෙමින් තිබිණි. වෙදමහත්තයා දෙතුන් විටක්ම ඒ ගැන කී දේවල් ඇත්ත නොවේදැයි ඈට සිතිණි.

"ගුණසෝම වැඩිය කතාවට එන්නේත් නෑ.. හැබැයි ඉතිං ජිනසෝමටත් වටිනව ගුණසෝම එක්ක ටිකක් වැඩිපුර කතා ... ඌ කොහොමටත් වැඩි කතා නැති මිනිහනෙ..."

Uploaded By Paba

පෙර දා හවස වෙදමහත්තයා කීවේ වටපිට බලා කාටවත් නොඇසෙන පරිද්දෙන් බැවි ඇසිලින් නෝනාට හොඳින් මතකය.

"කුසුමලතා තමයි ජිනසෝමව පැත්තකට ගන්නෙ"

"මටත් එහෙම එකක් තේරුණා ඇසිලින් නෝනෙ..."

"මං කිව්ව ගුණසෝමට අයිය ට්‍රේනිං කොලීජියට පාස්වෙලා කියල. මට සෝමෙ අයිය කිව්වයි කියල ඌ කිව්ව"

"ඒක වෙන්ඩ ඇති එදා පූල්පු වැලක් උස්සගෙන ආවෙ..."

"මටත් හිතුණ..."

සාලය දෙසින් කිසියම් සද්දයක් ඇසුණ හෙයින් දෙදෙනාම නිහඬ වූහ. මුල පිටින්ම මහ විශාල මයියොක්කා අල තුන හතරක් ඔසවාගෙන පැමිණි ගුණසෝම එය කුස්සියේ මුල්ලකින් තැබුවේය.

"මං බෝල පිට්ටනිය පැත්තෙ යනව..."

"රෑ වෙන්නෙ නැතුව වරෙං..."

ඇසිලින් නෝනා කීවාය. ගුණසෝම පිටව යන විට ඇසිලින් නෝනා හෝ වෙදමහත්තයා දෙස බැලුවේ නැත.

"කුසුමලතාත් රස්සාවකට යනව... දැන් ජිනසෝමත් ගුරුවරයෙක් වෙනව.. එතකොට රස්සාවක් කියල දෙයක් නැත්තේ ගුණසෝමට විතරයි. උගේ හිතේ මොනවගේ දෙයක් තියෙනවද කියල හිතාගන්ඩ අමාරුයි..."

වෙදමහත්තයා ඒ ටික කීවේ ගුණසෝම ගෙයින් පිටව නෑසෙන සීමාවකට යන්නට ඇතැයි සිතුණ පසුවය.

"මහොම හිටියට ගුණසෝම හිතින් හරිම ලාමකයි. කුසුමලතා ජිනසෝමට අඹුකුවෙන් කලකන එක හරි නරකයි. ඔය ජිනසෝමට ඇඳුම් ගේනකොට උටත් සරමක් බැනියමක් ගෙනල්ල දුන්න නම් කොච්චර දෙයක්ද... ඒ වගෙ දේවල් ගැන කිසිම සැලකිල්ලක් නෑ... අපේ එකෙක් ගාවවත් නැති ගතිගුණ තියෙන්නෙ..."

"ඒව ගැන අපි ඕනැවට වඩා හිතන්ඩ ඕනැත් නෑ... ගුණසෝමට දුකෙන්ට අරින්ඩ ඕනැත් නෑ..."

"උට ඕව දැනෙනව...සද්ද නැතුව හිටියට..."



ඇසිලින් නෝනා එසේ කියමින් නැගී සිටියාය.

"මේ දෙන්න ගම්පහ ගිහින් කීයට එයිද දන්නෙ නෑ... වෙදමහත්තය මාටින්ගෙ කඩේට ගිහින් සාඩින් ටින් එකක්වත් ගෙනාවොත් හොඳා..."

ඈ වෙදමහත්තයාට කියා සාලය පැත්තට ගියාය.

"මගෙ අතේ නං කඹයක් නෑ..."

ඊට පිළිතුරු නොදුන් ඇසිලින් නෝනා කාමරයට ගොස් රුපියල් දහයේ නෝට්ටුවක් රැගෙනවිත් වෙදමහත්තයා අත තැබුවාය.

"දුංකොළ කැල්ලක් ගන්ඩ ඉතුරු වෙයිද මන්දා" වෙදමහත්තයා කීවේ ඇසෙන නෑසෙන හඬකිනි.

"ඉතුරු වුණේ නැත්නං ණයට ඉල්ලගන්ඩ... හෙට දෙන්ඩ බැරියැ"

ඇසිලින් නෝනා එසේ කීවේ වැඩිපුර සල්ලි දුන්නොත් වෙදමහත්තයා ගුණපාලගේ දර මැස්ස පැත්තේ යාවී යැයි සිතූ හෙයිනි.

x x x x

ජිනසෝම ට්‍රේනිං කොලීජියට ගිය පසු ගෙදර එකවරම නිහඬ විය. කුසුමලතා කාමරයෙන් පිටතට ආවේ ඉඳහිටය. ගුණසෝම දැන් ගෙදර එන්නේ හොඳටෝම රෑවෙලාය. වෙදමහත්තයා එක්කෝ මාටින්ගේ කඩේට යයි. නැත්නම් ගුණසෝමගේ ඇඳට වී ඔහේ කල්පනා කරමින් සිටියි. ඇසිලින් නෝනා කුස්සියෙන් එළියට එන්නේද දවසකට හත් අට වතාවක් පමණි.

ජිනසෝම පිළිබඳ මතකය තුනී වී ගොස් එදිනෙදා කටයුතු වෙතට දෙතුන් දෙනාගේම අවධානය යොමු වූ නමුත් කුසුමලතාගේ නිහඬ බව අඩුවූයේ නැත.

ඇසිලින් නෝනා සමග කරන කතාබහද අඩු වී ඇත. "තේ බීපං" කිව්වොත් ඈ තේ බොයි. "කෑවද?" කියා ඇසුවොත් "නෑ" කියයි. "අද කෑම එපාද?" කියා ඇසුවොත් "එපා" කියයි. "ඔනෑද?" කියා ඇසුවොත් "ඕනෑ" කියයි. ඇසිලින් නෝනාට මේ වෙනස හොඳින් පෙනිණි. අවස්ථාවක් බලා ඈ කුසුමලතාගෙන් මේ ගැන ඇසුවාය. ඒ වනවිට වෙදමහත්තයා ගෙදර සිටියේ නැත. ගුණසෝම ද දවාලට බත් කා පිට වූ ගමන්මය. කුස්සියේ සිටියේ ඇසිලින් නෝනා පමණි.

WWW.SINHALAELIBRARY.COM 84
Uploaded By Paba
SL UNLIMITED Sri Lankan e-Community
www.sinhalaelibrary.com

"මෙසිට මොකද වෙලා තියෙන්නෙ?" යනුවෙන් තමාගෙන්ම අසාගත් ඇසිලින් නෝනා, කුසුමලතාගේ කාමරයට ගියාය. කුසුමලතා සිටියේ ඇඳමත මුණින් තලාවී මුහුණ කොට්ටය අස්සේ ඔබාගෙනය. ගවුම හැකිලී කලවා දෙපසින් නිරාවරණය වී තිබිණි. ඇසිලින් නෝනාගේ ඉවසිල්ලේ සීමාව ඉක්ම ගියේ එවිටය.

"උඹට මොකද වෙලා තියෙන්නෙ? ඇඟත් එළියෙ දාගෙන... විලිසංගෙ නැතුව හැදෙන හැටි... ඔය පත්තරවල ඔව වෙන්ඩ ඇති තියෙන්නෙ..."

ඇසිලින් නෝනාගේ හඬින් සමග සිටි ඉරියව්වෙම සිටිමින් කුසුමලතා ගවුම සකස් කර ගත්තා මිස හිස ඔසවා බැලුවේ නැත.

"මං ඉන්නෙ මගේ කාමරේ... මං ඉන්නෙ ඉස්තෝප්පුවෙ ඇඳේ නෙමෙයිනෙ"

"යමක් කිව්වාම එකට එක කියන්ඩත් පුරුදුවෙලා..."

"අම්මෙ මගේ ඔලුව රිදෙනවා... මට ටිකක් නිදාගන්ඩ දෙන්ඩ..."

"මොන වාරෙකට හැදෙනවද මන්ද... උඹල රස්සාවලට ගියයි කියල මට වහලියක් වෙන්ඩ බෑ..."

කුසුමලතා කිසිසේත්ම බලාපොරොත්තු නොවූ ලෙස එසේ පැවසූ ඇසිලින් නෝනා කාමරයෙන් පිටව ගියාය. ඉන්පසු කුසුමලතාට ඇසුනේ පොල් ගෙඩියක් බිඳින හඬය. ඒ හඬින් සමග ඇඳෙන් නැගී සිටි කුසුමලතා කෙස් වැටිය අතින් සකස් කරමින් කුස්සියට ගියාය. කුසුමලතා කුස්සියට පැමිණි බව දුනගත් නමුත් ඇසිලින් නෝනා ඇව ගණනකට නොගෙන පොල් ගාන්නට පටන් ගත්තාය.

"දෙන්ඩ මං ගාන්නං"

කුසුමලතා දෙතුන් වතාවක්ම පොල්ගාන්නට ඉල්ලූ නමුත් ඇසිලින් නෝනා එය කණකට ගත්තේ නැත.

"මටත් දන් මේ ගෙදර ඉන්ඩ එපාවෙලා තියෙන්නෙ"

කුසුමලතා කීවාය. ඇගේ හඬෙහි ස්වරයද අමුතු එකකි. ඇසිලින් නෝනා පොල් ගෑම නවත්වා කුසුමලතා දෙසට තියුණු බැල්මක් හෙලුවාය. කුසුමලතා සිටියේ ජනේලයෙන් ඉවත බලාගෙනය.



"අම්මල මාව විතරක් කන්ඩ හදන්නෙ අහිත් එවුන් ගැන මොකුත් දන්නෙ නැතුව..."

"මොකක් ගැනද උඹ කියන්ඩ හදන්නෙ?"

"අම්මගේ බාල පුතා ගැන"

"ගුණසෝම ගැන?"

"එයා චාර්ලිසාලගෙ ගෙදර කින්න බගින්ඩ යනව"

ඇසිලින් නෝනා පොල් බෑය එහෙමම වට්ටිය මත වැටෙන්නට ඉඩහැර නැගී සිටියාය.

"උඹට ඇති මනමාල පිස්සුවක් නෑ. ඔය එක එකා හදන කයි කතන්දර වෙන්ඩ ඇති"

"අම්මෙ මේ... තමන්ගෙ පුතාව සුද්ද කරන්ඩ යන්ව එපා.."

"මගෙ පුතා කියන්නෙ යකෝ උඹේ මල්ලිනෙ..."

"මල්ලි තමයි... මටත් පාරෙ බැහැල යන්ඩ බෑ... එක එකීල අහන ප්‍රශ්නවලට උත්තර දෙන්ඩ ගියාම... ඔය බෝල පිට්ටනිය තියෙන්නෙ චාර්ලිස් බාස්ලගෙ ගෙදර එහා පැත්තෙ... මෙයා රෑ වෙනකල් ලගින්නෙ එහෙ... නිකං කිරි බෝතලෙකුත් දෙනවලු... කුමාරිහාමිගෙ ඇඟ හරියන්ඩ... ලොකු එකී බැඳලත් නෑ ගෙදරට නාකි වෙනව... අපේ එකා ගිහිල්ල එල්ලුනා දෙවෙනි එකීගෙ කරේ... මොනව නැතත් පොත්ත රතුයිනෙ... හිර ගන්ඩ නෙමේ නිකමට ගොඩවෙන්ඩ හොඳ ගෙවල්ද... චාර්ලිස් බාස් වැඩට ගියාම දාවිතා ඔය ගෙට රිංගපු කතාව ගමේ හැම එකාම දන්නවනෙ... අම්ම විතරම නැතැයි දුවත්..."

කුසුමලතා කබල් මැසිමක් හඬ නගන්නාක් මෙන් කියාගෙන කියාගෙන ගියාය. කිසි දවසක නොවූ ලෙස ඇගේ ස්වරය අසංවර වී ඇත. ඇසිලින් නෝනාගේ සරුවාංගයම දහඩියෙන් තෙත්ව ගියේය. කුසුමලතා තව තවත් මොනවාදෝ කියවන්නට වූ නමුත් ඒ එකක්වත් ඇසිලින් නෝනාගේ සිතට ඇතුළු වූයේ නැත. තමාගේ පපුව හිරවෙන බවක් ඈට දැනිණි. කුස්සියෙන් පිටව ගිය ඇසිලින් නෝනා ඉස්තෝප්පුවේ ලණු ඇඳට ගොස් ඇලවුණාය. කුසුමලතා පොල් ගාන හඬ ඈට ඇසිණි. එය ඇසිලින් නෝනාට ඇසුණේ ඉවසාගත නොහැකි තරම් කටුක පීඩාකාරී හඬක් ලෙසිනි. ටික වේලාවකින් පොල්ගාන හඬ නැවතිණි. මේ සිදු වූයේ කුමක්දැයි

WWW.SINHALAELIBRARY.COM 85
Uploaded By Paba

ඇසිලින් නෝනාට තවම වටහාගත නොහැකිය. ඇතැම් විට මෙවා කුසුමලතාට ඇසුණු කටකතා විය හැකිය. පහුගිය කාලයේ කුසුමලතා ගුණසෝමගෙන් ඈත්වෙන්නට සිතුවේ මේ නිසාවත්ද?

චාර්ලිස් බාස්ගෙ දෙවෙනි කෙල්ල ඇහැට කණට පෙනෙන එකියකි. පහුගිය දවසක සමුපෙට යන විට අතරමගදී හමුවුණු ඇ "නැන්ද සමුපෙ පැත්තෙ යනවද?" යනුවෙන් ඇසූ බවත් "ඔව් චිත්තරෝ" යනුවෙන් තමා පිළිතුරු දුන් බවත් ඇසිලින් නෝනාට සිහිපත් විය. ඒ මොනවා කිව්වත් ගුණසෝම මෙවැනි දෙයක් කරාවි යැයි කොහොමටවත් සිතන්නට ඉඩක් නැත.

වෙදමහත්තයා පැමිණියේ හොඳටම හවස් වෙලාය. ඒ වන විටත් ඇසිලින් නෝනා සිටියේ කුස්සියට වී කල්පනා කරමිනි. වෙනදා කුස්සිය අස්පස් කර තබන ඈට ඒවා කරන්නටද හිතක් නැත. කුස්සියට ගිය වෙද මහත්තයාට මේ වෙනස එක්වරම වැටහිණි. ඔහු වට පිට බැලුවේය. ඇසිලින් නෝනා බලාගත් අත බලාගෙන සිටියාය. වෙදමහත්තයාගේ පැමිණීම ගැන වගේ වගක් නැත. මේ තත්ත්වය තවදුරටත් ඉවසා සිටිය නොහැකි තැන වෙදමහත්තයා ඒ ගැන විමසුවේය.

"ඇසිලින් නෝනෙ මොකද මේ...? සනීප නැද්ද?"

වෙදමහත්තයා ඈ අසලට විත් නළලට අත තබා බැලුවේය. ඇගේ ඇස් කඳුළුවලින් පිරී ඇති බවක් ඔහු දුටුවේ ඒ මොහොතේය.

"ඇසිලින් නෝනෙ... මොකද මේ...?"

එහෙත් ඇය කිසිවක් නොකියා එතැනින් නැගිට කාමරයට ගොස් ඇඳෙහි ඇල වුණාය. මොකක් හෝ ලොකු දෙයක් සිදුවී ඇති බවක් වෙදමහත්තයාට දැනිනි. ඇතැම් විට අම්මත් දුවත් හොඳ රණ්ඩුවක් අල්ලන්නට ඇත. පහුගිය දවස්වල දිගටම එහෙම දෙයක් සිදුවිය හැකි බවට ලකුණු පහළ වෙමින් තිබූ බව වෙදමහත්තයාටද වැටහී තිබුණේය. ඔහු කුස්සියෙන් පිටව සාලයට විත් කාමරයට එබිකම් කෙළේය. ඇසිලින් නෝනා බිත්තිය පැත්තට හැරී ඇඳෙහි වැතිර සිටී. වෙදමහත්තයා කුසුමලතාගේ කාමරයේ දොර රෙද්ද මෑත් කෙළේය. කුසුමලතාද ඇඳෙහි මුනින් තලාවී සිටී.

ඔහු ඉස්තෝප්පුවට ගොස් ලණු ඇඳේ විට්ටමට හිස තියා ඇල වුණේය. ඔහුගේ දෑස් ඉබේම පියැවිණි. සිදුව ඇත්තේ කුමක්දැයි

WWW.SINHALAELIBRARY.COM 86



හරිහැටි වටහාගත නොහැකි නමුත් අම්මාත් දුවත් අතර හුටපටයක් ඇතිවී ඇති බවට නම් සැකයක් නැත.

ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට පැමිණ පුටුවක ඉඳගන්නා තුරුම ඔහු දන්නේ නැත. වෙදමහත්තයා හිස ඔසවා ඇඳෙහි තරමක් ඉහළට ඇදී විට්ටමෙහි හිස තබා වඩා පහසුවෙන් ඇලවුණේය.

"වෙදමහත්තය කලබල වෙන්ඩ එපා. මේ කුසුමලතා කියාපු කාරණාවක් ගැන මං හිත හිතා හිටියෙ. මේක වෙදමහත්තයට නොකිය ඉන්ඩ තිබුණ නං හොඳයි. ඒත් මට ඒකත් ඉවසගෙන නිකං ඉන්ඩ අමාරුයි"

ඇසිලින් නෝනාගේ කතාවත් සමග තිගැස්සුණු වෙදමහත්තයා විට්ටමෙන් හිස ඔසවාගෙන ඇඳෙහි ඉඳගත්තේය.

"කුසුමලතා ගැන හුටපටයක්වත්ද?"

"නෑ... ගුණසෝම ගැන..."

"ගුණසෝම ගැන?"

වෙදමහත්තයාගේ දෑස් විශාල විය. තියුණු විය. ඒවා දෙස කෙළින් බලන්නට ඇසිලින් නෝනාට ශක්තියක් තිබුණේ නැත.

"ගුණසෝම අර චාර්ලිස් බාස්ලගෙ ගෙදර යනව එනව කියල තමයි කිව්වෙ. දෙවෙනි එකී... අර චිත්තරා එක්ක සම්බන්ධයක් තියෙනවලු"

"ඔය කයිකතන්දරයක් වෙන්ඩ ඇති ඇසිලින් නෝනො..."

වෙදමහත්තයාගේ සිත තුළද සියුම් කම්පණයක් ඇති වූ නමුදු ඒ කිසිවක් නොපෙන්වා සාමාන්‍ය තත්ත්වයෙන් කතා කරන්නට උත්සාහ ගත්තේය.

"නෑ. හැමදාම කිරි බෝතලයක් දෙනවලු සල්ලි ගන්නෙ නැතුව"

"කුසුමලතා කොහොමද දන්නෙ?"

"මං දන්නෙ නෑ ඒකිත් මොකක් හරි හේතුවක් නැතුව කියන්නෙ නැනෙ... ඔය බෝල ගහන්ඩ යනව කිය කියා ගිහින් ඒකිත් එක්ක කුටු කුටු ගගා ඉන්නව කියන්නෙ... ඔය බෝල පිට්ටනිය තියෙන්නෙ චාර්ලිස් බාස්ගෙ වත්තට අල්ලපු වත්තෙලුනෙ..."

කුටු කුටු ගෑම කෙසේ වෙතත් නොමිලයේ කිරි බෝතලයක්

Uploaded By Paba

දීම නම් ටිකක් බැරෑරුම්ව සිතා බැලිය යුතු කාරණාවකි.

"ඔය කියන විදියට හුගක් කල් ගිහිල්ල වාගෙ..."

"කුසුමලතා කියන දෙවල් කොච්චර දුරට ඇත්තද කියල අපි දන්නෙ නැහැ... එකපාරට ගුණසෝමගෙන් අහන්ඩ යන්ඩ එපා..."

වෙදමහත්තයා කීවේය. ඔහුගේ සිතේද යම් චංචල බවක් ඇති වුවද ගුණසෝමගෙන් ඒ ගැන ප්‍රශ්න කළහොත් තත්ත්වය සිතනවාටත් වඩා බැරෑරුම් විය හැකියැයි වෙදමහත්තයාට සිතිණි. එහෙත් ඇසිලින් නෝනාගේ සිත දිනෙන් දින පෝරණුවක් මෙන් රත්වෙන්නට විය. ගුණසෝමගේ හැසිරීම දෙස විමසිල්ලෙන් සිටි ඇට කුසුමලතා පැවසූ කාරණා සත්‍ය බව පැහැදිලි වෙමින් තිබිණි.

"මං බෝල පිට්ටනිය පැත්තෙ යනව ටිකක් රෑ වෙයි එන්ඩ"

ගුණසෝම එසේ කියා බයිසිකලයට නගින විට "රෑත් බෝල ගහනවද?" කියා අසන්නට තරම් හිතේ ශක්තියක් නොතිබිණි. ඇසිලින් නෝනාද ගුණසෝම සමග තිබූ කතාබහ අඩු කළාය. මේ අලුත් පසුබිම නිසා වඩාත් අපහසුවට පත්වූයේ වෙදමහත්තයාය. සතියක් දෙකක් මේ තත්ත්වය එසේම තිබුණ නමුදු ගුණසෝමගේ චරියාව ඇසිලින් නෝනාට ඉවසා සිටිය නොහැකි තරමටම හෙළිදරව් වෙන්නට පටන් ගත්තේය.

"කොහෙද මෙච්චර රෑ වෙනකල් උඹ ඇවිදින්නෙ?"

දෙගොඩහරි ජාමයේ ගෙදරට පැමිණ රෑ කෑම කන්නට කුස්සියට පැමිණි ගුණසෝමගෙන් ඇසිලින් නෝනා ඇසුවාය. බත් කමින් සිටි වෙදමහත්තයාගේ මුහුණ එක්වරම අඳුරු වී ගියේය. ඇසිලින් නෝනා එහෙම දෙයක් අසන්නට සිතාගෙන සිටි බවක් ඔහු දැන සිටියේම නැත.

"බෝල ගැහුව..."

"දෙගොඩ හරි වෙනකල්?"

"ඊට පස්සෙ කාඩ් ගැහුව..."

"කාඩ් ගැහුවෙ කොහෙද? චාලිස් බාස්ගෙ කෙල්ලොත් එක්කද?"

ඇසිලින් නෝනාගේ හඬ තද වැඩි යැයි වෙදමහත්තයාට එක්වරම සිතිණි.



"ඇසලින් නෝනෙ කෑගහන්ඩ එපා"

"වෙදමහත්තය ඉතිං හැම දෙයක්ම වෙන්ඩ ඇරල බලාගෙන ඉන්නවනෙ... ඒක ලේසියිනෙ..."

"අපේ ගෙදර ප්‍රශ්න පිට මිනිස්සු දැනගන්ට ඕනෑ නෑ..."

"පිට මිනිස්සු ඔක්කොම දන්නව... අපි තමයි දන්නෙ නැත්තෙ"

"මොනවද පිට මිනිස්සු දන්නෙ?"

ගුණසෝමගේ කටහඬද සැර වැඩි යැයි වෙදමහත්තයාට සිතිණි.

"දන්නෙ...! උඹ චාලිස්ගෙ ගෙදර බින්නබහින්ඩ යනවයි කියන එක"

"අම්මෙ... එක එකී කියන පට්ටපල් කේලම් අහල මගේ ඇඟට පනින්ඩ එපා... ඔය කියන අයට කියන්ඩ තමන් නටන ඒවා නවත්ත ගන්ඩ කියලා"

ගුණසෝමගේ දෑස් රතුවී ඇත. ඔහුගේ අත වෙව්ලයි. ගුණසෝම මෙසේ හැසිරෙනු වෙදමහත්තයා කිසිදිනෙක දැක නැත. ඔහු අන්දමන්ද වී ගොසිනි. කාමරයේ නිදා සිටි කුසුමලතාද කුස්සියට කඩා පැන්නාය.

"කාටද ඔය කියන්නෙ?"

"ගම්පහ ටවුමෙ නටන එකීලට කියන්නෙ"

"කොහෙද මං නැටුවෙ...?"

"නටන හැටි මුළු ගමම දන්නව..."

"උඹ හිතුවද චාලිස්ගෙ දුව වගේ කියල මාත්"

"ඊට එහා... පිස්වර් හෝල් ගානෙ ගහන රස්තියාදු අපි දන්නව..."

"බල්ලො... බලු කතා කියන්ඩ එපා"

කුසුමලතා ගුණසෝමගේ ඇඟට පැන්නාය. ගුණසෝම ඇව තල්ලු කෙළේය. ඈ විසිවී ගොස් බිත්තියෙහි හැපිණි.

"වහපියව් දෙන්නම කට"

WWW.SINHALAELIBRARY.COM 87

වෙදමහත්තයාගේ කෑගැසීමත් බත් පිඟාන පොළොවේ ගසන හඬත් ඇසුණේ එකවිටය. පිඟාන් කැබලි කුස්සිය පුරා විසිරිණි.

Uploaded By Paba

කුසුමලතා හඬාගෙන කාමරයට දිව්වාය. තත්පර කිහිපයක් කුස්සියේ රැඳී සිටි ගුණසෝම බිම බලාගෙන කුස්සියේ දොරෙන් පිටව ගියේය. වෙදමහත්තයා ඉස්තෝප්පුවට පැමිණ ලණු ඇඳමත ඇල වුණේය. ඔහු වතුර බිව්වේවත් අත සෝදාගත්තේවත් නැත. ඇසිලින් හෝනා හිරමණ කොටය මත ඉඳගෙන ඉකිගසන්නට වූවාය.

ටික වේලාවකට පසු ඉස්තෝප්පුව දෙසින් සිහින් කෙඳිරියක් ඇසිණි. ඇසිලින් හෝනා අඩියට දෙකට ඉස්තොප්පුවට ගියාය.

''ඇසිලින් හෝනෙ... පපුව ටිකක් හිරවෙනව වාගෙ...''

වෙදමහත්තයා සිහින් හඬින් කීවේය.

ඇසිලින් හෝනා කාමරයට ගොස් සිද්ධාර්ථ තෙල් කුප්පිය ගෙනැවිත් අත්ලට ටිකක් හලා වෙදමහත්තයාගේ පපුවෙහි තවරා පිරිමදින්නට වූවාය. සිහින් ලෙස කෙඳිරිගාමින් සිටි ඔහු ටික වේලාවකින් නින්දට වැටුණේය.

× × × ×

# 15

කුසුමලතා දිවුලපිටියේ මිනිහෙක් සමග පැනගියේ ගුණසෝම පිළිබඳ කයිකතන්දර ආරංචි වී සති තුනකට පමණ පසුවය. එදා උදේ කන්තෝරුවට ගිය කුසුමලතා රාත්‍රි අට නමය වෙනතුරුත් පැමිණියේ නැත. ගුණසෝමත් සෝමපාලත් බයිසිකලයක් රැගෙන මහ රාත්තිරියේ වික්‍රමපාල ලියන මහත්තයා මුණ ගැහෙන්නට කොස්පිල්ලෑවට යන විට රාත්‍රි දහයත් පසුවී තිබිණි. වික්‍රමපාල ලියන මහත්තයාද වැඩ කෙළේ සේනානායක පෙරකදෝරු මහත්තයා ළඟය.

''ඔය නඩුවලට ආගිය මිනිහෙක් එක්ක සම්බන්ධකමක් තිබුණා... මිනිහ බැඳපු කෙනෙක්ය කියල ආරංචි වුණාට පස්සෙ අපිත් කුසුමලතාට අවවාද කළා. ඔය මිනිහත් එක්ක තමයි යන්ඩ ඇත්තෙ... ඊයේ දවාලෙත් මිනිහ ඇවිල්ල කැරකි කැරකී හිටිය... මිනිහගෙ ඔය රසකැවිලි හදන බිස්නස් එකක්ද කොහෙද තියෙනව... වැන් කබලකුත් තිබුණා. මේ ළමය රැවටුණා... මම හරියටම දන්නෙ නෑ... දිවුලපිටිය පැත්තෙ තමයි ගෙවල්... හැබැයි කන්තෝරුවට ආවොත් ඔය නඩු විස්තර බලල ඇඩ්‍රස් එක හොයාගන්ඩ බැරිවෙන එකක් නෑ...''

වික්‍රමපාල ලියන මහත්තයා කියූ විස්තර ගුණසෝම එක්වරම ඇසිලින් හෝනා සමඟ කියන්නට ගියේ නැත. එහෙත් කඩින් කඩ ඒවා කටින් පිටවිය.

WWW.SINHALAELIBRARY.COM 88

''දිවුලපිටිය පැත්තෙ මිනිහෙක්ලු''

''[illegible] බැඳපු මිනිහෙක්ලු''

Uploaded By Paba

"විස්තර කාරයෙක්ලු"

කුසුමලතා පැනගියේ කසාද මිනිහෙක් සමගය යන්න ඇසිලින් නෝනාට මෙන්ම වෙදමහත්තයාටද දරාගත හැකි ආරංචියක් නොවීය.

"ඉසී ගුණසෝමගෙ කයිකතන්දරත් කියන්න ඇත්තෙ පැනල යන්ට හිතේ තිබිච්ච දවස්වල තමයි"

"සිරිදාස කන්තෝරුවට ඇවිල්ල කසාද බඳින්ඩ කතා කළාය කියල දවසක් මට කිව්ව. මං ඒක වෙදමහත්තයාටවත් කිව්වෙ නෑ... මෙයි අපි ඔක්කොගෙම ඇස්වලට වැලි ගහල පැනල ගියේ..."

"බැඳපු නැති මිනිහෙක් එක්ක පැනල ගියානම් මට මෙච්චර හිතේ අමාරුවක් නෑ... තවත් දරුපවුලක් කඩා ඉහිරවපු එක ගෙවල ඉවරකරගන්න බැරි පාපයක්. දන් ඒ ගෑනි දෙස් දෙවොල් දෙනව ඇති... ඒ ගෑනිගෙ ශාපවලින් කොටසක් අපටත් වදිනව"

"වෙදමහත්තය ඕව ගැන ඕනෑවට වඩා හිතන්ඩ එපා... ඒකි මැරුණයි කියල හිත හදාගමු. ඕව ගැන හිතන්ඩ ගියාම වෙදමහත්තයත් ලෙඩ වෙනව... උන්ට අපිව එපානං අපි මොකටද පස්සෙන් යන්නෙ... අපි තරකක් කෙරුවෙ නෑනෙ. උන්ගෙ නොසංඩාලකමට අපි මොනව කරන්ඩද?"

"උඹට ඕනෑ නං මය කා එක්ක හරි දිවුලපිටිය පැත්තෙ ගිහිං ආරංචි කරල බලපං... මට නං හිතක් දෙන්නෙ නෑ යන්ට..."

වෙදමහත්තයා ඇසිලින් නෝනාට දෙතුන් විටක්ම කී මුත් කුසුමලතා සොයා යන්නට කිසිම උනන්දුවක් ඇ තුළ තිබුණේ නැත. ඒ වෙනුවට තිබුණේ හැඬල කේන්තියකි. වෙදමහත්තයාට ගමේ මිනිසුන්ගේ තිබුණු පැළසිල්ල කුසුමලතා විසින් කාබාසිනියා කරන ලද්දය යන සිතුවිල්ල ඇසිලින් නෝනාගේ සිත පාරමින් තිබිණි. "මාටින්ගෙ කඩේට ගියා ගුණපාලගෙ දර මැස්සටවත් යන්ඩ හිතක් දෙන්නෙ නෑ" යි වෙදමහත්තයා කීප විටක්ම පැවසූ අයුරු ඇට සිහිපත් විය.

මේ සිද්ධියෙන් පසු ගුණසෝමගේද කතාබහ හොඳටම අඩු වූ අතර ඔහු ගෙදර රැඳී සිටින වේලාවද අඩු විය. වෙදමහත්තයා මේ ගැනද සිතන බව ඇසිලින් නෝනා දනගත්තේ ඉඳහිට ඔහු කියන වචනවලිනි.



එදාට පසුවද වෙදමහත්තයාගේ පසුව හිරවීමක් සිදුවිය. ඉස්පිරිතාලයට ගොස් දොස්තර බෙහෙත් ටිකක් ගනිමුදැයි ඇසිලින් නෝනා ඇසූ නමුත් ඔහු එතරම් කැමැත්තක් දක්වූයේ නැත.

"මය සිද්ධාර්තෙ ටිකක් ගාපුවාම අඩුවෙනව. හිතං වාගෙත් වෙන්ට ඇති. අනිත් එක ඉස්පිරිතාලෙ යනවයි කියන්නෙ මාව අලුවෙන් හැටියට ගමේ මිනිස්සුන්ට කියා පාන එක. උන් එතකොට හිතයි කුසුමලතා පැනල ගිය හින්ද කියල"

වෙදමහත්තයා ඉස්පිරිතාලයට යාමට අකමැත්තක් දක්වන්නේ ඒ අන්තිම කාරණය නිසා බව ඇසිලින් නෝනාට තේරුම් ගැනීමට අපහසු වූයේ නැත. ඊට පසුවද ඒ ගැන මතක් කළ නමුදු වෙදමහත්තයා කැමැති කරවා ගැනීමට නොහැකි විය.

ජිනසෝමට මේ කරුණු දන්වා ලියුමක් ලියා යවන්නට ඇසිලින් නෝනාට ලොකු වුවමනාවක් තිබූ නමුත් එවැනි ලියුමක් ලියා ගන්නට තරම් විස්වාසවන්ත කෙනෙකු ගැන ඇට සිහිපත් වූයේ නැත. කරන දෙයක් වෙදමහත්තයාට නොදනෙන්නට කළ යුතුය.

"තාත්තව දොස්තර මහත්තෙකුට පෙන්නුවොත් තරකද?"

ගුණසෝමද කීහිප විටක්ම ඇසුවේය.

"තාත්ත කැමැති නෑ..."

"තාත්තගෙ කැමැත්ත අකමැත්ත බල බලා ඉඳල හරි යනවයැ"

"තාත්තට මය පොඩි වාත අමාරුවක් හැදුනට... ඉස්පිරිතාලෙ යන්ඩ තරං මහලොකු අමාරුවක් නෑනෙ"

ඇසිලින් නෝනා එසේ කීවේ ගුණසෝම ඉදිරියේ වුවත් වෙදමහත්තයාව හෑල්ලු කිරීමට නොකැමැති වූ නිසාය. ඒ වන විට ගුණසෝම පිළිබඳව වුවද ඇගේ තිබුණ පැහැදීම නැත්තටම නැතිව ගොස් තිබිණි. වෙදමහත්තයාගේ හිතේ අමාරුවට කුසුමලතා පමණක් නොව ගුණසෝමද වගකිව යුතුය යන සිතුවිල්ල ඇගේ සිතෙහි මතුවී තිබිණි. එහෙත් ජිනසෝමගේ උදව්ව ඇ සිත යටින් ප්‍රාර්ථනා කළාය.

මාටින් මුදලාලි හදිසියේම පැමිණියේය. එය වෙදමහත්තයා මෙන්ම ඇසිලින් නෝනාද කිසිවිටෙකත් බලාපොරොත්තු නොවූවකි. සාමාන්‍යයෙන් ඔහු කිසිම හේතුවක් නිසා ගෙවල් ගානේ ඇවිදින්නකු නොවූ නිසාය.

SL UNLIMITED
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 89
Uploaded By Paba

"දවස් හත අටකින් කඩේ පැත්තෙ ආපු නැති හින්ද මට හිතුන වෙදමහත්තයට අසනීපයක් වත්ද කියල"

ඉස්තෝප්පුවේ පුටුවක් උඩින් වාඩි වෙමින් මාටින් මුදලාලි කීවේය. ඒ මොහොතේ වෙදමහත්තයා සිටියේ ලණු ඇඳ මත දිගාවෙලාය.

"කුසුමලතාගෙ කාරණාව ගැන නම් ඕනෑවට වඩා හිතන්ඩ ඕන නෑ... ඔව ඉතින් ඒ ළමයින්ගෙ කරුම... ඒව ඉතිං අපට වළක්වන්ඩ බෑ නොවැ වෙදමහත්තය"

මාටින් මුදලාලි සිගරට් උගුරක් ඇද දුම් පිට කරමින් කීවේය. ත්‍රීරෝස් සිගරට් සුවඳ ඉස්තෝප්පුව පුරා පැතිර යන්නට විය.

"ඒව ඉතිං අපට කරන්ඩ දෙයක් නෑ. මම මේ දවස්වල පුස්කොළ පොත් වගයක් බැලුව... මගෙ හිතේ තියෙනව හෙහරාජ තෙල හිදල බලන්ඩ..."

"බොහොම බලගතු තෙලක් නෙව.:."

මාටින් මුදලාලි එවැනි කෙටි පිළිතුරක් දුන්නා මිසක වැඩි වර්ණනාවක් කරන්නට ගියේ නැත. වෙදමහත්තයා හෙහරාජ තෙලක් ගැන මාටින් මුදලාලි සමඟ කතා කරන්නට පටන් ගත්තේ ඇයි දැයි ඇසිලින් නෝනාටද වැටහුණේ නැත. සමහරවිට කුසුමලතා ගැන කතාව වෙන අතකට හරවන්නට විය යුතුය. ඒ වුණත් හෙහරාජ තෙලක් ගැන කීම අනවශ්‍ය වැඩකි.

"ඇසිලින් නෝනා... දැන් දවස් හත අටකින් ඉඳි ආප්ප ගෙනාවෙත් නැතෙ... මිනිස්සු හැමදාම අහනව..."

මාටින් මුදලාලි තකහනියක්ම එන්නට ඇත්තේ ඒ ප්‍රශ්නය නිසා යැයි ඇසිලින් නෝනාට එක්වරම සිතිණි. දවස් හත අටකින් නොව කුසුමලතා පැන ගියදා සිට ඉඳිආප්ප හැම්බීමක් සිදු නොවූ බවත් මාටින් මුදලාලිට එය විශාල ප්‍රශ්නයක් බවත් ඇසිලින් නෝනාට පැහැදිලි වූයේ ඒ මොහොතේය.

"ජේපිත් උන්දෑ ඇවිත් දෙතුන් දවසක්ම ඇහුව ඉඳිආප්ප ටිකක් එවන්ඩද කියල.. මම ඉතිං වෙදමහත්තේලගෙන් අහන්නෙ නැතුව වචනයක් දෙන්නෙ නැනෙ... මට ඔය ඉඳි ආප්ප ටිකකට වඩා වෙදමහත්තය වටිනව. ඒත් ඉතිං මිනිස්සු ඇවිත් හැමදාම අහනව නෙ..."



මාටින් මුදලාලි ත්‍රීරෝස් එකේ අන්තිම උගුරත් ඇද කොටය මිදුලට වීසි කළේය.

"නෑ ඉතිං... ඇසිලින් නෝනගෙ හිතත් මේ දවස්වල හරි නැහෙ මුදලාලි... ඒක තමයි මේ ප්‍රශ්නෙ..."

ඇසිලින් නෝනා ටිකකට කුස්සිය පැත්තට ගිය විට වෙදමහත්තයා ඇසෙන නෑසෙන හඬින් කීවේය.

"ඒක තමයි... මටත් ඒක තේරෙනවනෙ... අපි කොච්චර සිච්චත් අමම කෙනෙකුට ඕවගෙ දෙයක් දරාගන්ඩ ලේසි නෑ..."

එසේ කියූ මාටින් මුදලාලි "ඇසිලින් නෝනා තේ එහෙම වක්කරන්ඩ එපා... මම මේ තේ බීපු ගමන් ආවෙ" යනුවෙන් උස් හඬින් කීවේය.

නැවතත් ඉඳි ආප්ප තම්බන්නට ඇසිලින් නෝනාගේ අදහසක් නැත.

"හින්දර අස්සෙ ඉඳල මගෙ පපුවත් රිදෙනවා පෙළක් වෙලාවට.. පුළුවන්කමකට කෙරුව නෙමෙයි... අනිත් එක වෙදමහත්තයව උදේ පාන්දර කඩවල් ගානෙ යවන්ඩ මං කැමැති නෑ..."

මාටින් මුදලාලි ගිය පසු ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට පැමිණ කීවාය. වෙදමහත්තයාද ඒ ගැන කිසිවක් කීවේ නැත.

"පුළුවන් වුණොත් සුමානෙකට සැරයක් විතර ඔය සව් දොදොල් වගේ දෙයක් හදනව ඒක මට හරි ගිහින් දෙන්ඩ පුළුවන්නෙ..."

එහෙත් සව් දොදොල් හැදීමක්ද සිදුවූයේ නැත.

ඒ සති අන්තයේ ජිනසෝම ගෙදර පැමිණියේය. ගෙදරට ගොඩ වෙනතුරුම ඔහුගේ පැමිණීම ගැන ඇසිලින් නෝනාවත් දැනසිටියේ නැත. ඔහු කෙලින්ම ඇඳුම් බෑගයත් සමඟ කුසුමලතාගේ කාමරයට ගොස් මිනිත්තු කිහිපයක් එහි රැඳුණේය. ඇසිලින් නෝනා සාලයට පැමිණි නමුත් කාමරයට එබිකම් කරන්නට ගියේ නැත. මොකක්දෝ අභියත බියකින් ඇගේ සිත පිරී යන්නට විය.

ටික වේලාවකින් ජිනසෝම කාමරයෙන් පිටතට පැමිණියේය. ඔහු සාලයේ තිබුණ පුටුවක ඉඳගත්තේය. ඇසිලින් නෝනා උලුවස්සට බර වී බලා සිටියාය.

WWW.SINHALAELIBRARY.COM 90
Uploaded By Paba

"වෙච්ච දේවල් මට ආරංචි වුණා... පහුගිය සුමානෙ මං ආවෙ නැත්තෙත් ඒ හින්ද... අම්මල වුණත් මීට වඩා හොයල බලන්ඩ තිබුණ.."

එය තිගැස්සුණු හඬක් මෙන් පැමිණි වචන කිහිපයකි. ජිනසෝමගේ හඬ මෙතරම් තිගැස්සුණු වූ දවසක් ගැන ඇසිලින් නෝනාට මතකයක් නැත. මුහුණ පුරා වැවී ඇති රැවුල නිසා ඔහුගේ පෙණුමද තිගැස්සුණු එකක් වී ඇත.

"අපි දන්නෙ නෑ පුතේ"

ඇසිලින් නෝනා කීවේ ඉතාමත් දුබල බිඳුණු හඬකිනි. වෙදමහත්තයා කාමරයේ සිට සාලයට විත් ඉඳගත්තේ මේ මොහොතේය. පොරවාගෙන සිටි රෙදි කැල්ල නිසා වෙදමහත්තයා ජිනසෝමට පෙණුනේ රෝගියකු ලෙසිනි.

"කෙල්ලෙක් පැනල යනවයි කියන එක මේ කාලෙ ඒ තරං දෙයක් නෙමෙයි. පවුලක් කඩාගෙන බැඳපු මිනිහෙක් එක්ක ගිය එකයි ප්‍රශ්නෙ..."

"අපිත් ඕකම තමයි කිව්වෙ"

වෙදමහත්තයා කතාවට සම්බන්ධ වූයේ ජිනසෝම ඉදිරියේ ඇසිලින් නෝනා අසරණ වී ඇති බව ඔහුට දැණුනු නිසාය.

"මේ ප්‍රශ්නෙ මගෙ ජීවිතේටත් බලපානවා"

ජිනසෝම එසේ කියා නැගිට යළිත් කාමරය තුළට ගියේ වෙදමහත්තයා හෝ ඇසිලින් නෝනා දෙස බලන්නේවත් නැතුවය. වෙදමහත්තයා ඇසිලින් නෝනා දෙස බැලුවේය. ඈ බිම බලාගත්තාය. ඉන්පසු කුස්සියට ගියාය. වෙදමහත්තයාත් ඈ පසුපසින්ම වාගේ කුස්සියට ගියේය. ඇසිලින් නෝනා හිරමණ කොටය මත ඉඳගත්තාය. වෙදමහත්තයා පුටු කබල මත ඉඳගත්තේය. එයින් නැඟුණු "කිරි කිරි" හඬ වෙනදාටත් වඩා විශාලව ඇසුණේය.

"ඒ වැරැද්දත් අපේ ඔලුවටද කඩා වැටෙන්ඩ යන්නෙ..."

"වෙදමහත්තය ඕව ගැන හිතන්ඩ එපා... ජිනසෝම හිතේ වේගෙට කියන්ඩ ඇති. ජිනසෝමට වුණත් ප්‍රශ්නයක් තමයි. ට්‍රේනිං එකට ආරංචි වෙලානං වස ලැජ්ජාවකුත් ඇතිනෙ..."



එසේ කියූ ඇසිලින් නෝනා තවත් මිනිත්තු කිහිපයකට පසු "කසාදෙකදි වුණත් මේක බලපාන්ඩ පුළුවන්" යනුවෙන්ද වචන කිහිපයක් බිඳිනු හඬින් එකතු කළාය.

ජිනසෝම පසුදා හැන්දෑවේ ආපසු මහරගම ගියේය. ගෙදර සිටි කාලය තුළද ඔහුගේ වැඩි කතාබහක් තිබුණේ නැත. ගුණසෝමද ඔහුට මුහුණදෙන්නට අකමැත්තක් දක්වූ බවක් පෙණිනි.

"තාත්තට සනීප නෑ වාගෙ... දොස්තර මහත්තෙකුට පෙන්නන්ඩ වෙයි"

ගෙදරින් පිටව යන්නට පෙර කුස්සියට ගිය ජිනසෝම ඇසිලින් නෝනා අත රුපියල් පණහේ නෝට්ටුවක් තබමින් කීවේය.

ඇසිලින් නෝනා ඔහුගේ මුහුණ දෙස බැලූ නමුත් ඔහු ඒ සල්ලි දුන්නේ බිම බලාගෙනය. තමාගෙන් වරදක් සිදුවුණාය වැනි හැඟීමක් ජිනසෝමගේ සිතෙහි මතුවෙමින් පවතින්නට ඇතැයි ඇසිලින් නෝනාට හැඟිණි. ඔහු ආපසු හැරුණු පසු ඇසිලින් නෝනා චීත්ත පොට උස්සා කඳුළු පිසදා ගත්තාය. ජිනසෝම රුපියල් පණහක් දුන් කතාව ඇසිලින් නෝනා වෙදමහත්තයාට කීවේ දවස් දෙක තුනකට පසුවය.

ඒ මොහොතේ "මොකටද ගත්තෙ?" වැනි ප්‍රශ්නයක් ඔහුගේ මුහුණෙහි ඇඳී ගිය නමුත් එය වචනවලට නොපෙරළීම ඇසිලින් නෝනාට මහත් අස්වැසිල්ලක් විය.

"ජිනසෝමත් ලොකු කල්පනාවකින් තමයි ගියේ"

ඇසිලින් නෝනා එසේ කීවේ වෙදමහත්තයාගේ නිහඬ බව තවදුරටත් ඉවසා සිටිය නොහැකි වූ නිසාය. එහෙත් ඒ වචන කිහිපයෙන්වත් ඔහුගේ නිහඬ බව බිඳින්නට ඇසිලින් නෝනාට හැකිවූයේ නැත.

වැඩි කතාබහක් නොමැතිව දවල් කාලයේ ඉස්තෝප්පුවේ ලණු ඇඳේ වැතිර සිටින වෙදමහත්තයා දිනක් හදිසියේම වාගේ බැනියමක් දාගෙන මිදුලට බැස්සේය. කුස්සියේ සිටි ඇසිලින් නෝනා ඔහු යන බවක් දැන සිටියේ නැත. ඔහු ගෙදර නැති බව ඇසිලින් නෝනා දැනගත්තේ ඉස්තෝප්පුවට පැමිණිවිටය. කම්මැලි කමට මාටින් මුදලාලිගෙ කඩේ පැත්තට යන්නට ඇතැයි ඈ සිතුවාය.

www.sinhalaelibrary.com
UNLIMITED — The spirit of Sri Lankan e-community
WWW.SINHALAELIBRARY.COM 91
Uploaded By Paba

"ඒක අතකට එහෙම ගිහින් ඔය මොනව මොනව හරි ගැන කතාවට වැටෙන එක හොඳා" යැයි ඈට සිතිණි. එවිට හිතට කරදර කරන දේවල් අතාමතා යන්නටත් පුළුවන්. එහෙත් වෙදමහත්තයා ගොස් තිබුණේ කඩය පැත්තෙ නොවේ.

"මං සිරිදාසලගෙ ගෙවල් පැත්තෙ ගියා"

පැයකින් හමාරකින් ආපසු පැමිණි වෙදමහත්තයා කෙළින්ම කුස්සියට ගොස් පුටුවේ ඉඳ ගනිමින් කීවේය.

"ඒ මොකද හදිස්සියෙන් සිරිදාස මතක් වුණේ?"

"මූණදිහා බලාගෙන කතා කරන්ඩවත් කෙනෙක් නැතෙ... මාටින් මුදලාලිගෙ කඩේ ඔියන් මිනිස්සු මා දිහා බලන්නෙ මහ අමුතු විදියකට..."

"වෙදමහත්තයට හෝර්ලික්ස් එකක් හදල දෙන්ඩද?"

"තේ එකක් බිව්වොත් නං හොඳයි තමයි ඒත් ඔය හෝර්ලික්ස් බොන්ඩ මං අසාධ්‍ය ලෙඩෙක් නෙමෙයිනෙ"

"ගුණසෝම ගෙනල්ල තිබුණ..."

ඇසිලින් නෝනාට අවශ්‍ය වුණේ ගුණසෝම වෙදමහත්තයා ගැන සිතා විශේෂ දේවල් ගෙනැවිත් දෙන බැව් කියා පාන්නටය. එහෙත් ඉන් සිදුවූයේ වෙදමහත්තයාගේ මුහුණේ තිබූ සැහැල්ලුව යළිත් අතුරුදන් වීම පමණකි.

"මේ ළමයින්ට නොතේරෙන එක දෙයක් තියෙනව ඇසිලින් නෝනා... දෙමාපියෙකුගෙ හිත හදන්ඩ මේ දේවල්වලින් බැහැ කියන එක... ඒකට ඔය තරං වියදං කරන්ඩ ඕනැ නෑ..."

වෙදමහත්තයා ඒ පිළිතුර දුන්නේ එතරම් බැරෑරුම් බවකින් නොවන බැව් තේරුම් ගිය නිසා ඇසිලින් නෝනාගේ සිත ඔනෑවට වඩා රිදුනේ නැත.

"සිරිදාස මොකද කිව්වෙ?"

ඇසිලින් නෝනා වහාම මාතෘකාව වෙනස් කළාය. වෙදමහත්තයාට ඒ බැව් දැනුණු නමුත් වෙනසක් නොපෙන්වා පිළිතුරු දෙන්නට සිතුවේ ඈ කෙරෙහි උපන් අනුකම්පාව නිසාය. තමාගේ සිත කිසිවකින් හෝ නොරිදෙන අන්දමින් තබන්නට ඈ ගන්නා උත්සාහය වෙදමහත්තයාට හොඳින්ම දැනී තිබිණි.



"මිනිහ ගෙදර හිටියෙ නෑ... ගණේමුල්ලෙ වැඩක් කිව්ව. මම පණිවිඩයක් තියල ආවා... ආපුවාම එන්ඩ කියල..."

වෙදමහත්තයා කතා කරන අතරේ ඉඳහිට කෙටි පිළිතුරක් දුන් ඇසිලින් නෝනා හෝර්ලික්ස් වීදුරුවක් හැදුවාය.

"කෑද වීදුරුවක් බොන එකතරම් මට නම් මෙච වටින්නෙ නැතෙ..."

"අපේම කැමැත්ත අකමැත්තට ජීවත්වෙලාම බෑ... උන්ගෙ ආසාවල්වලටත් ඉඩක් දෙන්ඩ එපායැ..."

තමා ඇත්තටම හෝර්ලික්ස් වීදුරුව පානය කරන්නේ ඇසිලින් නෝනා කියූ ඒ කාරණාව නිසා නොවේදැයි වෙදමහත්තයාට පසුව සිතෙන්නට විය. ඒ අතර ඔහුගේ මුහුණේ මඳ හිනාවක්ද මතු විය. ඇසිලින් නෝනා ප්‍රශ්නාර්ථයකින් යුක්තව ඔහුගේ මුහුණ බැලුවාය.

"මං හිතන දේ කියන්ඩ ඇසිලින් නෝනා දක්සයි නෙව"

බොහෝ දවසකට පසු ලැබූ සිතට සැනසිල්ලක් දෙන වචනයක් වෙදමහත්තයාගෙන් පිට විය.

"මං හිතාගෙන හිටියෙ කවදහරි හෙනරාජ් තෙල හිඳින්ඩ... ඒක මගෙ ජීවිතේ තිබුණු ලොකු ආසාවක්..."

"වෙදමහත්තයට දැන් ඕව කරන්ඩ හයි හත්තියක් තියෙනවයැ..."

"මට හිතෙනව ඉතුරු පුස්කොළ ටිකත් සිරිදාසට දෙන්ඩ... බටගොල්ල වෙදමහත්තයට දෙන්ඩ කියල... ඔය පොත්වල වටිනා තෙල් වර්ග හදන හැටි තමයි තියෙන්නෙ. බටගොල්ලෙ වෙදමහත්තයට දුන්නොත් ඕවයෙන් වැඩක් ගනීවි... ඒක අපටත් පිනක්නෙ ඇසිලින් නෝනෙ... මං සිරිදාසට හැන්දෑකරේ එන්ඩ කියල පණිවිඩයක් තිබ්බෙ ඒක හින්ද තමයි..."

"ඔව් ඉතිං බලාගෙන ගියාම ඒක අතකට ඕව අල්මාරියෙ දාගෙන ඉන්න එකේ තේරුමක් නෑ තමයි"

ඇසිලින් නෝනාද කීවාය. පුස්කොළ පොත් ටික දීම හෝ නොදීම ගැන නොව ඈට අවශ්‍ය වූයේ වෙදමහත්තයාගේ හිතේ ඇති වී ඇති සැහැල්ලුව රැකගැනීම සඳහා ඔහු කැමැති දෙයක් ගැන... ඔහු කැමැති පිළිවෙළකට කතා කිරීමටය.

WWW.SINHALAELIBRARY.COM 92
Uploaded By Paba

මරණාධාර සමිතියේ රැස්වීම ගැන ඇසිලින් නෝනා කීවේද ඒ අදහස සිතේ තබාගෙනය.

"සේනත් අප්පුහාමින් මට කිව්ව... ඒ කට්ටියගෙ හිතේ මේ පාර මාව සභාපති කොරන්ට... දැන් අවුරුදු තුන හතරක්ම සේනත් අප්පුහාමිනෙ සභාපති... මට කිව්ව වෙදමහත්තය දැන් මං සභාපතිකම අවුරුදු තුන හතරක් කෙරුවනෙ... මටත් දැන් අමාරුයි... වෙදමහත්තය සභාපති වෙන්ඩ කියල..."

වෙදමහත්තයා එසේ කියා මදක් නිහඬ විය.

"රෙද්දකුත් ඇඳගෙන ඔය සමිතිවල සභාපතිකම් කරන්ඩ පුළුවන්ද ඇසිලින් නෝනෝ"

ඔහුගේ ඒ කතාවට සහ ස්වරය ඇසුණු විට ඇසිලින් නෝනාගේ සිත යළි තිගැස්සුණේය. කතා කරගැනීමට නොහැකි බවක් දැනුණි. කෙතරම් සැහැල්ලු බවක් පෙන්නමින් සිටියද ඔහුගේ සිතෙහි සැඟවී ඇති වේදනා හිටිහැටියේ පිටට පනින බවක් ඇසිලින් නෝනා දැනගත්තේ ඒ මොහොතේය.

"ළමයි වැරදි කළාට ගමේ මිනිස්සුන්ගේ වෙදමහත්තයාට තියෙන සැලකිල්ල අඩුවෙලා නෑ... ඒකනෙ සභාපති වෙන්ඩ කියන්නෙ..."

ඇසිලින් නෝනාගේ කතාවෙන් පසු වෙදමහත්තයා මොහොතක් කල්පනා කෙළේය. ඉන්පසු පුටුවෙන් නැගී සිටියේය.

"ඒකනං ඇත්ත... බලමුකො"

එසේ කියමින් ඔහු ඉස්තෝප්පුවට ගියේය. මරණාධාර සමිති රැස්වීම ගැන මතක් නොකර සිටියා නම් හොඳ යැයි ඇසිලින් නෝනාට පළමුව සිතිනි. එහෙත් දෙවනුව සිතුනේ කෙසේ හෝ සමිති රැස්වීමට වෙදමහත්තයාව යවා ගන්නට ලැබුණොත් ඔහුගේ සිතේ තිබෙන කළකිරීම සහ වේදනාවන් පහව යන්නට හොඳටම ඉඩ තිබෙන බවය.

සිරිදාස පැමිණියේ බිං කළුවරත් වැටී සැඟෙන වෙලාවක් ගියාට පසුවය. ඔහුගේ අතේ හොඳ කෝලිකුට්ටු ඇවරියක් ද තිබිණි.

"මංකඩේ කඩේ හොඳ කෙහෙල් කැණක් එල්ලල තිබුණා..."

සිරිදාස පුරුදු සිනාව මුවගට නංවා ගනිමින් කෙසෙල් ඇවරිය ඇසිලින් නෝනාට දී පුටුවක ඉඳගත්තේය. ලණු ඇඳ මත වාඩිවී



සිටි වෙදමහත්තයා බුලත් හෙප්පුවේ අඩු වැඩිය සොයා බලා එය සිරිදාස දෙසට දිගු කෙළේය.

"මේ දවස්වල ගණේමුල්ලේ මහ විශාල ගෙයක් හදනව... ඒ ගෙදර එක දරුවෙක් ඉන්නෙ ජර්මනියෙ. එයා තමයි ගේ හදන්නෙ"

ඒ විදියට පටන්ගත් කතාබහ එක එක අතට විහිද ගිය නමුත් කුසුමලතා ගැන කතා නොකරන්නට වෙදමහත්තයා මෙන්ම සිරිදාසද වගබලා ගත්තේය. අන්තිමේදී සිරිදාස ආපසු ගියේ සිමෙන්ති කවරයක අඩුක් කළ පුස්කොළ පොත් හත අට බොහොම ගෞරවයෙන් තුරුළුකර ගෙනය.

"සිරිදාස කිව්ව, මේව බොහොම වටිනා පොත්... ඒක හින්ද බටගොල්ලෙ වෙදමහත්තයාගෙන් ලොකු මුදලක් ඉල්ල ගන්ඩත් පුලුවන් වෙයි කියල"

වෙදමහත්තයා, සිරිදාස පිටව ගිය පසු කුස්සියට ගොස් පුටු කබල මත ඉඳගනිමින් කතාබහ පටන් ගත්තේය.

"එපාය කියල කියන්ඩ තිබුණෙ"

"මං එහෙම කිව්වෙ නෑ.. දුන්නොත් ගන්නව... ඇසිලින් නෝනට පිංකමකටවත් දෙන්ඩ බැරියෑ..."

වෙදමහත්තයා කීවේය. ඇසිලින් නෝනාට ඔහු ගැන දුක සිතිණි. වෙදමහත්තයා පිළිබඳව උපදින මෙවන් වූ දුක් සිතුවිලිවලින් ඇසිලින් නෝනාගේ සිත දැන් නිතර නිතර පිරී යයි. එවිට සියුම් වේදනාවක් ඇති වන නමුදු ඔහු වෙනුවෙන් වැඩිපුර වෙහෙසිය යුතුය යන සිතුවිල්ලද ඒ වේදනාව පසුපසින්ම එයි.

"සීයව මතක් වෙන්ඩවත් එක පොතක් තියාගන්ට තිබුණෙ..."

ටික වෙලාවකට පසු ඇසිලින් නෝනා කීවාය. ඒ කතාවටද වෙදමහත්තයාට මඳ සිනාවක් ගියේය.

"හෙනරාජ් තෙල හිඳින හැටි ලියවිලා තිබුණ කැල්ල මං ගලව ගත්ත... ඒක අල්මාරියෙ මුල්ලක ඇති. නෑ ඉතිං හෙනරාජ් තෙල්වලින් මිනිස්සුන්ට වැඩක් නැනෙ... මොකද වාත අමාරුවකට ගාන්ඩයෑ... මං නැති දවසක මාව මතක්වෙන්ඩ ඇසිලින් නෝනාටත් මොකක් හරි තියෙන්ඩ එපායෑ..."

WWW.SINHALAELIBRARY.COM 93
Uploaded By Paba

වෙද්මහත්තයාගේ මද සිනාව සමග ඇසිලින් නෝනාගේ සිතට ද එක් වී ඔහු කළ සැනැල්ලුව තුන්සිය තරම අවට හැමතැනම පැතිර ගියේය. මේ සැනැල්ලුව වෙද්මහත්තයාගේ ජීවිතයට කොතරම් බලපෑවේ ද යත් පසුදා ඇසිලින් නෝනා වත්ත පහළ පොල් අතු පාහිමින් සිටියදී එතැනට ගොස් වත්ත පහළ එළවළු වගාවක් දැමීමට ද යෝජනාවක් ඉදිරිපත් කළේය.

ඒ යෝජනාව ක්‍රියාත්මක වීමට දවසකට දෙකකට වඩා ගියේ නැත. ඇසිලින් නෝනා වත්ත පහළට යනවිට උදළු කොටියක් කර තබාගෙන එහි ගිය වෙද්මහත්තයා තරමක එළිමහන් තැනක් බලා උදළු ගාන්නට පටන් ගත්තේය.

එහෙත් මිනිත්තු හත අටකට වඩා එක දිගට උදළු ගාන්නට නොහැකිය. ඉන්පසු වෙද්මහත්තයා වැඩේ නවත්වා හති අරින්නට පටන් ගනියි. ඉන්පසු නැවතත් උදළු ගාන්නට පටන් ගනී. පළමු මිනිත්තු පහේදී ඔහුගේ ඇඟපත දහඩියෙන් නෑවෙයි.

"වෙද්මහත්තයට පුළුවන්ද ඕක කොරන්න... අසනීපෙත් වැඩි වෙන්ඩ පුළුවන්..."

"ඇසිලින් නෝනා මේව කරන කොට ලෙඩ අඩුවෙනව..."

එසේ කියා නැවතත් ඔහු උදළු ගාන්නට පටන් ගනී. නැවතත් හති අරියි. එවිට ඇසිලින් නෝනා උදලු කොටිය රැගෙන උදළු ගාන්නට පටන් ගත්තීය. පැයක් හමාරක් යනවිට සෑහෙන කොටසක් උදළු ගා අවසන් කිරීමට දෙදෙනාට හැකිවිය.

"තණකොළ ටික වේලෙන්ඩ ඇරල ගිනි තියමු"

ඇසිලින් නෝනා යෝජනා කළාය.

"ඔව්... එහෙම හොඳයි..."

වෙද්මහත්තයාද එකඟ විය. එහෙත් එදින රාත්‍රියේ මේ ගැන ඇසිලින් නෝනා ගුණසෝමට කීවාය.

"සීප්පුද මං දන්නෙ නෑ... ඔය පොළව කඩ ගහන්ඩ තාත්තට පුළුවන්ද"

"තාත්තගෙ ආසාවක්නෙ. තාත්තටත් මොනවත් හරි කරන්ඩ දෙයක් තියෙන්ඩ එපායැ... ජීවිත කාලෙම එක එක වැඩ කරපු මනුස්සයින්ට දවසම ඇඳේ ඉන්ඩ බෑ... අපි කිව්වට"



ඇසිලින් නෝනා, ගුණසෝම සමග කීවේ වෙද්මහත්තයා සතුටින් තැබීම සඳහා කළ හැකි යමක් කළ යුතු බව ඇසේවිය. පසුදා හිමිදිරි යාමේ උදැල්ලක් රැගෙන වත්ත පහළට ගිය ගුණසෝම බිම පෙරළා දවල් වනවිට හරි අපූරු පාත්ති වගයක් අතේ කර දුන්නේය.

"මොනවගෙම අපූරුයි තමයි... හැබැයි අපිට මේක තනියම කරන්ඩ පුළුවන් වුණොතිං තමයි හොඳ... එක අතකට ඉස්සර වගේ වැඩ කරන්ඩ බෑ තමයි"

පාත්ති දෙස බැලූ වෙද්මහත්තයා කීවේය.

"නෑ දැන් වෙද්මහත්තයට පුළුවන්නෙ පැළ ටිකක් හිටවන්ඩ"

"මිරිස් පැළ ටිකක් හොයාගන්ඩ පුළුවන් වෙයි"

වෙද්මහත්තයා පාත්තිවල වැටි දිගේ ඇවිදිමින් කීවේය.

× × × ×

SL UNLIMITED
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 94
Uploaded By Paba

SL UNLIMITED
The spirit of Sri Lankan e-community

# 16

වෙද මහත්තයා හිමිදිරි පාන්දර යම්තමින් එළිය වැටෙන කොටම වත්ත පහළ මිරිස් පාත්තියට යයි. නාඹර මිරිස් පැළ බොහොම නිරෝගී යැයි ඔහු කිහිපවිටක්ම ඇසිලින් නෝනා සමඟ කීවේය.

"ආදිරිස් උන්නැහේ හොඳම මිරිස් පැළ තමයි මට ගෙනල්ල දුන්නෙ"

මිරිස් පැළ ගෙනාවේ පිටියේගෙදර ආදිරිස් උන්නැහේගේ ඔච්චෙන්ය.

"මං මාටින් මුදලාලිට කිව්ව මේ පාර බඩු ගේන්ඩ ගම්පහ ගියාම මට මිරිස් පෝර පැකට් දෙක තුනක් ගෙනත් දෙන්ඩ කියල"

වෙදමහත්තයාගේ කතාව දුන් මිරිස් පාත්තිය ගැනමය. ඔහු පැළයෙන් පැළය වෙතට ගොස් අතගාමින් මැස්සන් පණුවන් ඉන්නවාදැයි බලයි. උදේ පාන්දරින් ගොස් බාල්දියකට ගොළු බෙල්ලන් අහුලා වත්ත පහළටම ගෙනගොස් දමයි. කුස්සියේ වැඩ කටයුතු අවසන් නොවූවද කිරි කෝප්පයක් රැගෙන වත්ත පහළට යන ඇසිලින් නෝනා එහි සිටින වෙදමහත්තයාට දෙයි. ඉන්පසු ඇයද හෙමින් සීරුවේ වල්පැළ උදුරන්නට පටන් ගනී. වෙදමහත්තයාද කුස්සියේ වැඩට උදව් වෙයි. පොල් ගෑමේ කටයුත්ත දැන් ඔහු භාරගෙන ඇත.

"මට හිතෙනව අර අඳුන ආයිමත් ජීවංකරන්ඩ... මට බලන්ඩ නෙමෙයි ඇසිලින නෝනාට බලන්ඩ... පැත්තකට දාල තිබ්බට බොහොම බලගතු අඳුනක්"



වෙදමහත්තයාගේ අදහසට ඇසිලින් නෝනා එක්වරම පිළිතුරු දෙන්නට ගියේ නැත. කෙසේ වුවද එම අදහස් ඔහුගේ සිතේ පවතින සැහැල්ලු බව නිසාම උපන් ඒවා යැයි ඇට සිතිණි.

"නෑ... ඉතිං නිකං ඉන්න එකේ අහක යන්නෙ නැතෙ... මට හිතෙනව කවද හරි දවසක ඇසිලින් නෝනට අංජනම ජේන්ඩ පටන් ගනී කියල. අඩුගානෙ අපේ පවුල ගැනවත් මොනව මොනව හරි දැනගන්ට ලැබුණොත් එහෙම... හොඳ හිතකට දෙවියො නොවැඩ ඉන්නෙ නෑ..."

වෙදමහත්තයාගේ මේ අදහස් ගැන ඇසිලින් නෝනා විශේෂ කැමැත්තක් ප්‍රකාශ නොකළ නමුත් අකමැත්තක් ප්‍රකාශ කෙළේද නැත. ඒ නිහඬ බව විසින් පොළඹවනු ලැබූ වෙදමහත්තයා අලුතින් මල් බුලත් පුවුවක් පිළියෙළ කොට රෑට රෑට අඳුන ජීවම් කරන්නට පටන් ගත්තේය.

දවල් කාලයට මිරිස් පාත්තියත් රාත්‍රියට අඳුන ජීවම් කිරීමත් ඇසිලින් නෝනා අඳුනට දෑස් යොමාගෙන සිටින විට ඇ අසලින්ම සිටිමින් ප්‍රශ්න ඇසීමත් දැන් වෙදමහත්තයාගේ දින චරියාව වී ඇත. ඉඳහිට දවසක කළුවර වැටුණාට පසු වෙදමහත්තයා මාටින්ගේ කඩය පැත්තේද ගියේය. ඔහු මිරිස් පාත්තිය ගැනද මුදලාලි සමඟ කීවේය.

"මිරිස් පැළ හැත්තෑ පහක් තියෙනව කියන්නේ ලොකු දෙයක්.."

මාටින් මුදලාලිද ඔහුව දිරිමත් කළේය.

"හැබැයි වෙදමහත්තය ඔය රට පෝර දාන්නෙ නැතුව ගොම රොඩු තමයි දාන්ඩ ඕනෑ... එතකොට තමයි නියම ගුණේ.."

"ඔක්කොමත් හරි වතුර දාන එක තමයි ප්‍රශ්නෙ..."

"ඔව් ඉතින් මහන්සි නොවී බෑ ගොවිතැනක් කොරන්ඩ"

එවැනි කතාබහකින් පසු වෙදමහත්තයා ගෙදර එන්නේ බලවත් සතුටකිනි. ඊළඟ දවසේ මිරිස් පාත්තියට යන්නේද ඒ සතුටින් හිත පුරවාගෙනය. මිරිස් පැළ දැන් නාඹර වී තිබේ. ඒ ගස් තමා පිරිවරා සිටින දරු කැලක් බඳු යැයි වෙදමහත්තයාට සිතුණේය. කුසුමලතා පිළිබඳව වූ අලුත්ම ආරංචිය ඇසිලින් නෝනා, වෙදමහත්තයා සමඟ කීවේ මෙසේ එක් හැන්දෑවක මිරිස් පාත්තියේ වැඩ කරමින් සිටියදීය. එය ප්‍රසන්න වූ සැන්දෑවක් විය.

WWW.SINHALAELIBRARY.COM 95
Uploaded By Paba

"කුසුමලතාට දරුවෙක් ඉපදිලා කියල දනියෙල්ගෙ පවුල කිව්ව. දනියෙල්ගෙ පවුල ගිහිල්ල තියෙනව ගම්පහ ඉස්පිරිතාලෙට ගුණවතී බලන්ඩ... ඒනිටත් දරුවෙක් ලැබෙන්ඩ හිටියනෙ... ගුණවතී තමයි කියල තියෙන්නෙ කුසුමලතා ඉන්නව කියල..."

ඇසිලින් නෝනා හදිසියෙන්ම වාගේ පැවසූ ආරංචියෙන් වෙදමහත්තයාගේ සිත සම්පූර්ණයෙන්ම වාගේ වෙනස් විය. ඔහුගේ මුහුණේ තිබුණ සැහැල්ලු පෙනුම හෙමින් යටපත්ව ශෝකයට කිට්ටු බැරෑරුම් පෙනුමක් ආරූඪ වන අයුරු ඇසිලින් නෝනා බලා සිටියාය. ඔහු ඇගේ මුහුණ බැලුවේද නැත. එකම මිරිස් පැළය අතපත ගාමින් බොහෝ වේලාවක් එකම තැන ගත කළේය.

"ඇසිලින් නෝන ඉස්පිරිතාලෙට ගිහින් කුසුමලතාව බලල එන්ඩ... මේවගෙ වෙලාවකදී අම්ම කෙනෙක් ගිහිල්ල බළුව අතගාන එක බොහොම ලොකු දෙයක්නෙ ගෑණු ළමයෙකුට"

වෙදමහත්තයාගේ සිත කොහොමටත් සෞම්‍ය එකක් බැව් ඇසිලින් නෝනා දන සිටියාය. එහෙත් කුසුමලතාගේ ආරංචිය දනගත් මොහොතේ ඔහුගේ මුහුණෙහි දක්නට ලැබුණු පෙනුම තරම් මඳු පෙනුමක් ඇසිලින් නෝනා කවදාවත් දක තිබුණේ නැත.

පසුදා කුසුමලතා බලන්නට ගම්පහ ඉස්පිරිතාලයට ගිය ඇසිලින් නෝනා ආපසු එනතුරු වෙදමහත්තයා සිටියේ බලවත් නොඉවසිල්ලෙනි. ඔහු ඒ පැය දෙක තුනම ඉස්තෝප්පුවේ ලණු ඇඳට වී කල්පනා කරමින් සිටියා මිස අඩුම තරමින් මිරිස් පාත්තිය පැත්තේවත් ගියේ නැත.

"අපූරු කොලු පැටිය. බෝලගෙඩිය වාගෙ..."

ඉස්පිරිතාලයේ සිට ආපසු පැමිණි ඇසිලින් නෝනා සාලයටවත් නොගොස් ඉස්තෝප්පුවේ පුටුවක වාඩි වී හති අරිමින්ම වෙදමහත්තයාට විස්තර කරන්නට පටන් ගත්තාය.

"එච්චර සාරයක් නෑ වාගෙ... කුසුමලතාට හුගක් අමාරු වුණාලු... වැත් එකක් වික්ක කියල තමයි කිව්වෙ... ඒකි මාව බදාගෙන අඬන්ඩ පටන් ගත්ත..."

ඒ දවස් දෙක තුනේදීම ඉස්පිරිතාලයට ගිය ඇසිලින් නෝනා අලුත් අලුත් ආරංචි ගෙනාවාය.



"මහ ගෑනි මගෙ මූණ දිහාවත් බැලුවෙ නෑ..." ඇසිලින් නෝනා ඒ ටික කිවූ නමුත් "ඉස්සෙල්ල පවුලටත් ළමයෙක් ඉන්නවලු" යන ආරංචිය වෙදමහත්තයා සමග කීවේ නැත.

කුසුමලතාගේ දරු පැටියා දකගන්නට වෙදමහත්තයාගේ සිතේ ද ආසාවක් ඇති වූ නමුත් ඒ බව ඇසිලින් නෝනාට කියන්නට ඔහු ඉක්මන් වූයේ නැත. එහෙත් අලුත් ආරංචි ගැන ඔහු නිතරම විමසිල්ලෙන් සිටියේය. ඒ සති අන්තයේ ගෙදර පැමිණි ජිනසෝම සමග ද ඇසිලින් නෝනා කුසුමලතාට දරුවෙක් ලැබිලා යන ආරංචිය කීවාය.

"ඉස්සෙල්ල පවුලටත් ළමයෙක් ඉන්නවලු අම්මෙ..."

ජිනසෝම පැවසූ දෙයින් ඇසිලින් නෝනා තිගැස්සුනාය. ඇ වෙදමහත්තයා දෙස බැලුවාය. ජිනසෝම දෙසත් ඇසිලින් නෝනා දෙසත් මොහොතක් බලා සිටි වෙදමහත්තයා ලණු ඇඳෙන් නැගිට කාමරයට ගියේය. ඇසිලින් නෝනා සහ ජිනසෝම අතර අප්‍රසන්න වූ නිහඬතාවක් පැතිර ගියේය.

"මොකටද තාත්තට ඇහෙන්ඩ ඕව කිව්වෙ?"

ඇ ජිනසෝමගෙන් ප්‍රශ්න කළාය. ඒත් කාමරයට නොඇසෙන්නට හීන් හඬින්ය. ජිනසෝම බිම බලාගෙන සිටියා මිස පිළිතුරක් දෙන්නට ගියේ නැත.

"මං හිතුවෙ තාත්ත ඒ පරණ කතාවල් හිතෙන් අයින් කරල කියල"

බොහෝ ආයාසයකින් පසුවද ජිනසෝමට අපහසුවෙන් කියාගත හැකි වූයේ එපමණකි. ඔහු ඒ ටිකද කීවේ ඇසිලින් නෝනාගේ මුහුණ නොබලා සිටින්නට උත්සාහ ගනිමිනි.

"උඹලා... අපි... හිතනවට වඩා තාත්තා වෙනස්. දරුවන්ගෙ දේවල් තාත්ත ලේසියෙන් අමතක කරන කෙනෙක් නෙමෙයි. හිත යට ඔය හැම එකක්ම තියෙනව... මටත් ඕක ආරංචි වුණා... මම නොකිය හිටියෙ ඒකයි"

"මං එච්චර දුරට හිතුවෙ නෑ..."

ජිනසෝමගේ ඒ ප්‍රකාශයෙන් පසු ඇසිලින් නෝනා ඊට වඩා යමක් ඔහුට කියන්නට ගියේ නැත.



Uploaded By Paba

"උඹ කාලද ආවෙ?"

"බත් ටිකක් තියෙනවනං කන්ඩ පුළුවන්..."

"බත් ටිකක් හැලියෙ ඇති. හැබැයි කරවල කෑල්ලක්වත් නෑ... තාත්ත දන් මස් මාලු කරවල මොකක්වත් ගෙදරට ගන්නෙ නෑ... තාත්ත ආයිමත් අඳුන ජීවං කරන්ඩ පටන් අරගෙන..."

ඇසිලින් නෝනා එසේ කියමින් කුස්සිය පැත්තට ගියාය. ජිනසෝමද ගමන් බෑගය සාලයේ පුටුවක් උඩට දමා ඈ පසුපසින් කුස්සියට ගියා මිසක "මොව කරල හරියනවද අම්මෙ?" යනුවෙන් වෙනදාමෙන් ප්‍රශ්න කළේ නැත.

"පොල් සම්බෝලයක් හැදුවනං ඇති. දෙහි දාපු පොල් සම්බෝලයක් කාපු දවසක් මතක නෑ..."

ඇසිලින් නෝනා පොල් සම්බෝලය හදන අතරේ ජිනසෝම ඇඳුම් මාරුකොට ළිඳ ළඟට ගොස් මුහුණකට සෝදාගත්තේය. මුහුණ අත්පය පිස තුවාය පිට හරහා දමාගත් ජිනසෝම කුස්සියට වීත් පුටු කබල මත ඉඳගත්තේය.

"මගෙත් එක්ක ගෑණු ළමයෙක් සම්බන්ධ වෙලා ඉන්නව අම්මෙ..."

ජිනසෝම බත් කන අතරේ හෙමින් සීරුවේ ඇසිලින් නෝනාට ඇසෙන්නට කීවේය. ඇසිලින් නෝනාගේ සිත තිගැස්සී ගිය නමුත් එස්වරම ජිනසෝමගේ මුහුණ බලන්නට හෝ යමක් කියන්නට ඉක්මන් වූයේ නැත.

"නුවර පැත්තෙ... ප්‍රින්සිපල් කෙනෙකුගෙ දූවක්... ඔය අක්කගෙ සිද්ධිය එයා දන්නව... එයාගෙන් ප්‍රශ්නයක් නෑ... අම්මල තාත්තල දැනගත්තොත් කියන එක තමයි ප්‍රශ්නෙ..."

ජිනසෝම කඩින්කඩ ටිකෙන් ටික කියාගෙන ගියේය. ඇසිලින් නෝනා නිහඬව අසාගෙන සිටියාය. ඈ ට්‍රේනිං කොලීජියේම ගෑණු ළමයෙක් විය යුතුය. එහි ඇති වැරැද්දක් හෝ අරුමයක් නැත. එහෙත් දරුවන්ගේ දේවල් පිළිබඳව යමක් කමක් කරන්නට සිසිදු අවස්ථාවක් නැතිවීම නම් සිතට දුකකි. කුසුමලතාගේ සිද්ධිය සිදුවූ කාලයේ පටන් සිත යට සැඟව තිබූ සිතුවිලි ගොන්නක් එක දිගට ඇසිලින් නෝනාගේ සිතට ගලා එන්නට පටන් ගත්තේය.



"උඹලගෙ ජීවිත ගැන තීන්දු ගන්ඩ අපට වඩා හොඳට උඹලට පුළුවන් කියල අපට තොතේරෙනව නෙමෙයි. ඒත් එකපාරම මීක තාත්තට කියන්ඩ යන්ඩ එපා... මම හෙමින් සීරුවෙ කියන්නං... තාත්ත විරුද්ධ වෙන එකක් නෑ... ඒත් තාත්ත හිතන හැටි වෙනස්.. හිතේ තියෙන දේවල් පිටට දෙන්නෙ නෑ..."

ඇසිලින් නෝනා එසේ කියා ජිනසෝම ළඟින් වතුර වීදුරුවක් තැබුවාය. ඇගේ හඬ හොඳටෝම බිඳී ඇත.

"මම බැංකු ණයක් ගත්ත... ගෙදරට ලයිට් අරගෙන තීන්ත ටිකක් එහෙම ගාන්ඩ හිතාගෙන... ඒගොල්ලන්ගෙ අම්මල තාත්තල ගෙවල් පැත්තෙ එන්ඩ ඕනෑයි කිව්වොත්..."

සෑහෙන වේලාවක් නිහඬව සිටි ජිනසෝම කීවේය. එවර ඇසිලින් නෝනා දෙස ඔහු කෙළින්ම බැලුවේය.

"මහ ලොකු සල්ලියක් යාවිනෙ..."

"රුපියල් තුන් හාරදාහක් යාවි... කොන්ක්‍රීට් කණු හත අටකුත් දාන්ඩ වෙනවනෙ... මාටින් මාමගෙ කඩේ හරියෙ ඉඳල..."

මේ දවස් දෙක තුළ ජිනසෝමත් ඇසිලින් නෝනාත් අතර බොහෝ කතාබහ ඇති වුවද වෙදමහත්තයා ඒ කතාබහෙන් ඈත් වී සිටියේය.

එහෙත් ජිනසෝම ආපසු ගිය පසු ජිනසෝම සමඟ වූ කතාබහ එක දිගට නොව එකින් එක වෙදමහත්තයාට ඉදිරිපත් කෙළේ එකවර සියලු තොරතුරු කිව්වොත් ඔහු කලබලවේය යන බිය නිසාය.

"ජිනසෝම ගෙදරට ලයිට් ගන්ඩ යනව..."

ඒ ආරංචියත් සමඟ ඔහුගේ මුහුණට මඳ සිනාවක් ද ආවේය.

"ගෑණු ළමයෙක් යාළු වෙලාලු... ට්‍රේනිං එකේම... නුවර පැත්තෙ පිංසිබල් කෙනෙකුගේ දුවෙක්ලු"

ඒ ආරංචියද වෙදමහත්තයාගේ සිතට අමුතු කලබලයක් ඇති කෙළේ නැත.

"ඕව ට්‍රේනිං කොලීජ්වල වෙන දේවල්නෙ. අනික් එක ජිනසෝම තමන්ට හානි වෙන දෙයක් කරන්නෙ නෑ... තමන්ගෙ දේවල් පිළිවෙළට කරගන්ඩ හිතන කෙනෙක්නෙ"



Uploaded By Paba

වෙදමහත්තයා ඒ ටික කීවේ තරමක උපහාස හිනාවක්ද සහිතවය.

"හැබැයි ඉතිං ඔක්කොම ලෑස්ති කරගෙන ඉවරවෙලා අපට කියන එක තමයි අවුපාඩුව... දැන් ඔය කියන විදියට ගේ රෙපෙයාර් කරන්නෙත් ලයිට් ගන්නෙත් අපි ගැනම හිතලත් නෙමෙයිනෙ..."

වෙදමහත්තයා එසේ කියා ඇසිලින් නෝනාගේ මුහුණ බැලුවේය.

"දරුවන්ගෙ වැඩවලදී අපි තපුරු වෙන්ඩ හොඳ නෑ..."

ඇසිලින් නෝනා, වෙදමහත්තයා දෙස නොබලාම පිළිතුරු දුන්නාය.

"ඔව උඹ එක්ක කිව්වට මං වෙන කා එක්කවත් කියන්ඩ යන්නෙ නෑ... හැබැයි ඇසිලින් නෝනෙ ඕක තමයි තියෙන ප්‍රශ්නෙ... අම්මල තාත්තලගෙ හිතේ තියෙන දේවල් ඒ විදියට කවදාවත් දරුවන්ට දැනගන්ඩ ලැබෙන්නෙ නෑ..."

ඇසිලින් නෝනා, වෙදමහත්තයාගේ අදහස්වලට විරුද්ධව යමක් කියන්නට හෝ තවත් දෙයක් එකතු කරන්නට ගියේ නැත. එහෙත් ඔහු මේ දේවල් ගැන කෙතරම් දුරදිගට සිතා සිටිනවාදැයි යන සිතුවිල්ල නම් ඇගේ සිතට ඇතුළුව ඒ මේ අත හැපෙන්නට පටන් ගත්තේය.

"මිරිස් පාත්තිය පැත්තෙ දවස් දෙක තුනකින් යන්ඩ බැරිවුණා..."

මාතෘකාව වෙනස් කළ යුතු යැයි වෙදමහත්තයාටම සිතුණේ තමන්ගෙන් පිටවූ ඇතැම් වචන නිසා ඇසිලින් නෝනා අපහසු තත්වයට පත්වන්නට ඇතැයි සිතුණ නිසාය.

"අරනෝලිසාලාගෙ කුකුල්ලු ඇවිල්ල පනුරු ගානව දැකල මං එලෙව්ව"

වෙදමහත්තයා මිරිස් පාත්තිය පැත්තේ ගියේය. කුකුළන් පනුරුගෑම නිසා මල් පිපී තිබුණ ගස් දෙකතුනක්ම කැඩී තිබිණි. ඔහුගේ සිතට දුකක් මෙන්ම කෝන්තියක්ද ඇතිවිය.

"කුකුල්ලු ඇති කරනව නං අනික් මිනිස්සුන්ට කරදරයක් නොවෙන්ඩ ඇතිකරන්ඩ එපායැ..."

වෙදමහත්තයා තරමක් උස් හඬින් කීවේ අර්නෝලිසාගේ ගෙදරටත් ඇසෙන පරිද්දෙනි. අර්නෝලිසාගේ ගෙදර කුස්සිය



තිබුණේ වැට අද්දරටම වෙන්නටය. ඒ නිසා වෙදමහත්තයාගේ කට හඬ කුසසියට ඇසෙන්නට ඇත. අර්නෝලිසාගේ ලොකු කොලුවාගේ පවුල කුස්සියෙන් පිටතට බැස වෙදමහත්තයා දෙස බලා සිටියේ ඒනිසා වෙන්නට ඇත.

වෙදමහත්තයාගේ කට හඬ කුස්සියේ සිටි ඇසිලින් නෝනාටද ඇසුණේය.

"වෙදමහත්තය ඔය ගෑණුන්ට මොකවත් කියන්ඩ යන්ඩ එපා. දන්නැද්ද අර්නෝලිසාගෙ ගෑනිගෙ කට. මං හිතන්නෙ සිරිපාලයාගෙ පවුල තමයි කුකුල්ලු ඇති කරන්නෙ..."

"අර්නෝලිසාගෙ තාත්තත් ඔහොමයි. වැටේ පැල ඉණි ගලෝ ගලෝ මෙහාට කර කර හිටෝන එක තමයි කෙරුවෙ... අපේ තාත්තල ඉන්න කාලෙ ඉඳල හිත හොඳ නෑ.. හරිම කුඩු කේඩු පවුලක්... ගමේ කා එක්කවත් ආස්සරේකුත් නෑ නෙව"

ඒ කතාව එතනින් අවසන් වුවද ඊට පසුවද කුකුළන් විසින් මිරිස් වගාව පනුරු ගා තිබිණි. එහෙත් ඇසිලින් නෝනා වෙදමහත්තයාට ඒ බව කීවේ නැත. ඒ වෙනුවට අර්නෝලිසාගේ ලොකු එකාගේ පවුලට දෙතුන් විටක්ම කුකුළන් එවන්නට එපා යැයි කීවාය.

"ඔය කුකුල්ලු යවන්ඩ එපා... මහ ලොකු මිරිස් වගාව පාළු වෙයි..."

ඇසිලින් නෝනා වත්ත පහළ පොල් අතු පාහිමින් සිටින අතරතුර අර්නෝලිසාගේ පවුල ලේලියට උස් හඬින් කියනු ඇසිණි. ඒ කතාව එල්ල කළේ තමාට බව තේරුම් ගියද ඇසිලින් නෝනා අඩුම තරමින් ඒ පැත්ත බලන්නටවත් උත්සුක වූයේ නැත.

තවත් මිරිස් ගස් හත අටක්ම කඩා වැටී තිබෙනු වෙදමහත්තයා දුටුවේ දවස් දෙක තුනකට පසුවය.

"ඇසිලින් නෝනා කිව්වද අරුන්ට?"

"හ්ම්... මම ආයිමත් කියන්නං. වෙදමහත්තය කතාවට යන්ඩ එපා..."

"ගෑණුංගෙ කටවල්වලට යටත්වෙලා ජීවත් වෙන්න බැහෙ ඇසිලින් නෝනෙ..."

WWW.SINHALAELIBRARY.COM 98
Uploaded By Paba

"ඒකට කමක් නෑ. වෙදමහත්තය කතාවට නොගිහින් ඉන්ඩකො"

වෙදමහත්තයා කුස්සියේ සිට ඉස්තෝප්පුවට ගොස් ලණු ඇඳේ දිගා වුණේය. අර්නෝලිසාගේ පවුල පිළිබඳ ඇසිලින් නෝනා කියූ දේ ගැන හිතට හරි නැත.

"ඒ ගෑනි ඇසිලින් නෝනට මොනවහරි කතාවක් කියන්ඩ ඇති"

වෙදමහත්තයා දිගින් දිගට සිතන්නට පටන් ගත්තේය. ඊට පසු දින දෙක තුන තුළදී කිසිදු සිද්ධියක් සිදු නොවූ නමුත් සෙනසුරාදා උදේ වත්ත පහළින් කුකුළන්ගේ සද්දයක් ඇසුණේය. වෙදමහත්තයා කුස්සියේ දොරෙන් එළියට බැස්සේය.

කිකිළියන් හත් අට දෙනෙක් මිරිස් පාත්තිය පහුරු ගාමින් පෙරදා හැන්දෑවේ දමූ ගොම අවුස්සන අයුරු දුටු වෙදමහත්තයා තරහෙන් පිපිරෙන්නට විය. කුස්සිය පැත්තේ තිබුණ දර පොල්ලක් අතටගත් වෙදමහත්තයා ඇසිලින් නෝනා එපා කියද්දීත් පහළට ගොස් කුකුළන් දෙසට දමා ගැසීය. කුකුළෝ මරහඬ තලමින් එහා වත්තට දිවූහ. ඉන්පසුවද උන්ගේ හඬ ඇසිණි.

"මොකාද යකෝ කුකුල්ලු මරන්ඩ හදන්නෙ?"

අර්නෝලිසාගේ පවුල කෑගසනු ඇසිණි. ඇසිලින් නෝනා කුස්සියේ සිට වෙදමහත්තයාට කෑගැසුවාය.

"ඔන්න ඔය ගෑණුන්ට ඕනෑ දෙයක් කියාගන්ඩ ඉඩදීල වෙදමහත්තය මෙහාට එන්ඩ"

ඇසිලින් නෝනාගේ කීමට අවනත වූ වෙදමහත්තයා කිසිත් නොකියා පැමිණ පස්සා දොරින් කුස්සියට ඇතුළු විය. ඔහුගේ මුහුණ එතරම් හොඳ නැත. ඇසිලින් නෝනාට අවනතව පැමිණි නමුත් ඇගේ මුහුණ දෙසවත් නොබලා කල්පනා කරන්නට පටන් ගත්තේය. ඉන්පසු කතා නොකරම ඉස්තෝප්පුවට ගොස් ඇඳෙහි ඇලවුණේය. ඔහුගේ සිතෙහි විශාල කේන්තියක් ඇති බැව් ඇසිලින් නෝනාටද නොතේරුණා නොවේ. පසුගිය දවස්වල ඔහුගේ එකම ලෝකය බවට පත්ව තිබුණේ මේ මිරිස් වගාවය. ඔහු කළ එකම කාර්යයද එයම පමණක් විය. ඊට හානි පැමිණෙන විට ඔහුගේ සිතට දරාගත නොහැකි වේගයක් ඇතුලු වීම ස්වභාවිකය.



බොහෝ වේලාවක් නින්දට වැටී සිටි වෙදමහත්තයා අවදිවූයේ දවල් කෑම ඉව්වාටත් පසුවය. දවල් කෑමෙන් පසු මේස පිහියක් ගෙන වත්ත පහළට ගිය වෙදමහත්තයා කෙහෙල් පට්ටා කිහිපයක් සකස්කර කැඩුණු මිරිස් පැළවලට කෝටු තබා බඳින්නට පටන් ගත්තේය.

අර්නෝලිස්ගේ පවුල යළිත් වරක් කෑගසන්නට පටන් ගත්තේය.

"කිකිළියො දෙන්නෙකුගෙ කකුල් කැඩිල වෙදකම් කරන එකයි ඇත්තෙ... ගමේ වෙදානෙ..."

"උඹල මොකටද කුකුල්ලු එව්වෙ?"

"අපි එව්වෙ නෑ උන් ආවා..."

"මිරිස් ගස් පහුරු ගාල කැඩිල"

"මිරිස් ගස් මොනවද වෙදෝ... දෝණියන්ද කසාද මිනිහෙක් එක්ක ගිහින් දරු පවුලක්ම කඩල පහුරු ගගා ඉන්නෙ.."

වෙදමහත්තයාට යකා නැංගේ මේ ප්‍රකාශයත් සමගය. ඔහු ආවේශ වූවාක් මෙන් අර්නෝලිසාගේ පවුලට බැණ වදින්නට පටන් ගත්තේය. දෙපැත්තෙන්ම කුණු හරුප ගලා එන්නට විය. අහල පහළ උදවියද මේ බැණ ගැනිල්ල අසන්නට එක් රොක් වූහ.

වයරිං කිරීමට අවශ්‍ය බඩු පෙට්ටියක්ද කර තබාගෙන ජිනසෝම ගෙට ගොඩ වූයේ මේ අතර වාරයේය. ඉස්තෝප්පුවේ බඩු පෙට්ටිය තැබූ ඔහු වත්ත පහළින් ඇසෙන කෑගැහිල්ල ඔස්සේ කෙළින්ම කුස්සියට ගියේය.

ඇසිලින් නෝනා බියපත්ව උලුවස්සට හේත්තු වී බලාසිටියාය.

"මොකද මේ?"

"මිරිස් පාත්තිය කුකුල්ලු පහුරු ගාලා..."

ඇසිලින් නෝනාට කියන්නට ඉඩ ලැබුණේ එපමණකි. ජිනසෝම එළියට බැස වත්ත පහළට ගියේ මඟ සිටම කෑගසමිනි.

"තාත්ත මොකද ඔය කෑගහන්නෙ යමු ගෙදර..."

ජිනසෝමගේ කට හඬින් වෙදමහත්තයා තිගැස්සුණේය. තමාගේ දැස් නිලංකාර වී යන බවක් ඔහුට දැනිණි. පසුව වේගයෙන් ගැහෙන්නට විය.

WWW.SINHALAELIBRARY.COM 99
Uploaded By Paba

''එක්ක පලයල්ල... මහ ලොකු වෙදා දූන් යක්කුන්ගෙ පෙරේතයන්ගෙ කකුල් කඩන්නෙ නෑ... කිකිළියන්ගෙ කකුල් කඩනව මිසක...''

අර්නෝලිසාගේ පවුල තව තවත් කෑගසන්නට පටන් ගත්තාය. ජිනසෝම වෙදමහත්තයා කිසිත් නොකියා ගෙට ගොඩ විය. ජිනසෝම වෙදමහත්තයාට දොස් කියන්නට පටන් ගත්තේ එසේ ගෙට ගොඩ වූ පසුවය.

''මොන විලි ලැජ්ජාවක්ද... එක එක ගෑනුන්ගෙ බැණුං අහන්ඩ... පාරෙ ඉඳල මිනිස්සු බලාගෙන... මුළු ගමම හිනස්සෝනව...''

ජිනසෝම කවදාවත් නැති විදියට උස් හඬින් කෑගසමින් වෙදමහත්තයාට දොස් පවරන්නට විය. ඇසිලින් නෝනා පසෙකට වී ඉකිගසන දෙස වෙදමහත්තයා යටැසින් බැලුවේය.

''මිරිස් ගස් පහුරු ගාහව කියල කුකුල්ලු එවන්ඩ එපා කියල හත් අට වතාවක් උන්ට කිව්ව... මමත් කිව්ව... උඹලගෙ අම්මත් කිව්ව''

වෙදමහත්තයා එසේ පැවසුවේ ජිනසෝමගෙ කෑගැහිල්ල තව දුරටත් ඉවසා සිටිය නොහැකි වූ බැවිනි.

''මිරිස් ගෝනියක් හරි මං ගෙනත් දෙනවනෙ කිව්වනං... මළ ඉලව් මිරිස් ගස්...''

ජිනසෝම කෑගසා කීවේය. වෙදමහත්තයාගේ මුහුණ හොඳටම අඳුරු විය. ඔහුගේ ඇහිපිය වේගයෙන් ගැහෙන්නට පටන් ගත්තේය.

''එහෙම කියන්ඩ එපා පුතේ... ඔය මිරිස් ගස් මං හැදුවෙ උඹල හැදුව වගේ... ඒ වේදනාව උන්ට තේරෙන්නේ නෑ... උඹලට තේරෙන්නෙත් නෑ...''

වෙදමහත්තයා එසේ කියා පුටුවෙන් නැගිට කාමරයට ගියේය. ඇසිලින් නෝනාගේ ඉකිගැසුම ඇඬුමක් බවට පත්විය.

''ඔන්න ඔක නවත්තපං පුතේ...''

ඇසිලින් නෝනා ජිනසෝම වෙතට ළං වෙමින් පැවසුවාය. ජිනසෝම ඇගෙන් ඈත්ව ඉස්තෝප්පුවට ගියේය.

ඒ හැන්දෑව රාත්‍රිය බවට පත්වූයේ එසේ මූසල අන්දමටය. රාත්‍රිය ගෙවී ගියේද අප්‍රසන්න සිතුවිලි ගලා හැලෙද්දීය.



ජිනසෝමත් වෙදමහත්තයාත් ඉර අව්ව වැටී බොහෝ වේලාවක් යනතුරු අවදි නොවීම පුදුමයක් නොවිය. පුදුමය වූයේ ඇසිලින් නෝනාද අවදි නොවීමය. ඇසිලින් නෝනා අවදි වූයේ ඇසිලින් කෑගසන හඬිනි. වෙදමහත්තයා තවමත් නිදිය. ජිනසෝමගේ කාමරයට එබිකම් කළ ඈ ජිනසෝමද නිදා සිටින බව දුක සුසුමක් හෙළමින් කුස්සියට ගියාය.

කුස්සියේ ළිප දෙස බැලීමටත් පෙර දොර විවර කළ ඇසිලින් නෝනා මිරිස් වගාව දෙස බැලුවාය. කිසියම් අමුත්තක් සිදුව ඇති බව පෙණුන නිසා ඈ වත්ත පහළට ගියාය. මිරිස් පැළ සියල්ල උදුරා තැනින් තැන විසිකොට තිබිණි. එය යක්ෂයන්ගේ පිටියක් වැන්න. පපුව ඇතුළතින් සියුම් වේදනාවක් ඇති වී එය ගත පුරාම පැතිර යන බවක් ඇසිලින් නෝනාට දැනිණි. අඩියට දෙකට කුස්සියට පැමිණි ඈ පුටුව මත ඉඳගත්තාය. ඒ වන විට ජිනසෝමද කුස්සියට පැමිණ සිටියේය. ඇසිලින් නෝනාගේ වෙනස දුටු ජිනසෝමද වත්ත පහළට ගියේය. ඔහු ගිය පයින්ම ආපසු පැමිණියේ අඳුරු කරගත් මුහුණකින් යුක්තවය.

''මං හිතුවෙ නෑ තාත්ත මෙච්චර නපුරු මිනිහෙක් කියල''

ජිනසෝම කීවේ ඇසිලින් නෝනාට තියුණු බැල්මක් හෙළමිනි. ඇසිලින් නෝනාද ඔහු වෙත පෙරළා තියුණු බැල්මක් හෙළුවාය.

''තාත්ත වෙන්ඩ බෑ... ගුණසෝම වෙන්ඩ ඇති... ඊයෙ ය් ඇවිල්ලත් නෑ...''

ජිනසෝම කුස්සියෙන් පිටව කාමරයට ගියේ ඇසිලින් නෝනා අන්තිමට කියූ දේ නෑසුනාක් මෙනි.

x x x x

SL UNLIMITED The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 100
Uploaded By Paba

## 17

ගුණසෝම සති දෙක තුනකින් ගෙදර ආවේ නැත. වෙදමහත්තයා ඒ ගැන ඇසුවේද නැත. වයරිං බඩු පෙට්ටිය සාලය මුල්ලේ දූවිලි බැදෙමින් තිබිණි. ඒවා පිසදමන්නට ඇසිලින් නෝනාටද වුවමනාවක් තිබුණේ නැත.

වෙදමහත්තයා වැඩිපුර කතාබහක් නැත. එහෙත් ඔහුගේ මුහුණේ කේන්තියක් හෝ නපුරු පෙණුමක්ද නැත. ඇසිලින් නෝනා ඇතැම් විටක ඔහුගේ මුහුණ දෙස විමසිලිමත්ව බැලුවාය. ඔහුගේ මුහුණ තේරුම් ගැනිමට උත්සාහ කළාය. ඉදහිට ඔහුගේ පපුවේ වේදනාව මතුවිය. ඒ වෙලාවට සිද්ධාර්ථ තෙල් ඇබිත්තක් අත්ලට ගෙන ඇසිලින් නෝනා පපුව පිරිමදියි. එසේ පපුව පිරිමැද අවසන් වූ පසු ඇඳ පාමුලින් ඉඳගන්නැයි වෙදමහත්තයා ඇට කියයි. ඉන්පසු ඔහු දෑස් පියාගනී. ඔහුට නින්ද ගියේ කොයි වෙලාවේදැයි ඇසිලින් නෝනා දන්නේ නැත. ඔහුගේ උගුරේ සෙම ගැටෙන හඬ කාමරය පුරා පැතිරෙන්නට වූ කල ඈ කාමරයෙන් පිටව යයි.

ඇසිලින් නෝනා දැන් වැඩිපුර කුස්සියට යන්නේද නැත. එක්කෝ ඈ කාමරයේ ඇඳ මත ඇලවී සිටී. එහෙමත් නැත්නම් ඉස්තොප්පුවේ පුටුවකට බර වී සිටී. වත්ත පහළ හොඳටම වැල්වැදී ඇත. ගුණසෝම දැන් දෙනුත් බඳින්නේ වත්ත පහළය. අර්නෝලිසාලාගේ ගේ පැත්තෙන් එන කිකිළියන්ගේ හඬ ඉඳහිට ඇසේ. උදේ වරුවේ නම් උන් කෙකර ගාන හඬ එකදිගට ඇසෙන්නට පටන් ගනී.

ගුණසෝම වුවද දැන් වැඩි කතාබහක් නැත. සමහර දිනවලදී ඔහු කිරි උණු කරයි.

WWW.SINHALAELIBRARY.COM 101



"අම්මෙ අන්න කිරි ටික රත් කෙරුව"

සාලයේ සිට තරමක් උස් හඬින් එසේ කියන ගුණසෝම කිරි බෝතල් ටික රැගෙන බයිසිකලයෙන් පිටව යයි. ඉන්පසු බීළ ගෙදරම මුසල නිහඬතාවක ගිලේ. මේ නිහඬතාව ඉඳහිට හෝ බිඳෙන්නේ වත්ත පහළ දිගේලි කොට ඇති දෙනුන් තිඳෙනා තරගයට මෙන් නගන හඬින් පමණි. රතු එළදෙන හඬ නගන්නේ පැටියා ඈතට ගොස් ඇති නිසා විය යුතුය.

ඒ හඬ ඇසුණ පසුව නම් ඇසිලින් නෝනාට නැගිට කුස්සිය පැත්තට යන්නට සිතෙයි. ඈ දොර විවරකොට වත්ත පහළ බලයි. රාත්තිරියේ වැටුණු වැස්සෙන් තෙත් බර වූ ගස්වලින් තවමත් දිය බිංදු වැටෙනවා ඇතැයි ඈට සිතේ. පොරවාගෙන ඇති චිත්ත රෙද්ද ඉවත් කරන්නට ඈට සිතෙන්නේ නැත. කිරි මුට්ටිය තවමත් ළිප උඩය. එය පැත්තකින් තබන ඇසිලින් නෝනා ළිපට යළි ගින්දර දමයි. ඒ ගිනි තැපීමටය. ටික වේලාවකින් වෙදමහත්තයාද පැමිණ ළිප ළඟ ඇන තියාගනියි. ගිනි තපින්නට ඔහුට ඉඩදී නැගිටින ඇසිලින් නෝනා මුට්ටියේ ඇති කිරි ටික ජෝගුවකට දමා සීනි ඇබිත්තක් දිය කරයි. වෙදමහත්තයා කිරි වීදුරුව බොන්නේ ළිප ළඟ ගිනි තපින ගමන්මය.

"වෙදමහත්තයට ගින්දර ළඟ හුඟක් වෙලා ඉන්ඩ හොඳ නැතෙ"

කිරි වීදුරුව බී අවසන් වුවද වෙදමහත්තයා තවදුරටත් ළිප ළඟින් නැගී නොසිටියහොත් ඇසිලින් නෝනා එවැන්නක් කියයි.

"බලාගෙන ගියාම ජීවිතේම ගින්දර තමයි ඇසිලින් නෝනෙ"

වෙදමහත්තයා මඳ සිනාවක්ද ඇතුව එවැන්නක් කියමින් නැගී සිටී. ගුණසෝම එළවළු ටිකක් අල පරිප්පු ටිකක් ගෙනැවිත් දෙයි. ඉඳහිට සුප් එකකට අවශ්‍ය දේවල් ගෙනත් දෙයි. ඊයේ පෙරේදා හෝර්ලික්ස් බෝතලයක් ගෙනැවිත් දුන්නේය.

අඳුර වැටෙන විට මල් බුලත් පුටුව ළඟ වාඩිවී අඳුන ජීවම් කරන වෙදමහත්තයා ඉන්පසු ඇසිලින් නෝනාට කතා කරයි.

"බලාපංකෝ අංජනම් දේවි අදවත් පෙනී හිටීද කියල"

වෙදමහත්තයාගේ ඉල්ලීම පිට ඇසිලින් නෝනා අංජනම බලන්නට පටන් ගනී. එහෙත් පහන් සිල සෙලවෙනු පෙනෙනවා

Uploaded By Paba

මිසක අඳුනට වඩින අංජනම් දේවි කෙනෙක් හෝ හනුමන්තා කෙනෙක් නැත.

සිරිතක් වශයෙන් ඒ බෝ වූ පසු අංජනම් දේවි වඩිනවාදැයි බැලීමට දන් ඇසිලින් නෝනාට සිදුව ඇත. කල්ගත වන විට වෙදමහත්තයා නොකීවත් මිනින්නු විස්සක් තිහක් අඳුන දෙස බලා සිටින්නට ඈ පුරුද්දක් කරගත්තාය. තමා එසේ කරන විට වෙදමහත්තයා හිත යටින් කිසියම් සතුටක් ලබන්නේය යන සිතුවිල්ල ඒ වන විට ඇසිලින් නෝනාගේ සිතට ඇතුල්වී තිබිණි. දන් තමාගේත් වෙදමහත්තයාගේත් ලෝකය සැදී තිබෙන්නේ මේ අඳුන වටා නොවේදැයි ඇසිලින් නෝනාට සිතුණේ වරක් දෙවරක් නොවේ. එක් අතකට සියල්ල ඇත් වී යද්දී අල්ලාගෙන ජීවත්වීම සඳහා එවැන්නක් හෝ තිබීම කොයිතරම් දෙයක්දැයි ඈට සිතිණි.

ඔවුන්ගේ මේ ලෝකය මදකට හෝ චංචල වූයේ චිත්තරා ගෙදර එක්කර ගෙන එන්නට අදහසක් තිබෙන බව ගුණසෝම ප්‍රකාශ කළ මොහොතේය.

"අම්මටත් දන් මහන්සි වෙන්ඩ බෑ... ගෙදර වැඩ ටික කරගන්ඩ හරි කවුරු හරි ඉන්ඩ එපායැ... චිත්තරා මං ගැන හිතාගෙන මඟුල් යෝජනා තුන හතරකටම බෑ කිව්ව... මට මේක තාත්තට කියන්ඩ බෑ... අම්ම වෙලාවක් බලල කියන්ඩ"

ගුණසෝම සිටියේ කුස්සියේ එළිපත්ත මත ඉඳගෙනය. ඔහු මඩියොක්කා අල දෙක තුනක්ද එල්ලාගෙන කුස්සියට පැමිණියේ ඊට විනාඩි දෙක තුනකට පෙරය. ඔහු පළමුව ඇසිලින් නෝනාගෙන් තේ උගුරක් ඉල්ලුවේය. මේ අදහස ඇසිලින් නෝනාට කීවේ ඒ තේ උගුර බොන ගමන්ය.

"තාත්ත මොකට විරුද්ධ වෙනවද? තාත්ත දන් ඔව ගැන එච්චර දුරට හිතන්නෙ නෑ..."

ඇසිලින් නෝනාගේ පිළිතුර නිසා ගුණසෝමගේ සිතෙහි සතුටක් ඇති වුණේ නැත. ඇගේ හඬෙහි පමණක් නොව වචනවලද තිබුණේ කලකිරීමක් වැනි හැඟීමක් යැයි තේරුම් ගැනීමට ඔහුට අපහසු වූයේ නැත. එහෙත් ඒ බැව් නොපෙන්වූ ඔහු "අම්ම කෝකටත් තාත්තට කියල බලන්ඩකෝ" යනුවෙන් පවසා ගෙයින් පිටව ගියේය.

දවල් කෑම කන අතරේ කල්යල් බලා ඇසිලින් නෝනා මේ ආරංචිය වෙදමහත්තයාට කීවේය. බත් කෑම නතර නොකළ ඔහු



බත් පිඟාන දෙස බලාගෙන සිටියා මිස හිස ඔසවා ඇසිලින් නෝනා දෙස බැලුවේ නැත. කතාවක් බහක් නැතුව බත් කටවල් කෑ අවක්ම ගිල දමූ නමුත් උත්තරයක් දෙන පාටක් පෙණුනේ නැත.

"අපි මොකට විරුද්ධ වෙනවද ඇසිලින් නෝනෙ?"

අන්තිමේදී පුටුවෙන් නැගිටිමින් වෙදමහත්තයා කීවේය. "මට මොකද බං?" යනුවෙන් නොකියා "අපි මොකට විරුද්ධ වෙනවද?" යනුවෙන් පිළිතුරක් දීම පිළිබඳව ඇසිලින් නෝනා සතුටට පත් විය. "මම මොකට විරුද්ධ වෙනවද?" යනුවෙන් නොව "අපි මොකට විරුද්ධ වෙනවද?" යනුවෙන් තමාවත් ඈඳා ගනිමින් පිළිතුරක් දීම නිසා ඒ සතුට තවත් වැඩිවෙමින් ඇගේ සිතට ඇතුළු විය.

ගුණසෝම, චිත්තරාව ගෙදරට කැඳවාගෙන ආවේ මේ කතාබහ ඇති වී දවස් දහයකට දොළහකට පසුවය. වෙදමහත්තයා කිසිදු අමුත්තක් නොමැති ආකාරයට හැසිරුණු නමුත් ඔහුගේ සිතේ මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙන බව ඇසිලින් නෝනා ඉවෙන් මෙන් දනගත්තාය.

"ගුණසෝමගෙන් අහපං කසාද බැන්දද කියල"

ඇසිලින් නෝනා කුස්සියේ තනිවූ මොහොතක වෙදමහත්තයා ඇසුවේය.

"මං ඇහුව... තාම නෑ කිව්ව... ලබන සුමානෙ බඳිනව කිව්ව..."

වෙදමහත්තයා ඒ ගැන වැඩි යමක් ඇසුවේ නැති නමුත් ඔහුගේ මුහුණේ ඉරියව් වෙනස් වූයේ එතරම් යහපත් අයුරින් නොවන බව ඇසිලින් නෝනා දනගත්තාය.

"මොන විහිළුද බං මේව... ලෝකෙ හිනස්සන්නෙ නැතුව ඉක්මණට කසාදෙ රෙජිස්ටර් කොරන්ඩ කියාපං"

වෙදමහත්තයා චිත්තරාට හෝ ගුණසෝමට වැඩිපුර මුහුණ දුන්නේ නැත. එහෙත් චිත්තරා කටපුරා "තාත්තා" යැයි කියමින් ඔහුට කතා කරන්නට කීපවිටක්ම උත්සාහ ගත්තාය. වෙදමහත්තයා ඔවුන්ගේ මුහුණ දෙස කෙළින් බැලුවේ ඊට සති දෙකකට පසුවය. ඒ කසාද බැන්ද දවසේය. කසාද බැඳ ගෙදරට ගොඩවුණු චිත්තරා පළමුව වෙදමහත්තයාටත් දෙවනුව ඇසිලින් නෝනාටත් දණගසා වැන්දාය.

WWW.SINHALAELIBRARY.COM 102
Uploaded By Paba

"චිත්තරා ආපු එක හොඳයි... අම්මටත් දැන් වැඩක් පොලක් කරන්ඩ බෑ..."

එදා සවස වෙදමහත්තයා චිත්තරාට කීවේය. එහෙත් ගමේ කතාව ගියේ චිත්තරාට දරුවෙක් උපදින්න සිටින නිසා ගුණසෝමට කසාද බඳින්නට සිදුවූ බවය. ඔය කතාව ඇසිලින් ඉක්මණින්ම ... නොනාට ආරංචි වූ නමුත් ඒ ගැන වෙදමහත්තයාට කියනු තබා ගුණසෝමගෙන්වත් අසන්නට ශක්තියක් ඇගේ සිතේ තිබුණේ නැත. පළමුව චිත්තරා පිළිබඳව එක්තරා අප්‍රසන්න බවක් ඇති වුවද ඇගේ කුස මෝරන විට ඇසිලින් නෝනා ඇට පැත්තකට වී සිටින්නට යැයි කියමින් යළිත් කුස්සියේ වැඩ කරන්නට පටන් ගත්තාය.

දිනෙන් දින ගෙවී යන විට වෙදමහත්තයාටද ඒ පිළිබඳව සැකයක් ඇති වූ නමුත් ඇසිලින් නෝනාගෙන්වත් ඒ ගැන නොවිමසා සිටින්නට සිතාගත්තේය.

"එන එන හැටියට මූණදෙනව මිසක වෙන කරන්ඩ දෙයක් නෑ ඇසිලින් නෝනෙ..."

එක දවසක රාත්තිරියේ වෙදමහත්තයා කාටත් නොඇසෙන සේ ඇසිලින් නෝනාට කීවේය.

ජිනසෝම හදිසියෙන් ගෙදර ආවේ මේ කාරණාව දැනගෙන නොවේ. ලයිට් ඇදීම සඳහා සෙනසුරාදා විදුලිබල මණ්ඩලයෙන් පැමිණෙන නිසා ඊට පෙර සළකුණු කර දෙන තැන්වලින් කණු සිටවන්නට වළවල් කපා තැබීම කළ යුතු වූ හෙයිනි.

උදරය ඒ තරම් ඉදිරියට නෙරා නොතිබූ නමුත් චිත්තරා ගැබ්ගෙන සිටින බව දැනගැනීමට ජිනසෝමට එතරම් අපහසු වූයේ නැත. ඔහු පළමු බැල්මෙන්ම ඒ බැව් තේරුම් ගත්තේය. ඔහු කිසිත් කතා නොකර කාමරයට ගිය නමුත් එය චිත්තරාලාගේ කාමරය බැව් තේරුම්ගත් සැණින් ආපසු පිටතට විත් බෑග් එක සාලයේ පුටුවක උඩට විසිකොට කුස්සියට ගොස් පුටුව මත ඉඳගත්තේය.

මිදුල අතුගාමින් සිටි චිත්තරා හිඟැස්මට පන්ව කාමරයට ගොස් සැඟවුණාය. ඇසිලින් නෝනා කුස්සියට ආවේ මොකක්දෝ අමුතු සද්දයක් ඇසුණු හෙයිනි. ජිනසෝම දුටු සැණින් ඇසිලින් නෝනා ... තැති ගත්තාය.



"මොකද්ද අම්මෙ මේකෙ තේරුම? මං ආවේ ගෙදරට ලයිට් ගන්ඩ... මං මේ මොකක්වත් දන්නෙ නෑ..."

"කෑගහන්ඩ එපා..."

ඇසිලින් නෝනාට කියාගත හැකි වූයේ එපමණයි.

"ළමයෙක් හම්බවෙන්ඩත් හේද ඉන්නෙ..."

ජිනසෝම ඒ ටික ඇසුවේ ඇසිලින් නෝනාට පමණක් ඇසෙන ලෙසිනි. එහෙත් ඔහුගේ මුහුණේ තිබුණ කෝපය නම් දෙගුණ තෙගුණ වී තිබිණි.

"එක අතකට මං තමයි මෝඩය... දැන් ලබන මාසෙ අර මිනිස්සු එනව.. කිව්ව"

ජිනසෝම මේ සියල්ල කීවේ පහත් හඬකින් වුවද "අම්මලත් මේවට වගකියන්ඩ ඕනෑ..." යන්න ඔහුගෙන් පිටවූයේ බලාපොරොත්තු නොවූ තරම් වේගවත් ලෙසය. වෙදමහත්තයා කාමරයේ සිට කුස්සියට ආවේ ඒ හඬ ඔස්සේය. ඔහුගේ මුහුණද හොඳටෝම අඳුරු වී ඇති බැව් ඇසිලින් නෝනාට පෙණිනි.

"මේ ගෙදර සිද්ධවෙන කිසිම දේකට වගකියන්ඩ අපට ඕනෑකමක් නෑ... කුසුමලතා පැනල ගියා... ගුණසෝම ගෑනියෙක් ගෙනාව... උඹටත් ඕනෑනං ගෙනෙං"

වෙදමහත්තයාගේ හඬ ඉදිරියේ ජිනසෝමගේ හඬ බාල වී යටපත් වී ගිය බව ඇත්තය. එහෙත් අප්‍රසන්න හැඟීම් හැම තැනින්ම මතුවෙන්නට පටන් ගත්තේය. මේ වෙලාවේ ගුණසෝම නොසිටීම ගැන ඇසිලින් නෝනා සිතින් දෙවියන්ට පින් දුන්නාය.

"අඩුගානෙ අර මිනිස්සු ඇවිල්ල යන කල්වත් ඉන්ඩ බැරි වුණානෙ..."

ජිනසෝම කීවේ බිඳුණු හඬකිනි. වෙදමහත්තයාගේ හිතට ආත්මානුකම්පාව සමගම දරාගත නොහැකි වේගයක්ද ඇතුළු වූයේ ජිනසෝමගේ ඒ කතාවත් සමගය.

"මට ඔය කවුරුත් ලොකු නෑ... මට ඕවට උත්තර දෙන්ඩ ඕනෑකමකුත් නෑ... මේ ගෙදර මං නාම කාටවත් ලියලත් නෑ... ගුණසෝම ගෑනියෙක් ගෙනාපු එක නෙමෙයි හෙට අනිද්දා කුසුමලතා ළමයි දෙන්නත් එක්ක ඇවිත් නැවතුනත් මට ප්‍රශ්නයක් නෑ... මට ලයිට් ඕනෑත් නෑ..."



Uploaded By Paba

වෙදමහත්තයා කියාගෙන ගියේය. ඇසිලින් නෝනා හඬන්නට පටන් ගත්තාය.

"මට කිසිම ප්‍රශ්නයක් නෑ... මට දුක මේ ගැනි ගැන... පසුගිය කාලෙම ජිවිතෙ හිතේ ගින්දරට පිච්චි පිච්චී... උඹලට කවදාවත් අම්මල තාත්තලව තේරුම්ගන්ඩ බෑ..."

වෙදමහත්තයාගේ වචනත් සමග ඇසිලින් නෝනා මහ හයින් හඬන්නට පටන් ගත්තාය.

වෙදමහත්තයා කුස්සියෙන් පිටව ගොස් කාමරයේ ඇඳමත ඇලවුණේය. ජිනසෝම ඉස්තෝප්පුවට ආවේය. ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට එනවිටත් ජිනසෝම ගෙදරින් පිටව සෑහෙන දුරක් ගොස් තිබිණි. කාමරයට පැමිණි ඇසිලින් නෝනා ඇඳ පාමුල වැතිර ඉකිගසන්නට වූවාය.

හැන්දෑ කළුවර වැටෙනතුරුම චිත්තරා කාමරයෙන් පිටතට පැමිණියේ නැත. ඇ පිටතට ආවේ ගුණසෝම ගෙදර පැමිණියාට පසුවය.

"අයියට කියන්ඩ ඒ ගොල්ලන්ට එන්ඩ කියන්ඩ කියල... අපි සුමානෙකට දෙකකට චිත්තරාලාගෙ ගෙදර යන්නං"

රාත්‍රියේ ගුණසෝම ඇසිලින් නෝනා සමග කීවේය. චිත්තරා සිටියේ සම්බෝලයක් අඹරමිනි. ඇ සම්බෝලය ඇඹරිල්ල නවත්වා ගුණසෝම දෙස බැලුවේ නැත. දිගටම ඒ වැඩේ කළාය.

"ඕව ගැන හිතන්ඩ එපා... උඹ දැන් මේ කෙල්ල ගැන හිතාපං"

ඇසිලින් නෝනා කීවේ එපමණකි. චිත්තරාගේ සිතු තුළ තිබූ මහා ගින්දර එක්වරම නිවී ගියේය. ගුණසෝමගේ සිත කෙතරම් සැහැල්ලු වී ද යත් ඔහු පුටුව මත ඉඳගත්තේය.

මේ කතාබහෙන් පසු ගුණසෝම අලුත් පණක් ලැබුණාක් මෙන් වැඩ කරන්නට පටන් ගත්තේය. ඔහු පහළ වත්තේ ළඳු පඳුරු කපා දමා කෙසෙල් පැල විසිපහක් තිහක් සිටවීය. බතල වැල් දෙසියක හමාරක පාත්තියක් දැම්මේය. අර්නෝලිසාලාගේ වත්ත පැත්තේ මායිමේ ගැලවුණු පැලඉණි සහ කම්බිය යළි සකස් කොට පොල් අතු අත්තිසිවලින් ආවරණයක් කෙළේය. වළං පිඟන් හත අටක්ම ගෙනැවිත් කුස්සියේ අඩුපාඩු සකස්කර දුන්නේය.



"තාත්තට කියන්ඩ ඕනෑ නෑ... කෙළිට ඉඳිබිට තෝර මාළු පෙත්තක් ගෙනත් දීපං..."

ඇසිලින් නෝනා කීවාය. චිත්තරාද හදිසියෙන් මහත් වී ඇත්තියක් මෙන් වැඩ කරන්නට වූවාය. සව් දොදොල් අච්චාරු වැනි කැවිලි පිළියෙළ කොට ගුණසෝම අතේ මාවත් මුදලාලිගේ කඩේට යැව්වාය.

"නිකම්ම ඉන්නෙ නැතුව ඔය කාලෙට වැඩක් කරන එකත් හොඳයි... එක අතකට"

ඇසිලින් නෝනාද එවැනි දේ කියමින් චිත්තරාගේ වැඩවලට උදව් පදව් වූයේ අපූර්ව ප්‍රීතියකිනි. චාර්ලිස්ගේ පවුලද දවස් දෙකතුනකට වරක්වත් දුව බලන්නට පැමිණියාය. තරමක කටකාර ගෑනියක වූ ඇ වෙදමහත්තයා සමගද හරි හරියට කතා කළාය.

× × × ×

මහරගම පුහුණුවෙන් පසු ජිනසෝමටත් රමණීටත් පත්වීම් ලැබුණේ කුරුණෑගල දිස්ත්‍රික්කයටය. ඔහු හදිසියේ ගෙදර පැමිණියේ ඒ බව කියන්නටය.

"දැන් උඹල කොයි කාලෙද කසාද බඳින්නෙ?"

ජිනසෝමගේ තොරතුරු අසා සිටි ඇසිලින් නෝනා අන්තිමේදී ඇසුවාය.

"රමණීලගෙ තාත්තලට ඔක්කොම ආරංචි වෙලා... අත්ත කසාද මිනිහෙක් එක්ක ගිය එකයි... මල්ලි දරුවෙක් හම්බවෙන්ඩ ඉන්න ගෑනියෙක් ගෙනාපු කතාවයි... තාත්තගෙ බීමයි... මේ ඔක්කොම ආරංචි කරගෙන..."

ජිනසෝම කීවේ හෙමින් සීරුවේ බිම බලාගෙනය. ඇසිලින් නෝනා කුස්සියේ එළිපත්ත මත ඉඳගෙන ඒවා අසා සිටියේ වත්ත පහළ බලාගෙනය.

"ගමේ කවුරුහරි එකෙක් කියන්ඩ ඇති"

"බොරුවකුත් නෙමෙයිනෙ.."

"කැවට බිව්වට උඹලගෙ තාත්ත නරක මිනිහෙක් නෙමෙයි. ජිනසෝම... ඒ මිනිස්සුන්ට අගයක් නැතුවට දාහකින් හොයා ගන්ඩ බැරි මිනිහෙක්"

WWW.SINHALAELIBRARY.COM 104
Uploaded By Paba

ඇසලින් නෝනා ඒ වචන තුන හතර පිට කෙළේ තරමක වේගයෙනි. ජිනසෝම නිහඬ වූයේ ඒ නිසාය.

"කියල වැඩකුත් නෑ... මේව කාටවත් තේරෙන්නෙ නෑ..."

ජිනසෝම එසේ කියා කුස්සියෙන් පිටව ඉස්තෝප්පුවට ගියේය. පුටුවක ඉඳගත් ඔහු හිස් බැල්මකින් යුක්තව ගුරු පාර දෙස බලා සිටියේය.

පිරිසියක් මත තැබූ තේ කෝප්පයක්ද රැගෙන චිත්තරා ඉස්තෝප්පුවට පැමිණියේ විනාඩි තුන හතරකට පසුවය. නොරාගිය කුසක් දරාගෙන ඇ පියවර තැබුවේ ඉතා සීරුවෙනි.

"අයියා තේ එකක් බොමු"

ජිනසෝම ඇගේ මුහුණ දෙස නොබලාම තේ එක ගත්තේය. එහෙත් දරුවෙක් ලැබෙන්නට සිටින ගැහැනියකගේ සිත රිදවීම යහපත් දෙයක් නොවේ යැයි ඊළඟ මොහොතේ ඔහුට සිතුණේය.

"කෝ ගුණසෝම?" යනුවෙන් ඇසුවේ ඒ නිසාය.

"තුඹුර පැත්තෙ ගියා... එන පුමානෙ ගොයම් කපනවනෙ"

ජිනසෝම තවත් මොනවා හෝ අසනු ඇතැයි බලාපොරොත්තු වෙන් චිත්තරා උලුවස්සට හේත්තු වී බලාගෙන සිටියාය. ඇසිලින් නෝනා ඉස්තෝප්පුවට ආවේ ඒ මොහොතේය.

තමාගෙන් වෙනත් කිසිම ප්‍රශ්නයක් අසන්නට ජිනසෝම සූදානම් නැති බව දනුණු හෙයින් චිත්තරා ආපසු කාමරයට ගියාය.

"තාත්ත මෙච්චර වෙලා ඇඳේ ඇලවෙලා ඉඳල මාටින්ගෙ කඩේ පැත්තෙ ගියා... පත්තරේ බලන්ඩ වෙන්ඩ ඇති... දැන් හොඳටෝම දුර්වලයි. මං හිතන්නෙ ඔය දවස් තුන හතරකින් ඒ පැත්තෙ ගියා..."

ඇසිලින් නෝනා ඒ ටික කීවේ නිහඬතාව බිඳින්නටම නොව වෙදමහත්තයා ගැන ජිනසෝම කිසිවක් ඇසුවේ නැති එක ඇගේ සිතේ පතුලටම කාවැදුණු නිසාය. එහෙත් ජිනසෝම වෙදමහත්තයා එනතුරු සිටියේ නැත.

"තාත්තට කියන්ඩ මට කුරුණෑගලට පත්වීමක් ලැබිල කියල වෙන මොකුත් කියන්ඩ එපා"



ජිනසෝම මිදුලට බැස්සේය. ඉන්පසු යන්නට ගියේය. ඇසිලින් නෝනා ඔහු නොපෙනී යනතුරු බලා සිටියේ නැත. ඊට පෙර කුස්සියට ගොස් හිරමණා කොටය මත වාඩි වී ඉගිගසන්නට පටන් ගත්තාය.

ජිනසෝමගේ කසාදයට වෙදමහත්තයා ප්‍රශ්නයක් වීම ඇසිලින් නෝනාට ලේසියෙන් දරාගත හැකි දෙයක් නොවිය. තමන්ගේ ඉකිගැසීම චිත්තරාට ඇසේ යැයි සිතුණ හෙයින් ඇ කැත්තත් රැගෙන වත්ත පහළට ගියාය.

වෙදමහත්තයා වත්ත පහළට එනතෙක්ම ඇසිලින් නෝනා දුටුවේ නැත. ඇ සිටියේ කෙහෙල් පඳුරුවල පරඬලා ඉවත් කරමිනි.

"ජිනසෝම ආවයි කියල සුබතේරිස්ගෙ කොලුව කිව්ව"

"කුරුණෑගලට පත්වීමක් ලැබිලලු... වැඩ තියෙනව කියල ආ පයින්ම ගියා..."

තමාගේ වචනවලින් වෙදමහත්තයාගේ සිත පැරෙන බව ඇසිලින් නෝනා හොඳින්ම දන සිටියාය. එහෙත් ඒ මොහොතේ කියන්නට වෙන කිසිම දෙයක් ඇගේ හිතට ආවේ නැත. වෙදමහත්තයා කතාවක් බහක් නැතුව ආපසු යනු ඇ බලා සිටියාය. කෙහෙල් පරඬලා කැපිල්ල නවතා දැමූ ඇසිලින් නෝනා ඔහු පසුපසින්ම ගෙට ගියාය. වෙදමහත්තයා ඒ වන විටත් ලණු ඇඳමත ඇල වී සිටියේය. ඔහු සිටියේ දෑස් පියාගෙනය.

"වෙදමහත්තයට තේ එකක් වක්කරල දෙන්ඩද?"

ටික වේලාවක් ඔහු දෙස බලා සිටි ඇසිලින් නෝනා ඇසුවාය.

වෙදමහත්තයා "හ්ම්" යනුවෙන් පිළිතුරු දුන්නේය.

වෙදමහත්තයා එවැනි කෙටි පිළිතුරු දෙන්නේ සිත වංචල වූ අවස්ථාවලය. එවැනි අවස්ථාවලදී ඇසිලින් නෝනා කරන්නේ ඔහුට එසේ සිටින්නට ඉඩදී පැත්තකට වී නිහඬව සිටින එකය. ඊනැවට වඩා කතා කරන්නට ගියහොත් වෙද මහත්තයාට කේන්ති යන බව ඇ අත්දැකීමෙන් දනී. කෙසේ වුවද එදා වටින් ගොඩින් කළුවර වැටෙන තෙක්ම ඔහුගේ නිහඬ බව එසේම තිබිණි. කළුවර වැටුණ පසු වෙදමහත්තයා ලණු ඇඳෙන් නැගිට්ටේය. ඇසිලින් නෝනාගෙන් රුපියල් දහයක් ඉල්ලා ගත්තේය. ඇසිලින් නෝනා එය දුන්නේ චිත්තරාගෙන් ඉල්ලාගෙනය.

WWW.SINHALAELIBRARY.COM 105
Uploaded By Paba

"චිත්තරාගෙ තත්වෙත් දන් විශ්වාස නෑ... බීල අසිහියෙන් එන්ඩ එපා"

ඇසිලින් නෝනාට පිළිතුරක් නොදුන් වෙදමහත්තයා මිදුලට බැස්සේය. චිත්තරා සාලයට වී බලා සිටියාය.

"ජිනසෝම ආ පයින් ගිය එක ගැන තාත්තගෙ හිතට හරි නෑ... ඒ වෙලාවෙ ඉඳල කල්පනා කර කර හිටියෙ... යන්ඩ ඇත්තෙ අරක්කු ටිකක් බොන්ඩ වෙන්ඩ ඇති. මගෙන් ඔය කාලෙකින් මුදලක් ඉල්ලුව..."

ඇසිලින් නෝනා චිත්තරාට කීවාය. ඇගේ සිතේද ජිනසෝම ගැන කලකිරීමක් ඇති බැව් චිත්තරාට නොදැනුණා නොවේ.

"තාත්තට බොන්ඩ හොඳයෑ... පපුවෙ අමාරුවත් තියාගෙන..."

"සල්ලි ඉල්ලපු විදියට මගෙ පපුව හෝස් ගාල පත්තු වුණා... මම නෑ... බෑ... කියන්නෙ කොහොමද?"

ඇසිලින් නෝනා චීත්ත පොටින් දෑස් පිසදමමින් කුස්සියට ගියාය.

"අයියට තිබුණෙ තාත්ත එනකං ඉඳල යන්ඩ"

ගුණසෝම ඒ සිද්ධිය ගැන කීවේ එපමණකි. මේවා ගැන කිසිම වචනයක් පිට නොකර තමන්ගේ පාඩුවේ ඉන්නැයි ඔහු චිත්තරාටද අවවාදයක් දුන්නේය.

ගෙයින් පිටව ගිය වෙදමහත්තයා වෙනදාට වඩා බොහෝ වේලාසනින් ගෙදර ආවේය. චිත්තරා ගැන ඇසිලින් නෝනා කියූ කාරණාව ඔහුගේ සිතට තදින්ම කාවැදී තිබිණි.

වෙදමහත්තයා ගෙට ගොඩවෙන විට ඇසිලින් නෝනා සිටියේ ඉස්තෝප්පුවේ පුටුවක් උඩට වී අන්ධකාරය දෙස බලාගෙනය.

"මොකද ඇසිලින් නෝනෙ කළුවරේ...?"

වෙදමහත්තයා එසේ අසන තුරුම ඔහුගේ පැමිණීම ඇට දැනුණේ නැත. තමා බලාපොරොත්තු වූවාටත් වඩා වේලාසනින් ගෙදර ඒම ගැන විමතියක් මෙන්ම සතුටක්ද මතු වෙමින් තිබිණි.

"මෙන්න මේ ටික චිත්තරාට දීපං"

"මොනවද?"



"නමිනං ගෙඩි ටිකක්... ගුණපාල ළමයගෙ මිදුලෙ ගහේ පිරිල..."

හබරල කොළයක ඔතා තිබූ නමිනං ගෙඩි කිහිපය ඇසිලින් නෝනා අතට දෙමින් වෙදමහත්තයා ලණු ඇඳෙහි ඇලවුණේය.

"කාලම බුදිය ගත්තනං"

ඇසිලින් නෝනා එසේ කියූ නමුත් ඔහුගෙන් වචනයක් පිටවූයේ නැත.

ජිනසෝමගේ සිද්ධිය කෙමෙන් අමතකව ගියේය. චිත්තරාගේ තත්වය පිළිබඳව ඇසිලින් නෝනාගේ මෙන්ම වෙදමහත්තයාගේ ද සැලකිල්ල යොමු වන්නට විය. එහෙත් දවස් දහයකට දොළහකට පසු ජිනසෝමගෙන් ලැබුණු ලියුම් කඩදාසිය නිසා ඇතිවෙමින් තිබූ සැහැල්ලුව යළිත් නැතිව ගොස් වෙදමහත්තයා ඉස්තෝප්පුවේ ලණු ඇඳට නොව කාමරයේ ඇඳ මත කොට්ටකර දැම්මේය.

"රමණීලාගේ ගෙදරින් කැමැත්ත ගන්ඩ බැරි වුණා... අපේ ගෙදර තොරතුරු ගැන ඒ කට්ටිය හොඳටම කලකිරිලා... කැමැත්ත ගන්ඩ හිටියොත් මේක කෙරෙන්නෙ නැහැ. අපි රමණීලාගේ ගෙදරට කියන්නෙත් නැතුව කසාද බැන්දා... දැනට අපි ඉන්නේ කුලියට ගත්තු පුංචි කාමරයක... වෙනම ගෙයක් හොයාගන්ඩ බලනවා... අම්මලා තාත්තලා දරුවන් ගැන මීට වඩා හිතන්ඩ තිබුණා... දරුවො ලොකු මහත් වෙනකොට තමන්ගෙ ජීවිත වෙනස් කරගන්ඩ දෙමාපියො වගබලාගන්ඩ ඕනෑ... අපේ ගෙදර එහෙම වුණේ නැහැ... අපට අද මෙහෙම වුණේ ඒ හින්දා..."

ජිනසෝම තව තවත් දේ ලියා තිබිණි. ලියුම කියවන අතරේ වෙදමහත්තයාගේ මුහුණ හොඳටම අඳුරු වනු ඇසිලින් නෝනාට පෙනිණි. කිසිවක් නොකී වෙදමහත්තයා කාමරයට ගියේ ලියුම පුටුව උඩට වීසි කරමිනි.

ඇසිලින් නෝනා ලියුම කියවා ගත්තේ චිත්තරා ලවාය. තමාගේ සිතද විශාල වේගයකින් අප්‍රාණික වී ගිය නමුත් චිත්තරා ඉදිරියේ කිසිවක් නොකියා සිටින්නට ඇසිලින් නෝනා වගබලා ගත්තාය. දවල්ට කන්නට ගෙදර පැමිණි ගුණසෝම සමග චිත්තරා ලියුමේ තිබුණු දේවල් කීවේ ඉකිගසමිනි.

"උාට පිස්සු... චිත්තරා ඔව ගැන හිතල හිත නරක් කරගන්ඩ එපා"

WWW.SINHALAELIBRARY.COM 106.
Uploaded By Paba

චිත්තරාට එසේ කී නමුත් "අම්ම මොන එහෙකටද ඒ ලියුම චිත්තරාට පෙන්නුවෙ" යැයි ප්‍රශ්න කෙළේ තරමක් උස් හඬිනි.

"මම දන්නෙ නෑ පුතේ.. මොනව තිබුණද කියල.. අකුරු දන්නව නං මං ඔය කාටවත් ඕක පෙන්නන්නෙ නෑ.. මං චිත්තරාට කාරණා තේරුම් කරල දෙන්නං..."

"දන් මොනව තේරුම් කරන්වද? චිත්තරාගෙ හිත ගැස්සෙන්ට හොඳ වේලාවක් නෙමෙයිනෙ මේක... අම්මත් අම්ම කෙනෙක් වෙන්ට හිටපු කාලයක් තිබුණනෙ..."

ගුණසෝම නොදනුවත්ම වාගේ ඔහුගේ හඬ වේගවත් වී ඇත. කාමරයේ සිටි වෙදමහත්තයාට මේ කතාබහේ අවසාන කොටස හොඳින් ඇසිණි. නිසැකවම ඒ වචන කිහිපය කිණිසි පාරවල් මෙන් ඇසිලින් නෝනාගේ පපුව හරහා යන්නට ඇතැයි ඔහුට සිතිණි. කුස්සියට ගොස් මේ කතාබහට මැදිහත්වී ඇසිලින් නෝනා වෙනුවෙන් ගුණසෝමට තරවටු කරන්නට වෙදමහත්තයාට සිතුණු නමුදු ඉතා අපහසුවෙන් ඔහු ඒ සිතුවිල්ල මැඩ පවත්වා ගත්තේය. යම් හෙයකින් ගුණසෝම තමාටත් වචනයක් කිවහොත් සියල්ල යළි හරිගැස්සිය නොහැකි තත්ත්වයකට පත්වෙනු ඇත. අනෙක් අතට චිත්තරා සිටින තත්ත්වය ගැන පළමුව සිතිය යුතුය. වෙදමහත්තයා සියලු හැඟීම් නිහඬවම දරාගත්තේය.

චිත්තරා කාමරයේ සිට ඉකිගසන හඬ ද ගුණසෝම හෙමින් කතා කරන හඬද ඇසෙන්නට පටන් ගත්තේ මේ අතර වාරයේය. ගුණසෝම කුස්සියේ සිට ඔවුන්ගේ කාමරයට යන්නට ඇතැයි වෙදමහත්තයා තීරණය කෙළේය. ඔහු කාමරයෙන් පිටව කුස්සියට ගියේ ඒ බැව් හොඳින්ම දනාගත් පසුවය.

ඇසිලින් නෝනා හිරමණ කොටය මත හිඳ දණහිස් මත මුහුණ ඔබාගෙන ඉකිගසමින් සිටිනු දුටු වෙදමහත්තයාගේ මුහුණ හොඳටම කළු වී ගියේය. ඇගේ උරහිස් ගැස්සෙන අයුරු ඔහු බලා සිටියේය. මුළු ගෙදරම අප්‍රසන්න වූ නිහඬතාවක ගිලී තිබිණි. ඒ නිහඬතාව තවත් අප්‍රසන්න කරමින් ඇසිලින් නෝනා සහ චිත්තරා ඉකිබිඳින හඬවල් ඇසෙන්නට විය.

වෙදමහත්තයා ඉස්තෝප්පුවට ගියේය. ලණු ඇඳෙහි ටික වේලාවක් ඇලවී සිටි ඔහු මිදුලට බැස්සේය.

x x x x

WWW.SINHALAELIBRARY.COM 107



වෙදමහත්තයා ආපසු එන විට රෑබෝවී තිබිණි. ඔහු ගෙට ගොඩවෙන විට ඇසිලින් නෝනා සිටියේ ඉස්තෝප්පුවේ පුටුවක් මත ඉඳගෙනය. තමා එනතෙක් ඇ ඉස්තෝප්පුවට වී බලා සිටින්නට ඇතැයි සිතුණ නමුත් ඔහු ඒ ගැන කිසිවක් කීවේ නැත. ඒ වෙනුවට ගෙදර කළුවරේ නැවීම ගැන දොස් පැවරුවේය. චිත්තරාගේ කාමරයෙන් පමණක් ලාම්පු කුප්පි එළියක් විහිදෙමින් තිබිණි. සාලය මෙන්ම කුස්සියද තිබුණේ කළුවරේය.

"මොකද මේ ලාම්පුවක්වත් පත්තු කරන්නෙ නැත්තෙ...? ගෙදර කළුවරේ තියන්ට තරම් දෙයක් වෙලා නැනෙ..."

වෙදමහත්තයා කීවේ ඇසිලින් නෝනාට පමණක් නොව චිත්තරාටද ඇසෙන පරිදිය. ඉන්පසු ඔහු කාමරයට ගියේය. ලාම්පු කුප්පියක්ද පත්තු කරගෙන ඇසිලින් නෝනා කාමරයට පැමිණියේ ටික වේලාවකට පසුවය. කොට්ටය ඇඳ විට්ටම මත තබාගෙන වෙදමහත්තයා ඇලවී සිටියේය. කාමරය පුරාම හැළි අරක්කු ගඳ පැතිරී තිබිණි.

"වෙදමහත්තයට වටින්නෙ නෑ මේ වෙලාවෙ ගිහින් බීල එන්ට"

ලාම්පු කුප්පිය ජනෙල් කණ්ඩිය මතින් තැබූ ඇසිලින් නෝනා කීවාය. ඉන්පසු ඇ ඇඳ පහළින් ඉඳ ගත්තාය.

"මගෙ බීම නම් මේ ගෙදර ප්‍රශ්නය මට ඒක නවත්තනන්ට පුළුවන්... ඇසිලින් නෝනා දන්නවනෙ මම දන් ඉස්සර වාගෙ බොන්නෙ නැති විත්තිය... හිත සැනසෙන්ට වෙන මොකක්වත් නැත්නම් මිනිහෙක් අඩුගානෙ ටිකක් බොන්ඩවත් ඕනෑ.."

"ඕක පිරිමින්ට දෙන්ට පුළුවන් ලේසිම උත්තරයක්නෙ"

ඇසිලින් නෝනා එවැනි උත්තරයක් දුන්නේ නැත. එවැන්නක් ඇගේ සිතට ආවේද නැත. අසාමාන්‍ය අන්ධකාරයක මුළුගෙදරම ගිලී ඇතැයි ඇට දැනිණි.

"මොකක් වෙලාද මන්ද මේ ගෙදෙට්ට"

ඇසිලින් නෝනා එසේ කීවිට වෙදමහත්තයා හිස ඔසවා කොට්ටය තව ටිකක් උඩට ගෙන ඇඳ විට්ටමට හේත්තු කොට යළි හිස තබා ගත්තේය.

"කසාද ජීවිතේ කියන්නෙ දරුවො විතරක්ම නෙමෙයි. ඒක ජීවිතෙන් කැල්ලක් විතරයි ඇසිලින් නෝනො... උන් හිතන්නෙත්

එහෙම තමයි.. දෙමව්පියෝ කියන්නෙත් ජීවිතෙත් පුංචි කෑල්ලක් විතරයි කියල''

''වෙදමහත්තය දොඩවන්ඩ පටන් ගන්නෙ නැතුව නිදාගන්ඩ...''

''මං කීල ඉන්න එක ඇත්ත.. ඒත් මේක දෙඩවිල්ලක් නෙමෙයි... හැබැයි තමන් දෙමාපියන් බවට පත්වෙච්චි වෙලාවක තමයි උන්ට තේරෙන්නෙ දරුවො කියන්නෙත් දෙමාපියන්ගෙ ජීවිතෙත් කොච්චර ලොකු කෑල්ලක්ද කියල... දරුවන්ගෙ ලෝකෙ දෙමාපියන්ට තියෙන ඉඩකඩ වගේ දාස් ගුණයක ඉඩක් තියෙනව දෙමාපියන්ගෙ ලෝකෙ දරුවන්ට... දුන් මය කාටවත් ඕක නොතේරුණාට දෙමාපියො වෙච්ච දවසට කාට කාටත් ඒක තේරෙනව...''

වෙදමහත්තයා දිගටම කියවන්නට පටන් ගත්තේය.

''දෙමාපියො වෙච්ච දවසකට උන්ටත් තේරෙයි දෙමව්පියො දරුවො ගැන කොච්චර හිතනවද කියල''

ඔහු හත් අට වතාවක්ම ඒ වචන ටික පිට කෙළේය.

''අනිත් අතට බලාපං... අපි ගමේ මඟුල් කීයකට ගිහිල්ල තියෙනවද? දරුවො තුන්දෙනෙක් ඉඳලත් මඟුලක් කන්ඩ බැරි වුණානෙ''

''ඕව ගැන දුන් හිතල වැඩක් නෑ වෙදමහත්තයො...''

''උඹ කියන එක ඇත්ත... දුන් හිතල වැඩක් නෑ... හැබැයි එකම ප්‍රශ්නෙ ඇසිලින් නෝනෙ අපට හිතන්ඩ කිසිම දෙයක් ඉතුරුවෙලා නැති එක...''

වෙදමහත්තයා එසේ කියා නැවතත් ටික වෙලාවක් නිහඬ බව රැක්කේය. ඇසිලින් නෝනා සිතුවේ ඔහුට නින්ද ගියාවත්දැයි කියාය. ඇත්තටම ඔහුගේ ඇස් පියවී තිබිණි.

''මට හිතට අමාරු කුසුමලතා ගැන... අපි ඒකි ගැන හොයල බැලුවෙත් නෑ... පැනල ගිය එක ඇත්ත... ඊට පස්සේ අපිත් ඒකිව අත්ඇරියා... සමහර වෙලාවට ඒකි අපි හිතාගෙන ඉන්නවට වඩා දුක් විඳිනව ඇති. කසාද මිනිස්සුන් එක්ක ගිය හුඟක් ගෑණුන්ට දුක් විඳින්ඩ වෙනව ඇසිලින් නෝනෙ... මොනව වුණත් ජීවිතේ අස්සක මුල්ලක හරි පරණ ගැති ඉන්නවනෙ... උඹට පුළුවන් නම් කුසුමලතා ගැන ටිකක් හොයල බලපං...''



නැවත මඳ වේලාවක් නිහඬව සිටි වෙදමහත්තයා ''වෙලාවකට හිතෙනව බං කවුරු හරි අපට කොඩිවිනයක් වත් කරලද කියල'' යනුවෙන් කීවේය.

තවත් මොන මොනවාදෝ කියමින් සිටි ඔහුට නින්ද ගියේ කොයි මොහොතදැයි ඇසිලින් නෝනාටද දැනුණේ නැත. ඔහු නින්දට ගොස් ඇති බව ඈ දැන ගත්තේ පසුව ඇසුණු ගොරවන හඬිනි.

''තාත්ත කෑවෙ නෑ නේද අම්මෙ... මං සම්බෝලයක් හැදුව... දවල් මාළු පිනි ටිකකුත් ඇති''

චිත්තරාගේ හඬ සාලයෙන් ඇසුණේය. ඇසිලින් නෝනා සාලයට පැමිණියාය.

''තාත්ත දුන් කන එකක් නෑ... ටිකක් වැඩිපුර බීපු දවසට ඔහොම තමයි. චිත්තරා කාල නිදාගන්ඩ... ගුණසෝම තාම ආවෙ නෑ නේද?''

''නෑ... අපේ ගෙවල් පැත්තෙත් යනව කිව්ව''

''රෑ දෙගොඩහරි වෙන්නෙ නැතුව ගෙදර එන්ඩ එපායැ...''

චිත්තරා මෙන්ම ඇසිලින් නෝනාද කතාබහ කළේ හැන්දෑවේ කිසි දෙයක් නොවූ අයුරිනි. කුස්සියේ මෙන්ම සාලයේද ලාම්පු කුප්පි දල්වා ඇත. චිත්තරා ඒවා පත්තු කරන්නට ඇත. ඇගේ කුස සාමාන්‍ය ප්‍රමාණයටත් වඩා නෙරා ඇතැයි ඇසිලින් නෝනාට සිතිණි.

''චිත්තරා කාල බුදියගන්ඩ. ගුණසෝම ආපුවාම මං කන්ඩ දීල කුස්සිය අස් කරන්නං''

චිත්තරා බිම බලාගෙන කාමරයට ගියාය. ඈ කාමරයට යනතෙක් බලා සිටි ඇසිලින් නෝනා කුස්සියට ගියාය.

× × × ×

WWW.SINHALAELIBRARY.COM 108

Uploaded By Paba

# 18

වෙද මහත්තයාට අංශබාගය වැළඳුනේ නිසිපරිදි ආහාර නොගැනීමත් දිනපතාම වාගේ හැළි අරක්කු බීමත් නිසා යැයි ජිනසෝම, සිරිදාස සමග කියනු ඇසිලින් නෝනාටද ඇසිණි. එහෙත් ඒවා නිවැරදි කරන්නට ඇසිලින් නෝනා උත්සාහ ගත්තේ නැත.

"දන්වත් අම්මෙ මාළු කැල්ලක් බිත්තරයක් තාත්තට දෙන්ඩ"

ජිනසෝම, ඇසිලින් නෝනා සමග දෙතුන් වතාවක්ම කීවේය. එහෙත් වෙදමහත්තයාගේ හිතේ තිබුණේ ද තිබෙන්නේද වෙනම සිතුවිලි බව ඈ හොඳින්ම දනී.

"කෝ උඹේ නෝන මහත්තය ආවෙ නැද්ද?"

කාමරයට පිවිසි ජිනසෝමගෙන් වෙදමහත්තයා දෙතුන් විටක්ම ඇසුවේය.

"එයාට බබෙක් හම්බවෙන්ඩ... මෙච්චර දුරක් බස්වල යන්ඩ එන්ඩ හොඳ නෑ..."

ජිනසෝමගේ පිළිතුර එය විය. එහෙත් වෙදමහත්තයා ඒ පිළිතුරෙන් තෘප්තිමත් නොවූ බව ඔහුගේ මුහුණෙහි ඇඳි යනු ඇසිලින් නෝනා දුටුවේය. රමණී සිටින්නේ තනියම යැයි කියමින් ජිනසෝම එදා සවසම කුරුණෑගල ගියේය. යෑමට පෙර ඔහු ඇසිලින් නෝනා අත රුපියල් සියයේ නෝට්ටු දෙකක් තැබුවේය. ඇසිලින් නෝනා ඒ මුදල් ගත් නමුත් ජිනසෝමගේ මුහුණ බැලුවේ නැත.



"රමණී ළඟ කවුරු හරි තවත්තල මම දවස් තුන හතරකින් එන්නම්... දැනට ඔය බටගොල්ලෙ වෙදමහත්තයාගෙ බෙහෙත් කරගෙන යන්ඩ... වෙනසක් නොවුණොත් අපි විශේෂඥ දොස්තර කෙනෙකුට පෙන්නමු"

ජිනසෝම කීවේය. සිරිදාසද හිස වනා එය අනුමත කෙළේය. අළුවාට කිරි දෙමින් සිට නිසා චිත්තරා පිටතට පැමිණියේ නැත. ජිනසෝම බෙහෙත් වගයක් සොයන්නට පිටියේ ගෙදර ගොසිනි. නැවතත් කාමරයට එබී බැලූ ජිනසෝම "තාත්තා නිදි" යැයි කියමින් මිදුලට බැස්සේය. ජිනසෝම පිටව ගිය නමුත් සිරිදාස තවත් වේලාවක් රැඳුණේය. ඔහු නැවතත් කාමරයට ගොස් වෙදමහත්තයාගේ ඇඳ අසළ තබා තිබුණු පුටුවෙහි ඉඳගත්තේය. මෙතෙක් වේලාවක් ඇස් පියාගෙන සිටි වෙදමහත්තයා ඇස් ඇරියේය.

"මං හිතුව සිරිදාස යන්ඩ ඇති කියල..."

"නෑ... තව ටිකක් වෙලා ඉන්නව"

"අංශබාගෙ කියන්නෙ හොඳ කරන්ඩ පුළුවන් ලෙඩක් නෙමෙයි"

"නෑ... බටගොල්ලෙ වෙදමහත්තයා ඔය ලෙඩේට බොහොම හොඳයි..."

"සමහරවිට මම ඒ දවස්වල කරපු ආරස්සාවල බලේ දැන් බිඳිලත් ඇති... හැමදාම ඔය ආරස්සාවල් එහෙම තියෙන්නෙ නෑ..."

"වෙදමහත්තයගෙ ආරස්සාවල් එහෙම ලේසියෙන් නැති වෙන්නෙ නෑ..."

සිරිදාසට මේ ආරස්සාවල් ගැන දැනුවත්කමක් නැත. එහෙත් වෙදමහත්තයාගේ සිත සනසන්නට ඔහු බොහෝ දේ කියමින් හවස් වනතුරුම සිටියේය.

"සිරිදාස එහෙම ඇවිල්ල වෙදමහත්තයත් එක්ක කතාකර කර ඉන්න එක ලොකු දෙයක්. නැත්නම් වෙදමහත්තයාගෙ වැඩේ කල්පනා කරන එක..."

සිරිදාස ආපසු යෑම සඳහා මිදුලට බසින විට ඇසිලින් නෝනා කීවාය.

"මං පුළු පුළුවන් වෙලාවට එන්නම්කො" යැයි කියමින් ඔහු මිදුලට බැස්සේය. ඇසිලින් නෝනා ඔහු බොහෝදුරක් යනතෙක්



Uploaded By Paba

බලා සිටියාය. මේ වෙලාවේ හැටියට සිරිදාස කොයිතරම් හයියක් දැයි ඇට සිතිණි.

රෝගීව ඇඳට වැටුණු පසු වෙදමහත්තයාගේ එකම සගයාය වුණේ ඇසිලින් නෝනා ඔහු අසලින්ම සිටීමය. ඈ පෙනෙන්නට නොසිටියොත් "ඇසිලින් නෝනේ" යනුවෙන් කතා කරයි. දෙතුන් විටක් එසේ අඬ ගැසීමට සිදුවුවහොත් ඊළඟ වතාවේ එය පිටවන්නේ කේන්තියෙන් කරන්නා වූ කෑගැසීමක් ලෙසිනි. මේ බැව් දන්නා ඇසිලින් නෝනා මොන වැඩක නියැලී සිටියද වෙදමහත්තයා කතා කරන විට කාමරයට දුවයි. චිත්තරා පොඩි දරුවාගේ කටයුතුවලට සිර වී සිටින නිසා වෙදමහත්තයාගේ වැඩ මෙන්ම කුස්සියේ වැඩද කරන්නට සිදු වී තිබෙන්නේ ඇසිලින් නෝනාටය. චිත්තරාලගේ අම්මා නිතර නිතර එන එක ගැන වෙදමහත්තයාගේ එතරම් මනාපයක් නැත. නමුත් ඔහු කිසිවක් කියන්නට ගියේ ද නැත.

"ඇසිලින් නෝනා මට හොඳටම විශ්වාසයි අපට කවුරු හරි කොඩිවිනයක් කරල... උඹට පුළුවන්නම් අංජනම බලල තොරතුරක් ගනිං... එහෙම වුණොත් තාඹිරිත්තෙ ගුරුන්නාසෙ ලව්වා කපාගන්ඩ පුළුවන්..."

වෙදමහත්තයා කීපවිටක්ම කොඩිවින කතාව කීවේය. ඇසිලින් නෝනා සැමදාම වාගේ රාත්‍රියට අංජනම බලන්නට පටන්ගත්තේ ඔහුගේ හිත සැනසීම පිණිසය.

ජිනසෝම වරක් දෙවරක් පැමිණ විශේෂඥ දොස්තර කෙනෙකු වෙතට යාමට යෝජනා කළ නමුත් වෙදමහත්තයා කැමැති වූයේ නැත. අංශබාගය වැනි රෝගවලට සිංහල වෙදකම මිසක දොස්තර වෙදකම් හොඳ නැතැයි යන්න ඔහුගේ ආකල්පය විය.

මාටින් මුදලාලි, සේතුන් අප්පුහාමි පමණක් නොව ගුණපාල ළමයා ආදී උදවියද මුල් දවස්වලදී දවස් දෙකතුනකට වතාවක් වෙදමහත්තයා සමග කතාබහ කරමින් සිටින්නට පැමිණි නමුත් කල්යාමේ ඒ ගමන්ද අඩුවී ගියේය. දවස් දෙක තුනකට සැරයක්වත් පැමිණෙන්නේ සිරිදාස පමණි.

"කුසුමලතා, සිරිදාසත් එක්ක ගියා නම් එක විදියකට ඉන්ඩ තිබුණ"



"වෙදමහත්තයා දැන් ඔව ගැන හිතල වැඩක් නැහැ... වෙන්ඩ තියෙන දේවල් තමයි වෙලා තියෙන්නෙ... එක එක්කෙනා ගෙනාපු දේවල් අපට වෙනස් කරන්ඩ බැහැ.."

"කුසුමලතා මේ ගැන දන්නව නම් නිච්චියට එනව බලන්ඩ"

වෙදමහත්තයා කුසුමලතා පිළිබඳව කතාව පටන්ගත්තේ ඒ ටික කියාගන්නට බැව් තේරුම් ගැනීම ඇසිලින් නෝනාට අපහසු නොවීය.

වෙදමහත්තයාගේ මුහුණකට පමණක් නොව ඇඟපතද සෝදා පිරිසිදු කිරීම ඇසිලින් නෝනාගේ දවසේ මුල්ම කාර්යය විය. නාවන්නට අවශ්‍ය වූ විටක ගුණසෝම ඔහුව ඔසවාගෙන ගොස් ළිඳ ළඟින් තබයි. ඇසිලින් නෝනා නැවූ පසු යළිත් ඔසවාගෙන විත් ඇඳමත තබයි.

"අරක්කු ටිකක් බොන්ඩ ආසයි බං"

වෙදමහත්තයා දවසක් එසේ කීවේ දවස් ගණනාවක උත්සාහයකින් පසුව බව ඇසිලින් නෝනා තේරුම් ගත්තාය. එහෙත් ඈ එය නෑසුණාක් මෙන් සිටියාය. ඊටපසුවද තුන් හතර වතාවක්ම ඒ ඉල්ලීම කළ නමුත් ඇසිලින් නෝනා ඒ සෑම විටම කිසිවක් නොකියා කාමරයෙන් පිටව ගියාය.

"අරක්කු ටිකක් බොන්ඩ ආසයි බං"

වෙදමහත්තයා, ඇසිලින් නෝනාගේ අතින් අල්ලා ගනිමින් කීවේය. ඔහුගේ මුහුණ පුරාම තිබුණේ බයාදු අසරණ බැල්මකි. ඇසිලින් නෝනාට ඒ දෙස බලාසිටීමටද අසීරු දෙයක් විය. ඇගේ දෑස් කඳුළින් තෙත් වෙන්නට පටන් ගත්තේය.

ඇඳ සිටි චීත්තය උඩින් තවත් චීත්තයක් පටලවාගත් ඈ මගදිගට කඳුළු පිසිමින් මාටින් මුදලාලිගේ කඩේට ගියාය. ඒ වන විට බඩුගැනීමට පැමිණ සිටි දෙතුන්දෙනා ඉවත්ව යන තෙක් බලා සිටි ඈ තමන් පැමිණි කාරණය මාටින් මුදලාලිට රහසින් මෙන් කීවාය. එදා රාත්‍රියේ මාටින් මුදලාලි වෙදමහත්තයා බලන්නට පැමිණියේ සිල් අරක්කු බාගයේ බෝතලයක්ද සඟවාගෙනය.

"වැඩියෙන් බොන්ඩ එපා... ගුණසෝම දැනගත්තොත් මට විසුමක් නෑ..."

WWW.SINHALAELIBRARY.COM 110
Uploaded By Paba

රාත්‍රිය ගුණසෝම ගෙදරින් පිටව ගිය පසු අරක්කු බෝතලය වෙදමහත්තයා අතට දෙමින් ඇසිලින් නෝනා කීවාය. ඉන්පසු කුස්සියට ගිය ඇ පපඩම් කෑලි දෙකක් බැදගෙන විත් වෙදමහත්තයා ළඟින්ම තැබුවාය.

ඔහු අරක්කු වීදුරුව පානය කෙළේ දවස් ගණනකින් වතුර පොදක් තොලක් පිපාසිතයකුට වතුර දෝතක් ලැබුණු කලෙක මෙනි.

"ඇසිලින් නෝනා... උඹ ඔහොම හිටපං... උඹ ජේන්ඩ ඉන්න කොට මට තනියක් නෑ බං"

වෙදමහත්තයා කතාව පටන් ගත්තේ ඒ විදියටය. ඉන්පසු බොහෝ දේ කීවේය. ඒ සියල්ල මීට පෙර කීපවතාවක්ම ඇසිලින් නෝනා අසා තිබුණු දේවල්ය.

වෙදමහත්තයාට ඕනෑ දෙයක් කියන්නට ඉඩ දී ඇසිලින් නෝනා ඇඳ පාමුලින් පැදුර එලාගෙන එහි වැතිර අසාගෙන සිටියාය.

"අපි උන් ගැන දුක්වෙන තරම් උන් අපි ගැන දුක්වෙන්නෙ නෑ... ඒකෙ හැටි එහෙම තමයි බං... ඒකනෙ උඹට අම්ම කියන්නෙ... ඒකනෙ මට තාත්ත කියන්නෙ..."

කියවිල්ල නතර කළ වෙදමහත්තයා එක්වරම ඉකිගසන්නට පටන් ගත්තේය. කලබලයට පත් ඇසිලින් නෝනා නැගිට ඔහුගේ හිස මෙන්ම පපුවද පිරිමදින්නට පටන් ගත්තාය. ටික වෙලාවකින් ඔහුට නින්ද ගියේය. ඇසිලින් නෝනා අඩක් හිස් වූ අරක්කු බෝතලය ගෙන කාමරයේ මුල්ලකින් තැබුවාය.

ඉන්පසු ඇඳ පැදුර මත ඇලවුණාය. මහරාත්තිරියේ ඇසිලින් නෝනා අවදි වූයේ වෙදමහත්තයා කෙඳිරි ගාන හඬිනි.

"පපුව ටිකක් රිදෙනව වගේ බං..."

ලාම්පු කුප්පිය දල්වාගත් ඇසිලින් නෝනා ගුණසෝමට කතා කළාය. ඇ කුස්සියේ රාක්කයක තිබූ සිද්ධාර්ථ තෙල් කුප්පිය රැගෙන එනවිට ගුණසෝම කාමරයට ගොස් වෙදමහත්තයාගේ හිසෙහි කොට්ටය සකස් කරමින් සිටියේය.

වෙදමහත්තය වෙතින් අරක්කු ගඳක් වහනය වූ නමුත් ගුණසෝම ඒ ගැන කිසිවක් ඇසුවේ නැත. ඇසිලින් නෝනා තෙල් බිංදු



කිහිපයක් අතට ගෙන වෙදමහත්තයාගේ පපුවෙහි තවරා තදින් පිරිමදින්නට වූවාය. ටික වේලාවකින් නැවතත් ඔහු නින්දට වැටුණේය.

"අමුත්තක් දැනුණොත් කතාකරන්ඩ" යි කියමින් ගුණසෝම කාමරයෙන් පිටව ගියේය. දල්වෙන ලාම්පු කුප්පිය තරමක් ඇතින් තැබූ ඇසිලින් නෝනා පැදුරෙහි වැතිරුනාය. නිදා නොගන්නට උත්සාහ ගත් ඇසිලින් නෝනා නින්දත් නොනින්දත් අතර කොතරම් වේලා සිටියාදැයි දැනුණේ නැත. එක්වරම වෙදමහත්තයාගේ අතපය සෙලවෙන හඬින් නැගී සිටි ඇ ලාම්පු කුප්පිය ළං කොට ඔහු දෙස බැලුවාය. ඔහු අසීරුවෙන් අතපය සොලවනු දුටු ඇසිලින් නෝනා පපුව පිරිමදිමින් ඉකිගසන්නට වූවාය. වෙදමහත්තයා ඇ දෙස බලා සිටිමින්ම නිසල වූයේය.

ඇසිලින් නෝනාගේ විලාපයත් සමග කාමරයට දුවගෙන පැමිණි ගුණසෝම වෙදමහත්තයා දෙස බලා සිට ඔහුගේ දෑස් පියත්පත් ඇඟිලි තුඩුවලින් වසා කාමරයෙන් පිටවී සාලයට ගොස් පුටුවක් මත ඉඳගෙන මහ හඬින් හඬන්නට පටන් ගත්තේය. වෙදමහත්තයාගේ ගෙවල් දෙසින් ඇසුණු විලාප හඬ රාත්‍රී නිසංසල බව අතරින් ගමේ ඈතටම විහිද ගියේය.

x x x x

WWW.SINHALAELIBRARY.COM 111

Uploaded By Paba

## 19

වෙදමහත්තයාගේ මළගම අවසන් වී සති දෙක තුනක් ගත වූ නමුත් ඇසිලින් නෝනා ගෙදර වැඩක් පොලක් කරනවා තබා ගෙයක් මිදුලක් අතුගාන්නටවත් උනන්දුවක් දක්වූයේ නැත. ඇ දවසේ වැඩි කාලයක් සිටියේ කාමරයේය. චිත්තරාලාගේ අම්මා පැමිණි විට නම් ඇ කාමරයෙන් පිටතට පැමිණියේම නැත.

"මං එනවට ගුණසෝමගෙ අම්ම කැමති නැතුව වගෙ"

චිත්තරාලාගේ අම්මා දවසක් එසේ කීවේ වෙනස්කම දරා සිටින්නට බැරිම තැනය.

"එහෙම එකක් නෙමේ අම්මෙ... ඒත් තාත්ත නැතිවුණාට පස්සෙ ගුණසෝමගෙ අම්ම හරි වෙනස්... ගුණසෝම එක්කවත් කතාබහක් නෑ... කාමරේම තමයි... වෙලාවකට ගුණසෝමටත් තේන්තියි"

"මිනිස්සු මැරෙනව තේන්නං... අනිත් එක මැරුණෙත් වයස ගිහිල්ලනෙ..."

"අනේ මන්ද අපට තේරෙන්නෙ නෑ... මගෙ පාඩුවෙ මං ඉන්නව"

"ඔහොම ඉන්නකොට හදිස්සියකට දරුව ගාවවත් තියල එළියට පහලියට යන්නවත් බැනෙ... හිතට බයයිනෙ"

අම්මාගෙන් මිට වූ ඒ වචන ටික නම් චිත්තරාගේ හිත ඇතුළටම කා වැදී ගියේය. බලාගත් අත බලාසිටින ඇසිලින් නෝනාගේ ස්වරූපය චිත්තරාගේ සිතේ ඇඳෙන්නට පටන් ගත්තේය. ඒ මුහුණ කිසිම හැඟීමක් නැති එකකැයි ඇට සිතිණි. චිත්තරා මේ ගැන ගුණසෝම සමඟ ද කතා කළාය.



"අම්මට තාම තාත්තාව අමතක කරන්ඩ බැරුව ඇති... මම කෝකටත් ලොකු හාමුදුරුවො මුණගැහිල කියන්නං..."

ගුණසෝම එසේ කීවේ චිත්තරාගේ සිතේ ඇති සිගැස්ම නැති කරගන්නටය. එහෙත් ඔහුගේම සිත පිගැස්සී ගියේ "හදිස්සියකටවත් දරුව ගාව තියල යන්ඩවත් බයයිනෙ" යි චිත්තරා කී කාරණාවටය. ඉක්මණින්ම ලොකු හාමුදුරුවන් හමුවූයේ ඒ නිසාය.

"ලොකු හාමුදුරුවෝ එන්ඩ කිව්ව" යි ගුණසෝම කී හෙයින් ඇසිලින් නෝනා පසු දවසක පන්සලට ගියාය. මාස ගණනකින් පන්සලට නොගිය හෙයින් ඇට ආගන්තුක බවක්ද දැනිණි.

"වෙදමහත්තයා මිනිස්සුන්ට බොහොම හොඳින් හිටපු කෙනෙක්නෙ..."

"එහෙමයි හාමුදුරුවනේ"

"දැන් උපාසක හාමිනේටත් තියෙන්නෙ පන්සලට එහෙම ඇවිල්ල මය බණ භාවනාවකට හිත යොදවන එක... ඒක් ඉතිං උපාසක හාමිනේටත් හොඳයි වෙදමහත්තයටත් හොඳයිනෙ..."

"එහෙමයි හාමුදුරුවනේ..."

ලොකු හාමුදුරුවන් මුණගැසී ආපසු පැමිණි ඇසිලින් නෝනා බුදු පහන තබන තැන පිරිසිදු කරන්නට පටන් ගත්තාය. පරණ කඩදාසිය ඉවත් කළ ඇ චිත්තරාගෙන් පත්තර කඩදාසියක් ඉල්ලාගෙන එය බුදුපහන රඳවා ඇති ලෑල්ලට දමා ඒ උඩින් බුදු පහනත් හඳුන්කූරු ගසන කුඩා ටින් එකත් තැබුවාය.

හිං කළුවර වැටෙන්නට පෙර මිදුලේ අඹගහ යට තිබූ වතුසුද්ද ගහෙන් මල් හත අටක් කඩාගත් ඇසිලින් නෝනා ඒවා බුදු පහන අසල තබා පහන දල්වා ගාථා කියන්නට පටන් ගත්තාය. ගාථා කියා අවසන් කළ ඇසිලින් නෝනා අල්මාරිය උඩ අතපත ගා එහි දමා තිබුණු අංජනම ගෙන එහි තැවරී තිබුණු දූවිලි පිසදා පිරිසිදු කළාය.

එකල අංජනම් බැලීම සඳහා පාවිච්චි කළ පුටුවට පිරුවට කෑල්ලක් එලා අංජනම ඒ මත තබා පොල්තෙල් පහන ද ඒ ළඟින්ම තැබුවාය. සාලයට පැමිණ පුටුවක් ඔසවාගෙන ගොස් එය ඉදිරියෙන් තබා අංජනම් බලන්නට පටන් ගත්තාය.

SL UNLIMITED
The spirit of Sri Lankan e-community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 112
Uploaded By Paba

ඇසිලින් නෝනා පසුදින අවදි වූයේ සිහියම් ප්‍රබෝධයකිනි. පෙරදා රාත්‍රියේ අංජනම් දේවිය නොවැඩියත් යම් මොහොතක වඩින්නට ඉඩ ඇතැයි යන සිතුවිල්ල ඇසිලින් නෝනාගේ සිතට අලුත් පිබිදීමක් එක්කරමින් සිතේ ඒ මේ අත සැරිසරන්නට පටන්ගෙන තිබිණි. මල් පහන් පූජාකිරීමත් අංජනම් බැලීමත් දිගින් දිගටම කරගෙන යද්දී හත්වැනි රාත්‍රියේ අංජනම් දේවිය අංජනමෙහි පෙනී සිටින බව ඇසිලින් නෝනා දුටුවාය. රත්තරන් පාට සළු පිළිවලින් සැරසී සිටි අංජනම් දේවිය එක්වරක් ඇසිලින් නෝනා දෙස බලා යළි නොපෙනී ගියාය. මැදියම් රැය ඉක්ම යනතුරු බලා සිටියද ඉන්පසු අංජනම් දේවිය පෙනී සිටියේ නැත.

පසුදා උදෙන්ම අවදි වූ ඇසිලින් නෝනා මුහුණකට සෝදාගෙන වතුසුද්ද මල් දෙකතුනක් කඩාගෙන විත් පූජා කළාය.

ඒ අතරතුර කුස්සියෙන් සද්ද බද්ද ඇසෙන්නට පටන් ගත්තේය. චිත්තරා නැගිට දරුවාට කිරි හදනවා විය යුතු යැයි ඇසිලින් නෝනාට සිතිණි. ඈ කුස්සියට ගියාය.

"දරුව ඇහැරලද?"

ඈ චිත්තරාගෙන් ඇසුවාය.

ඇසිලින් නෝනාගේ හදිසි වෙනස චිත්තරාට දනුණ නමුත් ඒ බව නොහඟවා "අම්මටත් තේ ටිකක් හදල දෙන්ඩද?" යි ඇසුවාය.

"එපා... තව ටිකකින් ගුණසෝම කිරි ගේන්නෙ නැතෑ..."

ඇසිලින් නෝනා එසේ පිළිතුරු දෙමින් කුස්සියේ ජනෙල් පියන ඇරියාය. තුළඟ හීතල වැඩිය. ඈ නැවතත් ජනෙල් පියන වසා කාමරයට පැමිණියාය.

දිවා කල ගෙවී ගොස් රාත්‍රිය එළඹෙනතෙක් ඇසිලින් නෝනාට ඉවසුමක් නැත. ඒ අංජනම් බලන්නටය. රාත්‍රිය එනතෙක් ඈ ගෙදර දොර බොහෝ කටයුතු කළාය. මිදුල අතුපතු ගෑම පමණක් නොව වැවී තිබුණ තණකොළ උදුරා ගන්නටද උත්සාහ කළාය.

එදා රාත්තිරියේද අංජනම් දේවිය අංජනමෙ පෙනී සිටියාය. ඇසිලින් නෝනා සමඟ සිනාසුණ අංජනම් දේවිය අතින් සංඥාවක් කළාය. වෙදමහත්තයා පෙන්වන්න යැයි ඈ සිතින් සිතාගත්තාය. අංජනම් දේවිය යළි නොපෙනී ගියාය.



අංජනම් දේවිය අංජනමට වඩින්නට පටන්ගෙන හත්වැනි රාත්තිරියේදී වෙදමහත්තයා පෙනී සිටියේය. ඔහුගේ මුහුණ ඇසිලින් නෝනාට හොඳින්ම පෙණිනි. වෙදමහත්තයා අතින් සංඥා කරමින් මොකක්දෝ කියන්නට උත්සාහ කරන බවක් පෙනිනි. "ඔහු ඕනැද?" ඇසිලින් නෝනා සිතුවාය. ඔහු නිසවනා නොපෙනී ගියේය. පහන නිවා දමා ඇඳමත ඇලවුණු ඇසිලින් නෝනා සැනසුම් සුසුමක් හෙලුවාය. වෙදමහත්තයා තමාගෙන් වෙන්ව නොයන බව ඈට විශ්වාසය. දැන් යළිත් ඔහුව දකින්නට අවසරය ලැබී තිබේ. මහා සතුටකින් සැහැල්ලුවට පත් වූ ඇසිලින් නෝනා පසුදා පහන් වනතුරු සිටියේ නොඉවසිල්ලෙනි. ඒ මේ අලුත් ආරංචිය ගුණසෝමට කියන්නටය.

"ඊයේ තාත්තව දැක්ක... අංජනමට ආවා... පින් ඕනෑ කියල අතින් කිව්ව... හාමුදුරුවන්ට අටපිරිකරක්වත් පූජා කරන්ඩ ඕනෑ..."

පසුදා හිමිදිරියේම ඇසිලින් නෝනා ගුණසෝමට කීවාය. ඇගේ ප්‍රබෝධමත් හැසිරීම ගුණසෝමටද වටහාගන්නට බැරි තරම්ය. පුස්කොළ පොත් වෙනුවෙන් බටගොල්ලේ වෙදමහත්තයා සිරිදාස අත එවා තිබුණු රුපියල් එකසිය පණහ වෙදමහත්තයා අල්මාරියේ කොතැනක හෝ තැබූ බව ඇසිලින් නෝනාට මතක් විය. ඈ අල්මාරිය අදින්නට වූවාය. මුදල් කවරය පමණක් නොව වෙදමහත්තයා සිරිදාසට නොදී ඉතිරි කරගත් පුස්කොළ පොතද ඈට හමුවිය. පුස්කොළ පොත මල් බුලත් පුටුවෙහි අංජනම ළඟින්ම තැබූ ඇසිලින් නෝනා කාමරයෙන් පිටවී ඉස්තෝප්පුවේ ලණු ඇඳ මත දරුවාත් තුරුළු කරගෙන ඇලවී සිටි ගුණසෝම වෙතට ගියාය.

"මට මේකෙන් පිරිකරක් ගෙනත් දීපං..."

"සල්ලි මොකටද? මං ගෙනත් දෙන්නං..."

"නෑ මේක තාත්ත තියල තිබ්බෙ පිංකමකට දෙන්ඩ කියල... තාත්ත හුඟක් සතුටුවෙයි මේ සල්ලිවලින් පිංකමක් කරපු බව දැනගත්තාම... මං අද රෑට තාත්තට කියනව..."

ඇසිලින් නෝනා එසේ කියා දරුවාගේ හිස ද අත ගා යළි කාමරයට ගියාය. ඇසිලින් නෝනා සමඟ වෙදමහත්තයා කතා කරන්නට පටන්ගත්තේ ඒ පිංකම සිදු කළ දා රාත්තිරියේය. එතැන්

WWW.SINHALAELIBRARY.COM 113
Uploaded By Paba

පටන් සෑම රාත්තිරියකම පාහේ වෙදමහත්තයා අංජනම ඔස්සේ ඇසිලින් නෝනා සමඟ කතා කළේය. ඇසිලින් නෝනා ඒ සමහර දේවල් ගුණසෝමටද චිත්තරාටද කීවාය. එහෙත් බොහෝ දේවල් සිත යට සඟවාගත්තාය.

"මිරිස් පැළවලට වතුර දානකොට කවදාවත් මිරිස් කරල් ගැන හිතන්ඩ එපා... ඒ පැළේ ගැන විතරක් හිතන්ඩ... එතකොට තමයි අපි පැළේට සැලකුව වෙන්නෙ... කරල් ගැන හිතුවොත් ඒක පාප චේතනාවක් වගේ... එහෙම හිතාගෙන වතුර දාන්නෙ පැළේට නෙමෙයි... අපට... අංජනම හදන්ඩ ගියාම මට වැරදුනේ එතන... ඇසිලින් නෝනාට අංජනම පේන්නෙ එහෙම පාප චේතනා ඇසිලින් නෝනා ගාව නැති හින්ද..."

× × × ×

"දරුවන්ට අපිව තේරුං ගන්ඩ බැරි වෙන්ඩ පුළුවන්... ඒත් අපට පුළුවන් වෙන්ඩ ඕනෑ දරුවන්ව තේරුං ගන්ඩ... ඒක හින්ද තමයි අපට දෙමව්පියෝ කියන්නෙ...'උඹට හිතෙනව නං දරුවො උඹ ගැන හොයන්නෙ බලන්නෙ නෑ කියල... ඒත් උඹ ඒ දරුවන්ට තියෙන ආදරේ නැති කරගන්ඩ එපා... ඒ අපි දෙමව්පියෝ හින්ද... හැබැයි ඇසිලින් නෝනා ජිනසෝමල තාත්තල වුණාම තේරෙයි තාත්ත කෙනෙක් දරුවන්ට කොච්චර ආදරේද කියල..."

මුළු ගමම දවස උදාවෙන තෙක් බලා සිටින නමුත් ඇසිලින් නෝනා බලා සිටින්නේ දහවල ගෙවී ගොස් රාත්තිරිය එළඹෙන තෙක්ය.

× × × ×

"මට බෑ ගුණේ මේ ගෙදර තනියම ඉන්ඩ... අම්ම තනියම කතා කරනව ඇහෙනකොට මට බය හිතෙනව... මේක හූත ගෙදරක් වෙලා"

ඕං කළුවර වැටෙන විට චිත්තරා ගුණසෝමට කියයි.

"දවාලට අම්ම හරි වෙනස්... හැම වැඩක්ම කරනව... මට උදව් වෙනව... ඊයේ පෙරේද මිරිස් පැළ තුනහතරකුත් හිටෙව්ව... ඒත් රෑ වෙනකොට මට බයයි. දවල්ටත් මට අම්මව පේන්නේ තනියම කතා කරන කෙනෙක් වගේ. හිටපු ගමන් තේරුමක් නැතුව මාත් එක්ක හිනා වෙනව..."



චිත්තරා කියන එක ඇත්තකි. අන්තිමේදී ගුණසෝම මේ පිළිබඳව ජිනසෝමට ලියා යැව්වේය.

"අම්ම අංජනම දිහා බලාගෙන තනියම කතා කරනව... අපට කියන්නෙ තාත්තත් එක්ක කතා කරනව කියල... චිත්තරා බයයි දන් ගෙදර ඉන්ඩ... සමහර වෙලාවට තනියම හිනාවෙනවලු... තාත්ත කියන දේවල් හරියටම හරි කියල කියනවලු... දවාලටවත් මං ගෙදරින් යනවට චිත්තරා කැමැති නෑ... හරි ප්‍රශ්නයක්... පිට කාටවත් කියන්ඩ පුළුවන් දේකුත් නෙමෙයිනෙ..."

ගුණසෝමගේ ලිපිය කියැවූ ජිනසෝම බර කල්පනාවකට වැටුණේය. ඔහු විමලසූරිය මහත්මයාටද ලිපිය පෙන්නා සිදුව ඇති දේ කීවේය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් ලබා ඇති විමලසූරිය මහත්මයා ගුරු මණ්ඩලය අතර ප්‍රකටව සිටියේ සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා සමාජ හෝ ජීවන ප්‍රශ්න පිළිබඳව කාරණා දන්නා පුද්ගලයෙකු හැටියටය. දනට පණස් වියද ඉක්මවා සිටි නමුත් අවිවාහකව සිටින ඔහුගේ එකම වැදගත් කාර්යය වන්නේ පොත පත කියවීමය. එහෙත් ඔහු සමඟ කතාවට වැටුණොත් බොහෝ වෙලාවක් පණ්ඩිත කතා අසන්නට සිදුවන බව නොදන්නා කෙනෙක් ගුරු මණ්ඩලයේ නැත. එසේ වුවද කරදරයක පැටලැවුණු විටක යමක් දනගන්නට ඔහු තරම් කෙනෙක් ද නැත.

"ජීවිතේ පුරාම අපි කරන්නෙ කන්දක් නගින එක... ඒත් අපි හැමෝටම කඳු මුදුනට යාගන්ඩ බෑ... මගක් දුර කන්ද නගිනකොට අපි දෙමාපියන් බවට පත්වෙනව. ඊට පස්සෙ දරුවොත් එක්ක කන්ද පාමුලට එන්ඩ අපට සිද්ධ වෙනව. දරුවන්ගෙන් නිදහස් වුණාට පස්සෙ අපි කන්ද නගින්ඩ පටන් ගන්නව. ඒත් දරුවො විඳින දුක දැකල එහෙමත් නැත්තං දරුවන්ගෙ දරුවො ගැන ආස හිතිල ආයිමත් කන්ද පාමුලට එනව... කාට හරි පුළුවන්නං මේ බන්දනවලින් මිදිල කන්ද තරණය කරල මුදුණටම යන්ට ඔහු අපූරු මිනිසෙක් වෙනව. මට හිතෙනව ජිනසෝමලගෙ තාත්තත් ඒ වගෙ අපූරු මිනිහෙක් කියල...

"තාත්ත මැරෙන්ඩ ඇත්තේ දුකින් කියලද විමලසූරිය මහත්තය හිතන්නෙ..."

WWW.SINHALAELIBRARY.COM 114

Uploaded By Paba

"මිස්ට ජිනසෝම මට මීට ඉස්සර කිව්ව ඒවත් දැන් කියන ඒවත්... හරි ඇත්ත නම් මට හිතෙන්නෙ තාත්තට කිසිම දුකක් තිබිල නෑ... හැබැයි එකක් ඇත්තම කියනව නම් මිස්ට ජිනසෝමගෙ හිතේ පුංචි දුකක් තියෙනව... ඒක හරි සාධාරණ දුකක්. මිස්ට ජිනසෝමගෙ විශ්‍රාන්ත පන්ති හින්ද වැඩිපුර ගෙදර ගියේ නෑ... ඊට පස්සේ වයිෆ්ගෙ ප්‍රශ්න නිසා යැවුණෙත් නෑ. අපි දෙමාපියො දිහා බලන්නෙ අපේ ඕනෑ එපාකම් අතර තියෙන පුංචි හිඩැස්වලින්... ඒ ජීතේ දරුවෙක් හින්ද... ඒත් ජීතේගෙම දරුවෙකුට පුංචි බඩේ අමාරුවක් හැදුනත් වැඩ ඔක්කොම නවත්තල ඒ ගැන වෙහෙසෙනව. ඒ ජීතේ තාත්ත කෙනෙක් හින්ද..."

"තාත්තගෙ හිතේ කේන්තියක් තියෙන්ඩ ඇද්ද?"

"නෑ... කේන්තියක් නෑ... කන්ද මුදුනට ගිය මිනිස්සුන්ගෙ හිත්වල කරුණාවක් මිස තරහක් රැඳෙන්නෙ නෑ. අම්ම බැඳිල තියෙන්නෙත් තාත්තගෙ කරුණාවට. මොනව වුණත් මිස්ට ජිනසෝම අම්මව මානසික දොස්තර කෙනෙකුට පෙන්නන්ඩ... ඔක මානසික ප්‍රශ්නයක් තමයි... හැබැයි මිස්ට ජිනසෝමලගෙ අම්මට තියෙන්නෙ ඔය කියන විදියට ඊටත් වඩා එහා ගිය තත්ත්වයක්...

විමලසූරිය මහත්මයා පැවසූ කාරණා කිසිවක් රමණී සමඟ කතා නොකරන්නට ජිනසෝම ඉටාගත්තාය.

"මං විමලසූරිය මහත්තයත් එක්ක කතා කළා... ඉක්මනට සයිකැට්‍රික් කෙනෙකුට පෙන්නන්ඩ කියල තමයි කිව්වෙ..."

"ඒක තමයි ජීතේ... හිත කලබල කරගන්ඩ එපා... හෙට උදේම ගෙදර යන්ඩ... මොකවත් කරගන්ඩ තේරුමක් නැතුව ගුණසෝම බයවෙලා ඇති... සෝම ඉන්න එකේ මට තනියක් නෑ..."

රමණී පැවසුවේ ජිනසෝමගේ අත අල්ලා ගනිමිනි. ඔහු හොඳටම කලබල වී ඇති බවක් ඈට දැනිණි.

ජිනසෝම පසුදා උදෙන්ම ගෙදර ගියේය. එහෙත් ගෙදර කිසි කලබලයක් නැත. අම්මා කුස්සිය අස්පස් කරමින් සිටියාය. චිත්තරා කාමරයේ සිට හඬන දරුවා නලවගන්නට උත්සාහ දරන හඬ ඇසේ. ගුණසෝම පෙනෙන්නට නැත.

"යාළුවෙක් හම්බවෙන්ඩ ගම්පහ ආවා... ඒ ගමන් දවල්ට කන්ඩත් එක්ක ආවෙ... හරිම බඩගිනියි.."



ජිනසෝම කීවේය. ඇසිලින් නෝනා හැඬුම්බරින් අඬන්නට පටන් ගත්තාය.

"පුළුවු නම් බදින්නෙ නෑ පුතේ... තාත්ත කැමැති නැතෙ... දැන් තාත්ත මට හැමදාම කතා කරනවනෙ... උඹල ගැනත් අහනව... සතුටින් ඉන්නව නම් එච්චරයි කියල තමයි තාත්ත කියන්නෙ..."

"බැඳුම් එපා සම්බෝලයක් හදන්ඩකො"

ජිනසෝම ඉතා ඉක්මනින් මාතෘකාව වෙනස් කෙළේය. ඇසිලින් නෝනා කුස්සියේ සිටින අතරේ සාලයට පැමිණ ජිනසෝම කාමරයට එබිකම් කෙළේය. මල් බුලත් පුටුවක තබා ඇති අංජනම ද පුස්කොළ පොතද පරවුණු මල් හත අටක්ද මොනර පිහාටුවක්ද විය. බුදු පහන තිබුණේ වෙනම තැනකය. ඇඳ කොට්ට මෙට්ට පිළිවෙළට සකස්කොට තිබිණි. කාමරයේ අපිළිවෙළක් නැත.

එහෙත් ඇසිලින් නෝනාගේ විශාල වෙනසක් සිදුවී ඇත. ඉතා ඉක්මණින් මනෝ වෛද්‍යවරයකුට පෙන්විය යුතුය. හවස් වරුවේ ඔහු ගුණසෝම සමඟ ද ඒ ගැන සාකච්ඡා කෙළේය.

ජිනසෝම ආපසු කුරුණෑගල ගියේ හැකි ඉක්මනින් ආපසු එන බලාපොරොත්තුවෙනි. එහෙත් එදා රාත්‍රියේ බලාපොරොත්තු නොවූ බොහෝ දෙවල් සිදුවිය.

ඇසිලින් නෝනා දෙගොඩහරි රාත්‍රියේ තනියම කතා කරන හඬ චිත්තරාගේ කාමරයටද ඇසෙන්නට විය. චිත්තරා නිදා සිටි ගුණසෝමව අවදි කළාය. ගුණසෝමටද ඇසිලින් නෝනා කතාකරන හඬ ඇසිණි. ඔහු කාමරයෙන් පිටව ඇසිලින් නෝනාගේ කාමරය අසලට ගොස් එබිකම්කර බැලීය. ඈ අංජනම දෙස බලාගෙන තනියම කතා කරමින් සිටී.

"වෙදමහත්තය හැමදාම මෙහෙම කතා කරන එක මගෙ හිතට ලොකු සැනසිල්ලක්... මට හිතෙනව මේ ආසාවල් ඔක්කොම නැති කරල නිදහස් වෙලා වෙදමහත්තය ළඟට මට ළඟදීම එන්ඩ පුළුවන් වෙයි කියල"

ඇසිලින් නෝනා තවත් මොනවාදෝ කියවන්නට පටන් ගත්තාය. ඒ හැම එකක්ම එක වාගේ දේවල්ය. ඒවාත් අපැහැදිලිය. ඔහු විනාඩියක් දෙකක බලා සිට ආපසු කාමරයට ආවේය. ඒ එනවිට චිත්තරා සිටියේ දරුවාත් තුරුලු කරගෙන ඉකිගසමිනි.

SL UNLIMITED
The spirit of Sri Lankan e community
www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 115
Uploaded By Paba

"මට බයයි... නින්ද යන්නෙත් නෑ... මට එක එක දේවල් හිතෙනවා... ඔයා ගෙදරින් පිටවුනාම මම ඉන්නෙ හරි බයෙන්... එක්කො මේ දේවල් ඉවරවෙන කල් මම දරුවත් එක්ක අපේ ගෙදර නවතින්නම්"

චිත්තරා දරුවාව නව නවත් තුරුල්ලට තද කරගත්තාය. ඈ හොඳටම බියපත්ව සිටින බව ගුණසෝමට හොඳ හැටි තේරුණි. එහෙත් ඔහු නිහඬව සිටියේය.

දෙනුන්ගෙන් කිරි දොවන්නට ගුණසෝම පාන්දරින් අවදිවෙයි. පසුදා පාන්දරින් අවදිවූ ඔහු දෙනුන් ගාවට යන්නට පෙර ඇසිලින් නෝනා නිදා සිටින කාමරයට එබිකම් කෙළේය. ඈට නින්ද ගොසිනි. හෙමින් සීරුවේ කාමරයට ඇතුළුවූ ගුණසෝම අංජනම සහිත පීරිසිය ගෙන කාමරයෙන් පිට විය. පළමුව වත්ත පහළට ගිය ඔහු පීරිසිය බිත්තෙන් එපිටට වීසි කෙළේය. දෙනුන් වෙතට ගොස් කිරි දොවන්නට පටන්ගත්තේ ඉන්පසුවය.

x x x x

අංජනම විසිකිරීමෙන් පසු ඇසිලින් නෝනා කතිරයම කතා කෙළේ නැත. ගුණසෝම සිතුවේ සියල්ල අවසන් වෙනු ඇත කියාය. එහෙත් ඒ වෙනුවට වචනයක්වත් පිට නොකර බලාගත් අත බලාගෙන සිටින්නට වූවාය. ඈ හැඬුවේද නැත. චිත්තරා දෙස නොව ගුණසෝම දෙසවත් බැලුවේ නැත. බොහෝ විට සිටියේ කාමරයේය. ඉස්තෝප්පුවට පැමිණියහොත් පුටුවක් මත වාඩිවී පාර පැත්ත බලාගෙන පැය ගණන් සිටියාය.

ජිනසෝම ගෙදර පැමිණි විටද ඇසිලින් නෝනා ඔහුගේ මුහුණ දෙස බැලුවේ නැත. ඔහු දෙතුන් වරක්ම කතා කළ නමුත් නාඳුනන පුද්ගලයෙකු දෙස බලන්නාක් මෙන් එක්වරක් මුහුණ දෙස බලා යළි පාර දෙස බලාගෙන සිටින්නට වූවාය. ඉන්පසු ජිනසෝම දෙසවත් ගුණසෝම දෙසවත් නොබලා කාමරයට ගියාය.

"කෑමක් නෑ... මේ දවස් ටිකේම... බත් පිගාන එහෙත් මෙහෙත් අවුස්සල පූසන්ට හලනවා. හරිම හිතුවක්කාරයි... ලොකු හාමුදුරුවො එන්ඩ කිව්වා කියලත් මම කිව්වා. ඇහෙන්නෙ නැතුවා වාගෙ අහක බලාගෙන ඉන්නවා... එච්චරයි..."

ගුණසෝම මූලින් හෙප්පුව අතට ගනිමින් කීවේය. චිත්තරා තේ එකක් රැගෙනවිත් ජිනසෝමට පිළිගැන්වූවාය.



මංකඩේ හත්දියේ එදිරිසිංහගෙ කාර් එක කතා කරගත් ගුණසෝමත් ජිනසෝමත් පසුදා උදෙන්ම වාගේ ඇසිලින් නෝනාත් සමඟ කොළඹ ගියහ. ඇසිලින් නෝනාට තිබෙන කෑම අප්පිරියාවට බෙහෙත් ගැනීමට යන බවකි. ඇසිලින් නෝනා කිසිවකට විරුද්ධ වූයේ නැත. ඈ කියන කියන දේ කළාය. ජිනසෝම එය දුටුවේ අසාමාන්‍ය ලක්ෂණයක් ලෙසිනි.

මනෝ වෛද්‍ය විශේෂඥ සපරමාදු මහතා ඇසිලින් නෝනාව පරීක්ෂා කොට ජිනසෝමටත් ගුණසෝමටත් කාමරයෙන් පිටවෙන්නැයි කියා ඇසිලින් නෝනා සමඟ විනාඩි දහයක් පමණ කතා කෙළේය. ඉන්පසු ගුණසෝමටත් ජිනසෝමටත් කතාකොට ඇසිලින් නෝනාව පිටතට කැඳවාගෙන යන ලෙසත් ගුණසෝමට කී දොස්තර මහත්තයා ජිනසෝමට මදක් නවතින ලෙස අතින් සංඥා කෙළේය.

"දැන් මොකද වුණේ? මොනවද දැක්කෙ? ඇහුවෙ? කියල කියාන්ඩකො බලන්ඩ"

"මම ඉන්නෙ කුරුණෑගල... මල්ලි තමයි ගෙදර ඉන්නෙ"

ජිනසෝමව පිටතට යවා ගුණසෝමව ගෙන්වාගත් සපරමාදු මහත්මයා සියලු විස්තර ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටියේය. ගුණසෝම කියූ සෑම වචනයකටම හොඳින් ඇහුම්කන් දුන් සපරමාදු දොස්තර මහත්මයාය කිසියම් තීරණයක් ගත් විටෙක මෙන් හිස වැනුවේය.

ඉන්පසු ඔහු ජිනසෝමව කැඳවූයේය. ඇසිලින් නෝනාව බලාගැනීම සඳහා ගුණසෝම පිට ගියේය.

"දෙන්නෙක් බොහොම සමීප සම්බන්ධතාවක් තියෙද්දී එක්කෙනෙක් මැරුණයි කියල ඒ බැඳීම නැති වෙන්නෙ නෑ... මාස ගණනාවක්.. සමහරවිට මාස තුනක්.. සමහරවිට හයක් යනතුරු ඒ බැඳීම තියෙනවා. සමහරවිට ඔවුන් එකිනෙකා සමඟ කතා කරනවා... කතා කරන්ඩ මාධ්‍යයක් ඕනෑ වෙනවා... ඒ ඒ අය තමන්ට ළඟා කරගන්ඩ පුළුවන් මාධ්‍යය තෝරාගන්නවා. දැන් මේ අම්මට තාත්තත් එක්ක සම්බන්ධතා පවත්වන්ඩ තිබුණු මාධ්‍ය තමයි අංජනම. අංජනම නැතිවුණාම අර සම්බන්ධතාවය පවත්වන්ඩ බැරිවෙලා



Uploaded By Paba

හිත පීඩනයකට අනුවෙනව... ඒක තමයි මේ වෙලා තියෙන්නෙ... ඒ සැනා කරන්නෙ තනියමද නැද්ද කියල මගෙන් අහන්ඩ එපා... ඒ අපට තේරුම්ගන්ඩ බැරි ඇත්තටම එහෙම දෙයක් ඒ අය අතරෙ සිද්ධ වෙන නිසා. ඒක එක්තරා විදියක මායාවක්... හැබැයි එහෙම කියල අපි ඒ සම්බන්ධය කඩල දාන්ඩ හොඳ නෑ... සමහර විට කාලයක් යනකොට ඒ බැඳීම තුනීවෙලා යන්ඩ පුළුවන්. ඒක අපට බලෙන් කාලය විසින් විසඳල දෙන්ඩ ඕනෑ දෙයක්. ඒක අපට බලෙන් කරන්ඩ බෑ...

"තාත්තත් එක්ක තිබුණු ඒ සම්බන්ධය කඩාදාපු හින්ද මෙයාගෙ මනස පීඩනයකට අසුවෙලා විකෘතිවෙලා තියෙන්නෙ. දැන් මේකට වෙදකම් කරන්ඩ වෙනව...

"අම්මත් තාත්තත් දෙන්නම හරිම සංවේදී දෙන්නෙක් කියල තමයි මේ කතාබහවලින් මට තීරණය කරන්ඩ වෙන්නෙ... සංවේදී සම්බන්ධයක් විනාශවීම හරිම හානිකරයි"

"අපි ආපහු ඒ අංජනම ලබා දුන්නොත්?"

"ඒක කොයි විදියට අම්ම භාරගනීවිද කියල අපට කියන්ඩ බෑ... ඒක තමයි මේ රෝගී තත්ත්වයන්ගෙ හැටි... අපට මේවා තේරුම් ගන්ඩ හරි අමාරුයි... මෙතන වෙලා තියෙන්නෙ අම්මයි තාත්තයි අතර තිබුණ බැඳීම දරුවන්ට තේරුම්ගන්ඩ බැරිවීම"

"ඩොක්ටර් දැන් මොකද්ද කරන්ඩ පුළුවන්?"

"දැන් ඉතින් බෙහෙත් කරමු. බලෙන් මොකක්වත් කරවන්ඩ යන්ඩ එපා... අපි හිතමු බලෙන් පන්සල් යවන්ඩ... බලෙන් මල් පූජා කරවන්ඩ... එහෙම කරන්ඩ යන්ඩ එපා... එතකොට තත්ත්වය තවත් හානිකර වෙන්ඩ පුළුවන්. අපේ මනස අනුව ඒගොල්ලන්ව හදන්ඩ බෑ. ඒගොල්ලො හදන්ඩ පුළුවන් ඒගොල්ලන්ගෙ මනස අනුව විතරයි"

ඇතිවී තිබෙන තත්ත්වය ගැන දීර්ඝ විස්තරයක් කළ සපරමාදු දොස්තර මහත්මයා සති දෙකකට සෑහෙන බෙහෙත් ලබාදුන්නේය.

එහෙත් ඇසිලින් නෝනා බෙහෙත් පෙති විසිකළා මිසක බීවේ නැත. ඇසිලින් නෝනා සිරිදාස ආවාදැයි කිහිපවිටක්ම ඇසූ බව සිහිපත් කළ ජිනසෝම ඒ ගැන ගැඹුරින් සිතා සිරිදාසට එන්නැයි



කියා ගුණසෝම අත පණිවුඩයක් යැවීය. හවස් යාමයේ සිරිදාස පැමිණියේය. ජිනසෝම ඔහු සමඟ මිනිත්තු දහයක් පහළොවක්ම සාකච්ඡා කෙළේය.

ඉන්පසු සිරිදාස ඇසිලින් නෝනාගේ කාමරයට ගියේය. ඈ ඔහු සමඟ බොහෝ වේලාවක් කතා කළාය. වෙදමහත්තයා ගැන පමණක් නොව දෙවියන් යකුන් ගැනද කතා කළාය. කතාව අතරතුර සිරිදාස බෙහෙත් පෙති දුන් විට ඈ බැල්මකින්වත් ඒවා ප්‍රතික්ෂේප නොකර ගිල දැම්මාය. එදා පමණක් නොව ඇසිලින් නෝනාට බෙහෙත් පොවන්නට හැම හැන්දෑවකම සිරිදාසට එන්නට සිදුවිය. හැන්දෑ වනවිට ඉස්තෝප්පුවට එන ඇසිලින් නෝනා සිරිදාස එනතෙක් මඟ බලාගෙන සිටින්නීය.

× × × ×

WWW.SINHALAELIBRARY.COM 117

Uploaded By Paba